ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දසවැනි පාර්ලිමේන්තුව

(පළමුවැනි සභාවාරය)

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 544

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල දෙවැනි වාර්තාව

## (2025.02.05 සිට 2025.06.03 දක්වා)

නියෝජ්‍ය කාරක සභා සභාපති

ගරු හේමාලි වීරසේකර මහත්මිය

විසින්

2026 ක් වූ ජුනි මස 25 වැනි දින ඉදිරිපත් කරන ලදී.

අනුමතිය ලැබීම මත මාසික වාර්තාවට ඇතුළත් කරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| අනු අංකය | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම | දිනය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.05 |
| 02. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.14 |
| 03. | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.20 |
| 04. | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.22 |
| 05. | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.28 |
| 06. | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.03.04 |
| 07. | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.03.12 |
| 08. | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.04.07 |
| 09. | කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.04.08 |
| 10. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.06.03 |

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්යමණ්ඩලය (2025.02.05 - 2025.06.03)**

- ඩී. ඩී. යූ. කේ. මුණසිංහ මහතා, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කාරක සභාවේ ලේකම්
- චන්දිමා සුහසිංහ මහත්මිය, ප්‍රධාන නිලධාරී
- ඩී. ආර්. ඒ. එම්. ඩී. සෙව්වන්ති රණසූරිය, සහකාර ප්‍රධාන නිලධාරී
- උදේශිකා තත්සරණී වීරසිරි මිය, පාර්ලිමේන්තු නිලධාරී
- ඩබ්. පී. යූ. හංසනී මුණසිංහ මිය, පාර්ලිමේන්තු නිලධාරී
- මාධවී අර්ථනායක මිය, පාර්ලිමේන්තු නිලධාරී
- ඩබ්. එම්. මධුෂාණී වීරසේකර, පාර්ලිමේන්තු නිලධාරී
- ප්‍රභා හෙට්ටිආරච්චි මෙනෙවිය, පාර්ලිමේන්තු නිලධාරී
- රුක්මණී දේවී මහත්මිය, ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තක
- එම්. එල්. මුහම්මදු පත්හුල්ලා මහතා, පරිගණක ක්‍රියාකරු

**අමාත්‍යාංශ ලේකම්වරුන් (2025.02.05 - 2025.06.03)**

- එච්. එස්. එස්. තුයියකොන්නා මහතා - ආරක්ෂක අමාත්‍යාංශය
- කේ. එම්. එම් සිරිවර්ධන මහතා - මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
- වරුණ ශ්‍රී ධනපාල මහතා (වැ.බ) - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
- කේ. එම්. ජී. එස්. නාලක කළුවැව මහතා - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
- ඩී. පී. වික්‍රමසිංහ මහතා - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
- අරුණි රණරාජ මහත්මිය - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
- එම්. ඒ. එල්. එස්. එන්. කේ. මන්ත්‍රීනායක මහතා - ධීවර, ජලජ, සහ සාගර සම්පත් අමාත්‍යාංශය
- ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මිය - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සී.කේ. පෙරේරා මහතා - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
- බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා - වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
- වෛද්‍ය අනිල් ජාසිංහ මහතා - සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
- කේ. ඒ. විමලේන්තිරරාජා මහතා - වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
- එස්. එම්. පියතිස්ස මහතා - කම්කරු අමාත්‍යාංශය
- යූ. ජී. රංජිත් ආරියරත්න මහතා - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
- එස්. ආලෝකබණ්ඩාර මහතා - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
- මලර්මතී ගංගාදරන් මහත්මිය - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

- වයි. එල්. මොහොමඩ් නවවි මහතා - විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
- ඩී. ඩබ්. ආර්. බී. සෙනෙවිරත්න මහතා - මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
- මහාචාර්ය කේ. ටී. එම්. උදයංග හේමපාල මහතා - බලශක්ති අමාත්‍යාංශය
- ඒ. එච්. එම්. යූ. අරුණ බණ්ඩාර මහතා - තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
- කේ. ඩී. ආර්. ඔල්ගා මහත්මිය - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
- කේ. ආර්. උඩුවාවල මහතා - පරිසර අමාත්‍යාංශය
- ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා - බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය - අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**කාරක සභා වාර්තා**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ප්‍රවේශ පථය (Access Path) ඔස්සේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ වාර්තා බාගත කළ හැකිය.

www.parliament.lk → පාර්ලිමේන්තුවේ කටයුතු → අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා → වාර්තාව පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළ දිනය අනුව තෝරන්න → බාගත කරන්න/ බලන්න

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි 05**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු (මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා (සභාපති)
ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
ගරු මොහමඩ් සාලි නලීම් මහතා
ගරු ලාල් ප්‍රේමනාත් මහතා
ගරු සංජීව රණසිංහ මහතා
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු දිනිඳු සමන් මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
ගරු මුහම්මද් ෆයිසාල් මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු කන්දසාමි ප්‍රභු මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු අරවින්ද සෙනරත් මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1 2020 සහ 2021 වර්ෂ සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා (2025.01.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)**

2020 සහ 2021 වර්ෂ සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා සලකා බැලීම එකී වාර්ෂික වාර්තා අධ්‍යයනයෙන් අනතුරුව ඉදිරි කාරක සභා රැස්වීමක සිදුකරනු ලබන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

සමස්ත රාජ්‍ය සේවය කෙරෙහිම රාජ්‍ය සේවකයා තුළ අතෘප්තිකර ස්වභාවයක් නිර්මාණය වී ඇති බැවින් තෘප්තිමත් රාජ්‍ය සේවකයකු නිර්මාණයෙන් ශක්තිමත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ කඩිනමින් ගැනීම සඳහා අනු කාරක සභාවක් පිහිටුවන ලෙස ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය ගරු පී. රුවන් සෙනරත් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා, ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, ගරු ලාල් ප්‍රේමනාත් මහතා, ගරු දිනිඳු සමන් මහතා, ගරු චන්දන සූරියආරච්චි මහතා, ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය සහ ගරු මුහම්මද් ෆයිසාල් මහතා යන මන්ත්‍රීවරුන්ගේ සාමාජිකත්වයෙන් යුතුව අනු කාරක සභාවක් පිහිටුවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය සේවයේ පවතින විශ්‍රාම වැටුප් ක්‍රමය, සේවක බඳවා ගැනීම් හා පත්වීම් ස්ථිර කිරීම සම්බන්ධ ගැටලු ආදිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමින් තෘප්තිමත් රාජ්‍ය සේවකයකු නිර්මාණයෙන් ගුණාත්මක රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම සඳහා එම අනු කාරක සභාව පිහිටුවන බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3. වෙනත් කරුණු

## 3.1 ගරු චන්දන සූරියආරච්චි මහතා

### 3.1.1 රාජ්‍ය සේවකයන් සඳහා පැවති විශේෂ කාර්ය සාධන ක්‍රමය අත්හිටුවීමට ගත් තීරණය යළි සලකා බැලීම

රාජ්‍ය සේවකයන් සඳහා පැවති විශේෂ කාර්ය සාධන ක්‍රමය 2014 වසරේ සිට අත්හිටුවීමට ගත් තීරණය හේතුවෙන් රාජ්‍ය සේවකයා අපහසුතාවට පත්ව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2013 වසරේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පෙන්වා දුන් සාධකයන් මත සුවිශේෂී කාර්ය සාධන ක්‍රමය සම්බන්ධ නිර්ණායකයන් යළි සලකා බලන තෙක් එම ක්‍රමය ක්‍රියාත්මක වීම අත්හිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයකට එළැඹි බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.1.2 රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් ක්‍රමය

රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත්ව 2016 වසරේ සිට රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වන බවත් එම හේතුව මත රාජ්‍ය සේවය සම්බන්ධයෙන් සේවකයා තුළ අතෘප්තිමත් ස්වභාවයක් නිර්මාණය වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2016 වසරේ සිට නව පත්වීම් සිදුකිරීමේ දී ඒ සඳහා ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප් ක්‍රමයේ සඳහන්ව ඇත්තේ 'රජය විසින් ඉදිරියේ දී හඳුන්වා දෙනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය' යනුවෙන් බවත් ඒ සම්බන්ධයෙන් ද ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීමෙන් ක්‍රියාමාර්ග ගත යුතු බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.1.3 සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින බවත් 2021 වර්ෂයෙන් පසුව සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් බඳවා ගැනීම සඳහා කටයුතු කර නොමැති අතර, මේ වන විට එකී බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කෙසේ වුව ද, අදාළ නිලධාරීන්ට ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී සේවයට එක්කර ගැනීම සඳහා අවම වශයෙන් මාස හයක පමණ කාලයක් ගතවිය හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.1.4 පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග

පළාත් පාලන ආයතනවල මෙතෙක් පැවති ව්‍යාපෘති අත්හිටුවා එකී ව්‍යාපෘති සේවකයන්ගෙන් කොටසක් ස්ථිර කිරීමට කටයුතු කර ඇති බවත් සෙසු ව්‍යාපෘති සේවකයන්ගේ සේවයේ ස්ථිර කිරීම යම් නිර්ණායකයන් සපුරා නොතිබීම මත සිදු නොවී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය ආයතනයන්හි ප්‍රාථමික ශ්‍රේණියට අයත් තනතුරුවලට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන දින 180කට අධික සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයන් සඳහා ස්ථිර පත්වීම් ලබාදීමට කටයුතු කරන ලද බවත් එසේ ස්ථිර පත්වීම් නොලද සේවක පිරිස සම්බන්ධයෙන් විමසා බැලීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

2024 වර්ෂය ඇතුළත අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් පළාත් පාලන ආයතනවල සේවකයන් 8,435ක් සේවයේ ස්ථිර කිරීම සඳහා කටයුතු කර ඇති බවත්, එම 8,435 දෙනාගේ සේවා ස්ථිර කිරීමේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා කාර්යමණ්ඩලය අනුමත කරගන්නා ලෙසට අමාත්‍ය මණ්ඩලය මගින් කොන්දේසියක් පනවන ලද බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම 8,435ක් වූ පිරිස සම්මුඛ පරීක්ෂණයකට ලක් කර පුරප්පාඩු පිරවීම සිදුකළ බවත් 'තනතුරු දරන්නාට පමණක් පෞද්ගලික වන සේ' යන කාණ්ඩය යටතේ සෙසු පිරිසගේ තනතුරු අනුමත කරගන්නා ලෙස එම නියෝගය ලබාදී ඇති බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව, ඉහත සඳහන් කරන ලද 8,435ක පිරිස අතර මෙතෙක් පත්වීම් නොලද පිරිසක් ඇත්නම් තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන සේ එම තනතුරු අනුමත කරවා ගැනීමේ හැකියාව පවතින බව ද අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.1.5 ව්‍යාපෘති සඳහා මතුවන සේවක අවශ්‍යතාව සඳහා විසඳුම් ලබාදීම

පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති සඳහා සේවක අවශ්‍යතා මතු වුවහොත් ඍජු ශ්‍රමය මිලදී ගැනීම සඳහා කටයුතු කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එලෙස ශ්‍රම මිලදී ගැනීම සඳහා සීතාවක ප්‍රාදේශීය සභාව තුළ දැන්වීම් පළකර තිබුණ ද, සේවකයන් ඒ සඳහා ඉදිරිපත් නොවීම මත සේවාවන් බිඳවැටීමේ

තත්ත්වයක් උද්ගත විය හැකි බැවින් එවන් සිදුවීම් නිර්මාණය වීම වැළැක්වීමට පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති අවසන් කර ඇතත්, අදාළ ව්‍යාපෘති නාමයෙන් ආරම්භ කරන ලද කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු බැවින් ඍජු ශ්‍රමය මිලදී ගැනීමට සිදුව ඇතත් ඒ සඳහා සේවකයන් ඉල්ලුම් නොකරන බවත්, ඒ තත්ත්වය වළක්වාලීම සඳහා ලබා දෙන විසඳුම පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තව ද, කිසියම් ව්‍යාපෘතියක් සඳහා බඳවා ගත් සේවකයන්ගේ සේවා කාලය එකී ව්‍යාපෘතිය අවසන් වීම සමඟ අවසන් වන බවත් 25/2014 චක්‍රලේඛයේ බල පැවැත්වීමත් සමඟ එකී සේවකයන් ද ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගැටලු නිර්මාණය වී ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ව්‍යාපෘති සඳහා බඳවා ගන්නා සේවකයින් එකී ව්‍යාපෘති ක්‍රියාත්මක වන තෙත් පමණක් සේවයට යොදා ගන්නා බවත් ඔවුන් සඳහා ස්ථිර පත්වීම් ලබාදීම සිදු නොකිරීම මත මේ වන විට එවැනි ව්‍යාපෘති සඳහා සේවකයන් ඉල්ලුම් නොකරන බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

### 3.1.6 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය තුළ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය තුළ පුරප්පාඩු රැසක් දැනට පවතින බැවින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා - 2024 (සීමිත) තරඟ විභාගයෙන් සමත් වී ඇති අපේක්ෂකයන්ගෙන් එකී පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය තුළ පුරප්පාඩු 5,000කට ආසන්න ප්‍රමාණයක් පවතින බවත්, විවෘත තරග විභාගයෙන් බඳවා ගන්නා අනුපාතය ද සලකා බලා, සීමිත පදනම යටතේ එකී තරග විභාගය සඳහා පෙනී සිට ඉන් සමත් වූ 100 - 115 අතර ලකුණු ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයන්ට අවස්ථාව සලසා දීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.1.7 බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල අර්බුද පාලනයට කටයුතු කිරීම

ගැටලු බහුලව දක්නට ලැබෙන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කොමසාරිස්වරුන් සහ ලේකම්වරුන් කැඳවා දැනට පළාත් පාලන අයතන තුළ දක්නට ඇති අර්බුද වළක්වා ගැනීමට ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදුකිරීම සඳහා අවස්ථාව ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඕනෑම පුද්ගලයකු කාරක සභාව හමුවට කැඳවා ප්‍රශ්න කිරීම සඳහා කාරක සභාවට බලය පවතින බැවින් ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම ක්‍රියාත්මක කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.1.8 අරගල සිදුවීම් සඳහා පළාත් පාලන ආයතන සතු නිල රථ අවභාවිත කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම

2022 වර්ෂයේ මැයි මස 09 වැනි දින පැවැති අරගල සිදුවීම් සඳහා ඇතැම් පළාත් පාලන ආයතනවල බලධාරීන් විසින් පළාත් පාලන ආයතන සතු නිල රථ අවභාවිත කර ඇති බවත් එහිදී එම වාහනවලට හානි වී ඇති බවත් හානිපූර්ණය කිරීමේ දී එම බලධාරීන් විසින් සභා අරමුදල් භාවිත කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවන ලෙසත්, නීති විරෝධී ලෙස කටයුතු සිදු කර ඇත්නම් අදාළ ක්‍රියාකාරකම් හා සම්බන්ධ පිරිස් වෙතින් එකී මුදල් අය කර ගැනීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.1.9 අස්වැසුම සමීක්ෂණ සඳහා භාවිත කරන පරිගණකගත කරන ලද පද්ධතියේ පවතින තාක්ෂණික දෝෂ

අස්වැසුම සමීක්ෂණ සිදු කරන නිලධාරීන් එම සමීක්ෂණ සිදුකිරීමේ දී භාවිත කරන පරිගණකගත කරන ලද පද්ධතියේ තාක්ෂණික දෝෂ හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ පා ඇති බැවින් ඒ සඳහා පියවර ගැනිමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තාක්ෂණික ගැටලුව සඳහා මෙතෙක් විසඳුම් ලැබී නොමැති බවත් ඒ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කර පියවර ගැනීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

## 3.2 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

### 3.2.1 පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශ්‍රේණි සේවකයන් සඳහා පවතින පුරප්පාඩු පිරවීම

පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශ්‍රේණි සේවකයන්ගේ පුරප්පාඩු රැසක් පවතින බවත් විශේෂයෙන්ම සනීපාරක්ෂක සේවා, විදුලි කාර්මික, රියදුරු ආදී සේවා බාණ්ඩ තුළ සේවක හිඟයක් දක්නට ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ හේතුවෙන් එම ආයතනවල කටයුතු යථා පරිදි ඉටු කර ගැනීමට නොහැකි වී ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඇතැම් පළාත් පාලන ආයතනවල රියදුරු සහ සනීපාරක්ෂක සේවා සඳහා බඳවා ගන්නා සේවකයින් පසුව අදාළ රාජකාරිවලින් පරිබාහිර රාජකාරි සඳහා අනුයුක්ත කර ගැනීමක් දක්නට ලැබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඒ අනුව, එවැනි තත්ත්ව සම්බන්ධයෙන් නියාමනයක් සිදුකිරීමට පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පළාත් පාලන ආයතනවල 2013 වර්ෂයේ සිට කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදුව නොතිබූ බවත් කාර්යමණ්ඩලය යාවත්කාලීන විය යුතු බැවින් අමාත්‍යාංශය හරහා සියලුම පළාත් පාලන ආයතනයන්හි කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදු කරමින් පවතින බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම සමාලෝචන වාර්තාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හරහා පමණක් වර්තමානය තුළ සත්‍ය වශයෙන් ම පවතින කාර්යමණ්ඩල අවශ්‍යතාව හඳුනාගැනීමට හැකියාව පවතින බව අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

පළාත් මට්ටමින් කාර්යමණ්ඩල සමාලෝචන වාර්තාව සකස් කර මාර්තු මස 31 වැනි දින වන විට එවීමට කටයුතු කරන ලෙස සියලු පළාත් වෙතට දැනුම් දී ඇති අතර එම වාර්තා ලද පසු අදාළ වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර කාර්යමණ්ඩලය යාවත්කාලීන කර ගැනීමට නියමිත බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.2.2 කුරුණෑගල යන්ත්‍රෝපකරණ දෙපාර්තමේන්තු අංගණයේ ගාල්කර ඇති අබලන් රථවාහන

කුරුණෑගල යන්ත්‍රෝපකරණ දෙපාර්තමේන්තු අංගණයේ විවිධ පළාත් පාලන හා පළාත් සභාවලට අයත් අබලන්ව ගිය වාහන 113ක් ගාල්කර ඇති අතර, ඇතැම් වාහන පිළිසකර කිරීමේ හැකියාව ඇති බවත් නොඑසේ නම් ඒවා වෙන්දේසි කිරීමට කටයුතු කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ පළාත් පාලන සහ පළාත් සභා දැනුවත් කර ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.3 සනීපාරක්ෂක සහායක සහ රියදුරු ආදී තනතුරු සඳහා පවතින සේවක හිඟය - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

මඩකලපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවල සනීපාරක්ෂක සහායක සහ රියදුරු ආදී තනතුරුවල සේවක හිඟයක් දක්නට ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කසල කළමනාකරණය සම්බන්ධ පියවර ක්‍රියාත්මක කිරීමට ද එම සේවක හිඟය හේතුවෙන් ගැටලු මතුව ඇති බවත් නැගෙනහිර පළාත තුළ ද එම ගැටලුව පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.4 ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

### 3.4.1 පළාත් පාලන ආයතන තුළ සේවය කරන සුළු සේවකයින් නියාමනය කිරීම

කම්කරු තනතුර සඳහා බඳවාගත් සේවක පිරිස් පළාත් පාලන ආයතන තුළ වැඩි වශයෙන් දක්නට ලැබුණ ද, එම සුළු සේවකයන් අදාළ රාජකාරි කටයුතුවල නොයෙදෙන තත්ත්වයක් දක්නට ලැබෙන බවත් එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.4.2 ග්‍රාම නිලධාරිවරුන්ගේ හිඟය

ග්‍රාම නිලධාරිවරුන්ගේ හිඟය හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2021.03.31 වැනි දිනට පැවති පුරප්පාඩු ප්‍රමාණයෙන් 1,998ක් ග්‍රාම නිලධාරී තනතුර සඳහා බඳවාගෙන ඇති බවත් තවත් 186ක් පමණ වූ නිලධාරීන් සංඛ්‍යාවක් බඳවා ගැනීම සඳහා අනුමතිය ලැබී ඇති බවත් අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

තවදුරටත් ග්‍රාම නිලධාරි තනතුරු සඳහා පුරප්පාඩු 1,800ක පමණ ප්‍රමාණයක් පවතින බැවින් 2025 වර්ෂයේ අයවැය තුළින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් වන්නේ නම් අදාළ බඳවාගැනීම් සිදුකළ හැකි බවත් අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.5 ග්‍රාම නිලධාරි තනතුරු සඳහා පවත්වන ලද තරග විභාගයෙන් බඳවා ගැනීම් සිදු කරන ආකාරය - ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ග්‍රාම නිලධාරී තනතුරු සඳහා තරග විභාගයක් පවත්වා කොටසක් බඳවා ගැනීම සඳහා කටයුතු කර ඇති බැවින්, එම විභාගයෙන් සමත් ලකුණු මට්ටම් ඇති සෙසු පිරිස ද අදාළ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ග්‍රාම නිලධාරි තනතුර සඳහා තරග විභාගයක් පවත්වා 1,900කට ආසන්න පිරිසක් බඳවා ගැනීම සිදුකළ බවත් වෙනත් රැකියාවල යෙදීම මත මුල් අවස්ථාවේදී ම තනතුර භාර නොගත් පිරිස් ද, වෙනත් රැකියා ලැබීම මත තනතුර හැර ගිය පිරිස් ද සිටීම මත බඳවා ගැනීමට අදහස් කළ සමස්ත ප්‍රමාණය ම බඳවා ගැනීම සිදු නොවූ බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැවත විභාගයක් නොපවත්වා පෙර පැවැත්වූ විභාගයේ මීළඟ කුසලතා මට්ටමෙහි සිටින පිරිස අතුරින් ග්‍රාම නිලධාරී තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පෙබරවාරි මස වන විට කටයුතු කරන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.6 ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

### 3.6.1 බහු කාර්ය සංවර්ධන කාර්ය සහායකයින් සම්බන්ධ ඉදිරි පියවර

බහු කාර්ය සංවර්ධන කාර්ය සහායක තනතුරු සඳහා බඳවාගත් සේවකයන් කොටසක පත්වීම් ස්ථිර කර නොමැති බවත් ඔවුන්ට දීමනා ලබා නොදෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බහු කාර්ය සංවර්ධන කාර්ය සහායකයින්ට අවම වශයෙන් දීමනාවක් හෝ ගෙවීමේ හැකියාවක් පවතී ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ස්ථිර පත්වීම් නොලබා සිටින බහු කාර්ය සංවර්ධන කාර්ය සහායකයන් සඳහා ස්ථිර පත්වීම් ලබාදීමටත්, ස්ථිර පත්වීම් ලබාදීම සඳහා යෝජිත එහෙත් පත්වීම් භාර නොගත් පිරිස සම්බන්ධයෙන් ඉදිරියේ දී ප්‍රතිපත්තිමය තීරණවලට එළැඹීම සඳහා නියමිත බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බහු කාර්ය සහායකයින්ගේ සේවා ස්ථිර කිරීම සම්බන්ධයෙන් සලකා බලමින් පවතින බවත් කළමනාකරණ සහකාර සීමිත සේවා තරග විභාගයෙන් ලකුණු 100 සීමාව ඉක්මවා ලබාගත් අපේක්ෂකයන්ගෙන් බඳවා ගත හැකි උපරිමය

සඳහා පත්වීම් ලබාදීම සම්බන්ධයෙන් ද සලකා බලමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.6.2 රාජ්‍ය ආයතන තුළ දක්නට ඇති තාක්ෂණ නිලධාරින්ගේ හිඟය

රාජ්‍ය ආයතනවල තාක්ෂණ නිලධාරින්ගේ හිඟයක් දක්නට ඇති බැවින්, ඒ සඳහා ඉදිරියේ දී බඳවා ගැනීම් සිදු කරන්නේ ද යන්න පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 3.6.3 සබරගමු පළාත් සභාව තුළ ඇති අලුත්වැඩියා කිරීම්වලින් අනතුරුව භාවිතයට ගත හැකි රථවාහන

සබරගමු පළාත් සභාව තුළ සුළු අලුත්වැඩියා කිරීම්වලින් අනතුරුව භාවිතයට ගත හැකි ආකාරයේ රථවාහන පවතින බැවින්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.6.4 අස්වැසුම සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමේ දී ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා එහි නිලධාරින්ගේ දායකත්වය ලබා ගැනීම

අස්වැසුම සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමේ දී අත්දැකීම් බහුල දැනුමෙන් හෙබි ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා එහි නිලධාරීන්ට මැදිහත්වීමට අවස්ථාවක් සලසා දීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අස්වැසුම සමීක්ෂණ සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ දායකත්වය ලබා දීමට එම නිලධාරින් සූදානම් බව අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා දත්ත ලබාගන්නා ක්‍රමයේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයට දන්වා ඇති බවත් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා සිදුවෙමින් පවතින බවත් අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.7 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

### 3.7.1 කිලිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල නගර සභා ස්ථාපිත කිරීමට කටයුතු කිරීම

උතුරු - නැගෙනහිර පළාත්වලට අයත් කිලිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්ක දැනට ලංකාවේ නගර සභා නොමැති දිස්ත්‍රික්ක 02 බැවින් එම පළාත්වල නගර සංවර්ධන කටයුතු ඇණහිට ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කිලිනොච්චි, මුලතිව් සහ මොණරාගල යන දිස්ත්‍රික්ක සඳහා නගර සභා නොපවතින බවත් නව පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කිරීමේ දී නාගරීකරණය, සේවා වියුක්තිය, ජනගහනය යනාදී සාධක සලකා බලා පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් හරහා තීරණයකට එළඹෙන බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

කිලිනොච්චි නගරය සඳහා නගර සභාවක් පිහිටුවීම සම්බන්ධ නිර්දේශය උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කෙරුණු බවත් කිලිනොච්චි නගරය සඳහා නගර සභාවක් පිහිටුවීමේ දී පළාත් පාලන ආයතන 03කට බණ්ඩනය

කර අදාළ ක්‍රියාවලිය සිදු කළ යුතු බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

කරච්චි මූලික කරගනිමින් නගර සභාව ස්ථාපනය වුවහොත් සෙසු ආයතන ද්විත්වය පවත්වා ගැනීම සඳහා ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණවත් පරිදි පැවතිය යුතු බව අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඒ අනුව, නව පළාත් පාලන ආයතන පිහිටුවීමේ දී එම ආයතනවල පැවැත්ම පිළිබඳ තහවුරුවක් තිබිය යුතු බවත් ඒ හේතුවෙන් උක්ත දිස්ත්‍රික්ක 03 සඳහාම නගර සභා ස්ථාපනය කිරීමේ හැකියාවක් නොතිබූ බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

### 3.7.2 ප්‍රාදේශිය සභා උත්ශ්‍රේණි ගත කිරිම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම

උතුරු - නැගෙනහිර පළාත්වලට අයත් කිලිනොච්චිය, මන්නාරම, යාපනය සහ මුලතිව් යන දිස්ත්‍රික්කවලට අයත් කණ්ඩාවල, මඩු, මරදන්කේනි සහ ඔඩ්ඩුසුඩාන් යන ප්‍රාදේශිය සභාවන් උත්ශ්‍රේණි ගතකිරිම සඳහා අවශ්‍ය ව්‍යාපෘතීන්වල මූලික කටයුතු සියල්ල පසුගිය සමයේ අවසන් කර ඇති බැවින් ඊට අදාළ ගැසට් නිවේදනය නිකුත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.8 ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

### 3.8.1 ග්‍රාම නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාවලිය

ලංකාවේ ග්‍රාම නිලධාරි සේවක සංඛ්‍යාව සඳහා වූ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී දීර්ඝ කාලයක් පොදු ප්‍රතිපත්තියක් අනුගමනය නොකෙරෙන බවත් රටේ පවතින පුරප්පාඩු සියල්ල එකවර සම්පූර්ණ කිරීමේ ක්‍රමයක් අනුගමනය නොකිරීමෙන් ගැටලු පැනනැගී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එනම්, එක් ග්‍රාම නිලධාරිවරයෙක් විසින් කොට්ඨාස 03ක පමණ වැඩ ආවරණය කිරීමට සිදුව ඇති බැවින් නියමිත බඳවාගැනීමේ පටිපාටියක් අනුගමනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.8.2 පළාත් පාලන ආයතනයන්හි පවතින සුළු සේවක ඇබෑර්තු නිසි පරිදි සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම

ප්‍රාදේශිය සභාවක් පාලනය කිරීම සඳහා සභාපති, ලේකම්, ආදායම් නිලධාරී, තාක්ෂණ නිලධාරී ඇතුළු සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුක්ත කාර්යමණ්ඩලයකට හැකියාවක් ඇති නමුත් ඒ සඳහා 20කට වැඩි සුළු සේවකයින් අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය රජය සමයේ සංවර්ධන නිලධාරීන් සහ කළමණාකරන නිලධාරීන් සියයට වැඩි සංඛ්‍යාවකට පත්වීම් ලබා දී ඇති බැවින් පත්වීම් ලබාදීමේ තුලනය වියවුල්ව ඇති බවත් එහි සුළු සේවකයින්ගේ හිඟයක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි වී ඇති බැවින් ඔවුන් අත්තනෝමතිකව ක්‍රියාකරන බවත් මෙම තත්ත්වය නගර සභා සහ මහනගර සභාවල පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පළාත් පාලන ආයතනයන්හි පවතින සුළු සේවකයින්ගේ ඇබෑර්තු නිසි පරිදි සම්පූර්ණ කර එම ආයතනයන්හි පරිපාලනය විධිමත් කිරීම තුළින් වැඩ පහසු කිරීමට අවස්ථාව සැලසෙන බවත් එමඟින් පළාත් පාලන ආයතනවලට "ක්ලීන් ශ්‍රී ලංකා" රජයේ වැඩසටහනට සහයෝගය දැක්විය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම ඉල්ලීම් සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්මික නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධව බඳවා ගැනීම් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බවත් අදාළ වාර්තා ලැබුණු පසු එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පළාත් පාලන ආයතනවලට බඳවා ගැනීම් පළාත් සභා විසින් මූලිකත්වය දරා සිදු කළ යුතු අතර අත්‍යවශ්‍ය තත්ත්වයන් සලකා බලා කාර්යමණ්ඩල බඳවා ගැනීම සිදුකිරීමට පළාත් සභාවලට හැකියාව ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

කාර්යමණ්ඩල සමාලෝචන තුළින් පළාත් පාලන ආයතන නියාමනය වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

නගර සංවර්ධන සැලසුම් යටතේ ඉඩම් කට්ටි කිරීමේ බලතල නාගරික සංවර්ධන අධිකාරිය සතුව ඇති අතර එම ආයතනය මගින් පොල් ඉඩම් කට්ටි කිරීමේ බලපත්‍ර ලබාගන්නා ඉඩම් වෙන්දේසිකරුවන් එම ඉඩම් අත්තනෝමතිකව කට්ටිකර විකිණීම හේතුවෙන් මහා පරිමාණයේ පොල් ඉඩම් විනාශ වන බැවින් නගර සංවර්ධන සැලසුම් යටතේ ඉඩම් කට්ටි කිරීමේ බලතල ප්‍රාදේශීය සභාවට ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.9 ඌන සේවා නියුක්ත උපාධිධාරීන් සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග - ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා

PL – 01, PL – 02 සහ PL - 03 යන සේවා ඛාණ්ඩ, ප්‍රාථමික ශ්‍රේණි සේවා යටතට අයත් බැවින් අදාළ තනතුරුවලට පත්වීම් ලද පසු තම උපාධි සම්පූර්ණ කරන ලද පිරිස් සඳහා ඉදිරියේ දී ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 3.10 කල්පිටිය ප්‍රාදේශීය සභාව තුළ තාක්ෂණික නිලධාරි තනතුරු සඳහා පුරප්පාඩු පැවතීම - ගරු මුහම්මද් ෆයිසාල් මහතා

පුත්තලම ආසනයේ, කල්පිටිය ප්‍රාදේශීය සභාව තුළ තාක්ෂණික නිලධාරි තනතුරු සඳහා පුරප්පාඩු පවතින බවත් ඒ හේතුවෙන් මාර්ග සංවර්ධනය කිරීම් ආදී සංවර්ධන කටයුතු ඇණහිටීමෙන් පාසල් ශිෂ්‍යයන් ඇතුළු මහජනයාට ද, සංචාරක ව්‍යාපාර ආදී ක්ෂේත්‍රයන්ට ද ගැටලු උද්ගතව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.11 පළාත් පාලන ආයතන මෙහෙයවනු ලබන පරිපාලන කමිටු - ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

පළාත් පාලන ආයතන 341ක් අතුරින් ආයතන 340ක පවතිනුයේ කොමසාරිස් සහ ලේකම්වරුන්ගේ පාලනයක් බවත් පරිපාලන කමිටුවක් හරහා පාලන කටයුතු සිදුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පරිපාලන කමිටුවෙහි සංයුතිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සභිකයන් නොමැති තත්ත්වයක් තුළ දී පරිපාලන කමිටුවක් මඟින් පරිපාලනමය කටයුතු සිදුවීම හඳුන්වා දී ඇති බවත් ඊට අමතරව, එම කමිටුව සඳහා නීතිමය රාමුවක් නොමැති බවත් පළාත් සභා හා පළාත් පාලන අංශයේ නීති නිලධාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එක් එක් පළාත් පාලන ආයතන විසින් පළාත් සභාවෙන් ලද උපදෙස් මත එම පරිපාලන කමිටුව පිහිටුවාගෙන ඇති බව පළාත් සභා හා පළාත් පාලන අංශයේ නීති නිලධාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඉහත අදහස් දැක්වීමට අමතරව කරුණු දක්වමින් පරිපාලන කමිටු සඳහා නෛතික බලයක් පවතින බවත් විෂයභාර නිලධාරීන්ගෙන් මෙම පරිපාලන කමිටුව අනිවාර්යෙන් සමන්විත විය යුතු බවත් ස්වදේශ කටයුතු අංශයේ අතිරේක ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ) විසින් දැනුම් දෙන ලදී.

පරිපාලන කමිටු හරහා මෙහෙයවෙන බහුතර පළාත් පාලන ආයතන තුළින් මහජන සේවා නිසියාකාරව සැපයීම සඳහා එම පරිපාලන කමිටුවල ව්‍යුහය විධිමත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවල ව්‍යුහයන් තෙයාකාර බවත් මහ නගර සභාවක් තුළ අභ්‍යන්තර දෙපාර්තමේන්තු පවතින අතර එහි පරිපාලන කමිටු සඳහා අභ්‍යන්තර දෙපාර්තමේන්තු ප්‍රධානියා සහභාගි විය යුතු බවත් අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තාක්ෂණික නිලධාරී, ලේකම් සහ අවස්ථානුකූලව කමිටුව හා සම්බන්ධ වන නිලධාරීන්ගෙන් ප්‍රාදේශීය සභාවක පරිපාලන කමිටුව සංයුක්ත වන බව අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

කෙසේ වුව ද, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි පරිපාලන කමිටුවල ගැටලු පවතින බැවින් පළාත් 09 සඳහාම එකී කමිටුවල ව්‍යුහය සඳහා ඒකීය ක්‍රමයක් යොදා ගන්නා ලෙසට දැනුවත් කරන බව අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) විසින් දැනුම් දෙන ලදී.

තව ද, කොළඹ නගර සභාව ගැටලු රාශියක් පවතින නගර සභාවක් බවත් කොළඹ නගර සභාවෙහි විශාලතම මූල්‍ය වංචා සම්බන්ධයෙන් වෝහාරික විගණනයන් ද්විත්වයක් 2022 වර්ෂයේ පවත්වන ලද බවත් ස්වදේශ කටයුතු අංශයේ අතිරේක ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ) විසින් දැනුම් දෙන ලදී.

අදාළ වාර්තා විගණකාධිපති සතුව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ස්වදේශ කටයුතු අංශයේ

අතිරේක ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ) විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට කටයුතු කරන බවට ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.12 ගරු මොහමඩ් සාලි නලීම් මහතා

### 3.12.1 පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ප්‍රාදේශීය ලේකම්වරයෙකු නොමැති වීම

පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මාස 06 කාලයක් පුරා ප්‍රාදේශීය ලේකම්වරයෙකු නොමැති වීමෙන් ජනතාව ගැටලුවලට මුහුණපාන බැවින් එම ප්‍රාදේශීය සභාවට ප්‍රදේශීය ලේකම්වරයෙකු පත්කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

විමර්ශනවලින් අනතුරුව පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රාදේශීය ලේකම් එම තනතුරින් ඉවත් කර ඇති බවත් එහි රාජකාරී ආවරණය සඳහා වෙනත් ප්‍රාදේශීය ලේකම්වරයකු පත් කර ඇති බවත් අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පවතින දූෂණ වංචා ආදිය සම්බන්ධයෙන් නිරතුරුවම පැමිණිලි වාර්තා වන බැවින් විමර්ශන අංශය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් එහි අතිරේක ලේකම් නිරතුරුව අවධානය යොමු කරන බව අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

### 3.12.2 නිවාස ඉදිකිරීමේ දී මඩකළපුව - එරාවූර් ප්‍රදේශයේ ජනතාව මුහුණදෙන ගැටලු

මඩකළපුව - එරාවූර් ප්‍රදේශයේ වර්ග කිලෝමීටර් 3.5ක ජනතාව 40,000ක් පමණ සහ කාත්තාන්කුඩි ප්‍රදේශයේ වර්ග කිලෝමීටර් 3.5ක ජනතාව 45,000ක් පමණ ජීවත්වන නමුත් එම ප්‍රදේශයේ නිවාස තැනීම සඳහා පර්චස් 06ක් අවශ්‍ය බවට නාගරික සංවර්ධන අධිකාරිය මගින් නීති පනවා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නාගරික සංවර්ධන අධිකාරිය මගින් පනවා ඇති මෙම නීතිය ලිහිල් කර එම ප්‍රදේශයේ පර්චස් 04 සීමාවෙහි  නිවාස තැනීමට අවසර ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.12.3 මඩකලපුව දිස්ත්‍රික්කයේ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට පියවර ගැනීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ දිනකට සාමාන්‍යයෙන් ඝන අපද්‍රව්‍ය ටොන් 450 - 500ක් එකතු වන  අතර මෙම ඝන අපද්‍රව්‍ය නිසි කළමනාකරණයකින් තොරව වලකට දමනු ලබන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම අපද්‍රව්‍ය යන්ත්‍රානුසාරයෙන් ප්‍රතිචක්‍රීකරණය කර ස්වාභාවික පොහොර නිපදවීම කෘෂිකර්මාන්තයටත්, පරිසරයටත් වාසිදායක වන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.12.4 මඩකලපුව ප්‍රදේශයේ ඉඩම් මායිම් නිර්ණය කිරීමේ දී ගැටලුකාරී තත්ත්ව පැන නැඟීම

මඩකලපුව ප්‍රදේශයේ ඉඩම් මායිම් නිර්ණය කිරීමේ ගැටලු උග්‍රව පවතින බවත් එනම් ඉඩම් බලතල එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම්ටත්, ඉඩම්වල පරිපාලනය එරාවූර් ප්‍රාදේශීය ලේකම්ටත් ලබාදීමෙන් එම ප්‍රදේශයේ ජනතාවට පරිපාලනමය සහ ඉඩම් සම්බන්ධ ගැටලු විසඳා ගැනීම සඳහා ආයතන 02කට යැමට සිදුවීමෙන් එම ජනතාව ගැටලුවලට මුහුණපාන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, එම ගැටලු නිසි ලෙස නිරාකරණය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.12.5 එරාවූර් ප්‍රාදේශීය සභාව තුළ පවත්නා වංචා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම

එරාවූර් ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තමා කටයුතු කළ කාලසීමාවේ දී රු. ලක්ෂ 12කට ටෙන්ඩර් කැඳවන ලද ජේ. සී. බී යන්ත්‍රයක් අලුත්වැඩියා කිරීම සඳහා ඉන්පසු පත්වූ සභාපති විසින් රු. ලක්ෂ 38 - 40ක් පමණ වැයකර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එවැනි වංචා සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නිසි දඬුවම් ලබාදිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.12.6 රජයේ නිලධාරීන් පත්කිරීමේ දී සෑම ජාතියකටම අයත් නිලධාරීන් මිශ්‍රව පත්කිරීමට කටයුතු කිරීම

සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව ජීවත්වන ප්‍රදේශවල රාජකාරි කටයුතු සඳහා රජයේ නිලධාරීන් පත්කිරීමේ දී සෑම ජාතියකටම අයත් නිලධාරීන් මිශ්‍රව පත්කිරීමෙන් ජාතීන් අතර අන්‍යෝන්‍ය සබඳතාවක් ගොඩනැගිය හැකි බැවින්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

භාෂා ගැටලුව වළක්වා ගනිමින් ජනතාව වෙත ප්‍රවේශ විය හැකි පරිදි අදාළ භාෂා මාධ්‍යයන්ගෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් බඳවා ගැනීම සිදුකර ඇති බව අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාළ භාෂා මාධ්‍යයන්ගෙන් කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පුරප්පාඩු 34ක් හඳුනාගෙන ඇති බවත් 2016 වර්ෂයෙන් පසු බඳවා ගන්නා ලද නිලධාරීන් එකී පුරප්පාඩු ආවරණය සඳහා යොදවා ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් දැනුම් දී ඇති බවත් අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.13 ගරු අරවින්ද සෙනරත් මහතා

### 3.13.1 ග්‍රාම නිලධාරී සේවා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු

ග්‍රාම නිලධාරීන්ට අදාළ සේවා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ඔවුන් අතර ගැටලුකාරී තත්ත්වයක් මතුව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කමිටුව හරහා සකස් කරන ලද සේවා ව්‍යවස්ථාව වෙනුවට අමාත්‍යාංශය මගින් සැකසූ සේවා ව්‍යවස්ථාවක් පවතින බවට ග්‍රාම නිලධාරීන් විසින් පෙන්වා දෙන බවත් ඒ සඳහා ග්‍රාම නිලධාරීන් අතුරින් විරෝධතාවක් මතුව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ග්‍රාම නිලධාරීන් කැඳවා ඔවුන්ට ඇති වෘත්තීමය ගැටලු පිළිබඳව සාකච්ඡා කර සේවා ව්‍යවස්ථාවෙහි සංශෝධනයක් සිදුකිරීමේ අවස්ථාව පවතින්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ග්‍රාම නිලධාරී සේවා ව්‍යවස්ථාව සම්බන්ධ ගැටලුව දීර්ඝ කාලයක් තිස්සේ පැවැති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඔවුන් මතු කරන ප්‍රධානතම ගැටලුව වන්නේ වැටුප් ක්‍රමය බවත් ඒ සඳහා ග්‍රාම නිලධාරී වෘත්තිය සංගම් සමඟ සාකච්ඡා පැවැත්වුව ද එකඟතාවකට එළැඹීමට නොහැකි වූ බැවින් තවදුරටත් ඒ සම්බන්ධ සාකච්ඡා පැවැත්විය යුතු බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ග්‍රාම නිලධාරීන් සඳහා වන කාර්යාල දීමනා, ලිපි ද්‍රව්‍ය දීමනා, නිල ඇඳුම් දීමනා ආදී දීමනා ඉහළ නැංවීමට කටයුතු කර ඇති බවත් ගමන් වියදම් දීමනාවෙහි ද ඉහළ දැමීමක් සිදුකිරීමට අපේක්ෂිත බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

තව ද, ඉදිරි මාස කිහිපය තුළ ග්‍රාම නිලධාරී සේවා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සතුටුදායක ප්‍රතිපත්තිමය තීරණවලට එළැඹීමට හැකි වනු ඇති බවට ද අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

### 3.13.2 අස්වැසුම සමීක්ෂණ සඳහා දත්ත ලබා ගැනීමට තාක්ෂණික උපකරණ භාවිත කිරීම සඳහා අවස්ථාව ලබාදීම

අස්වැසුම සමීක්ෂණ සඳහා දත්ත ලබා ගැනීමට තාක්ෂණික උපකරණ භාවිත කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ග්‍රාම නිලධාරීන් විසින් ඉල්ලීම් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ග්‍රාම නිලධාරීන් හට අස්වැසුම සමීක්ෂණ සිදුකිරීමට අවශ්‍ය තාක්ෂණික මෙවලම් සම්බන්ධ ගැටලුව සඳහා අමාත්‍යාංශයට මැදිහත්වීමක් සිදු කිරීමට හැකියාව පවතින බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

## 3.14 බහු කාර්ය සංවර්ධන නිලධාරීන් සඳහා නිශ්චිත කාර්යභාරයක් නොමැති වීම - ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

බහු කාර්ය සංවර්ධන නිලධාරීන් සඳහා නිශ්චිත කාර්යභාර්යක් නොමැති බැවින් එම නිලධාරීන්ගෙන් ඵලදායී සේවයක් නොලැබීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම තත්ත්වය දිස්ත්‍රික් කිහිපයක පමණක් වාර්තා වන බවත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුව ඇති බැවින් ඉදිරියේ දී ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ට ඕනෑම පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ඇති ගැටලු කාරක සභාවේ ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කළ හැකි බවත් පසුව කාරක සභාවේ ලේකම් විසින් එය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඒ අනුව ඊට අදාළ පිළිතුරු සෘජුව ගරු මන්ත්‍රීතුමා වෙත

අමාත්‍යාංශය මඟින් යොමු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම සාර්ථක අයුරින් පවත්වා ගැනීමට දායක වූ සියලු දෙනාට ගරු සභාපතිතුමා විසින් ස්තූතිය පළ කරන ලදී.

**4.** කාරක සභාව ප. ව. 12.20ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2025 පෙබරවාරි 14**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු (මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා (සභාපති)
ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය)
ගරු ජේ. සී. අලවතුවල මහතා
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු චමින්ද ලලිත් කුමාර මහතා
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
ගරු නිශාන්ත පෙරේරා මහතා
ගරු ලාල් ප්‍රේමනාත් මහතා
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු දිනිඳු සමන් මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

**1. පනත් කෙටුම්පත් සලකා බැලීම**

**1.1 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත (2025.01. 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)**

2025.01.09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම්වලට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ලැබී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතට අදාළව යම් පැහැදිලි කර ගැනීමක් හෝ අදහස් දැක්වීමක් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

යම් පක්ෂයක් විසින් කිසියම් ඡන්ද කොට්ඨාසයක් ජයග්‍රහණය කිරීමෙන් පසු එම කොට්ඨාසයට පත්වූ අපේක්ෂකයාගේ නාමයෝජනා ප්‍රතික්ෂේප වුවහොත් එම සභික ධූරයේ පුරප්පාඩු වීමකදී එකී පුරප්පාඩුව පිරවීම සඳහා කිසිදු ප්‍රතිපාදනයක් මෙම පනතේ අඩංගුව නොමැති බව ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, කිසියම් පළාත් පාලන ආයතනයක සභිකයකුගේ ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ වෙනත් හේතුවක් මත පුරප්පාඩු වන සභික ධූරය සඳහා දින 30ක කාලයක ඇතුළත නව නාමයෝජනා මැතිවරණ කොමිෂන් සභාවට එවන ලෙස දන්වා ඇති බවත් එසේ සිදු කිරීමට කටයුතු නොකළහොත් එම පුරප්පාඩු පිරවීම සඳහා වෙනත් කිසිදු විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත් ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

තව ද, ස්වාධීන කණ්ඩායමක නායකයකු මියගිය අවස්ථාවක දී ඔහු වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පත් කොට නොමැති අවස්ථාවක දී නායකත්වය හිමිවිය යුත්තේ කාහට ද, ඉන් අනතුරුව සිදුවන පුරප්පාඩු සඳහා නාමයෝජනා ලබා ගත යුත්තේ කිනම් පාර්ශ්වයක වෙතින් ද යන ගැටලුවත් මෙකී පනත තුළ පවතින අඩුපාඩු වශයෙන් සඳහන් කළ හැකි බව ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් කාරක සභාවට වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කිසියම් ස්වාධීන කණ්ඩායමක නායකයකු සම්බන්ධව අධිකරණයක නඩුවක් ගොනුකර ඇති අවස්ථාවක දී එකී පුද්ගලයා වැරදිකරු වී දඬුවම් ලබන්නේ නම් ඔහුගේ සභික ධූරය අහිමි වූ විට තවදුරටත් අදාළ පුද්ගලයාට කණ්ඩායම් නායකත්වය දැරිය හැකි ද යන්න සහ එවැනි අවස්ථාවක දී පුරප්පාඩු වූ සභික ධූරය සඳහා නාමයෝජනා ලබා ගත යුත්තේ කිනම් පාර්ශ්වයක් වෙතින් ද යන්න පිළිබඳව ද කිසිදු සඳහනක් මෙම පනතේ නොමැති බවටත් ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

"කිසියම් පළාත් පාලන ආයතනයක් සඳහා තේරී පත්වන ස්වාධීන කණ්ඩායම් නායකයකුගේ නගරාධිපති ධූරය, සභාපති ධූරය හෝ සභික ධූරය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9 (3)1 වගන්තියේ සඳහන් පරිදි අහිමි වී ඇති අවස්ථාවක එම ධූරයෙන් ඉවත් කරනු ලැබීමේ දින සිට අවුරුදු පහක කාලසීමාවක් දක්වා මෙම ආඥාපනත යටතේ තෝරාපත් කර ගනු ලැබීමට හෝ යම් පළාත් පාලන ආයතනයක අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට සුදුස්සෙකු නොවන්නේය" යනුවෙන් ආඥාපනතේ සඳහන්ව ඇති බව ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සිවිල් අයිතිවාසිකම් අහිමි වූ එවැනි කණ්ඩායම් නායකයකුගේ පුරප්පාඩු සිදුවන සභික ධූරය සඳහා නාමයෝජනා ලබාගත හැකි ද යන්න පිළිබඳව ද, එසේ නොහැකි වන්නේ නම් ස්වාධීන කණ්ඩායම් සඳහා බලයලත් නියෝජිතයකු පත් කර නොමැති අවස්ථාවක ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳව ද සඳහනක් මෙම පනතේ අඩංගුව නොමැති බවට ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, යම් සභිකයකු සභා වාර සඳහා සහභාගී නොවීම යන හේතුව මත අදාළ සභිකයා ඉවත් කර වෙනත් අයකු නම් කිරීමට දැනුම් දෙන අවස්ථාවක දී ඇතැම් පක්ෂ විසින් එකී පුද්ගලයාම නැවතත් පත් කිරීමට කටයුතු කරන බවත් එය වැළැක්වීම සඳහා ද ක්‍රියාමාර්ග ගත යුතු බවත් ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එකී කරුණු පනතට සංශෝධන වශයෙන් ඉදිරියේ දී ඇතුළත් කිරීමට ඇති හැකියාව පිළිබඳව ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් විමසීමක් කරන ලදී.

ඉදිරි මැතිවරණය පැවැත්වීමේ කාර්ය සඳහා පමණක් නිශ්චය කොට මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කොට ඇති බව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු නීතිඥ සුනිල් වටගල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2023 වර්ෂයේ දී පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් කල්දැමීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ SC/FR 69, SC/FR 79, SC/FR 90 සහ SC/FR 139 යනුවෙන් පෙත්සම් 04ක් ගොනුකොට ඇති බව ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එකී පෙත්සම් විභාග කිරීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හැකි ඉක්මනින් අදාළ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ක්‍රියාත්මක කරන ලෙසට තීන්දුව ලබා දී ඇති බවත් ඒ අනුව එම විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇති බවත් ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පළාත් පාලන ආයතන මැතිවරණය පැවැත්වීම සඳහා මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත මඟින් බාධාවක් පවතීද යන්න පිළිබඳව ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් විමසීමක් කරන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත යනු ඡන්ද විමසීම් කැඳවනු ලැබ සහ කල්තබා ඇති ඇතැම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද පටන් කෙටුම්පතක් බවත් යම් සංශෝධනයක් සිදුකිරීමට අවශ්‍ය නම් එකී සංශෝධන මුල් ආඥාපනතට සිදුකළ යුතු බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුරේකා අහමඩ් මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මුල් ආඥාපනතට විය යුතු සංශෝධන ද මීට සමාන්තරව සිදුකිරීමට හැකියාව පවතී නම් එය ඉදිරි මැතිවරණ පැවැත්වීම සඳහා පහසුවක් වනු ඇති බව ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2023 වර්ෂයේ දී අදාළ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම නොපැවැත්වීම හේතුවෙන් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදු වී ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කොට ඇති බැවින් අදාළ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම කඩිනමින් පැවැත්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, සලකා බලන ලද පනත් කෙටුම්පත විශේෂ විධිවිධාන පනත් කෙටුම්පතක් වීම හේතු කොටගෙන එම සංශෝධන මෙම අවස්ථාවේ දී සලකා බැලිය නොහැකි බවත් ඉදිරි අවස්ථාවක දී අදාළ සංශෝධන සලකා බැලීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පළාත් පාලන මැතිවරණයට අපේක්ෂකයන් ලෙස නාමයෝජනා භාර දුන් රාජ්‍ය සේවකයින් සම්බන්ධයෙන් මතුවූ ගැටලුවලට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් විමසීමක් කරන ලදී.

පළාත් පාලන මැතිවරණයට අපේක්ෂකයන් ලෙස නාමයෝජනා භාර දුන් රාජ්‍ය සේවකයින්ට තමන් තරඟ කරන දිස්ත්‍රික්කය හැර ළඟම ඇති පළාත් පාලන කොට්ඨාසය තුළ රැකියාවල නිරත වීමට අවස්ථාව ලබාදී ඇති බවට අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ රජයේ නිලධාරීන්ගේ වැටුප් සම්බන්ධව තිබූ ගැටලුව ද නිරාකරණය කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එලෙස පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකයන් ලෙස නාමයෝජනා භාර දුන් කිසියම් හෝ රාජ්‍ය සේවකයෙකුට මේ වන විටත් යම් ගැටලුවක් තිබේ නම් ඒ සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකසන ලෙස ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

එලෙස අභියාචනා ඉදිරිපත් වුවහොත් ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට හැකි බවත් කිසියම් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අවශ්‍ය නම් ඊට අදාළව කටයුතු සිදු කළ හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත පනත් කෙටුම්පතට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 2. වාර්ෂික වාර්තා සලකා බැලීම

### 2.1 2020 සහ 2021 වර්ෂ සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා (2025.01.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ඒ. එච්. එම්. එච්. අබයරත්න මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 3. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ පළමුවැනි රැස්වීමේදී ස්ථාපිත කරන ලද අනු කාරක සභාව කඩිනමින් රැස්ව රාජ්‍ය සේවයේ පවතින ගැටලු සඳහා විසඳුම්

සෙවීමට කටයුතු කළ යුතු බවට ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4. වෙනත් කරුණු**

**4.1 රක්වාන ප්‍රදේශයට නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක අවශ්‍යතාව - පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායක, ගරු සජිත් ප්‍රේමදාස මහතා**

රක්වාන ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක අවශ්‍යතාව පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එවැනි ඉල්ලීම් රාශියක් විවිධ ප්‍රදේශවලින් ලැබී ඇති බවත් ඊට අදාළ මූලික නිරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.2 දිස්ත්‍රික් ලේකම්වරුන් කිහිප දෙනෙකු අදාළ තනතුරුවලින් ඉවත් කිරීමට කටයුතු කිරීම - ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**

රාජ්‍ය පරිපාලන සේවයට අයත් දිස්ත්‍රික් ලේකම්වරුන් කිහිප දෙනෙකු අදාළ තනතුරුවලින් ඉවත් කිරීමට කටයුතු කර තිබීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ආසන්න වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් තිදෙනකුගේ පමණ ස්ථාන මාරුවීම් සිදුකිරීමට කටයුතු කළ බවත් ඔවුන්ව සංචිතයේම රඳවා තැබීමට කටයුතු නොකළ බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, ඔවුන් විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් වූ බැවින් අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීමේ දී දෙදෙනෙකු විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා ද සෙසු නිලධාරියා අතිරේක ලේකම් තනතුරකට ද මාරු කිරීම් සිදුකර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**4.3 ගරු චන්දන සූරියආරච්චි මහතා**

**4.3.1 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා සීමිත තරඟ විභාගය සඳහා පෙනී සිටි රාජ්‍ය සේවකයින්ට පත්වීම් ලබා දීම**

PL වැටුප් කාණ්ඩයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා සීමිත තරඟ විභාගය සඳහා පෙනී සිට ඉන් අවම වශයෙන් ලකුණු 100ක් හෝ ලබාගත් රාජ්‍ය සේවකයින්ට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට ඇතුළත් වීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම වසරේ මාර්තු මස මුල කළමනාකරණ සහකාර සේවාවේ තනතුරු සඳහා නව කණ්ඩායමක් පත්වීම් භාරගැනීමට නියමිත බවත් අදාළ කණ්ඩායම අතරින් පත්වීම් භාර නොගත් පිරිස සහ පත්වීම් සඳහා සුදුසුකම් සපුරා නොමැති සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඇතිවන පුරප්පාඩු මත පෙර පැවැති විභාගයෙන් නව කණ්ඩායමක් බඳවා ගැනීම සම්බන්ධයෙන් තීරණය වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සීමිත තරඟ විභාගයෙන් ලකුණු 100 සීමාව පසු කරන ලද 2,500කට ආසන්න පිරිසක් සිටින නමුත් ඉන් මුල් වටයේ පත්වීම සඳහා 680කට ආසන්න පිරිසක් සුදුසුකම් ලබා ඇති බවත් ලකුණු 100 සීමාව පසු කරන ලද එහෙත් පත්වීම්

නොලද අපේක්ෂකයින් 1,885ක පමණ පිරිසක් සිටින බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා සීමිත තරඟ විභාගය පවත්වා එයින් බඳවාගැනීමට නියමිත වූ තනතුරු සංඛ්‍යාව, බඳවා ගත් ප්‍රමාණය, මුල් අවස්ථාවේදීම තනතුර භාර නොගත් සංඛ්‍යාව, මූලික පුහුණුවෙන් පසු තනතුර අතහැර ගිය සංඛ්‍යාව සහ එකී තත්ත්ව මත ඇති වූ නව පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධයෙන් සංඛ්‍යාමය වශයෙන් දත්ත ලබාදීමට කටයුතු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා තනතුර සඳහා පවතින පුරප්පාඩුවලින් සීමිත පදනම යටතේ 30%ක වූ පුරප්පාඩු සංඛ්‍යාවක් සම්පූර්ණ කිරීම සඳහා තනතුරු 692ක ප්‍රමාණයකට අදාළ පත්වීම් භාරදීමෙන් පසුව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත ගැටලුව සම්බන්ධයෙන් නිශ්චිත සංඛ්‍යාත්මක අගයක් ලබාදීමට හැකියාව ලැබෙන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා තනතුරු සඳහා පවතින පුරප්පාඩුවලට විවෘත පදනම යටතේ බඳවා ගැනීමේ දී දැඩි තරඟකාරී විභාගයකින් අනතුරුව ඉහළ ලකුණු සීමාවන් මත බඳවා ගැනීම සිදුකරන බැවින් සීමිත පදනම යටතේ අදාළ තනතුරුවල පුරප්පාඩු පිරවීමට ලැබෙන මෙවන් ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී පවතින බඳවා ගැනීමේ පටිපාටි උල්ලංඝණය නොවන ආකාරයෙන් කටයුතු කළ යුතු බව අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.3.2 ග්‍රාම නිලධාරී විභාගය සඳහා පෙනී සිට සාධනීය ලකුණු මට්ටම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ට පත්වීම් ලබා දීම

ග්‍රාම නිලධාරී විභාගය සඳහා පෙනී සිට සාධනීය ලකුණු මට්ටම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන් අතරින් ග්‍රාම නිලධාරී තනතුරෙහි සෙසු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ග්‍රාම නිලධාරී විභාගයේ සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබ පත්වීම් භාර නොගත් සහ පත්වීම් භාර ගෙන එහි පුහුණුව කාලසීමාවෙන් පසු තනතුර අතහැර ගිය 200 ඉක්මවූ පිරිසක් සිටින බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමඟින් ඇති වූ පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා පැවති විභාගයේ ප්‍රතිඵල මත පත්වීම් ලබා දීමට කටයුතු කරමින් පවතින බව අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පැවති විභාගයේ ප්‍රතිඵල මත තවත් කණ්ඩායමක් ග්‍රාම නිලධාරී තනතුර සඳහා බඳවා ගන්නේ නම් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කොට මතු අවස්ථාවන්වල දී ගැටලු ඇති නොවන ආකාරයෙන් කටයුතු සිදුකළ යුතු බව අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.3.3 වෙනත් ආයතනයක සේවය සඳහා මුදා හරින ලද නිලධාරීන් තම පැමිණීම සහ පිටවීම සටහන් කළ යුතු ආකාරය

එක් ආයතනයක සේවය කරන නිලධාරියකු අමාත්‍ය කාර්යමණ්ඩල සඳහා මුදා හැරීමේ දී අදාළ නිලධාරියා තම පැමිණීම සහ පිටවීම එකී කාර්යාලයේ

පැමිණීම හා පිටවීම සටහන් කරන ආකාරයට සටන් කිරීමේ අවශ්‍යතාවයක් පවතී ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඕනෑම ආයතනයක පැමිණීම සහ පිටවීම අදාළ ආයතනයෙහි පවතින කිසියම් හෝ ක්‍රමයකට අනුකූලව සිදු කිරීම අදාළ නිලධාරියාට සහ ආයතනයට පහසුවක් බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.3.4 බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන තුළ සිටින සේවා ස්ථිර නොවූ සේවකයන් සම්බන්ධයෙන් පියවර ගැනීම

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන තුළ සේවා ස්ථිර නොවූ සේවකයන් විශාල පිරිසක් සිටින බැවින් ඒ සම්බන්ධයෙන් ගතහැකි පියවර සම්බන්ධයෙන් ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අදාළ ගැටලු සඳහා විසඳුම් ලබා දීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.4 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

### 4.4.1 ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම සඳහා නැවත තරඟ විභාගයක් පැවැත්වීමෙන් අපේක්ෂකයින් මුහුණ දෙන ගැටලුව

ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම සඳහා නැවත තරඟ විභාගයක් පැවැත්වුවහොත් පෙර විභාගයේ ප්‍රතිඵල මත සමත් ලකුණු මට්ටමට නොපැමිණීම හේතුවෙන් නැවත විභාගයට මුහුණ දීමට අපේක්ෂිත පිරිසගේ වයස් සීමාවල් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පැන නගින බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.4.2 පළාත් පාලන ආයතනවල පවතින ප්‍රාථමික ශ්‍රේණි සේවකයන්ගේ පුරප්පාඩු

පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශ්‍රේණි සේවකයන්ගේ පුරප්පාඩු රැසක් පවතින බවත් ඒ හේතුවෙන් එම ආයතනවල කටයුතු යථා පරිදි ඉටු කර ගැනීමට නොහැකි වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, බඳවා ගැනීමේ පටිපාටිය අනුව යම් තනතුරක් සඳහා බඳවා ගත් ප්‍රාථමික ශ්‍රේණි සේවකයන් එකී තනතුරින් පරිබාහිර රාජකාරී සඳහා යොදවා ගෙන ඇති තත්ත්වයක් වාර්තා වන බවත් ඒ හේතුවෙන් එම ආයතනවල අභ්‍යන්තර ගැටලු රැසක් මතු වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

විධිමත් ක්‍රමවේදයක් අනුව අදාළ පුරප්පාඩු පිරවීමට මේ වන විට කටයුතු සිදුකරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.5 ඇතැම් ග්‍රාම නිලධාරීන් විසින් දේශපාලනික අරමුණු මත සිදුකරන ක්‍රියා විමර්ශනයට කටයුතු කිරීම - ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

කඩුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලඹේ - උතුර ග්‍රාම නිලධාරී වසමේ, ග්‍රාම නිලධාරී තනතුරෙහි රාජකාරියෙහි නියුතු ග්‍රාම නිලධාරී විසින් ඇතැම් අවස්ථාවල දී දේශපාලනික අරමුණු පෙරදැරිව කටයුතු කරන බවට වාර්තා වන බැවින් එවැනි නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයකට එළැඹෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ග්‍රාම නිලධාරීන් යනු දේශපාලන අයිතිවාසිකම් නොමැති රාජ්‍ය නිලධාරීන් කොටසක් වන බැවින් අදාළ ග්‍රාම නිලධාරීවරයා විසින් දේශපාලනික අදහස් ප්‍රකාශ කිරීමට කටයුතු කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.6 අඩු කුලී නිවාසවල පදිංචිකරුවන්ට සින්නක්කර ඔප්පු ලබාදීමේ දී පැන නැඟ ඇති ගැටලුකාරී තත්ත්වය - ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

වර්ෂ 1980 ගණන්වල දී පමණ එවකට පැවැති රජය විසින් අඩු කුලී නිවාස යනුවෙන් කුලී නිවාස ලබාදී ඇති බවත් එකී නිවාසවල පදිංචිකරුවන්ට සින්නක්කර ඔප්පු ලබාදීමේ දී පැන නැඟ ඇති ගැටලුකාරී තත්ත්වය සම්බන්ධයෙන් විසඳුමක් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**4.7 ග්‍රාම නිලධාරීවරුන් විසින් අස්වැසුම සමීක්ෂණ සිදුකිරීමෙන් ඉවත්ව සිටීම සම්බන්ධයෙන් ගත් තීරණය - ගරු නිශාන්ත පෙරේරා මහතා**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයක් හේතුවෙන් අස්වැසුම සමීක්ෂණ සිදුකිරීම සඳහා තම දායකත්වය ලබා නොදීමේ තීරණයකට ග්‍රාම නිලධාරීවරුන් එළැඹී සිටින බැවින් ඒ සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එකී චක්‍රලේඛය සංශෝධනය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.8 සංවර්ධන නිලධාරී සේවය සඳහා බඳවා ගන්නා ලද ඇතැම් නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීමේ දී මතු වූ ගැටලුව - ගරු ටී. කේ. ජයසුන්දර මහතා**

සංවර්ධන නිලධාරී සේවය සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා පරිවාස කාලය අවසන් වීමට පෙර අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතු බවත් එසේ අදාළ විභාගය සමත්වීමට නොහැකි වූ නිලධාරීන්ගේ සේවා ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගැටලු මතුවී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, ඔවුන්ට නැවත අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉදිරියේ දී පෙනී සිටීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කාර්යමණ්ඩලවලට මුදාහැරීම සම්බන්ධයෙන් මෙම ගැටලුව මතු වී ඇති බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා රීතිවල යම් මුදාහැරීමක් සිදුකිරීමට අවශ්‍ය නම් සේවය ස්ථිර වී සිටීම අවශ්‍ය බවට සඳහන්ව ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.9 මඩබාවිට කොට්ඨාසයේ සීමා නිර්ණය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලුව - ගරු චමින්ද ලලිත් කුමාර මහතා**

ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩබාවිට නම් කොට්ඨාසය තුළට වෙනත් කොට්ඨාසයක ගමක් ඇතුළත් වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සීමා නිර්ණය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී

**5.** කාරක සභාව ප. ව. 03.00ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි 20**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා (සභාපති)
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
ගරු එරංග ගුණසේකර මහතා
ගරු වසන්ත පියතිස්ස මහතා
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු එරංග වීරරත්න මහතා
ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති)
ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
ගරු බී.ආරියවංශ මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු ගයාන් ජනක මහතා

ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු මොහමඩ් සාලි නලීම් මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු විජේසිරි බස්නායක මහතා
ගරු සුරංග රත්නායක මහතා
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

## 1. වෙනත් කරුණු

### 1.1 ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා

#### 1.1.1 වසා දමා ඇති මාර්ග යළි විවෘත කිරීම

උතුරු සහ නැගෙනහිර පළාත්වල 2009 සිට හමුදාව සතුව පැවැති මුළු ඉඩම් අක්කර 23,000ක ප්‍රමාණයෙන් වරින් වර ඉඩම් නිදහස් කිරීමෙන් පසු ඉඩම් අක්කර 2,624ක ප්‍රමාණයක් ඉතිරිව පවතින බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැනට නිදහස් කර නොමැති පලාලි - වසාවිලාන් පාර විවෘත කරදෙන ලෙස එම ප්‍රදේශයේ ජනතාව විසින් ඉල්ලීම් කරන බැවින් මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන තෙක් වසා දමා තිබූ මාර්ග ගරු ජනාධිපතිතුමා විසින් 2024 වර්ෂයේ දී ගමනාගමනයට නැවත විවෘත කළ බව ද ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව හමුදා කඳවුරක් ආශ්‍රිතව පවතින තවත් කිලෝමීටර් 2.4ක දුර ප්‍රමාණයකින් යුත් මාර්ගයක් ගමනාගමනයට විවෘත කර දෙන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම මාර්ගය සම්බන්ධව මේ වන විට අවධානය යොමු කර ඇති බැවින් මෙම මාර්ගය සම්බන්ධව නැවත තක්සේරු කිරීම සඳහා යුද්ධ හමුදාධිපතිතුමා වෙත භාර දී ඇති බවත් යුද්ධ හමුදාධිපතිතුමා විසින් ලබා දෙන වාර්තාව අනුව ඉදිරියේ දී මේ සම්බන්ධව තීරණයක් ගැනීමට හැකිවනු ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.1.2 වගා බිම් ලෙස නිදහස් කර ඇති ඉඩම්වල පදිංචි වීම

2024 වර්ෂයේ වගාබිම් ලෙස නිදහස් කරන ලද ඉඩම් අක්කර 234න් ඉඩම් හිමි වූ වගාකරුවන් බොහොමයක් යුද සමයේ දී පදිංචිය අත්හැර වෙනත් දුර බැහැර ප්‍රදේශවල පදිංචි වූ ජනතාව වන බැවින් නැවත ඔවුන්ට මෙම වගා ඉඩම් හිමිවීමත් සමඟ එම වගා බිම්වල වගා කටයුතු කිරීම සඳහා නිවාස සාදා පදිංචි වීමට අවසර ඉල්ලා සිටින බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වගා බිම් ලෙස නිදහස් කරන ලද ඉඩම්වල ජනතාව වගා කටයුතු සිදු කරන්නේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

ඇතැම් ගොවීන් එම ඉඩම්වල වගා කටයුතු සිදු කරන නමුත් බොහෝ ගොවීන් මෙම වගා බිම් පිහිටි ප්‍රදේශවලින් ඉතා දුර බැහැරව ජීවත් වීම හේතුවෙන් වගා කටයුතු සිදු කිරීම අපහසු බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම වගා බිම්වල නිවාස සාදාගෙන පදිංචි වීමට අවසර ලබාදීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

කඩිනමින් නිදහස් කරන ඉඩම්, වගා බිම් සඳහා නිදහස් කරන ඉඩම්, මාස 06ක් තුළ නිදහස් කරන ඉඩම් සහ වසරක් තුළ නිදහස් කරන ඉඩම් හඳුනාගෙන ඒ සම්බන්ධව වාර්තාවක් ලබාගෙන ඇති බවත් වගාබිම් ලෙස නිදහස් කරන ලද ඉඩම් අක්කර 234 පිහිටා ඇත්තේ පලාලි අධි ආරක්ෂිත කලාපය තුළ වන බැවින් තාවකාලික බෝග (Seasonal Crops) වගා කිරීම නිර්දේශ කරන බව වාර්තාවෙහි දක්වා ඇති බවත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙය අඛණ්ඩව සිදුකරන ක්‍රියාවලියක් වන බවත් නිදහස් කළ හැකි ඉඩම්, වගා බිම් සඳහා ලබාදිය හැකි ඉඩම් සහ පදිංචි වීමට ලබාදිය හැකි ඉඩම් සම්බන්ධව මේ වන විටත් සලකා බලමින් තිබෙන බවත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.1.3 හමුදාව සතු ඉඩම් ජනතාව වෙත ලබාදීම

මුලතිවු දිස්ත්‍රික්කයේ කෙප්පාපිලාවු ගම්මානයේ ඉඩම් අක්කර 59.5ක භූමි ප්‍රදේශයක දිස්ත්‍රික් හමුදා මූලස්ථානයක් පවත්වාගෙන ගිය බවත් මේ වන විට එම මූලස්ථානය එම ස්ථානයෙන් ඉවත් කරගෙන තිබෙන නමුත් යුද්ධ හමුදා ආපනශාලාවක් පමණක් පවත්වාගෙන යන බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම ඉඩම ද නිදහස් කර ජනතාව වෙත ලබාදීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ත්‍රිවිධ හමුදාවට අයත් ඉඩම් ප්‍රමාණ සම්බන්ධව නැවත තක්සේරු කර ඒ සම්බන්ධ වාර්තා මෙම මස අවසානය වන විට ආරක්ෂක අමාත්‍යාංශයට ලබා දෙන ලෙස ත්‍රිවිධ හමුදාවට දැනුම් දී ඇති බවත් එම වාර්තා ලැබුණු පසුව නිදහස් කළ හැකි ඉඩම් පිළිබඳව සලකා බලන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දිවයින පුරා ත්‍රිවිධ හමුදාවට අයත් ඉඩම් සම්බන්ධව නැවත විගණනයක් සිදුකර මේ සම්බන්ධව තීරණයක් ගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

නිශ්චිත ස්ථානය හා ගැටලුව සම්බන්ධව නිවැරදි දත්ත ලබා දෙන්නේ නම් මේ සම්බන්ධව පරීක්ෂා කිරීමට හැකි බව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මුලතිව් දිස්ත්‍රික්කයේ කෙප්පාපිලාවු ප්‍රදේශයේ යුද්ධ හමුදා ආරක්ෂක සේනා මූලස්ථානයක් පවත්වාගෙන ගිය බවත් මේ වන විට එම ස්ථානයේ 59 වැනි සේනාංකය (59 Division) ස්ථාපිත කර ඇති බවත් යුද්ධ හමුදාධිපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීට පෙර 59 වැනි සේනාංකය (59 Division) ස්ථාපිත කර තිබුණේ යුද්ධ හමුදා ආරක්ෂක සේනා මූලස්ථානයට (මුලතිව්) යාබදව බව ද යුද්ධ හමුදාධිපති විසින් දැනුම් දෙන ලදී.

මුලතිව් යුද්ධ හමුදා ආරක්ෂක සේනා මූලස්ථානය පිහිටි ඉඩම නිදහස් කර නොමැති බවත් එහි පවතින ගොඩනැගිලි යම් ආයතනයකට භාරදිය යුතු බවත් යුද්ධ හමුදාධිපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ගොඩනැගිලි ආරක්ෂා කිරීම සඳහා නිලධාරීන් කිහිපදෙනෙකු එම ස්ථානයේ සේවය සඳහා යොදවා ඇති බවත් මුලතිව් යුද්ධ හමුදා ආරක්ෂක සේනා මූලස්ථානයේ සේවය කළ නිලධාරීන් සහ භාණ්ඩ සියල්ල එම ස්ථානයෙන් ඉවත් කර ඇති බවත් යුද්ධ හමුදාධිපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එම ගොඩනැගිලි දිස්ත්‍රික් ලේකම් වෙත භාරදීමට නියමිත බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා විසින් ද අදහස් දක්වන ලදී.

### 1.1.4 මයිලෙට්ටි වරායේ ධීවර බෝට්ටු නැවැත්වීමට අවසර ලබා දීම

මයිලෙට්ටි ධීවර වරාය තුළ ඉන්දියානු ධීවර යාත්‍රා 100කට වැඩි ප්‍රමාණයක් නවතා ඇති බැවින් මෙරට ධීවර යාත්‍රා මීට පෙර නවතා තිබුණේ කරෛනගර් ජැටියේ බවත් මේ වන විට එහි හමුදාව රැඳී සිටින බවත් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ හේතුවෙන් මෙරට ධීවර යාත්‍රා කරෛනගර් ජැටියට රැගෙන ඒමට ඉඩ ලබා නොදෙන බැවින් මේ සඳහා අවසර ලබාදෙන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉන්දියානු ධීවරයින්ට අයත් ධීවර යාත්‍රා සැලකිය යුතු සංඛ්‍යාවක් නැවත ඉන්දියාවට රැගෙන යාම සඳහා නිදහස් කර ඇති නමුත් ඇතැම් යාත්‍රා නැවත ඉන්දියාවට රැගෙන ගොස් නොමැති බැවින් මෙහි ඉඩකඩ ගැටලුවක් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව සිදුකළ අධ්‍යයනයෙන් අනතුරුව සකස් කළ වාර්තාව අනුව එම ඉන්දියානු ධීවර යාත්‍රා අතරින් නිදහස් කළ යාත්‍රා කිහිපයක්, පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින යාත්‍රා කිහිපයක් සහ නිදහස් කළ ද ගෙන යාමට නොහැකි තත්ත්වයේ පවතින යාත්‍රා කිහිපයක් තිබෙන බැවින් පවතින සංකීර්ණ තත්ත්වය මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධව නාවික හමුදාවේ නිර්දේශය ඉදිරිපත් කළ බවත් මේ සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළ බවත් නාවික හමුදාධිපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉන්දියානු ධීවරයන් විසින් මෙම තහනම් ධීවර කටයුතුවල නිරතවීම නොනවත්වා සිදු කරන බැවින් අත්අඩංගුවට ගැනීම් කටයුතු ද නොකඩවා සිදුවන බවත් 2025.02.19 වැනි දින ද තවත් ඉන්දියානු යාත්‍රා 03ක් අත්අඩංගුවට ගත් බවත් නාවික හමුදාධිපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව පිළිබඳ වාර්තාවක් ආරක්ෂක අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කර ඇති බවත් මෙම ඉන්දියානු ධීවර යාත්‍රා මේ වන විටත් අධිකරණ අමාත්‍යාංශය සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සතුව පවතින බවත් නාවික හමුදාධිපති විසින් දැනුම් දෙන ලදී.

2021 - 2025 කාලය තුළ අත්අඩංගුවට ගත් මුළු ඉන්දියානු ධීවර යාත්‍රා 167ක් අධිකරණය භාරයේ පවතින බවත් ඒ අතර රාජසන්තක කරන ලද යාත්‍රා 88ක්,

නීතිමය කටයුතු සිදුවෙමින් පවතින යාත්‍රා 66ක් සහ නිදහස් කරන ලද නමුත් නැවත රැගෙන ගොස් නොමැති යාත්‍රා 16ක් පවතින බවත් නාවික හමුදාධිපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙරට ධීවර ජනතාවගේ කටයුතු සඳහා මයිලෙට්ටි ධීවර වරාය නිදහස් කිරීමට මේ වන විට එහි නවතා ඇති ඉන්දියානු ධීවර යාත්‍රා වෙනත් ස්ථානයකට රැගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සහ මෙම ඉන්දියානු ධීවර යාත්‍රා මයිලෙට්ටි ධීවර වරායේම නවතා තැබිය යුතු බවට වන නියෝගයක් පවතී ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

අධිකරණ තීන්දුවට අනුව මෙම ඉන්දියානු ධීවර යාත්‍රා මෙම ධීවර වරායේ නවතා තැබිය යුතු බව නාවික හමුදාධිපති විසින් දැනුම් දෙන ලදී.

අධිකරණ තීන්දුවට අනුව මෙම ඉන්දියානු ධීවර යාත්‍රා මෙම ධීවර වරායේ නවතා තැබිය යුතුය යනුවෙන් අදහස් කරනු ලබන්නේ අධිකරණයට අවශ්‍ය වූ විට එය අධිකරණය භාරයේ තිබිය යුතුය සහ එම ස්ථානය ආරක්ෂිත වීම වන බවත් අධිකරණය සමඟ සාකච්ඡා කර වෙනත් ස්ථානයක් සොයාගැනීම සුදුසු බවත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජසන්තක කර ඇති දේපළ මෙරට ජනතාවට හෝ බෙදා දීමට හැකි බව ද ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

මෙරට භාරයේ ඇති ඉන්දියානු ධීවර යාත්‍රාවල සංඛ්‍යාත්මක දත්ත පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

## 1.2 ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

### 1.2.1 නැගෙනහිර පළාතේ ඉඩම් නිදහස් කිරීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ කායන්කනි ප්‍රදේශයේ පාසල පිහිටි ස්ථානය අසල යුද්ධ හමුදාව විසින් නිවාඩු නිකේතනයක් ඉදිකර ඇති බවත් මේ සම්බන්ධව විමසීමේ දී එම නිවාඩු නිකේතනය ඉවත් කරගත නොහැකි බව යුද්ධ හමුදාව විසින් දැනුම් දුන් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මඩකලපුව දිස්ත්‍රික්කයේ මොරකොට්ටාන්චේනයි ප්‍රදේශයේ පාසල, පාලයියඩිවට්ටෙයි ප්‍රදේශයේ පිහිටි වෙළෙඳපොළ, කුරුක්කල්මඩම් ප්‍රදේශයේ පිහිටි පාසල මේ වන විටත් හමුදාව භාරයේ පවතින බවත් තාණ්ඩිඅඩි විශේෂ කාර්ය බළකා කඳවුර සුසාන භූමියක ද, කලවංචිකුඩි පොලිස් ස්ථානය පෞද්ගලික ඉඩමක ද, ස්ථාපිත කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නාවික හමුදාව විසින් වාකරේ ප්‍රදේශයේ අත්පත් කරගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණ ද යන්න සහ ඉන් භාවිත කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණ ද යන්න පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැති බවත් වාකරේ ප්‍රදේශයේ බොහෝ ඉඩම් නාවික හමුදාව සතුවන බැවින් එම ඉඩම් ද නිදහස් කරගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ඉඩම් සම්බන්ධ කටයුතු පිළිබඳව විස්තරාත්මකව සලකා බැලිය යුතු බැවින් මීට අදාළව කමිටුවක් පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ආලයඩිවෙම්බු ප්‍රදේශයේ වී අලෙවි මණ්ඩලය ද යුද්ධ හමුදා කඳවුර තුළ පවතින අතර හමුදා කඳවුරු තුළ පවතින ඇතැම් පාසල් වෙනුවට ආදේශක පාසල් ඉදිකර ඇති නමුත් ඒවා ගමෙන් පිටත පිහිටා ඇති බවත් මෙවැනි තවත් බොහෝ ගැටලු පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සියලුම හමුදා කඳවුරු පවතින භූමි පිළිබඳව නැවත පරීක්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දී ඇති බවත් එම වාර්තාව ලැබුණු පසු ඒ මත පදනම්ව නැවත සාකච්ඡා පවත්වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.2 අසාද් මවුලානා විසින් සිදුකළ ප්‍රකාශය සම්බන්ධව විමර්ශනය කිරීම

අසාද් මවුලානා විසින් සිදුකළ ප්‍රකාශය සම්බන්ධව ඇතැම් පුද්ගලයින් ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කර තිබෙන බවත් මෙම ගැටලුව හේතුවෙන් ඇතැම් පුද්ගලයින්ට ජීවිත තර්ජන පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, මීට සම්බන්ධ පුද්ගලයින්ට ආරක්ෂාකාරීව සහ විශ්වසනීයව කරුණු දැක්විය හැකි ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙසත් මේ සම්බන්ධව පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.2.3 වෙරළ තීරයන් අසල හමුදාව විසින් ඉදිකර ඇති නිවාඩු නිකේතන

මඩකලපුව දිස්ත්‍රික්කයේ කායන්කනි වෙරළ තීරයේ හමුදා විසින් ඉදිකර ඇති නිවාඩු නිකේතනයක් අසල ධීවර බෝට්ටු නැවැත්වීම වළක්වාලමින් පුවරු සවිකර ඇති බවත් මුහුද රළු කාලවල දී ධීවර බෝට්ටු නවතා තැබීමේ ගැටලු මතුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.4 යාපනයේ තයිට්ටි විහාරය

පෞද්ගලික ඉඩමක බෞද්ධ විහාරයක් ඉදිකර තිබීම හේතුවෙන් පැනනඟින ගැටලුව සම්බන්ධව කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පන්සලට හිමි ඉඩමක් පැවතිය ද පන්සල ඉදිකර ඇත්තේ පෞද්ගලික ඉඩමක වන බැවින් ඉදිකර තිබෙන පන්සල ඉවත් කිරීමට නියෝග කිරීම ගැටලුවක් විය හැකි බවත් මෙම ප්‍රශ්නය දෙස දේශපාලන කෝණයකින් නොබැලිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ඉඩමේ පවුල් 05ක් පදිංචි වී ඇති බව පළමු අවස්ථාවේ දී දැනුම් දී ඇති බවත් 2016 සිට මේ දක්වා ඔප්පු 15ක් පමණ ඉදිරිපත් වී ඇති බවත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට ඉදිකර තිබෙන පන්සල ඉවත් කිරීමේ ප්‍රායෝගික ගැටලුවක් පවතින බැවින් පන්සලට අත්‍යවශ්‍ය ඉඩම් කොටස් පන්සලටත් ඉතිරි ඉඩම් කොටස් ඉඩම් හිමියන් යටතේ බෙදා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සාකච්ඡා කර තිබුණ ද මෙම ඉඩමේ මැනුම් කටයුතු සිදුකිරීමට යාමේ දී ගම්වැසියන් විසින්ම ඊට බාධා කරන බව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් දැනුම් දෙන ලදී.

මීට අදාළ ඉඩම් හිමියන් නිවැරදිව හඳුනාගෙන තිබේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දුන් ආකාරයට මෙහි ඇතැම් ඉඩම් සඳහා නව ඔප්පු තිබෙන බවත් දැනට ඔප්පු ලබාගෙන තිබෙන පුද්ගලයින් මෙහි සත්‍ය හිමිකරුවන් වන්නේ ද යන්න පරීක්‍ෂා කර බැලිය යුතු බවත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් දැනුම් දෙන ලදී.

ඉඩම මැන කොටස් හඳුනා ගැනීම, පැරණි ලිපි ලේඛන සමඟ සංසන්දනය කිරීම ආදී මූලික කටයුතු සිදුකිරීමට හෝ අවස්ථාවක් නොලැබුණු බව ද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් කාරක සභාවට තවදුරටත් දැනුම් දෙන ලදී.

ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලයේ (The Office for National Unity and Reconciliation - ONUR) සභාපති ඇතුළු පිරිසක් මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා දී ඇති බවත් එය ගරු සභාපතිතුමා වෙත ලැබීමට සලස්වන බවත් ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පොහොය දිනවල හමුදා ආරක්‍ෂාව යටතේ වෙනත් ප්‍රදේශවලින් බස් රථවලින් ජනතාව පැමිණ මෙහි විවිධ පූජා සහ පිංකම් කටයුතු පවත්වන බවත් අධි ආරක්ෂිත ප්‍රදේශයක්ව පැවති කාලයේ දී මෙම පන්සල ඉදිකර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ඉඩම් අයිති ජනතාව 2005 වර්ෂයේ දී පමණ යුධමය වාතාවරණය සමඟ ඒවා අතහැර ගිය ද ඔවුන්ට ඒවායේ අයිතිය අහිමි නොවන බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ජනතාව විසින් මේ වන විට සාදා ගෙන ඇති නව ඔප්පු සත්‍ය හිමිකාරීත්වය සහිත ඔප්පු ද නැතහොත් නව හිමිකරුවන් විසින් වෙනත් ආකාරයකින් සකස් කරගත් ඔප්පු ද යන්න පරීක්ෂා කළ යුතු බවත් මෙය දේශපාලන ගැටලුවක් කර නොගෙන පුරවැසියන් සහ පන්සල අතර ඇති ගැටලුවක් බවට පත්වන්නේ නම් මේ සඳහා විසඳුමක් ලබා දිය හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවැනි වාර්ගික සහ ආගමික ගැටලු විවිධ ප්‍රදේශවල වරින් වර මතුවීම නොවැළැක්විය හැකි බැවින් මහා බ්‍රිතාන්‍ය වැනි රටවල පනත් මඟින් ස්ථාපිත කර ඇති Race Relation Board වැනි ස්වාධීන මණ්ඩලයක් පත්කර එයට ව්‍යවස්ථාදායකය මඟින් බලය ලබා දී ඒ වෙත මෙවැනි ගැටලු යොමු කර එම මණ්ඩලයේ සිටින විවිධ ආගමික නායකයින්ට මෙම ගැටලු විසඳීම සඳහා බලය ලබා දී ඉන්පසුව ඉදිරි කටයුතු සඳහා අධිකරණය වෙත යා හැකි වන ආකාරයේ ක්‍රමවේදයක් සකස් කරන ලෙස ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා විසින් යෝජනා කරන ලදී.

ආගම්වාදය සහ ජාතිවාදය දේශපාලනීකරණය කර නොගන්නා තෙක් ගැටලු විසඳිය හැකි බව ගරු සභාපතිතුමා විසින් නුම් දෙන ලදී.

## 1.3 ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

### 1.3.1 මන්නාරම සිලාවතුර නගරයේ ඉඩම් නිදහස් කර ගැනීම

1990 දී ත්‍රස්තවාදීන් විසින් මන්නාරම දිස්ත්‍රික්කයේ සිලාවතුර නගරයේ සිටි ජනතාව පලවාහැර එය ජන ශූන්‍ය ප්‍රදේශයක් බවට පත් කළ පසුව නාවික හමුදාව විසින් එහි තාවකාලිකව ස්ථාපිත කරගත් හමුදා කඳවුර මේ වන විට ස්ථිර හමුදා කඳවුරක් බවට පත්කරගෙන ඇති බවත් සිලාවතුර කඩපොළ මේ වන විට හමුදාව සතුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සිලාවතුර ප්‍රදේශයේ පිහිටි මෙම ඉඩම් නැවත අදාළ හිමිකරුවන්ට ලබා දෙන ලෙස දීර්ඝ කාලයක් මුළුල්ලේ ඉල්ලීම් කළ නමුත් ඒ පිළිබඳව විසඳුමක් නොලැබුණු බැවින් නැවත මේ පිළිබඳව අවධානය යොමු කර විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත ලිඛිතව දැනුම් දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.3.2 මාබල් බීච් වෙරළ තීරයේ ඉදිකර ඇති හමුදා නිවාඩු නිකේතනය

හමුදාව විසින් ඉදිකර ඇති මෙම නිවාඩු නිකේතනය හේතුවෙන් මාබල් බීච් අවට ප්‍රදේශයේ ධීවර කටයුතුවල නියැලෙන ජනතාවට ධීවර කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති වීම ආදී ගැටලුවලට මුහුණ දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යුද සමයේ දී ත්‍රිකුණාමලය ඩයමන් හිල්හි පිහිටි ගුවන් ආරක්ෂක කඳවුරේ ආරක්ෂාව සඳහා මාබල් බීච්හි ගුවන් හමුදා කඳවුරක් ස්ථාපිත කළ බවත් යුද්ධයෙන් පසු එය නිවාඩු නිකේතනයක් බවට පත්කළ බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සාමාන්‍ය ජනතාවගේ භාවිතය සඳහා ඉඩකඩ සහිත විශාල වෙරළ තීරයක් පවතින බවත් දහස් ගණන් ජනතාව මෙහි පැමිණෙන අතර සාමාන්‍ය ජනතාවට ද ගෙවීම් සිදුකර නිවාඩු නිකේතනයට පැමිණිය හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙවැනි ප්‍රදේශ විදේශ ආයෝජන සඳහා විවෘත කළහොත් විශාල හෝටල් පවා ඉදිකිරීමට හැකිවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙමඟින් චීන වරාය ගුවන්තොටුපළට (China Bay Airport) යම්කිසි බලපෑමක් ඇති වන්නේ නම් ඒ පිළිබඳව ද සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

යුද සමයේ දී කොඩ්ඩියාර් බොක්ක ආශ්‍රිත ප්‍රදේශයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් යානයකට මිසයිල ප්‍රහාරයක් එල්ල වීම හේතුවෙන් ඒ සඳහා ගත් ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස මාබල් බීච් ආශ්‍රිත ප්‍රදේශයේ කඳවුරක් ඉදිකළ බවත් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධව ඉදිරියේ දී සලකා බලන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ඉඩම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා තිබූ අතර ඉන්පසු අභියාචනාධිකරණයේ ද නඩු ගොනු කර එය විභාග කිරීමෙන් අනතුරුව නඩුව පරාද වූ බවත් එම ඉඩම පෞද්ගලික ඉඩමක් නොව එවකට ශ්‍රී ලංකා සංචාරක

මණ්ඩලය සතු ඉඩමක් බවත් නීති උපදේශක විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙය ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටලුවක් නොව මෙම ඉඩම වඩාත් ඵලදායී කටයුත්තක් සඳහා යොදාගත හැකි වීම සම්බන්ධව පරීක්ෂා කර බැලිය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ඉඩම බෙදා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය හා ගුවන් හමුදාව අතර සාකච්ඡා පවතින බවත් මීට අදාළව පැවැති අවසාන සාකච්ඡාවේ දී ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකිරීමට තීරණය කළ බවත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ඉඩම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට යොදා ගන්නා ලෙස ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ඉල්ලීමක් කළ බැවින් ඒ අනුව කටයුතු සිදුකරන බවත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) විසින් දැනුම් දෙන ලදී.

යුද්ධය අවසන් වූ විගසම සියලුම ඉඩම් නිදහස් කළ නොහැකි බැවින් එම ඉඩම්වල පවතින වැදගත්කම අනුව හමුදාව විසින් යම් ආර්ථික වටිනාකමක් සහිත ව්‍යාපෘති ආරම්භ කළ බවත් වර්තමානයේ දී ආර්ථික වටිනාකමක් ලැබෙන කිසිදු ව්‍යාපෘතියක් හමුදාව විසින් මෙම ඉඩම්වල ආරම්භ නොකරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පවතින ව්‍යාපෘති නවතා දැමීමක් හෝ අත්හැරීමක් සිදු කරන්නේ නම් ඒ පිළිබඳව පූර්ව අධ්‍යයනයක් සිදුකර ක්‍රමානුකූලව අවසන් කළ යුතු බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඉඩම් අත් නොහැර එම ඉඩම් සංචාරක කර්මාන්තය වැනි වැදගත් කටයුතු සඳහා භාවිත කරන ලෙස ගරු ෂානක්කියන් රාජපුත්තිරයන් රාසමානික්කම් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඇතැම් අවස්ථාවන්හි ඉතා වැදගත්කමක් සහ වටිනාකමක් සහිත ඉඩම් අයුතු ලෙස අත්පත් කරගෙන ඇති බවත් උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ සංචාරක කර්මාන්තය දියුණු කරන්නේ නම් මෙම ඉඩම් භාවිත කළ හැකි බවත් ගරු ෂානක්කියන් රාජපුත්තිරයන් රාසමානික්කම් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.4 ආගමික ස්ථානවල කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාව යොදා ගැනීම - ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ආගමික ස්ථානවල කටයුතු සඳහා ලිඛිත ඉල්ලීමක් සිදුකිරීම මගින් එම ප්‍රදේශයේ පවතින හමුදා කඳවුරුවල සිටින සෙබලුන්ගේ ශ්‍රමය යොදා ගත හැකි බැවින් පෞරාණික ආගමික සිද්ධස්ථානවල සිදුවන කටයුතු සඳහා හමුදා සෙබලුන්ගේ දායකත්වය ලබා ගැනීමට ඉල්ලීම් කළ හැකි ආකාරය සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කාලයක් මුළුල්ලේ හමුදා සෙබලුන් සැලකිය යුතු ප්‍රමාණයක් ආගමික ස්ථානවල විවිධ ව්‍යාපෘති කටයුතුවල නිරත වී සිටින බවත් දැනට එම ස්ථානවලින් සියලුම හමුදා සෙබලුන් ඉවත් නොකරන නමුත් ඔවුන් අනුයුක්ත

කර ඇති කාර්යයන් සම්බන්ධව තක්සේරු කිරීමක් සිදුකරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආගමික ස්ථානවල සිදු කරන ව්‍යාපෘතිය, එම ව්‍යාපෘතිය සඳහා ගතවන කාලය සහ ඒ සඳහා යොදාගත යුතු සෙබලුන් ප්‍රමාණය පිළිබඳව විගණනයක් සිදු කරන ලෙස මෙම ස්ථානවලට අනුයුක්ත කර ඇති හමුදා කණ්ඩවල ප්‍රධානීන් වෙත නියෝග කර ඇති බවත් ඇතැම් ස්ථානවල වසර ගණනාවක් පුරා භට පිරිස් රඳවාගෙන සිටීම අනුමත කළ නොහැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ආගමික ස්ථානවල කටයුතු සිදුකිරීම සඳහා ලිඛිතව එම ආගමික ස්ථානවලින් ඉල්ලීම් කරන බවත් එම ලිඛිත ඉල්ලීම් එම ආගමික ස්ථානය ආසන්නයේ පිහිටි කඳවුර වෙත ලබාදෙන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එම අදාළ හමුදා කඳවුරේ නිලධාරීන් ආගමික ස්ථානය වෙත ගොස් ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘතිය සඳහා ගතවන කාලය හා ශ්‍රමය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සඳහා අනුමතිය ලබාදෙන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

වසර ගණනාවක් පුරා එකම ආගමික ස්ථානයේ කටයුතුවල රඳවා සිටින හමුදා සෙබලුන් නැවත කඳවුරු වෙත ගෙන්වූ බවත් එසේ නොකරන්නේ නම් එහි සිටින පිරිස් මාරු කිරීමක් හෝ සිදුකළ යුතු බවත් අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.5 පොලිස් ස්ථානවල ඩ්‍රෝන තාක්ෂණය (Drone Technology) භාවිත කළ හැකි ඒකක ස්ථාපිත කිරීම - ගරු වතුර ගලප්පත්ති මහතා

සෑම පොලිස් ස්ථානයකටම ඩ්‍රෝන තාක්ෂණය (Drone Technology) භාවිත කළ හැකි ඒකකයක් ස්ථාපිත කළ හැකි නම් ඇතැම් අපරාධ යම් මට්ටමකට මර්ධනය කළ හැකි වනු ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඩ්‍රෝන තාක්ෂණය (Drone Technology) භාවිත කර නාගරික ප්‍රදේශවල නිරීක්ෂණ කටයුතු සිදු කළහොත් ඇතැම් අපරාධ හා නීති විරෝධී කටයුතු යම් මට්ටමකට අවම කරගත හැකිවනු ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන බවත් බාහිරින් සිදුවන අපරාධවලට වඩා වැඩි යමක් අභ්‍යන්තරව සිදුවන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පොලිස් ස්ථාන, හමුදා කඳවුරු, බන්ධනාගාර වැනි ආයතනවලින් අවි ආයුධ රහසිගතව රැගෙන යාම, ඒවාට රැකවරණය ලබාදීම සහ නිලධාරීන් විසින් ඒවාට සහාය දැක්වීම වැනි කටයුතු සිදුවීම මඟින් රජයට අයත් නිල ආයතන පාතාලයට සහාය දක්වන නිල ආයතන බවට පත්වන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි කටයුතු සම්බන්ධව පුළුල් විමර්ශනයක් සිදුකරන බවත් එම කටයුතු සඳහා කාලය ලබා දෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.6 නඩු කටයුතු සඳහා සැකකරුවන් වීඩියෝ තාක්ෂණයෙන් සම්බන්ධ කර ගැනීම - ගරු එරංග වීරරත්න මහතා**

විශේෂ ආරක්ෂාවක් සැපයිය යුතු දරුණු ගණයේ සැකකරුවන් අධිකරණයට නොගෙන්වා වීඩියෝ තාක්ෂණයෙන් අධිකරණ කටයුතුවලට සම්බන්ධ කළ හැකි ද යන්න පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

වීඩියෝ තාක්ෂණය හරහා සැකකරුවන් අධිකරණයේ නඩු කටයුතුවලට සම්බන්ධ කර ගැනීම සිදුකළ ද මෙම නඩු කටයුත්තේ දී අදාළ සැකකරුට 05 වැනි අධිකරණයේ දී සූම් තාක්ෂණය (Zoom Technology) ඔස්සේ අධිකරණයේ පෙනී සිටීමට හැකි වුවත් 09 වැනි අධිකරණයේ දී අදාළ සැකකරු උසාවිය ඉදිරියේ භෞතික වශයෙන් පෙනී සිටිය යුතු බවට මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් ලබා දී තිබූ බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

05 වැනි අධිකරණයේ දී සූම් තාක්ෂණය (Zoom Technology) ඔස්සේ අධිකරණයේ පෙනී සිටීමට හැකි වුවත් 09 වැනි අධිකරණයේ දී සැකකරුට සූම් තාක්ෂණය (Zoom Technology) ඔස්සේ අධිකරණයේ පෙනී සිටීමට අවශ්‍යවන උපකරණ සහ මෙවලම් බන්ධනාගාර තුළ නොමැති බැවින් මොහු නැවත 05 වැනි අධිකරණය වෙත රැගෙන යන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වීඩියෝ සබැඳි හරහා සැකකරුවෙකුට බන්ධනාගාරය තුළ සිට හෝ වෙනත් රටක සිට සාක්ෂි ලබාදීමට හැකිවන ආකාරයට අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර අපරාධ නීති සංග්‍රහයට සංශෝධනයක් සිදුකිරීමට කටයුතු කළ බවත් ඒ සඳහා මූලික අනුමතිය ලබා දී ඇති බැවින් කඩිනමින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.7 අපරාධ අධිකරණවල ආරක්ෂාව වැඩි කිරීම - ගරු නීතිඥ සුනිල් වටගල මහතා**

අපරාධ අධිකරණවලට පමණක් හෝ ප්‍රමාණවත් වැඩි ආරක්ෂාවක් ලබා දෙන ලෙස නීතිඥ ප්‍රජාව පොදු ඉල්ලීමක් කරන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අධිකරණ සේවා කොමිෂන් සභාව සහ පොලිස්පති විසින් මේ සම්බන්ධව යෝජනාවලියක් සකස් කර ඇති බවත් ඉන් එක් අවස්ථාවක දී නීතිඥවරුන් පරීක්ෂාවට ලක්වීම සඳහා විරෝධතාව පළ කිරීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉදිරියේ දී ලෝහ සංවේදක (metal detectors) යොදා ගැනීම වැනි යම් ක්‍රමවේදයක් හරහා අධිකරණවල ආරක්ෂාව තර කිරීමට කටයුතු කරන බව ද ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

හිටපු පොලිස්පති විසින් මීට වසර 02කට පමණ පෙර යොමු කරන ලද ලිපියට සාධනීය ප්‍රතිචාරයක් ලැබී නොමැති බව ද ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

අධිකරණ පරිශ්‍රයට ඇතුළුවීමේ දී නීතිඥවරුන් පරීක්ෂාවට ලක්වීම සඳහා මේ වන විට කැමැත්ත පළ කර ඇති බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නීතිඥවරුන් කැමැත්ත පළ කරන්නේ නම් ඉදිරි කටයුතු සිදු කිරීමට හැකි බව ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.8 ආපදා කමිටු ශක්තිමත් කිරීම - ගරු එරංග ගුණසේකර මහතා

අප්‍රේල් සහ මැයි මාස වන විට වර්ෂාව ඇදහැලී ගංවතුර තත්ත්වයන් ඇතිවිය හැකි බැවින් ආරක්ෂක අමාත්‍යාංශයේ මඟපෙන්වීමෙන් මහජනතාවගේ සහභාගිත්වයත් සහිතව ආපදා කමිටු ශක්තිමත් කිරීමේ කඩිනම් වැඩපිළිවෙළක් දියත් කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා පවත්වා ඇති අතර ඉදිරි දින කිහිපය තුළ මීට අදාළ කටයුතු ආරම්භ කරන බව ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආපදා කමිටු ස්ථාපිත කිරීමට පෙර ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත කරනු ලබන ජාතික ආපදා කමිටුව පිහිටු විය යුතු බව ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ආපදා කමිටුව ස්ථාපිත කිරීම සඳහා නාම යෝජනා ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දී ඇති බවත් ඇතැම් මන්ත්‍රීවරුන් මේ වන විට නාම යෝජනා භාර දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් ද ජාතික ආපදා කමිටුවේ සිටින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නාමයෝජනා ලැබී ඇති බැවින් ජාතික ආපදා කමිටුව කැඳවිය හැකි බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.9 ගරු වසන්ත පියතිස්ස මහතා

#### 1.9.1 වසා දමා ඇති ගුවන් හමුදා කඳවුර පාර ගමනාගමනය සඳහා යළි විවෘත කිරීම

අම්පාරේ සිට උහන දෙසට කිලෝමීටර් 05ක් පමණ ගමන්ගත් විට එතැන් සිට උහන ගුවන් හමුදා කඳවුර පාරෙන් හිමිදුරාව, මහකණ්ඩිය ආදී ගම්මානවලට කිලෝමීටර් 02කින් පමණ ගමන් කළ හැකි නමුත් වසර 20ක පමණ කාලයක් පුරා උහන ගුවන් හමුදා කඳවුර පාර වසා ඇති බැවින් ජනතාවට වැඩිපුර කිලෝමීටර් 15ක් පමණ ගමන් කර ගම්මානවලට යාමට සිදුවන බැවින් මේ සම්බන්ධව සලකා බලන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව පරීක්ෂා කළ අතර උහන ගුවන් හමුදා කඳවුර මැදින් පවතින මෙම පාර ගමනාගමනය සඳහා විවෘත කිරීම ගුවන් හමුදා කඳවුරේ ආරක්ෂාවට තර්ජනයක් වන බවත් මාර්ග සැලසුම්වලට අනුව විකල්ප මාර්ගයක් පවතින බැවින් අඩු වියදමින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දීමට ගුවන් හමුදාව එකඟ වී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගුවන් හමුදා කඳවුර මධ්‍යයෙන් යන මාර්ගය විවෘත කළ නොහැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දුන් අතර ගුවන් හමුදා කඳවුර මැදින් වැටී ඇති මාර්ගය සහ ගුවන් හමුදා කඳවුරට පිටතින් පිහිටි මාර්ගය අතර දුරෙහි වෙනස පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

ගුවන් හමුදා කඳවුරට පිටතින් පිහිටි මාර්ගය කරංගාව මාර්ගය බවත් මෙම මාර්ග දෙකෙහි වෙනස මීටර් 250ක් පමණ වන බවත් ගුවන් හමුදාධිපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම විකල්ප මාර්ගය වන කරංගාව මාර්ගයෙහි වන අලි ගැවසෙන බැවින් එම මාර්ගය නිසි ප්‍රමිතියකින් යුතුව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.9.2 සිවිල් ආරක්ෂක බලකාය

සිවිල් ආරක්ෂක බලකායේ රාජකාරි පිළිබඳව යළි සලකා බලන ලෙස දැඩි ඉල්ලීමක් පවතින බැවින් සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන් සඳහා වෘත්තීමය ගෞරවයක් ඇති කරන ලෙසත් නිශ්චිත රාජකාරී ලැයිස්තුවක් ලබා දෙන ලෙසත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දුරබැහැර ප්‍රදේශවල සිටින සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන් විවිධ ව්‍යාපෘති සඳහා කොළඹ වැනි ප්‍රදේශවලට කැඳවන නමුත් මෙහි පැමිණි පසු ඔවුන්ට නවාතැන් ගැනීමට නිසි ස්ථානයක් නොමැතිවීම සහ ආහාරපාන නොලැබීම වැනි පීඩාවන්ට මුහුණ දීමට සිදුවන බව එම නිලධාරීන් දැනුම් දෙන බැවින් මේ පිළිබඳව ද සලකා බලන ලෙස නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

විශේෂ ව්‍යාපෘතියක් ලෙස වී වගාකිරීමේ කටයුතු සඳහා සිවිල් ආරක්ෂක බලකා නිලධාරින් වැටුප් සහිතව රාජකාරියෙන් මාස 03ක් පමණ නිදහස් කරන බවත් ඔවුන්ගේ වී අස්වැන්නෙන් වී කිලෝග්‍රෑම් 900ක් පමණ සිවිල් ආරක්ෂක බලකා මූලස්ථානයට නැවත ලබාදිය යුතු බවත් නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඔවුන්ගේ වී ඇස්වැන්නේ වී කිලෝග්‍රෑම් 900 සිවිල් ආරක්ෂක බලකා මූලස්ථානයට ලබා නොදී ඒ වෙනුවට වී අලෙවි මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කන්නයේ සියලුම අස්වැන්න වී අලෙවි මණ්ඩලයට හා ලංකා සතොස ආයතනයට ලබා දෙන ලෙස දැනුම් දී ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට මහ කන්නයේ අස්වනු නෙලීම ආරම්භ කර ඇති අතර එම අස්වැන්න රජයේ ආයතනවලට ලබා දෙන ලෙස උපදෙස් ලැබී ඇති බැවින් ඒ සඳහා අස්වනු ගබඩා කිරීම ඇතුළු සියලු කටයුතු සූදානම් කර ඇති බව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සිවිල් ආරක්ෂක බලකාය මඟින් වගා කරන ඉඩම් පවතින නමුත් සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන් විසින් පෞද්ගලිකව වගා කරන ඉඩම් තිබේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

අද පදනම මත ඔවුන්ට අයත් වගා බිමක වගා කිරීම සඳහා සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන් මාස හතරකට සේවයෙන් නිදහස් කරන බවත් වගා කරන අක්කර 01කින් වී කිලෝග්‍රෑම් 900ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලබා ගන්නා බවත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඔවුන් ලබාදෙන මෙම අස්වැන්න රාජ්‍ය භාණ්ඩාගාරයට හෝ ක්‍රමවත්ව රජයට භාර ගැනීමක් සිදු නොවන බවටත් එම අස්වැන්න අස්ථානගතවන බවටත් සිවිල් ආරක්ෂක නිලධාරීන් චෝදනා කරන බව ගරු රෝහණ බණ්ඩාර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම අස්වැන්න රජයේ ආයතනවලට ලබා දීමෙන් මෙවැනි ගැටලුවක් ඇති නොවන බවත් මේවා ඒකාබද්ධ අරමුදලට ඇතුළත් නොවී අදාළ ආයතන තුළ පිහිටුවාගෙන තියෙන අරමුදල් වෙත යොදාගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.10 ත්‍රිවිධ හමුදාව සතු අරමුදල් විගණනය කිරීම - ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා**

2009 වර්ෂයෙන් පසු ත්‍රිවිධ හමුදාව තුළ පවතින රාජ්‍ය සහ රාජ්‍ය නොවන අරමුදල් දේශපාලනඥයින්ගේ ප්‍රතිරූපය නංවා ගැනීම සඳහා භාවිත කිරීම දක්නට ලැබෙන බැවින් මෙම අරමුදල් සම්බන්ධව විගණනයක් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.11 ආලයාඩිවෙම්බු සමූපකාර සමිතියට අයත් ඉඩම නිදහස් කර ගැනීම - ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

1965 සිට ආලයාඩිවෙම්බු සමූපකාර සමිතියට අයත්ව තිබූ ඉඩම 2008 - 2010 කාලයේ දී හමුදාව විසින් අත්පත් කරගෙන ඇති අතර 1965 වර්ෂයේ සිට සමූපකාර සමිතිය විසින් මෙම ඉඩමේ ගබඩාවක් සහ සහල් මෝලක් ස්ථාපිත කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ නියෝජ්‍ය සමූපකාර කොමසාරිස් මාර්ගයෙන් ජනතාවට සහන මිලට සහල් විකුණා ඇති බවත් 2008 - 2009 කාලයේ දී මෙම ඉඩම හමුදාවෙන් අත්පත් කර ගත්ත ද 2010 වර්ෂයේ දී මෙම ඉඩම ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විසින් නිදහස් කරන ලද බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහෙත්, 2023 වර්ෂයේ දී නැවතත් මෙම ඉඩම හමුදාව විසින් අත්පත් කරගෙන ඇති අතර සමූපකාර සමිතිය විසින් මෙම ඉඩමේ ගොඩනැගිලි ඉදිකර යන්ත්‍ර සූත්‍ර ස්ථාපිත කර විශාල ආයෝජනයක් සිදුකර තිබුණ ද මේ වන විට එහි යන්ත්‍ර සූත්‍ර කිසිවක් නොමැති බවත් මෙම ඉඩම නැවත සමූපාකාර සමිතිය වෙත ලබා දුනහොත් පෙර පරිදිම ජනතාව වෙත අඩු මිලට සහල් ලබාදීමට කටයුතු කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම ගැටලුව පිළිබඳව සලකා බලා විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

හමුදාව විසින් කිසිවිටෙකත් බලෙන් ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු නොකරන බැවින් මේ පිළිබඳව පරීක්ෂා කර බලා ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන බව යුද්ධ හමුදාධිපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ඉඩම සහ සහල් මෝල සමූපකාර සමිතියට අයිති වන බව තහවුරු කිරීමට අදාළ සියලු තොරතුරු තමා සතුව පවතින බව ද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් හරහා 2023 වර්ෂයේ දී මෙම ඉඩම පවරා ගැනීම සිදුකර ඇති බව ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.12 වේයන්ගොඩ ආහාර ගබඩා පරිශ්‍රයේ ඇති වූ ගිනි ගැනීම - ගරු මුනීර් මුලාෆර් මහතා

වේයන්ගොඩ ආහාර ගබඩා පරිශ්‍රයේ ඊයේ දිනයේ දී විශාල ගින්නක් හටගත් අතර යුද්ධ හමුදාව සහ පොලිසිය එක්ව එම ගින්න මැඩ පැවැත්වූ බවත් එම පරිශ්‍රය ආශ්‍රිතව පුපුරණ ද්‍රව්‍ය ද ගබඩා කර ඇති බවට තොරතුරු ලැබුණු බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම ප්‍රදේශය දැඩි ලෙස වල් බිහි වී ඇති අතර එම පරිශ්‍රය පිරිසිදු කිරීමේ කටයුතු ද සිදුකළ යුතු බැවින් මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව පරීක්ෂා කර බැලූ බවත් ඒ සම්බන්ධ වාර්තා ඉදිරිපත් කරන බවත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.13 ගරු ඥානමුත්තු ශ්‍රීනේෂන් මහතා

### 1.13.1 කලවංචිකුඩි කුරුකල්මඩම් කලෛයිවානි පාසලට අයත් ඉඩම්

මඩකලපුව දිස්ත්‍රික්කයේ කලවංචිකුඩි කුරුකල්මඩම් කලෛයිවානි විදුහලට අයත් ඉඩම් හමුදාව සතුව පවතින අතර එම පාසලේ සිසුන්ට ක්‍රීඩා පිටියක් නොමැති වීමෙන් ඔවුන් දැඩි අපහසුතාවකට පත්ව සිටින බැවින් මෙම ඉඩම් එම පාසල වෙත නැවත පවරා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.13.2 මඩකලපුව මොරකොට්ටාන්චේනයි පාසල

මඩකලපුව දිස්ත්‍රික්කයේ මොරකොට්ටාන්චේනයි පාසලට අයත් ඉඩම ද මේ වන විට හමුදාව සතුවන බවත් පසුගිය කාලයේ දී එම ඉඩම නිදහස් කරගැනීමට උත්සාහ කළ ද එය ව්‍යර්ථ වූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.13.3 කෙවිලියාමඩුව ප්‍රදේශයේ කජු වගා කිරීම සඳහා ලබා දුන් ඉඩම්

පට්ටිපලයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෙවිලියාමඩුව ප්‍රදේශයේ විශාල ඉඩම් ප්‍රමාණයක් කජු වගා කිරීම සඳහා ග්‍රාම ආරක්ෂක නිලධාරීන්ට ලබා දී ඇති නමුත් එහි වෙනත් ක්‍රියාකාරකම් ද දැකිය හැකි අතර එම ඉඩම කොටස් වශයෙන් පුද්ගලයින්ට විකුණන බවට තොරතුරු ලැබී ඇති බැවින් මේ පිළිබඳව පරීක්ෂා කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.13.4 මඩකලපුව ගුවන්තොටුපොළ පසෙකින් පවතින මාර්ගය ගමනාගමන කටයුතු සඳහා විවෘත කිරීම

මඩකලපුව ගුවන්තොටුපොළ මධ්‍යයෙන් සහ ගුවන්තොටුපොළ පසෙකින් පවතින මාර්ග 02ම වසා දමා තිබීම හේතුවෙන් ජනතාව මේ වන විට විකල්ප

මාර්ග භාවිත කරමින් කිලෝමීටර් 2 - 3 ක් පමණ අතිරේක දුරක් ගමන් කිරීමට සිදුවන බැවින් ගුවන්තොටුපොළ පසෙකින් පවතින මාර්ගය ගමනාගමන කටයුතු සඳහා විවෘත කරදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉඩම් ගැටලු සම්බන්ධව කැඳවා ඇති වාර්තාව ලැබුණු පසු මේ සම්බන්ධව සාකච්ඡා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.14 ගරු රවී කරුණානායක මහතා

### 1.14.1 එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරී සඳහා වැඩි සෙබළ ප්‍රමාණයක් යෙදවීම

මෙරට ත්‍රිවිධ හමුදා සෙබලුන් 18,000ක් පමණ මේ වන විට එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරිවල නිරත වන අතර ඉදිරියේ දී එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරි සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පිටව යන හමුදා නිලධාරීන් සංඛ්‍යාව වැඩි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මීට අදාළව තාක්ෂණික ගැටලු සහ ක්‍රමවේදය (Wetting Procedure) සම්බන්ධ ගැටලු පවතින බවත් එක්සත් ජාතීන්ගේ නියෝජිතයින් සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කළ අතර මේ සම්බන්ධව යහපත් තීරණයක් ලබා දෙන බව දැනුම් දුන් බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අනාගතයේ දී නිපුණත්වය සහිත පුහුණු නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරිවල යෙදවීමට හැකි වනු ඇති බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.14.2 කල් ඉකුත් වූ ආයුධ නැවත විකිණීම

මෙරට ත්‍රිවිධ හමුදාවන් සඳහා අවි ආයුධ මිලදී ගැනීමේ දී එම අවි ආයුධ තොගය මිලදී ගන්නා මිල සහ එම අවි ආයුධ තොගය කල් ඉකුත්වන විට ඉතා අඩු මිල ගණනකට නැවත විකුණනු ලබන බැවින් මේ සම්බන්ධව පරීක්ෂා කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට ප්‍රසම්පාදන කැඳවීමක් සිදුකර ඒ අතරින් වඩාත් ප්‍රතිඵලදායක මිල ගණන් ලබා දෙන ආයතන හඳුනාගෙන ඇති අතර මෙම අවි ආයුධ මිලදී ගෙන තිබෙන රටවල් සහ කල් ඉකුත් වූ විට ඒවා නැවත විකිණීමේ දී මිලදී ගන්නා රටවල් අතර පවතින එකඟතාවයන් සහ නීතිමය ගැටලු හේතුවෙන් ප්‍රසම්පාදන කැඳවීම් සිදුකර තෝරාගන්නා ගැණුම්කරුට මෙරට කැමැත්ත පරිදි අදාළ අවි ආයුධ ලබාදීමට නොහැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම අවි ආයුධ සතුරු පාර්ශ්ව අතට යාමේ ගැටලු මෙන්ම ජාත්‍යන්තර ගැටලු ද පවතින බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අවි ආයුධ නිෂ්පාදනය කරනු ලබන්නන්ගේ සහතිකය සියලු දෙනාටම නොලැබීම, අවි ආයුධ කල් ඉකුත් වීමේ දින ඉතා ආසන්න වීම, එම අවි ආයුධ ගබඩා කර තැබීම ඉතා අවදානම් වීම යනාදී ගැටලු පවතින අතරතුර මෙම

ප්‍රසම්පාදන කැඳවීම සිදුකරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව පෙ.ව. 11.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි 22**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු ආනන්ද විජේපාල මහතා (සභාපති)
ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍ය)
ගරු එරංග වීරරත්න මහතා
ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු ඊ. එම්. බස්නායක මහතා
ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
ගරු මොහමඩ් සාලි නලීම් මහතා
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා

**1. වෙනත් කරුණු**

**1.1 විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පවතින ගැටලු**

විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පවතින ගැටලුකාරී තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළ යුතු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

මේ වන විට පැය 24 පුරා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව තම සේවාව අඛණ්ඩව ලබාදීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන බවත් විවිධ අසීරුතා හමුවේ වුව ද එහි කාර්යමණ්ඩලය සේවා වැඩ මුර 02කට බෙදී මෙම කටයුත්ත සඳහා තම සේවාව ලබාදෙමින් මේ වන විටත් විදේශ ගමන් බලපත්‍ර 4,000ක් පමණ නිකුත් කර ඇති බවත් ආගමන විගමන පාලක ජනරාල් (වැ.බ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ගැටලුව මතුවූයේ නව විදේශ ගමන් බලපත්‍ර හිඟතාවය හේතුවෙන් බවත්, මේ වන විට පිටපත් මිලියන 1.1ක් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන ඇති බවත් ආගමන විගමන පාලක ජනරාල් (වැ.බ) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නව විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ දී ඇති වූ දැඩි ප්‍රමාදය හේතුවෙන් මහජනතාව තුළ වූ විශ්වාසය බිඳවැටීම හේතු කොටගෙන පැය 24 සේවාව මහජනතාවට ලබාදීමට සිදුවූ බවත් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ නව ක්‍රියාවලිය මඟින් එම විශ්වාසය යළි ගොඩනැගීම අරමුණ වූ බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විදේශ ගමන් බලපත්‍ර 125,000ක පමණ ප්‍රමාණයක් (Backlog) නිකුත් කිරීමට තිබූ අතර මහජනතාව තුළ මේ සම්බන්ධයෙන් ඇති වූ අනියත බිය නිසා ගමන් බලපත්‍ර සඳහා ඉල්ලුම අධික වීම මඟින් අනවශ්‍ය කාලයක්, ශ්‍රමයක් වැය කිරීමට සිදුවීම හේතුවෙන් මෙම තත්ත්වය කළමනාකරණය සඳහා මූලිකව කටයුතු කළ බවත් මෙතුළින් පැවති තත්ත්වය පාලනය වී යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී ආගමන විගමන පාලක ජනරාල් ඇතුළු කාර්යමණ්ඩලය විසින් මෙම සේවාව අඛණ්ඩව පැය 24 පුරා පවත්වා ගෙන යෑමට දායකත්වය ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් සිය ස්තූතිය ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා තවදුරටත් සහකාර පාලකවරුන් 21දෙනෙකු බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය ලද අතර මෙයින් 07 දෙනෙකු පුරප්පාඩු ලෙස බඳවා ගැනීමටත්, ඊට අමතරව මෙම කාර්ය සඳහා අමතර නිලධාරින් ලෙස නිලධාරීන් 15 දෙනෙකු රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් නිදහස් කර ඇති බවත් මේ වන විට පවත්නා ගැටලු සහගත තත්ත්වයන් මසක් ඇතුළත මෙම ක්‍රියාවලිය ඔස්සේ යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

දිනකට ගමන් බලපත්‍ර ලබා ගැනීමට පැමිණෙන මහජනතාව 4,000කින් 70කට පමණ ජාතික හැඳුනුම්පත් සම්බන්ධ ගැටලු පවතින බැවින් ඒ සම්බන්ධව ක්‍රියාත්මක වීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහාය ද පැය 24 පුරා අපේක්ෂා කරන බැවින් එම සහාය මීළඟ සතියේ සිට ලබාදීමට අදාළ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට කටයුතු සැලසුම් කළ බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යාපනය දිස්ත්‍රික්කයේ කාර්යාලයක් විවෘත කිරීමට සැලසුම් සකස් කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය මුද්‍රණ යන්ත්‍රය මිලදී ගත් වහාම එම කාර්යාලය ද විවෘත කරන බවත් මීට අමතරව ප්‍රාදේශීය කාර්යාල මඟින් නිකුත් කරනු ලබන බලපත්‍ර සංඛ්‍යාව දෙගුණ කිරීමට සැලසුම් සකස් කර ඇති අතර මෙමඟින් මහජනතාවට

අවශ්‍ය පහසුකම් කාර්යක්ෂමව ලබාදීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලිය තුළ දී බලය විමධ්‍යගත කිරීම මඟින් ආරක්ෂක නිෂ්කාශනය සම්බන්ධයෙන් ඉදිරියේ දී ගැටලු ඇති විය හැකිද යන්න පිළිබඳව ගරු රවී කරුණානායක මහතා විසින් විමසීමක් කරන ලදී.

එවැනි ගැටලු සහගත තත්ත්වයක් නොමැති බවත් ඒ සම්බන්ධ සියලු කරුණු ආරක්ෂිතව ජාලගත කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ආගමන විගමන කවුළුවල සේවයේ නිරත නිලධාරීන්ගේ හිඟය සහ අකාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ගරු රවී කරුණානායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහි පුරප්පාඩු පවතින අතර දැනට ඒ පිළිබඳව කටයුතු කරමින් සිටින බවත් එම කවුළු තුළ සේවාව පැය 24 පුරා අඛණ්ඩව කාර්යක්ෂමව ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වැඩිදුරටත් ගනු ලබන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පෙර පැවැති ලෙස මාර්ගගත ක්‍රමයට පමණක් විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් භාර ගැනීම සීමා වී නොමැති අතර තම අවශ්‍යතාවය මත කාර්යාලයට පැමිණ ගමන් බලපත්‍ර ලබා ගැනීමේ හැකියාව පවතින බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.2 ගරු එස්. එම්. මරික්කාර් මහතා

### 1.2.1 වීසා (Visa) සම්බන්ධයෙන් පවතින ගැටලු

විදේශ රටවල්වල වාසය කරන ස්ථිර පදිංචිය හිමි ශ්‍රී ලාංකික පුරවැසියන්ට මෙරට වීසා අලුත් කර ගැනීමේ දී ඇතිවන ගැටලු පිළිබඳව මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වාස වීසා (Residence Visa) සම්බන්ධයෙන් රෙගුලාසි සකස් කරන ලද අතර එම පද්ධතිය සංවර්ධනය කරමින් පවතින බැවින් තව මාස 02කින් පමණ මෙම කටයුත්ත කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතින බව ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක (වීසා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

1980 දශකයේ රට තුළ පැවැති යුධමය තත්ත්වය හේතුවෙන් වෙනත් රටවල පදිංචිය සඳහා ගිය පුද්ගලයින් නැවත මෙරට පුරවැසිභාවය ඉල්ලුම් කරන ලද අවස්ථාවල දී එම ක්‍රියාවලිය සඳහා මාස 09ත් වර්ෂ 02ත් අතර දීර්ඝ කාලයක් ගතවන බැවින් මාස 03ක් වැනි කෙටි කාලයකින් එකී ක්‍රියාවලිය සිදු කිරීමට ඇති හැකියාව පිළිබඳව පරීක්ෂා කරන ලෙසත් ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

රට තුළ පවතින නව දේශපාලන ස්ථාවරත්වය සමඟ මෙරටින් වෙනත් රටවලට පදිංචිය සඳහා ගිය ශ්‍රී ලාංකිකයින් නැවත විවිධ ආයෝජන සඳහා මෙරටට පැමිණීමට අපේක්ෂා කරන බැවින්, මෙම බලපත්‍ර නිකුත් කිරීමේ දී ඇතිවන ප්‍රමාදවීම් සම්බන්ධව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් මෙම ක්‍රියාවලිය වෙබ් ද්වාරය (Web Portal) ඔස්සේ සිදු කර ගැනීමට හැකියාව සකස් කරන ලෙසත් ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

පුරවැසිභාවය සඳහා අයදුම් කරනු ලබන පුද්ගලයන්හට විදේශ දූත මණ්ඩල හරහා හෝ අයදුම්කරු විසින්ම මෙරට ප්‍රධාන කාර්යාලය වෙත අයදුම්පත් භාර දී මෙම ක්‍රියාවලිය සිදු කිරීමේ හැකියාව පවතින බවත් දැනටමත් එකී ක්‍රියාවලිය වෙබ් ද්වාරය (Web Portal) ඔස්සේ සිදුකිරීමේ හැකියාව පවතින බවත් ආගමන විගමන පාලක ජනරාල් (වැ.බ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම් කරනු ලබන පුරවැසියෙකුට මාස 07 - 08ක් පමණ කාලයක් එම ක්‍රියාවලිය සඳහා ගත කිරීමට සිදුවන බැවින් එය අවම කාලයකින් කරගැනීමට හැකි ද යන්න පිළිබඳව සහ විදේශ රාජ්‍යයන් විසින් නිකුත් කරනු ලබන පොලිස් වාර්තා මෙරට වැදගත් වන්නේ කෙසේ ද යන්න පිළිබඳව ගරු රවී කරුණානායක මහතා විසින් විමසීමක් කරන ලදී.

එකී ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධ කටයුතු ඒ ඒ රටවල් අතර තානාපති කාර්යාල හරහා සිදුවන බවත් අදාළ සියලු නිෂ්කාශන වාර්තා ලබා ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවන බවත් ආගමන විගමන පාලක ජෙනරාල් (වැ.බ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම වාර්තා නිසියාකාරව නොමැති අවස්ථාවල දී යම්කිසි ප්‍රමාද වීමක් සිදුවන බවත් එම ඉල්ලුම්කරු අන්තර්ජාතික වශයෙන් වරදකරුවෙකු ද, අපරාධකරුවෙකු ද යන්න නිසියාකාරව පරික්ෂා කරගැනීම සඳහා වාර්තා වැදගත් වන බවත් ආගමන විගමන පාලක ජෙනරාල් (වැ.බ) විසින් දැනුම් දෙන ලදී.

ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම් කරනු ලැබූ 3,000ක පමණ ප්‍රමාණයක් තවදුරටත් සලකා බැලීමට ඇති බව සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.2.2 කොළඹ අධිකරණ පරිශ්‍රයේ සිදු වූ පුද්ගල ඝාතනය

2025.02.19 දින අධිකරණයක් තුළ සිදුකරන ලද පුද්ගල ඝාතනය (ගනේමුල්ල සංජීව ඝාතනය) සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු ලැබී නොතිබුණි ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මහජන නියෝජිතයින් හටද ආරක්ෂාව පිළිබඳව ගැටලු ඇති බැවින් මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය සතියේ ගම්පහ උසාවියට මෙම සැකකරු රැගෙන යාමට ප්‍රථමයෙන් යම්කිසි පහර දීමක් සිදු වෙතැයි බුද්ධි තොරතුරු ලැබීම මත එදින එහි රැගෙන නොගිය බවත් අධිකරණ කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ (Virtual Meeting) සිදුවූ නමුත් පෙර දින කොළඹ අධිකරණයට රැගෙන යෑම සඳහා අධිකරණ නියෝගයක් තිබූ හෙයින් සහ නිශ්චිතවම අනතුරුදායකභාවය සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු ලැබී නොතිබුණු බැවින් මෙම පුද්ගලයා එහි රැගෙන යෑමට සිදුවූ බවත් පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහිදී ද, විශේෂ කාර්ය බළකා සහාය ඇතිව ආරක්ෂිතව රැගෙන ගිය බවත් අධිකරණය තුළට කිසිදු ආයුධ රැගත් නිළධාරියෙකුට ඇතුළුවීමට නොහැකි වන පරිදි, බන්ධනාගාර නිලධාරීන් පමණක් අධිකරණය තුළ රැඳී සිටි බවත් පොලිස්පති (වැ.බ.) විසින් දැනුම් දෙන ලදී.

කෙසේ වුව ද, අධිකරණයක් තුළට නීතිඥයින්හට කිසිදු පරීක්ෂාවකින් තොරව ඇතුළු වීමට හැකිවීම මූලික ගැටලුවක් බවත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු

කිරීම සඳහා ඉදිරි සැලසුම් සකස් කරමින් සිටින බවත් පොලිස්පති (වැ.බ.) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එකී අධිකරණයේ සිදු වූ පහරදීම සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ අදාළ අත්අඩංගුවට ගැනීම් සිදු කළේ නම් එය වැරැදි සහගත බැවින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ කටයුතු කඩිනමින් සිදු කරන ලෙස ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

සංවිධානාත්මක අපරාධ කළමනාකරණය සම්බන්ධයෙන් පවතින නීති රාමුව මගින් මෙය ආවරණය නොවන බැවින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අදාළ අත්අඩංගුවට ගැනීම් සිදුකළ බව පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3 පොලිස් නිෂ්කාශන ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවීම - ගරු එරංග වීරරත්න මහතා

මෙරට පොලිස් නිෂ්කාශන ක්‍රියාවලිය සඳහා සති 06ක පමණ කාලයක් ගතවන බැවින් ඇතැම් අවස්ථාවල දී ජාත්‍යන්තර සමාගම් විවිධ ගැටලුවලට මුහුණ දුන් බව දක්වමින් මෙම ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සාමාන්‍යයෙන්, මෙම ක්‍රියාවලිය සඳහා සති 02ක කාලයක් පමණක් ගත වන අතර විශේෂිතම අවස්ථාවක දී පමණක් (උදා: ජාතික හැඳුනුම්පත් අංකය තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් අපහසුතා පැමිණීම හෝ පදිංචි ලිපිනයන් කිහිපයකින් තොරතුරු එක්රැස් කරගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වීම) යම්කිසි ප්‍රමාදයක් සිදුවන නමුත් සාමාන්‍ය මාර්ගගත ක්‍රියාවලිය ඔස්සේ පොලිස් නිෂ්කාශන වාර්තා ලබාගත හැකි බවත් එසේ නැතහොත් එම ප්‍රමාදයන් පිළිබඳව පැමිණිලි කිරීමේ හැකියාවක් පවතින බවත් පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.4 මිද්දෙණිය ඝාතනය - ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

මිද්දෙණිය ඝාතනය සම්බන්ධයෙන් සමාජ මාධ්‍යජාලා තුළ වූ හෙළිදරව් කිරීම හා ඒ අදාළ අපරාධකරුවන් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එකී ඝාතනය සම්බන්ධයෙන් මේ වන විටත් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ෂණ සිදු කරන බවත් එම හෙළිදරව්ව සිදු කරන ලද මාධ්‍යවේදියාට අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ අදාළ ආරක්ෂාව සපයන අතර වැඩිදුරටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ආරක්ෂාව ලබා ගත හැකි බවත් පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.5 මන්නාරම අධිකරණය අසල දී පුද්ගලයින් දෙදෙනකුට වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධිය - ගරු රිසාඩ් බදියුදීන් මහතා

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙහිදී එක් සැකකරුවෙකු හැර අනෙකුත් සියලු සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු වන පණිවුඩ ඔස්සේ ඔවුන්හට තිබෙන ජීවිත තර්ජන පවතින බව ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා සහ ගරු රිසාඩ් බදියුදීන් මහතා විසින් දැනුම් දෙන ලදී.

ඊට අදාළ පැමිණිලි නිසියාකාරව යොමු කරන ලෙසත් ඒ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා බව පොලිස්පති (වැ.බ.) විසින් දැනුම් දෙන ලදී.

## 1.6 පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායක, ගරු සජිත් ප්‍රේමදාස මහතා

### 1.6.1 මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව

රට තුළ සිදුවෙමින් පවතින පුද්ගල ඝාතන සහ අපරාධ හේතුවෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව ප්‍රමාණවත් නොවන බැවින් ඒ සම්බන්ධ ඉදිරි සැලසුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විට මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය විධිවිධාන සැලසීම සඳහා කටයුතු කරමින් සිටින බවත් ගරු කථානායකතුමා මේ පිළිබඳව දැනුවත් කරනු ලැබූ බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රැස්වීම් පවත්වන ස්ථාන සඳහා අවශ්‍ය ආරක්ෂාව සලසන බවත් මේ වන විට පොලිස් දෙපාර්තමේන්තුවේ පවතින මානව සම්පත් හිඟය සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සහ අදාළ පුහුණු කිරීම් කටයුතු සිදු කරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීවරුන් වෙත සැපයිය යුතු ආරක්ෂාව පිළිබඳ තක්සේරු වාර්තා මේ වන විට ලැබෙමින් පවතින බවත් එම වාර්තා අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුවට ඉදිරිපත් කළ අතර ජාතික ආරක්ෂාව සඳහා කිසිඳු තර්ජනයක් මෙම අවස්ථාවේ නොමැති බවත් පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙරට මත්ද්‍රව්‍ය බෙදා හැරීම, කප්පම් ගැනීම, ආයුධ සැපයීම යනාදී කටයුතු විදේශයන්හි සිට හසුරුවන පිරිසක් සිටින බවත් මෙරට සිටින ඔවුන්ගේ අනුගාමිකයින් කොන්ත්‍රාත් පදනමට අපරාධ සිදුකරන තත්ත්වයක් රට තුළ ක්‍රියාත්මක වන බවත් පොලිස්පති (වැ.බ.) විසින් දැනුම් දෙන ලදී.

අවි විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇති බවත් අවශ්‍ය ආරක්ෂක පියවර ගනිමින් ප්‍රාදේශීය මට්ටමින් මෙම කටයුතු මර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බවත් පොලිස්පති (වැ.බ.) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මැද පෙරදිග රාජ්‍යන්හි සහ අසල්වාසි රාජ්‍යයන්හි වෙසෙන අපරාධකරුවන් පිරිසක් විසින් සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් රාශියක් මෙහෙයවන්නා වූ තත්ත්වයක් රට පුරා පවතින බවත් මේ සඳහා දේශපාලන සම්බන්ධකම් ද ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශේෂ කාර්ය බලකායේ, බුද්ධි අංශයේ, හමුදාවේ, පොලිස්පතිතුමාගේ සහාය මෙම ත්‍රස්තවාදී ක්‍රියා මැඩලීම සඳහා ලැබෙන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එකී අයුරින් මේ වන විට මැද පෙරදිග විසූ සැකකරුවන් 09 දෙනෙකු සහ අසල්වැසි රාජ්‍යයන්ගෙන් සැකකරුවන් 03 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති

බවත් මෙම අත්අඩංගුවට ගැනීම අඛණ්ඩව ක්‍රියාත්මක කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ වන විට දියත් කරන ලද වැටලීම් මඟින් ටී 56 (T56) ගිනි අවි 14 ක්, පිස්තෝල 21ක් සහ තවත් කුඩා අවි කිහිපයක් අත්අඩංගුවට ගත් බව පොලිස්පති (වැ.බ.) විසින් දැනුම් දෙන ලදී.

### 1.6.2 මෙවර අයවැයෙන් ශ්‍රී ලංකා පොලීසියේ වැටුපට ඇති බලපෑම

ශ්‍රී ලංකා පොලිසියේ වැටුප සම්බන්ධ ව්‍යාකූල තත්ත්වයක් පවතින බැවින් මෙවර අයවැයෙන් ඔවුන්ගේ වැටුප සඳහා සෘණාත්මක බලපෑමක් තිබේ ද යන්න සම්බන්ධව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකා පොලිසියේ වැටුප් සම්බන්ධයෙන් කිසිඳු සෘණාත්මක බලපෑමක් නොමැති බවත් මීට අදාළ චක්‍රලේඛයක් නිකුත් කිරීමට නියමිත අතර මෙවර අයවැය මඟින් මූලික වැටුප වැඩි කිරීමේ පදනම මත සිට කටයුතු කර තිබෙන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.7 ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

### 1.7.1 තෛයට්ටි ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමක අනවසරයෙන් ඉදිකරනු ලැබූ විහාරස්ථානය

තෛයට්ටි ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමක අනවසරයෙන් ඉදිකරනු ලැබූ විහාරස්ථානය ඉවත් කිරීමට ඉල්ලමින් එහි පදිංචි ජනතාව විරෝධතාවයක් දක්වන ලද බවත් එයට තමාගේ කිසිඳු සම්බන්ධතාවයක් නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එතුමා කොළඹ ලිපිනයෙහි පදිංචි (පාර්ලිමේන්තු දිනයන්හිදීම) කාල සීමාව තුළදී පලාලි පොලිසිය විසින් එකී පන්සල සම්බන්ධ පැමිණිල්ලකට අනුව එහි උසාවියේ පෙනී සිටීමට ඉල්ලමින් කොල්ලුපිටිය පොලිසිය හරහා සිංහල භාෂාවෙන් ලිපියක් තමා හට ඒවා ඇති බවත් තමාට හෝ පවුලේ සාමාජිකයන්ට සිංහල භාෂාව තේරුම් ගැනීමට නොහැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ හේතුවෙන් නීතිමය කටයුතුවල දී නිසි ප්‍රතිචාර දැක්වීමට නොහැකි වන බැවින් මින් ඉදිරියට එම ලිපි දමිළ භාෂාවට පරිවර්තනය කර එවන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

මෙම ගැටලුව සම්බන්ධයෙන් ඉදිරියේ දී පරීක්ෂා කර කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද එකී ගැටලුව මේ වන විට අධිකරණයේ විභාග වන බව පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.7.2 කයිට්ස් කරෙයිනගර් දූපත්වල පොලිස් ස්ථානයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව

කයිට්ස් කරෙයිනගර් දූපත්වල පොලිස් ස්ථානයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවට මීට පෙර ද ඉල්ලීම් කළ බැවින් මේ සම්බන්ධව සලකා බලා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එකී කටයුත්ත සඳහා සුදුසු භූමියක හෝ ගොඩනැගිල්ලක අවශ්‍යතාවය පවතින බවත් ඒ පිළිබඳව තම අවධානය යොමු කරන බවත් පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.8 මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත - ගරු රවී කරුණානායක මහතා

මාර්ගගත ආරක්ෂණ පනත අහෝසි කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඒ සම්බන්ධයෙන් නැවත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර සමාලෝචනය කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.9 ගරු මොහමඩ් සාලි නලීම් මහතා

### 1.9.1 එරාවූර් ප්‍රදේශයේ පොලිස් ගොඩනැගිල්ල

එරාවූර් ප්‍රදේශයේ පොලිස් ස්ථානය පවත්වා ගෙන යනු ලබන, අලිගාර් පාසලට අයත් ගොඩනැගිල්ල පාසලේ ඉඩකඩ ගැටලුව විසඳා ගැනීම සඳහා නැවත ලබා දීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පොල් වගාකිරීමේ මණ්ඩලය සතු විශාල ඉඩම් ප්‍රමාණයක් ඇති බැවින් එය ප්‍රයෝජනවත් කටයුතු සඳහා යොදා ගත හැකි බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය රජය කාලයේ මේ පිළිබඳව සාකච්ඡා කර ආරක්ෂක කවුන්සිලය දක්වා රැගෙන ගිය ද මේ සඳහා විසඳුම් නොලැබුණ බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ඉඩම එරාවූර් පොලිසිය විසින් නිසියාකාරව පවරාගෙන ඇති බවත් නගරයෙන් බැහැර පිහිටි ඉඩමක් පිළිබඳවද යෝජනාවක් ලැබුණ ද එම භූමිය නුසුදුසු බවත් පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශේෂයෙන්ම නගරයෙන් පිටත ස්ථානයකට පොලිසිය රැගෙන යෑමේ දී නගරාසන්නව විශාල වශයෙන් ප්‍රශ්න පැනනැගුණු ප්‍රදේශවල ප්‍රශ්න විසඳීමේ දුෂ්කරතාවය නිසා මහජනතාව අපහසුතාවයට පත්වන බැවින් එම කටයුත්ත කළ නොහැකි බව පොලිස්පති (වැ.බ.) විසින් දැනුම් දෙන ලදී.

### 1.9.2 කාත්තන්කුඩි සහරාන් ජාම්වුල් අදර් පල්ලිය

හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පැමිණ කාත්තන්කුඩි සහරාන් ජාම්වුල් අදර් පල්ලිය පාස්කු ප්‍රහාරයෙන් පසු විවෘත කළ බවත් එය ත්‍රස්තවාදී ලැයිස්තුවෙන් ඉවත් කර තිබෙන නමුත් මේ වන විට එම පල්ලිය පොලිසිය භාරයේ පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අවට මහජනතාවට යාඥා කටයුතුවල නිරත වීම සඳහා මෙම පල්ලියේ අයිතිය ජම්මියතුල් උලමා සංවිධානයට හෝ කාත්තන්කුඩි මුස්ලිම් පල්ලි සම්මේලනයට ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

මෙම පල්ලිය රාජසන්තක කර තිබෙන බවත් දැනට පොලිසිය භාරයේ, ත්‍රස්ත විමර්ශන ඒකකය එහි ස්ථාපිත කොට ඇති බවත් පොලිස්පති (වැ.බ.) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.9.3 Clean Sri Lanka වැඩසටහන

මේ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කටයුතු සඳහා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටුවලට සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට සම්බන්ධ විය හැකි බව ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.10 නාරාහේන්පිට පොලිස් රෝහලට සහ පර්යන්ත ප්‍රදේශවල පවත්නා රෝහල්වලට වෙන් වෙන්ව අධ්‍යක්ෂවරු දෙදෙනෙකු පත් කිරීම - ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා

නාරාහේන්පිට පොලිස් රෝහලට සහ පර්යන්ත ප්‍රදේශවල පවත්නා රෝහල්වලට අධ්‍යක්ෂවරු දෙදෙනෙකු පත් කිරීම සුදුසු බවත් මේ සම්බන්ධයෙන් පසුගිය කාලයේ යෝජනාවක් ඉදිරිපත් කළ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් මේ වන විට කිසිඳු පරිපාලනමය අවශ්‍යතාවක් නොමැති බවත් ඒ සඳහා ප්‍රතිපාදන සැපයීමට අපහසු බැවින් මෙම අවස්ථාවේ මේ පිළිබඳව කටයුතු කළ නොහැකි බවත් පොලිස්පති (වැ.බ.) සහ නියෝජ්‍ය පොලිස්පති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.11 රාජ්‍ය නොවන සංවිධාන (NGOs) නියාමනය - ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

රාජ්‍ය නොවන සංවිධාන (NGOs) නිසි නියාමනයක් සහිතව මෙරටට ගැළපෙන ආකාරයෙන් පවත්වාගෙන යා යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂිකව ප්‍රථම කාර්තුවේ දී දිස්ත්‍රික්ක මට්ටමින් රැස් කර ඒවායේ අනුකූලතා පරීක්ෂා කර අදාළ අරමුදල් නිසියාකාරයෙන් යෙදවීම සම්බන්ධයෙන් නියාමනයන් පවතින බව රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 3.50 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 28**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු බිමල් රත්නායක මහතා (සභාපති)
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය)
ගරු චතුරංග අබේසිංහ මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු ධනුෂ්ක රංගනාත් මහතා
ගරු ආර්. ජී. විජේරත්න මහතා
ගරු ජගත් විතාන මහතා
ගරු දිනිඳු සමන් මහතා
ගරු දේවානන්ද සුරවීර මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු නලින් හේවගේ මහතා
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු නන්දන පත්මකුමාර මහතා
ගරු නන්ද බණ්ඩාර මහතා
ගරු විජේසිරි බස්නායක මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු තුරෛරාසා රවිකරන් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

**1. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

**1.1 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2023 වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව**
(2025.01.24 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු බිමල් රත්නායක මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**1.3 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව**
(2025.01.24 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඉදිරි කාරක සභා රැස්වීමක දී එම වාර්තාව සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජනා**

**2.1 මධ්‍යම පළාතේ, මහනුවර - මහියංගනය ප්‍රධාන මාර්ගයේ 62 කණුව ගුරුළුපොත හන්දියේ සිට ආරම්භ වන හසලක "කඳන්හේන මාර්ගය" ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා කඩිනමින් පියවර ගන්නා ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනාව - ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා (යෝජනා අංක 04)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.2 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල පදිංචිකරුවන් එම ඉඩම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ බවත් එකී ඉඩම් නැවත ලබා දීම සඳහා තීරණය කළ ද එහි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම නැවතී ඇති බවත් එම ඉඩම බදු පදනම මත ලබා ගැනීම සඳහා තමන් විසින් ඉල්ලුම් කර ඇති බැවින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරමින් බණ්ඩාරවෙල, දකුණු කැබිල්ලවෙල, වළව්වත්ත ලිපිනයෙහි පදිංචි ඩබ්.එම්.එම්. නිමල් මහතා විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාව - ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා (යෝජනා අංක 10)**

යෝජනා අංක 10ට අදාළ පිළිතුරු වාර්තාව ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) විසින් සහ නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරී (වාණිජ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පිළිතුරු වාර්තාව ගරු අමාත්‍යතුමා වෙත යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.

**2.3 පාදෙණිය - අනුරාධපුර මහාමාර්ගයේ අඹන්පොල - උඩංගාව පොදු සුසාන භූමිය අසළින් පිහිටි දුම්රිය හරස්කඩ මාර්ගයක් වන උස්ගොඩ - කිරිමැටියාව ගම්සභා බොරළු පාර, දුම්රිය මාර්ගය නවීකරණයත් සමඟ වසා දමා ඇති බැවින් ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවකට මුහුණ දී ඇති බවත් නැවත එම දුම්රිය හරස්කඩ මාර්ගය විවෘත කර දීමට කටයුතු සලසා දෙන ලෙසත් එම ගම්වාසීන් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කරන ලද යෝජනාව - ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය (යෝජනා අංක 11)**

යෝජනා අංක 11ට අදාළ පිළිතුරු වාර්තාව ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) විසින් සහ නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරී (වාණිජ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පිළිතුරු වාර්තා ගරු මන්ත්‍රීතුමිය වෙත යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

**2.4 මහනුවර - බදුල්ල රජමාවත මාර්ගයේ හලාව සිට මස්පන්න දක්වා කොටසේ වැඩ අවසන් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් සිදු කරන ලද යෝජනාව - ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා (යෝජනා අංක 24)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.5 A4 - බෙරගල - කොස්ලන්ද හරහා වැල්ලවාය මාර්ගය ඉතිරි කොටස කාපට් යොදා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් සිදු කරන ලද යෝජනාව - ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා (යෝජනා අංක 25)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ලේකම් විසින් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක් හරහා ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ලිඛිත යෝජනාවලට අදාළ පිළිතුරු අදාළ මන්ත්‍රීවරුන්ට ලැබෙන ආකාරය සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

ගරු රවී කරුණානායක මහතා, ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා, ගරු රුවන්තිලක ජයකොඩි මහතා, ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා, ගරු ධර්මප්‍රිය දිසානායක මහතා, ගරු මොහමඩ් සාලි නලීම් මහතා, ගරු අරුණ පනාගොඩ මහතා, ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා, ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා, ගරු දේවානන්ද සුරවීර මහතා, ගරු චන්දන සූරියආරච්චි මහතා සහ ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා යන මන්ත්‍රීවරුන් විසින් 2025.01.24 වැනි දින කාරක සභා රැස්වීමේ දී වාචිකව විමසූ ගැටලු සඳහා

ලිඛිත පිළිතුරු කාරක සභා රැස්වීම අවස්ථාවේ දී අදාළ ආයතනවල නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලදුව, ඉහත නම් සඳහන් කරන ලද මන්ත්‍රීවරුන් අතරින් මෙම කාරක සභා රැස්වීමට සහභාගී වූ මන්ත්‍රීවරුන් වෙත ලබාදීමට කටයුතු කරන ලෙසත්, සෙසු ලිඛිත පිළිතුරු අදාළ මන්ත්‍රීවරුන් වෙත පසුව ලබාදීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

2025.01.24 වැනි දින පැවැති කාරක සභා රැස්වීම් අවස්ථාවේ දී ස්ථාපිත කරගත් අනු කාරක සභා ත්‍රිත්වයේ ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් අදාළ අනු කාරක සභා සභාපතිවරුන්ගෙන් විමසීමක් කරන ලදී.

අවිධිමත් ප්‍රවාහන කර්මාන්තය හා සම්බන්ධ වෘත්තිකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා පිහිටුවන ලද ප්‍රථම අනු කාරක සභාවේ සභාපති ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් 2025.02.25 වැනි දින පැවති අනු කාරක සභා රැස්වීමේ සාකච්ඡා කරන ලද කරුණු සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් සිදුකරන ලදී.

ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිමය රාමුව ශක්තිමත් කිරීම තුළින් සාධනීය දිශානතියක් කරා ප්‍රවාහන ක්ෂේත්‍රය යොමු කරවීම සඳහා ස්ථාපිත කරන ලද දෙවැනි අනු කාරක සභාවේ සභාපති ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය විසින් 2025.02.22 වැනි දින පවත්වන ලද අනු කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කරන ලද කරුණු සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් සිදුකරන ලදී.

ප්‍රවාහන කර්මාන්තය හා බැඳි අතිරේක සේවා නිර්මාණය කිරීම සඳහා ව්‍යාපෘති මාදිලි (Business Models) සැකසීම වෙනුවෙන් ස්ථාපිත කරන ලද අනු කාරක සභාව 2025.03.01 වැනි දින පැවැත්වීමට නියමිත බවත් ඉන්පසු එහි ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා වෙත දැනුම් දෙන බවත් උක්ත අනු කාරක සභාවේ සභාපති ගරු චතුරංග අබේසිංහ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයීය උපදේශ කාරක සභාව මගින් ස්ථාපිත කරන ලද අනු කාරක සභාවල, ඉදිරියේ දී පවත්වනු ලබන රැස්වීම් සඳහා අදාළ අනු කාරක සභාවේ සභාපතිවරයාගේ අනුමතිය මත පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඕනෑම මන්ත්‍රීවරයෙකුට සහභාගී වීමට අවස්ථාව ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කොළඹ වරායේ බහාලුම් නිෂ්කාශනය සඳහා සංසරණය වීමේ දී උද්ගතව ඇති අර්බුදය මැතකදීම වඩාත් සාකච්ඡාවලට ලක්වූ බැවින් ඒ සම්බන්ධයෙන් එළැඹි යෝජනා සහ ගත් තීරණ සම්බන්ධයෙන් සභාව වෙත පැහැදිලි කිරීමක් සිදුකරන ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත දැනුම් දෙන ලදී.

වරායෙන් පිටත සංසරණය වන බහාලුම් සහ ඇතුළත සංසරණය වන බහාලුම් වශයෙන් අංශ 02ක් ඔස්සේ මෙම බහාලුම් ගැටලුව සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතු බව ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රධානතම ගැටලුව වරායෙන් පිටතට සංසරණය වන බහාලුම් සම්බන්ධයෙන් උද්ගත වූ බවත් දිනකට බහාලුම් 2,000කට ආසන්න සංඛ්‍යාවක් පිටතට

සංසරණය වන බවත් ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙලෙස දිනකට වරායෙන් පිටතට සංසරණය වන සියලුම බහාලුම් රේගුව හරහා නිරීක්ෂණය නොවන බවත් බහාලුම් 400 - 600ත් අතර ප්‍රමාණයක් දෛනික රේගු පරීක්ෂාව සඳහා භාජනය වන බවත් ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පසුගිය කාලයේ සිදුකරන ලද ආනයන ප්‍රමාණයේ ඉහළ යාමත් සමඟ භෞතික වශයෙන් සිදුකරනු ලබන පරීක්ෂා සංඛ්‍යාව ඉහළ ගිය බවත් බහාලුම් නිෂ්කාශනයේ පැවැති දැඩි තදබදය අවම කිරීම සඳහා දෙවැනි තක්සේරුකරණයක් පවත්වා, අවදානම් තක්සේරුකරණ කමිටුවක් හරහා විශ්ලේෂණය කර, අවදානම කළමනාකරණය කළ හැකි කාණ්ඩයට අයත් වන බහාලුම් තෝරා මුදා හැරීමට කටයුතු කරන ලද අතර එකී සම්පූර්ණ ක්‍රියාවලියම නීත්‍යානුකූල අයුරින් සිදුවූ බවත් ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

බහාලුම් නිෂ්කාශන ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග කිහිපය අතර අලුතින් නිලධාරින් බඳවා ගැනීම සඳහා කටයුතු කිරීම, වරාය අභ්‍යන්තරයේ පවතින තදබදය වළක්වා ගැනීම සඳහා බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ අක්කර 02ක වපසරියක් තුළ නව අංගනයක් ඉදිකිරීම සිදු කළ බවත් නව අංගනයේ මෙහෙයුම් ඉදිරි දින කිහිපය ඇතුළත ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට අමතරව, දීර්ඝකාලීන වැඩපිළිවෙළ යටතේ ඉහත ගැටලුවට තිරසාර විසඳුමක් ලබාදීමේ අරමුණින් Port Community System යන ඩිජිටල්කරණ වැඩසටහන සම්බන්ධයෙන් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද බවත් ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

දුම්රියවල ගැටීමෙන් වන අලි මිය යෑම සම්බන්ධයෙන් පුවත් පසුගිය සමයේ දී වාර්තා වූ බවත් එවැනි සිදුවීම් ඉදිරියේ දී සිදුවීම වළක්වා ගැනීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට තිරසාර විසඳුමකට එළැඹීමට තීරණය කරන ලද බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීනගයා නම් දුම්රියෙහි ගැටීමෙන් වන අලි රැසක් මරණයට පත්ව ඇති බවත් හිඟුරක්ගොඩ - ගල්ඔය, ගල්ඔය - පලුගස් වැව, ගල්ඔය - කන්තලේ යන ස්ථාන අතර අනතුරු බහුල වශයෙන් සිදුව ඇති බවත් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

වන අලින් සිටී නම් පැහැදිලිව දර්ශනය වීම සඳහා එකී අනතුරු බහුලව සිදුවන ස්ථානවල කැලෑව එළිපෙහෙළි කර ඇති බවත් අදාළ ස්ථානවල දී දුම්රිය ගමන් වේගය අඩු කිරීමටත්, අලි ගැවසෙන කාල මගහැර මීනගයා දුම්රියෙහි ගමන් වාර සංශෝධනය කිරීමටත් කටයුතු කළ බවත් ශ්‍රී ලංකා දුම්රිය

දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, මීනගයා දුම්රිය කට්ටලයේ පවතින අඩුපාඩු හේතුවෙන් මාර්ගය පැහැදිලිව දර්ශනය නොවන බැවින් වෙනත් දුම්රිය කට්ටලයක් ඒ සඳහා කඩිනමින් යෙදවීමට නියමිත බව ද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

ගරු පරිසර අමාත්‍ය, ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍ය, පරිසරවේදීන්, වනජීවි දෙපාර්තමේන්තුව සහ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ඒකාබද්ධව පැවැත්වූ සාකච්ඡාවේ දී එළැඹි කෙටිකාලීන විසඳුම් ලෙස දුම්රිය රියදුරන්ට පැහැදිලිව මාර්ගය දිස්වන ලෙස දුම්රිය මාර්ග දෙපස කැලෑව එළි කිරීම, මහජනතාව සම්බන්ධ කර ගැනීම, සංවේදක (Sensor) සවිකිරීම, බයිපාස් පාර (Bypass Road), යටිමාර්ග (Underpass), ගුවන් පාලම් (Flyover) ඉදිකිරීම ආදිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, දුම්රිය මාර්ගයේ සිල්පර මතුපිට පෘෂ්ඨයට සමාන මට්ටමකින් පවතින පරිදි බැලන්ස් ගල් ඇතිරීමට කටයුතු කිරීම මඟින් වනඅලි මාර්ගයට අවතීර්ණ වීම දර්ශනය වන බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දුම්රිය සඳහා කැමරා පද්ධති සහ GPS තාක්ෂණය ලබාදී තිබුණ ද දුම්රිය රියදුරන් එම තාක්ෂණය භාවිතා නොකරන තත්ත්වයක් වාර්තා වීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

GPS සේවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතන සමඟ සාකච්ඡා සිදුකර ඇති බවත් එකී GPS සේවාව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, වනජීවීන් සම්බන්ධයෙන් දුම්රිය රියදුරන්, කාර්මිකයන් සහ දුම්රිය ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් මාර්තු මස ආරම්භයේ දී සිදුකිරීමට වනජීවි දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර ඇති බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

දුම්රිය නිලධාරීන්, පරිසරවේදීන් සහ දුම්රියෙහි ගැටී වන අලි ජීවිතක්ෂයට පත් වූ දිස්ත්‍රික්කවල මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් සමඟ මෙම වනඅලි දුම්රියවල ගැටීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත්, මෙතෙක් අදාළ මීනගයා දුම්රිය අනතුර හා සම්බන්ධ ප්‍රදේශයේ දුම්රිය මාර්ගය දෙපස ඇති කඳුගැට දෙක ඉවත් කිරීම සම්බන්ධයෙන් පරිසර වාර්තා සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් (GSMB) වාර්තා ලබාගෙන නොමැති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වනඅලි සම්බන්ධ ගැටලුවට පිළියමක් ලෙස වනඅලි හඳුනාගැනීම සඳහා යොදන GPS තාක්ෂණය සහිත කරපටි වන අලි රංචු සඳහා යොදාගැනීම සම්බන්ධයෙන් ගරු චතුරංග අබේසිංහ මහතා විසින් අදහස් පළ කරන ලදී.

තව ද, වනඅලි ගැවසෙන ස්ථාන සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව දත්ත පවතින බැවින් එම දත්ත දුම්රිය රියදුරන් වෙත

සම්ප්‍රේෂණය කිරීම මගින් වනඅලි දුම්රියෙහි ගැටීම් අවම කර ගැනීමට හැකි බව ගරු චතුරංග අබේසිංහ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ස්වභාවික උපක්‍රම භාවිතා කොට වනඅලි ගැටලුවට විසඳුම් ලබා ගත හැකි බවත් ඒ සඳහා මිනිස් ජනාවාස වෙත වනඅලි ප්‍රවේශවන ස්ථාන ආශ්‍රිතව මී මැසි වැට යොදා ගැනීම, දෙහි සහ තල් ආදී ශාක වගා කිරීම සිදු කළ හැකි බවත් ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විදේශ රටවල භාවිත වන පරිදි දියුණු තාක්ෂණික ක්‍රම යොදාගෙන දුම්රිය ගමන් මාර්ග අසල වනඅලින් ගැවසේ නම් ඒ සම්බන්ධයෙන් ස්වයංක්‍රීය පණිවුඩ අදාළ දුම්රිය රියදුරන් වෙත ලැබෙන ආකාරයේ තාක්ෂණික ක්‍රම යොදා ගත යුතු බවත් ඒ අනුව, දුම්රියෙහි වේගය ස්වයංක්‍රීයව පාලනය වන ආකාරයට දුම්රිය සේවා හා සම්බන්ධ තාක්ෂණය දියුණු කළ යුතු බවත් ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

කෙසේ වුව ද, තාක්ෂණික වශයෙන් අවශ්‍ය සහාය ලබාදිය හැකි වුවත්, එය ක්‍රියාත්මක කිරීමෙහිලා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අදාළ බලධාරී පාර්ශ්වය වෙතින් යම් පසුබෑස්මක් දක්නට ලැබෙන බවට ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දුම්රිය සේවාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් තත්කාර්ය කාරක සභාවක් (Ad hoc Committee) පිහිටුවනු ලබන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඒ අනුව, ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා, ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, ගරු රුවන්තිලක ජයකොඩි මහතා සහ ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතාගේ සාමාජිකත්වයෙන් යුතුව තත්කාර්ය කාරක සභාව පිහිටුවනු ලබන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රට වටා දුම්රිය මගීන්ගේ නිල සමූහයක් යනුවෙන් තරුණ කණ්ඩායමක් විසින් පිහිටුවා ගත් මුහුණු පොතෙහි (Facebook) සමූහයක් ඇති බවත් එමඟින් ලංකාවේ සියලුම දුම්රිය ගමන් වාර සම්බන්ධයෙන් යාවත්කාලීන වූ නිවැරදි තොරතුරු ලබාදෙන බවත් ගරු ප්‍රවාහන හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) ආයතනය සමඟ ඒකාබද්ධ වී මෙම සමූහය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා සම්බන්ධ කිරීමට අපේක්ෂා කරන බව ගරු ප්‍රවාහන හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4. වෙනත් කරුණු

### 4.1 කෝට්ටේ ප්‍රදේශයේ ධාවනය වන බස් රථ කිහිපයක ගමන් මාර්ග වරින්වර සංශෝධනය කිරීම - ගරු චතුරංග අබේසිංහ මහතා

කෝට්ටේ ප්‍රදේශයේ බස් රථ 07ක් පමණ ධාවනය වන ගමන් මාර්ගය පසුගිය වසර 20 තුළ කිහිපවරක් වෙනස් කොට ඇති බවත් ඒ හේතුවෙන් ප්‍රදේශ 03ක පමණ ජනතාවට කුලී රථ යොදාගෙන බස් රථ ගමන් කරන ප්‍රධාන මාර්ග වෙත පැමිණීමට සිදුව ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

118 /168 /172 යන මාර්ග අංක සහිත බස් ත්‍රිත්වය සඳහා පාසල් සහ රැකියා සඳහා යන එන කාලසීමාවන් ඇතුළත ගමන් මාර්ගයෙහි යම් වෙනස් කිරීමක් සිදු කරදෙන ලෙස ඉල්ලීම් ලැබී ඇති බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

බස්නාහිර පළාත් සභාව හරහා පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් ධාවනය වන බස් රථ මෙම ගමන් මාර්ගවල අදාළ කාර්යබහුල කාලසීමාවන් තුළ වැඩි වශයෙන් ධාවනය කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන බවට ප්‍රවාහන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, මෙම ගමන් මාර්ගවල බස් රථ ගමනාගමනය වරින් වර සංශෝධනය සිදුකරන ලද්දේ කුමන හේතු මත පදනම්ව ද යන්න පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

අදාළ ප්‍රදේශ තුළ බස් ධාවනය කිරීම සඳහා අවසරපත් ලබා දෙනුයේ බස්නාහිර පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහනය අධිකාරිය මගින් බැවින් ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන්ගෙන් විමසීමක් සිදුකර පිළිතුරු ලබාදෙන බව ප්‍රවාහන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.2 ගරු දේවානන්ද සුරවීර මහතා

### 4.2.1 කොළඹ ඇතැම් ප්‍රදේශ තුළ ශ්‍රී ලංගම බස් රථ ධාවනය නොවීම

119 බස් මාර්ගය, මත්තේගොඩ මාර්ගය, රුක්මලේ මාර්ගය සහ කොට්ටාව - මාලඹේ මාර්ගයෙහි ශ්‍රී ලංගම බස් රථ කිහිපයක් ධාවනයේ යෙදුණු බවත් මේ වන විට කිසිදු ලංගම බස් රථයක් අදාළ මාර්ගවල ධාවනය නොවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කොළඹ ඇතැම් ප්‍රදේශ තුළ පෙර ධාවනය වූ බස් මේ වන විට ධාවනය නොවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පැමිණිලි ලැබී ඇති බවත් ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරමින් පවතින බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.2.2 ශ්‍රී ලංකා නැව් සංස්ථාව සතුව පැවති නැව්වල වත්මන් තත්ත්වය

ශ්‍රී ලංකා නැව් සංස්ථාව සතුව නැව් 02ක් පැවැති නමුත් 2016 සිට අදාළ නැව් 02 වෙනත් ආයතනයක් වෙත ලබා දී ඇති බැවින් එකී නැව් දෙකෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් බලශක්ති අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඇති බවත් අදාළ නැව් 02 එම සමාගමෙන් නැවත ලබාගෙන ගල්අඟුරු ප්‍රවාහනය සඳහා යෙදවීමට අපේක්ෂා කරන බවත් ගරු වරාය හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.3 ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

### 4.3.1 වවුනියාවේ සිට කිඩාච්චූරි සහ වවුනියාවේ සිට සේමමඩු දක්වා ධාවනය වන ශ්‍රී ලංගම බස් රථ එකී මාර්ගවල ධාවනය නතර කිරීමෙන් ජනතාව පත්ව ඇති අපහසුතාව

වවුනියාවේ සිට කිඩාච්චූරි දක්වා සහ වවුනියාවේ සිට සේමමඩු දක්වා ධාවනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ මේ වන විට එකී මාර්ගවල ධාවනය කිරීම නතර කර ඇති බවත් ඒ හේතුවෙන් පාසල් සිසුන් සහ රැකියා සඳහා යන ජනතාව අපහසුතාවට පත්ව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.3.2 වවුනියාව සිට මන්නාරම දක්වා ධාවනය වන ශ්‍රී ලංගම බස් රථය සම්බන්ධ ගැටලුව

පෙ.ව. 6.00ට වවුනියාව සිට මන්නාරම දක්වා ධාවනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථය දිගු වේලාවක් බස් නැවතුම්වල නවතා තබාගෙන සිටීම හේතුවෙන් මඟීන් අපහසුතාවයට පත්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 4.3.3 කනකරායන්කුලම් සිට වවුනියා මාර්ගයේ ධාවනය වන ශ්‍රී ලංගම බස් රථවලට පාසල් සිසුන් ඇතුළු කර නොගැනීම

කනකරායන්කුලම් සිට වවුනියා මාර්ගයේ ධාවනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථවලට පාසල් සිසුන් ඇතුළු කර නොගැනීම සම්බන්ධයෙන් වාර්තා වන බවත් ඒ හේතුවෙන් එම සිසුන් දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් වාර්තා වී ඇති බැවින් ඉදිරියට මෙවැනි සිදුවීම් වාර්තා වුවහොත් අදාළ පුද්ගලයින්ට එරෙහිව පියවර ගන්නා බවත් 1958 යන ක්ෂණික දුරකථන අංකයට ඇමතීමෙන් එම සිදුවීම් සම්බන්ධයෙන් වාර්තා කළ හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.4 කැලිප්සෝ දුම්රිය හපුතලේ දක්වා දීර්ඝ කිරීම සඳහා පියවර ගැනීම - ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

සංචාරක කර්මාන්තය නගා සිටුවීමේ එක් පියවරක් වශයෙන් බණ්ඩාරවෙල තෙක් පැමිණෙන කැලිප්සෝ දුම්රිය හපුතලේ දක්වා දීර්ඝ කිරීමට කටයුතු සම්පාදනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.5 කාපට් ලක්ෂයේ ව්‍යාපෘතිය සහ i-road ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය - ගරු කෝසල නුවන් ජයවීර මහතා

කාපට් ලක්ෂයේ ව්‍යාපෘතිය සහ i-road ව්‍යාපෘතිය සඳහා පළාත් සභාවට අයත් මාර්ග රැසක් පවරාගෙන ඇති බවත් එකී ව්‍යාපෘති ද්විත්ත්වයම මෙතෙක් අවසන් කර නොමැති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී නොයෙක් අක්‍රමිකතා සිදුවී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම මාර්ග මේ වනවිට දැඩි ලෙස අබලන් තත්ත්වයට පත්ව ඇති බවත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතට අදාළ මාර්ග අයත් බැවින් පළාත් සභා මගින් එකී මාර්ග පිළිසකර නොකරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පසුගිය සමයේ ඇති වූ ආර්ථික බිඳවැටීමත් සමඟම ආසියානු සංවර්ධන බැංකුව මගින් අයිරෝඩ් ව්‍යාපෘතිය (i-road project) සඳහා ලබා දුන් ණය අත්හිටුවීම නිසා එම ව්‍යාපෘතිය නැවැත්වීමට සිදුවූ බවත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ලබා දුන් උපදෙස් මත අදාළ ව්‍යාපෘති ඇරඹූ මාර්ග පෙර එකී මාර්ග අයත් වූ පළාත් පාලන ආයතන වෙත නැවත භාරදීමට මේ වන විට කටයුතු කර ඇති බවත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, ප්‍රතිපාදන නොලැබීම මත කිලෝමීටර් ලක්ෂයේ ව්‍යාපෘතියේ ද වැඩකටයුතු නතර කර ඇති බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘති සඳහා යොදා ගන්නා ලද මාර්ග, අදාළ ව්‍යාපෘති සඳහා තෝරාගත් පදනම, එම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබී තිබේ ද ආදී වශයෙන් එක් එක් දිස්ත්‍රික්ක වශයෙන් වාර්තාවක් ඉදිරි කාරක සභා රැස්වීම සඳහා ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලදී.

**4.6 රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පියවර ගැනීම - ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

රත්නපුර ප්‍රදේශයේ ප්‍රවාහන පහසුකම්වල යම් පසුගාමී තත්ත්වයක් පවතින බවත් කොළඹ - බදුල්ල සහ කොළඹ- හම්බන්තොට යන ප්‍රධාන මාර්ග රත්නපුර හරහා වැටී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සංචාරක කර්මාන්තය සහ මැණික් කර්මාන්තය නඟා සිටුවීමෙහි එක් පියවරක් ලෙස රත්නපුර අධිවේගී මාර්ගය ඉදිකිරීම ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය මත මෙවැනි ඉදිකිරීම් සිදු කිරීම සඳහා මේ වනවිට ණය පහසුකම් ලබාගත නොහැකි බැවින් රටෙහි ආර්ථික තත්ත්වය යහපත් වීමත්, ලංකාවට විදෙස් රටවලින් ණය ලබා ගැනීමට හැකියාව ලැබීමත් යන කරුණු මත රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම් කටයුතු ආරම්භ වන දිනය තීරණය වනු ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.7 කුකුලේගඟ ජල ව්‍යාපෘතියට අයත් මෝල්කාව සිට කෙලින්කන්ද දක්වා වන මාර්ගය නඩත්තු කිරීම - ගරු ධනුෂ්ක රංගනාත් මහතා**

අගලවත්ත සහ බුලත්සිංහල අතර කුකුලේගඟ ජල ව්‍යාපෘතිය පවතින බවත් මෙම ප්‍රදේශ අතර මෝල්කාව සිට කෙලින්කන්ද දක්වා පවතින මාර්ගයේ හිමිකාරීත්වය කුකුලේගඟ ජල ව්‍යාපෘතියට පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ ව්‍යාපෘතිය මගින් මෙකී මාර්ගයේ නඩත්තු කටයුතු සිදු නොකරන බැවින් දැඩි ලෙස අබලන් වී ඇති එම මාර්ගයේ මාරක රිය අනතුරු කිහිපයක් වාර්තා වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, අදාළ මාර්ගය කුකුලේගඟ ව්‍යාපෘතිය වෙතින් මාර්ග සංවර්ධන අධිකාරියට පවරාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම මාර්ගය A හෝ B වර්ගයේ ප්‍රධාන මාර්ගයක් නොවන බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.8 රියදුරු සහ කොන්දොස්තර හිඟය හේතුවෙන් ශ්‍රී ලංගම බස් රථ ප්‍රමාණවත් පරිදි ධාවනය නොවීම - ගරු නලින් හේවගේ මහතා**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සතුව බස් රථ පැවතිය ද රියදුරු සහ කොන්දොස්තරවරුන්ගේ හිඟය හේතුවෙන් බස් රථ ප්‍රමාණවත් පරිදි ධාවනය නොවන තත්ත්වයක් වාර්තා වන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙකී ගැටලුව බොහෝ විට ග්‍රාමීය ප්‍රදේශවල බස් රථ ධාවනය සම්බන්ධයෙන් වාර්තා වන බවත් දුරබැහැර ප්‍රදේශ සඳහා ශ්‍රී ලංගම බස් රථ යෙදවීමේ දී අදාළ ප්‍රදේශය තුළින් ම රියදුරන් බඳවා ගැනීම වඩාත් ප්‍රායෝගික බව පෙනී යන බැවින් ඉදිරියේ දී සිදුකරන නව බඳවා ගැනීම් සඳහා එකී කරුණට ප්‍රමුඛතාවක් ලබාදීමට අපේක්ෂිත බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.9 විනය ක්‍රියාමාර්ග මත රැකියා අත්හිටුවන ලද ලංගම රියදුරු සහ කොන්දොස්තරවරුන් සම්බන්ධයෙන් ප්‍රායෝගික විසඳුමකට එළැඹීම - ගරු චන්දන සූරියආරච්චි මහතා**

විවිධ හේතූන් මත රැකියා අත්හිටුවන ලද රියදුරන් සහ කොන්දොස්තරවරුන් සිටින බැවින් ඔවුන්ට ඇති චෝදනා නැවත සලකා බලා එකී රියදුරන් සහ කොන්දොස්තරවරුන් සම්බන්ධයෙන් ප්‍රායෝගික විසඳුමකට එළැඹෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රියදුරු සහ කොන්දොස්තරවරුන්ගේ ව්‍යාප්තිය අනුව අතිරික්ත සේවකයින් සහිත ස්ථානවලින් සේවකයින් හිඟ ස්ථානවලට අනුයුක්ත කිරීම, විනය ක්‍රියාමාර්ගවලට යටත්ව ඇති සේවක ලිපිගොනු සම්බන්ධ කටයුතු කඩිනමින් අවසන් කිරීම සහ අවුරුදු 60ට අඩු විනය ක්‍රියාමාර්ගවලට අවම වශයෙන් ලක් වූ සේවකයින් නැවත බඳවා ගැනීමට කටයුතු කිරීම යන කරුණු 03ක් පිළිබඳ මෙහිදී අවධානය යොමු කොට කටයුතු කරන බවට ගරු ප්‍රවාහන හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.10 කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නිල - කුලියාපිටිය මාර්ගයෙහි පෞද්ගලික බස් රථ පමණක් ධාවනය වීම - ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නිල - කුලියාපිටිය මාර්ගයෙහි මේ වනවිට පෞද්ගලික බස් රථ පමණක් ධාවනය වන බවත් පෞද්ගලික බස් රථ හිමියන්ගේ යම්කිසි ඒකාධිකාරයක් මත ලංගම බස් රථ ධාවනය වීම වැළැක්වීමේ සැලසුමක් මෙම ප්‍රදේශයෙන් වාර්තා වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ලෙස තමා ගිරිඋල්ල ඩිපෝව නිරීක්ෂණය කළ බවත් සේවක හිඟය හේතුවෙන් බස් රථ ධාවනය නොවන තත්ත්වයක් වාර්තා වූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් පෙර සඳහන් කළ පරිදි රියදුරන් සහ කොන්දොස්තරවරුන් පිළිබඳ ගන්නා ක්‍රියාමාර්ග අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින්

කටයුතු කරනු ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.11 කිරිදිවැල බස් නැවතුම්පොළෙහි ඉදිකර ඇති ගොඩනැගිල්ල නිසි පරිදි නඩත්තු නොවීම - ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

කිරිදිවැල බස් නැවතුම්පොළෙහි ඉදිකර ඇති විශාල ගොඩනැගිල්ල දැඩි ලෙස හානියට පත්ව ඇති බවත් එහි හිමිකම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.12 මඩකලපුව නගරයේ කිරාන් පාලම ගංවතුරට යටවීම සම්බන්ධයෙන් පියවර ගැනීම - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

මඩකලපුව නගරයේ කිරාන් පාලම නිරතුරුව ගංවතුරට යටවන තත්ත්වයක් දක්නට ලැබෙන බැවින් ඒ සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට කටයුතු කරන බවට ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.13 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**4.13.1 වලුක්කායි ආරු, අරාලි, වේලනෛ, පුංගුඩුතීවු, කුරිකට්ටුවාන් යන ගම්මාන හරහා වැටී ඇති මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දැමීම සම්බන්ධ පියවර ගැනීම**

යාපනයේ දිස්ත්‍රික්කයේ වලුක්කායි ආරු, අරාලි, වේලනෛ, පුංගුඩුතීවු, කුරිකට්ටුවාන් යන ගම්මාන හරහා වැටී ඇති මාර්ගයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අතරමඟ නවතා දමා ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**4.13.2 මුරුකණ්ඩි, අක්කරායන්, වන්නේරික්කුලම්, ජයපුරම්, කිරාන්චි, වේරවිල්, වලෙයිපාඩු, පාලාවි යන ගම්මාන හරහා වැටී ඇති මාර්ගය අධිවේගී මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම**

මුරුකණ්ඩි, අක්කරායන්, වන්නේරික්කුලම්, ජයපුරම්, කිරාන්චි, වේරවිල්, වලෙයිපාඩු, පාලාවි යන ගම්මාන හරහා වැටී ඇති මාර්ගය අධිවේගී මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වලෙයිපාඩු මාර්ගය සෑදීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවත් වේලනෛ මාර්ගය ඉදිකිරීමට ද උතුරු පළාත සඳහා වෙන්කොට ඇති ප්‍රතිපාදන මත හැකියාව ලැබෙන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී .

ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා මෙවර අයවැයෙන් විශාල මුදලක් වෙන් කොට ඇති බවත් ගම්වාසීන්ගෙන් සහ ග්‍රාමීය සමිති වෙතින් යෝජනා ලබාගෙන අදාළ යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙතින් අනුමත කර මාර්තු 05 වැනි දිනට පෙර අමාත්‍යාංශ ලේකම් වෙත ලැබීමට සලස්වන ලෙස දැනුම් දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**5.** කාරක සභාව ප.ව. 3.55ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 මාර්තු මස 04**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (සභාපති)
ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය)
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු ඔෂානි උමංගා මහත්මිය
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු අරුණ පනාගොඩ මහතා
ගරු විජේසිරි බස්නායක මහතා
ගරු සුනිල් රාජපක්ෂ මහතා
ගරු තිළිණ සමරකෝන් මහතා
ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු රවී කරුණානායක මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු තිලංක යූ. ගමගේ මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු නන්දන පත්මකුමාර මහතා
ගරු නිශාන්ත පෙරේරා මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු අරවින්ද සෙනරත් මහතා

**1. ගරු සභාපතිතුමාගේ නිවේදන**

අමාත්‍යාංශය යටතේ තිබෙන සෑම ආයතනයක්ම නියෝජනය කරන නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ යෙදී සිටින නමුත් ප්‍රාදේශීය කර්මාන්තකරුවන්ට පහසුකම් සැපයීම තවමත් ප්‍රමාණවත් මට්ටමින් සිදු නොවන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික් ලේකම් යටතේ දිස්ත්‍රික් කර්මාන්ත සභාව කැඳවීම සිදුකරන අතර එම කමිටුවේදී ප්‍රාදේශීය මට්ටමින් පවතින කර්මාන්ත සම්බන්ධ සියලු ගැටලු නිරාකරණය කරගැනීමට අවස්ථාව ලැබෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැනට දිස්ත්‍රික් මට්ටමේ කර්මාන්තකරුවන් හමුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බවත් එහි අරමුණ දිස්ත්‍රික් කර්මාන්ත කමිටුව නිසි ලෙස පෙළගස්වා ගැනීම බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

දැනට හම්බන්තොට සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල මෙය ක්‍රියාත්මක කරන බවත් දිස්ත්‍රික් කර්මාන්තකරුවන් මේ සඳහා සහභාගි කරවීම ගරු මන්ත්‍රීවරුන්ගේ වගකීමක් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ව්‍යවසායකයන්ගේ ගැටලු දිස්ත්‍රික් මට්ටමෙන් සහ ප්‍රාදේශීය මට්ටමින් විසඳා ගතහොත් ජාතික මට්ටමට පැමිණෙන ගැටලු සංඛ්‍යාව අවම කර ගත හැකි බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට තවදුරටත් දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික් කර්මාන්ත සම්බන්ධීකරණ කමිටුව දිස්ත්‍රික් ලේකම් සහ පළාත් ලේකම්ගේ සම සභාපතිත්වයෙන් රැස්වන බවත් ඒ සඳහා දේශපාලන අධිකාරිය ද සම්බන්ධ කරගැනීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ද ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන කමිටු ස්ථාපිත කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ට මෙම කමිටු සම්බන්ධව මඟපෙන්වීමක් ලබා දී ඇති බවත් එම කර්මාන්ත කමිටු රත්නපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ස්ථාපිත කළ බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ගම්පහ ප්‍රදේශයේ ද එම කමිටු පිහිටුවීමට සියලු කටයුතු සම්පාදනය කරමින් යන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී තවදුරටත් සාකච්ඡා කර ගරු අමාත්‍යතුමා හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් අනුව ප්‍රාදේශීය මට්ටමින් මෙම කර්මාන්ත සංවර්ධන කමිටු තවදුරටත් ව්‍යාප්ත කිරීමට අදහස් කරන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කමිටුව සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ සහභාගීත්වය පිළිබඳ ගරු අරුණ පනාගොඩ මහතා විසින් විමසීමක් කරන ලදී.

මෙම කමිටුව සඳහා ඉඩම් සම්බන්ධ කටයුතුවලට අදාළ සියලුම ආයතන, ලංකා විදුලිබල මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බැංකු නිලධාරීන්, දිස්ත්‍රික් කර්මාන්ත කමිටුවට අදාළ ප්‍රාදේශීය ලේකම්වරු හෝ දිස්ත්‍රික් ලේකම්වරු හා කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරීන් ද සහභාගී වන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බිම් මට්ටමේ කර්මාන්තයක් ආරම්භ කිරීමේ දී ඇතිවන ගැටලු නිරාකරණය කර ගැනීමටත් කර්මාන්ත ආරම්භ කර ගැනීමට ප්‍රමාදයන් වැළැක්වීමට මෙම කමිටු ගොඩනඟා ඇති බවත් එය විද්‍යුත් ක්‍රමවලින් දියුණු කර ප්‍රාදේශීය වශයෙන් අනුකමිටු පවා පත්කරගත හැකි ස්ථිර යාන්ත්‍රණයක් බවට පත්කර ගැනීම පිළිබඳව ඉදිරියේ දී සැලසුම් කරගත හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වෙනත් අමාත්‍යාංශ සහ ආයතන මෙම කමිටු සඳහා සම්බන්ධ කර ගැනීමෙන් මෙම ක්‍රියාදාමය ශක්තිමත් කරගත හැකි බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ගේ ගැටලු කාරක සභාවේ ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන ලදී.

එළැඹෙන කාරක සභා රැස්වීමේ දී කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ එක් එක් ආයතනවල කාර්යභාරය පිළිබඳව කෙටි හැඳින්වීමක් සහිත ඉදිරිපත් කිරීමක් (Presentation) සිදු කිරීමට සූදානම් වන ලෙස ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටින නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

එමෙන්ම, ගරු මන්ත්‍රීවරුන් වෙත එම තොරතුරු සහ සම්බන්ධීකරණ තොරතුරු ඇතුළත් පත්‍රිකාවක් පසුව ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දඹදෙණිය ප්‍රදේශයේ තල් ගසේ කොළය ආශ්‍රිතව තේ පැකට් නිෂ්පාදනය කිරීමේ නිෂ්පාදන ගම්මානයක් ඉදිකර ඇති බවත් එම නිෂ්පාදන අපනයනය කිරීම තවදුරටත් ඉහළ නැංවීම සඳහා අවධානය යොමු කරන ලෙසත් ගරු විජේසිරි බස්නායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශයට අයත් ආයතන විද්‍යාත්මක ක්‍රමවේදයකට පෙළගස්වා ඇති බවත් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, අපනයන සේවා මණ්ඩලය, ඛනිජ වැලි ක්ෂේත්‍රයට අයත් ආයතන ආදිය මෙම අමාත්‍යාංශයට එක්වූ නව ආයතන වන බවත් අමාත්‍යාංශය පිළිබඳව කෙටි හැඳින්වීමක් ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික වාර්තා සලකා බැලීම**

**2.1 2020/2021 වර්ෂය සඳහා මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්**
(2024.12.18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**2.2 2015/2016 වර්ෂය සඳහා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තාව**
(2025.01.08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**2.3 2023 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව**
(2025.01.21 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**2.4 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව**
(2025.02.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**2.5 2022 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව**
(2025.02.18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

වාර්ෂික වාර්තා සඳහා ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති වාර්තාවේ අඩංගු නිරීක්ෂණ පිළිබඳව තවදුරටත් සැලකිලිමත් වන ලෙසත් එම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියලු නිලධාරීන්ට දැනුම් දෙන ලදී.

වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන විට නොපමාව එම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පාර්ලිමේන්තුව විසින් කාරක

සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වීමට තීරණය කළාය.

කාරක සභාව, එකී වාර්ෂික වාර්තා පිළිබඳව කාරක සභාවේ මෙම වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් 2025 මාර්තු මස 11 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 3. වෙනත් කරුණු

### 3.1 ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

#### 3.1.1 අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුහුණු වැඩසටහන්

අපනයන සංවර්ධන මණ්ඩලය සම්බන්ධ කරගනිමින් හඳුනාගත් ව්‍යවසායකයන් කිහිපදෙනෙකු සමඟ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දී සිදුකළ සාකච්ඡාවේ දී ඉදිරියේ දී සිදු කිරීමට නියමිත පුහුණු වැඩසටහනෙහි ඉදිරි පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශවල නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් අපනයනකරුවන් හඳුනාගැනීමේ ක්‍රමවේදය පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුළුව දැනටමත් ක්‍රියාත්මක කර ඇති බවත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ අපනයන සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් දියුණු කිරීමට දැනටමත් කටයුතු කර ඇති බවත් අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලිපියක් නිකුත් කර ඇති බවත් මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ගරු මන්ත්‍රීවරුන් සහභාගී කර ගැනීමට අදහස් කරන බවත් අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙලෙස දියුණු කරන ලද ව්‍යාපෘතිය 2025.03.14 වැනි දින වන විට ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති බවත් කුරුණෑගල දිස්ත්‍රික් මට්ටමෙන් හඳුනාගත් ව්‍යවසායකයන් 94 දෙනෙකු පිළිබඳ තොරතුරු එම දිස්ත්‍රික් කාර්යාලය මඟින් නිරීක්ෂණය කරමින් පවතින බවත් අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 3.1.2 කර්මාන්තකරුවන්ට ණය ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමිකරුවන් ආර්ථික අර්බුදය හේතුවෙන් දැඩි බලපෑමකට ලක්ව ඇති බැවින් මෙම කර්මාන්තය නැවත ආරම්භ කිරීමට හෝ ඉදිරියට පවත්වාගෙන යාමට යම් ණය ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බොහෝ ව්‍යවසායකයින් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ ද ඒ සඳහා ණය පහසුකම් නොලැබෙන බවත් මේ සඳහා මඟපෙන්වාදීමක් හෝ උපදෙස් ලබාදීමක් අවශ්‍ය බැවින් ඒ සඳහා කර්මාන්ත හා ව්‍යයසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් යම් නිලධාරී මණ්ඩලයක් පත්කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

රේඛීය අමාත්‍යාංශයේ කාර්යභාරය පුළුල් පරාසයක විහිදෙන බැවින් කර්මාන්ත ක්ෂේත්‍රය පමණක් නොව කෘෂිකර්ම, ධීවර වැනි විවිධ ක්ෂේත්‍රවලට

අයත් ගැටලු රාශියක් විසඳීමට මෙමඟින් හැකි වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යම් කර්මාන්තයක් පිළිබඳ අදහසක් ඇත්නම් ප්‍රායෝගික තත්ත්වයක් දක්වා දියුණු කිරීමට අදාළ මාර්ගෝපදේශ ඇතුළත් වැඩපිළිවෙළක් සකස් කර ඇති බවත් එය මසක් පමණ ඇතුළත ජනගත කළ හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්තකරුවන් අදාළ ආයතනය වෙත නිවැරදිව යොමුකිරීම සඳහා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කාර්යභාරය පිළිබඳව අවබෝධයක් ඔවුන්ට ලබාදීමට බලාපොරොත්තු වන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පේෂ කර්මාන්තය සහ අත්කම් නිර්මාණය වැනි ක්ෂේත්‍රවල නියැලෙන සම්ප්‍රදායික කර්මාන්තකරුවන් තමාගේ කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා යොමු විය යුතු අනුබද්ධිත ආයතන පිළිබඳව අවබෝධයක් මෙමඟින් ලබාදිය හැකි බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

කර්මාන්ත සම්බන්ධ යෝජනා ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය වෙත භාරදිය හැකි බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ගෘහාශ්‍රිත සුළු පරිමාණ කර්මාන්ත සඳහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහාය ලබා ගත හැකි බවත් නව අදහසක් දියුණු කිරීම පිළිබඳව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (NEDA) සහාය ලබා ගත හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එමෙන්ම, අපනයන සම්බන්ධ නිෂ්පාදන දියුණු කරගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ලබා ගත හැකි බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉහත සඳහන් කරන ලද ආයතන නියෝජනය කරන නිලධාරීන් ඉදිරියේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දී හමුවී එම නිලධාරීන් සමඟ කර්මාන්ත ක්ෂේත්‍රවල පවතින ගැටලු පිළිබඳ සාකච්ඡා කළ හැකි බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ණය අර්බුදය පිළිබඳව රජයේ අවධානය යොමුව ඇති බවත් රු. මිලියන 5ට අඩු ණය බරක් ඇති ව්‍යාපාරවලට අවුරුද්දක සහන කාලයක් ලබා දී ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තම කර්මාන්තය ඉදිරියට කරගෙන යාම සඳහා යම් මුදලක් අවශ්‍ය බවට පිළිගත හැකි ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළහොත් ඒ සඳහා රු. මිලියන 05ක ණයක් ලබාදෙන බවත් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (National Enterprise Development Authority - NEDA) සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ (Small Enterprises Development Division - SED) නිලධාරීන් හා සම්බන්ධ වී එම කටයුතු වඩාත් සාර්ථක කරගත හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගරු තිළිණ සමරකෝන් මහතා ද මේ සම්බන්ධයෙන් අදහස් පළ කරන ලදී.

මෙම ප්‍රාදේශීය ආයතන සහ බැංකු සමඟ සාකච්ඡා කර ගැටලු රාශියක් විසඳාගත හැකි බවත් ඒවා විසඳා ගැනීමට හැකියාවක් නොමැති නම් පමණක් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වෙත කර්මාන්තකරුවන් යොමු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දෙන ලදී.

ගරු නිහාල් ගලප්පත්ති මහතා ද ලුණු කර්මාන්තශාලා හා බැඳුණු ගැටලු සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ඉංජිනේරුවන් සහ සහායකයින්ගෙන් යුත් කණ්ඩායමක් විසින් කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාව පරීක්ෂාවට ලක් කළ බවත් එහි තිබෙන ඇතැම් යන්ත්‍ර සූත්‍ර නැවත භාවිතයට ගත හැකි ලෙස පිළිසකර කළ හැකි බවත් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීළඟ මාස 06 තුළ අදාළ යන්ත්‍ර සූත්‍ර පිරිසිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ඉන්පසු මාස 06ක් ඇතුළත මෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.2 රත්නපුර දිස්ත්‍රික්කය තුළ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පවතින ගැටලු විසඳාගැනීම - ගරු සුනිල් රාජපක්ෂ මහතා**

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ මධ්‍යස්ථානය රත්නපුර දිස්ත්‍රික්කය වන බැවින් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති සමඟ මසකට වරක් රැස්වීමක් රත්නපුරේ දී පැවැත්වීමට සුදුසු බවට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

පවතින රාජකාරිමය කටයුතු හේතුවෙන් මසකට වරක් රැස්වීම අපහසු වුවත් හැකි සෑම අවස්ථාවකදීම අදාළ කර්මාන්තකරුවන් හා සාකච්ඡා කිරීමට කටයුතු කරන බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික් කර්මාන්ත සභාව පිහිටුවා ගතහොත් මෙවැනි ගැටලු රාශියක් ප්‍රාදේශීය වශයෙන් විසඳාගත හැකි බවත් ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සහ පතල් කැණීම් කාර්යාංශය වැනි ආයතන කැඳවා දිස්ත්‍රික් කර්මාන්ත කමිටු සහ ප්‍රාදේශීය අනුකමිටු පිහිටුවා ගැනීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කොළඹ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මාස එකහමාරකට වරක්වත් රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය හරහා විසඳා ගැනීමට නොහැකි වන තරමට ගැටලු බොහෝ ප්‍රමාණයක් පවතින බැවින් කොළඹ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ ගරු අමාත්‍යතුමා වෙත ගැටලු ඉදිරිපත් කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මැණික් කර්මාන්තය හා බැඳුණු විවිධ ගැටලු සඳහා ක්ෂණික විසඳුම් නොමැති බවත් එක් ප්‍රදේශයකට විශේෂිත වූ කර්මාන්තයක් බැවින් දිස්ත්‍රික්කය තුළම

එම ගැටලු විසඳීම සඳහා වැඩපිළිවෙළක් අවශ්‍ය බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.3 වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාව නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාව නිසියාකාරයෙන් ක්‍රියාත්මක නොවීම පිළිබඳව සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විට කඩදාසි කර්මාන්ත ශාලාවේ අලුත්වැඩියා කටයුතු සිදුකර නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබෙන බවත් ඉදිරියේ දී සිදුකිරීමට යෝජිත ව්‍යාපෘති සඳහා ආයෝජන කැඳවීමට තීරණය කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය ආයතනවලින් ඉවත දමන කඩදාසි ලබාගෙන ප්‍රතිචක්‍රීකරණය කර කඩදාසි නිපදවන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙහි නිෂ්පාදන කටයුතු ජනවාරි මාසයේ සිට ආරම්භ කරන ලද බවත් මාසයකට කඩදාසි ටොන් 200ක් පමණ නිපදවන බවත් සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කර්මාන්තශාලාවේ සියලුම අලුත්වැඩියා කටයුතු සිදුකිරීමෙන් පසු ඉදිරි මාස 03 තුළ කඩදාසි ටොන් 300ක් පමණ නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන බව ද සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මසකට කඩදාසි ටොන් 200ක් නිෂ්පාදනය කරන මෙම අවස්ථාවේ කර්මාන්තශාලාවේ සේවක වැටුප්, විදුලි බිල් ඇතුළු සියලු නිෂ්පාදන වියදම් දරා සමතුලිත මට්ටමකින් පවත්වා ගෙන යා හැකි බව ද සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සෙලියුලෝස් සහිත අමුද්‍රව්‍යවලින් කඩදාසි නිෂ්පාදනය සිදුකිරීමට ඇති හැකියාව පිළිබඳ ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විට විභාග දෙපාර්තමේන්තුවෙන්, උසාවි සහ විශ්වවිද්‍යාලවලින් ලබාදෙන ඉවතලන කඩදාසි ප්‍රතිචක්‍රීකරණය කිරීම පමණක් මෙම කර්මාන්තශාලාව තුළ සිදුකරන බව සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කඩදාසි නිෂ්පාදනය කරන අමුද්‍රව්‍ය පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

පිදුරු යොදාගනිමින් කඩදාසි නිෂ්පාදන කළ පාරිසරික ගැටලු පැන නැගීම මත එම ක්‍රියාවලිය අඩපණ වූ බව සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

සෙලියුලෝස් අඩංගු ඕනෑම අමුද්‍රව්‍යයකින් වර්තමානයේ දී විවිධ රටවල් කඩදාසි නිෂ්පාදනය කරනු ලබන හෙයින් ජපන් ජබර, මාන සහ ඉලුක් වැනි

ශාකවලින් කඩදාසි නිපදවීමට ඇති හැකියාව පිළිබඳව සලකා බලන ලෙස ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජපන් ජබර, මාන සහ ඉලුක් වැනි අමුද්‍රව්‍ය යොදා ගනිමින් සිදු කරනු ලබන්නේ ගෘහාශ්‍රිත ස්වයං රැකියා වැනි කටයුතු බැවින් මහා පරිමාණ නිෂ්පාදන කටයුතු සඳහා ඒවා යොදා ගැනීමට අපහසුතා මතුවන බවත් ගරු මන්ත්‍රීතුමාගේ අදහස පිළිබඳව ඉදිරියේ දී සලකා බලන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.4 ගරු අරුණ පනාගොඩ මහතා

### 3.4.1 කර්මාන්තපුරය ගිනිගැනීම සම්බන්ධව

හෝමාගම පිහිටි කර්මාන්තශාලාවක් හදිසි ගිනි ගැනීමකට ලක්වූ අවස්ථාවේදී එම ගින්න මැඩ පැවැත්වීම සඳහා කිසිදු ගිනි ආරක්ෂණ ක්‍රමවේදයක් නොතිබීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්තපුර තුළ පවතින අවිධිමත් ගිනි නිවාරණ පද්ධතිය පිළිබඳව සහ කර්මාන්තපුර හා බැඳුණු ඉඩම් ගැටලු පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කටුවාන ප්‍රදේශයේ ඇති කර්මාන්තශාලාවක් තුන් වරක් පමණ ගිනිගෙන ඇති බවත් මෙම ගිනි ගැනීම් නිසා පාරිසරික ගැටලු රැසක් මතුවී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

හොරණ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තශාලා ගිනිගැනීම් පිළිබඳ විශේෂ අවධානයක් යොමුකළ යුතු බවට ගරු ඔෂානි උමංගා මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව අමාත්‍යාංශය යටතේ කර්මාන්තපුර 34ක් ක්‍රියාත්මක වන බවත් තවත් කර්මාන්තපුර 08ක් සංවර්ධනය කරගෙන යන බවත් අතිරේක ලේකම් (කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉංගිරිය ප්‍රදේශයේ අක්කර 250ක් පමණ වූ කර්මාන්තපුරයක් ඉදිකිරීමට සාකච්ඡා කරමින් පවතින බව ද අතිරේක ලේකම් (කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගිනිගැනීම් ඇතිවී තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් කර්මාන්තශාලාවල සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තශාලාවල බවත් එම ගිනිගැනීම් නිසා පරිසර පද්ධතියට දැඩි බලපෑමක් ඇතිව තිබෙන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්තශාලා නඩත්තු කර ගැනීම සහ ඉදිරියට පවත්වා ගැනීමට නිසි ක්‍රමවේදයක් නාගරික සංවර්ධන අධිකාරියට නොමැති වීම හේතුවෙන් මෙම ගැටලු තවදුරටත් පවතින බව අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට හෝ නාගරික සංවර්ධන අධිකාරියට අයත් මෙම කර්මාන්තශාලා ඉදිරියේ දී කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා ගැනීම පිළිබඳව සාකච්ඡා පවත්වන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නිෂ්පාදන ක්ෂේත්‍ර අනුව කර්මාන්තපුර වෙන් කිරීමට බලාපොරොත්තු වන බවත් හරිත ක්‍රමවේදයකට අනුව සෞඛ්‍යාරක්ෂිත හා ගොඩනැගිලි ආරක්ෂණ ක්‍රමවේද යොදාගෙන එම කර්මාන්තපුර සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඇතැම් කර්මාන්තශාලාවල ආහාර සහ රසායනික ද්‍රව්‍ය යන වර්ග දෙකම නිෂ්පාදනය කරන අංශ පවතින බැවින් රසායනික ගිනිගැනීම් සිදු වුවහොත් ආහාර නිෂ්පාදනය සඳහා අහිතකර බලපෑම් ඇතිවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අලුතෙන් මෙම ව්‍යාපෘති නිර්මාණය කරන විට ඉහත කරුණු පිළිබඳව සැලකිල්ලක් දක්වා ගොඩනැගිලි ඉදිකළ හැකි බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට පවතින කර්මාන්තශාලාවල ගොඩනැගිලි ආරක්‍ෂණය, සෞඛ්‍ය ආරක්‍ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය හා ප්‍රවාහන ගැටලුවලට පිළියම් යෙදීම සඳහා අයවැය මඟින් යම් ප්‍රතිපාදන කොටසක් වෙන් කරගත් බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම කර්මාන්තශාලාවල ගැටලු පිළිබඳව අදාළ දිස්ත්‍රික් සංවර්ධන සමිති මඟින් අමාත්‍යාංශය වෙත යොමුකිරීමට ප්‍රජාව දැනුවත් කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන ලදී.

රේඛීය අමාත්‍යාංශයේ අවසරයකින් තොරව කර්මාන්තශාලා අතුරු බඳුදීම් පිළිබඳව වාර්තා වී ඇති බැවින් වර්තමානයේ දී ඒ සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදුකරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කර්මාන්තපුරවල බදු අය කිරීම සහ පරිපාලන කටයුතු පැවරෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වන නමුත් එම පරිපාලනමය කටයුතු නිසිලෙස සිදු නොවන බව නිරීක්ෂණය වී ඇති බැවින් පරිපාලනමය අයිතිය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධනය අමාත්‍යාංශය වෙත ලබා ගැනීම පිළිබඳව ද අවධානය යොමු වී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

බදු ඔප්පු ලබාදීමේ ප්‍රමාදය පිළිබඳව ද ගරු සභාපතිතුමා විසින් අදහස් පළ කරන ලදී.

ආයෝජකයින් වෙත බදු ඔප්පු නිකුත් කිරීමේ ක්‍රමවේදයේ ඇති අකාර්යක්ෂමතාව මඟහරවා ගැනීමට සියලු ආයතන එකිනෙක සම්බන්ධ කළ ක්‍රමවේදයක අවශ්‍යතාව පිළිබඳව ගරු ඔෂානි උමංගා මහත්මිය විසින් දැනුම් දෙන ලදී.

### 3.4.2 කහ ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු

කහ මිලදී ගැනීමට අදාළ ආනයනික බලපත්‍ර නිකුත් නොකිරීමෙන් ඇතැම් කුළුබඩු නිෂ්පාදන කර්මාන්තශාලා අපහසුතාවයට ලක්ව ඇති බවත් මේ හේතුවෙන් නීති විරෝධී ලෙස ආනයනය කරන කහ තොග මිලට ගැනීමට ව්‍යාපාරිකයන්ට සිදුවී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉඟුරු කහ ආනයනය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වී ඇති නමුත් තවමත් එම තහනම ඉවත් කර නොමැති බව අතිරේක ලේකම් (ආංශික සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

අපනයන අරමුණු සඳහා තාවකාලිකව ද්‍රව්‍ය ආනයන කිරීමේ ක්‍රමවේදය (Temporary Imports for Export Purposes - TIEP) මත විවිධ ද්‍රව්‍ය ආනයනය කළ හැකි බවත් ව්‍යවසායකයන් බොහෝ දෙනා මේ පිළිබඳව දැනුවත් වී නොමැති බවත් අතිරේක ලේකම් (ආංශික සංවර්ධනය) විසින් දැනුම් දෙන ලදී.

කහවලට බලපත්‍රය ලබාදීමට හැකියාවක් පවතින බැවින් ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් විවිධ ආයතන සඳහා ඉහත ක්‍රමවේදයන් පිළිබඳව අවශ්‍ය සහාය ලබාදීමට කටයුතු කරන බවත් අතිරේක ලේකම් (ආංශික සංවර්ධනය) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අපනයන අරමුණු සඳහා තාවකාලිකව ද්‍රව්‍ය ආනයන කිරීමේ ක්‍රමවේදය (Temporary Imports for Export Purposes - TIEP) පිළිබඳව පවත්වන දිස්ත්‍රික් රැස්වීම්වල දී ව්‍යවසායකයන් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ලංකාවේ කහ සඳහා විදේශීය වෙළෙඳපොළ තුළ වැඩි ඉල්ලුමක් පවතින බැවින් දේශීය කහ ගොවීන් මෙවැනි කර්මාන්තකරුවන් වෙත හඳුන්වාදීමට අදාළ කර්මාන්තරුවන් රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

වෙළෙඳපොළෙහි පවතින උච්ඡාවචනයන් මත කහ වගාකරුවන් එයින් බැහැරවීම සම්බන්ධයෙන් ඇති වූ ගැටලුව පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සෑම වෙළෙඳපොළක් තුළම මෙවැනි ගැටලු පැන නගින බැවින් ගොවීන්ට තම නිෂ්පාදන අඛණ්ඩව වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා උනන්දුවක් දක්වන ගොවි ප්‍රජාව හඳුන්වාදීමට හැකි බවත් කර්මාන්තකරුවන් සඳහා වගා ඉඩම් පහසුකම් පවා සපයා දිය හැකි බවත් ගරු සභාපතිතුමා විසින් ද කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා විසින් මේ පිළිබඳව අදහස් පළ කරන ලදී.

## 3.5 ගරු කෝසල නුවන් ජයවීර මහතා

### 3.5.1 තල්දූව ධාවන පිටිය තුළ කැණීම් වළවල් ගොඩකර අවසන් නොවීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ තල්දූව ධාවන පිටිය තුළ කැණීම් වළවල් ගොඩකර අවසන් නොවීම නිසා ඇති වී තිබෙන පාරිසරික ගැටලු පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වළවල් ගොඩකිරීම සඳහා ප්‍රසම්පාදන කැඳවා ඇති බවත් ඉදිරි සති 02 තුළ එම වළවල් වසා පිළිසකර කළ හැකි බවත් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

කැණීම් වළවල් වැසීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ මුදල් යොදාගන්නේ ද යන්න පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

කැණීම් කරන පුද්ගලයන් විසින් අධිකාරියේ තැන්පත් කර ඇති ඇප මුදලින් එම කටයුතු සිදුකරන බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) විසින් දැනුම් දෙන ලදී.

යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් සිදුකරන කැණීම්වල දී මෙන් නොව සාම්ප්‍රදායික කැණීම්වලට අය කරන ඇප මුදල ප්‍රමාණවත් නොමැති බැවින් (සාම්ප්‍රදායික කැණීම් සඳහා ලබාගන්නේ රු. 10,000/= ක මුදලකි) එය නිදහස් කර ගැනීමට කර්මාන්තකරුවන් උනන්දු නොවීම මත මෙම ගැටලුව පැන නැඟී ඇති බව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එක් එක් ස්ථාන සඳහා තැන්පත් කර ඇති ඇප මුදල් ප්‍රමාණය, එම ඇප මුදල් යොදාගනිමින් වසා දමන ලද වළවල් ප්‍රමාණය, එම කැණීම් වළවල් වසා දැමීම සඳහා සත්‍ය වශයෙන්ම වියදම් කරන ලද මුදල පිළිබඳ සංසන්දනාත්මක වාර්තාවක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.5.2 කැලණි ගඟ සහ සීතාවක ගඟ ආශ්‍රිතව රත්‍රන් ගැරීමේ කර්මාන්තය

කැලණි ගඟ සහ සීතාවක ගඟ ආශ්‍රිතව රත්‍රන් ගැරීමේ කර්මාන්තය සම්බන්ධව ගැටලු ඇතිවී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

මෙම රත්‍රන් ගැරීමේ කාර්මාන්තය ඉතා ප්‍රාථමික මට්ටමක පවතින බවත් කාන්තාවන් මෙම කර්මාන්තයට සම්බන්ධ වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

දැනට කාන්තාවන් 2000ක් පමණ මෙම කර්මාන්තයට යොමුව ඇති බවත් දිනකට රු. 2,500ක පමණ ආදායමක් එක් අයකු විසින් සොයාගන්නා බවත් ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කර්මාන්තය සඳහා බලපත්‍ර ලබා දී එය නීතිගත කිරීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා භූ විද්‍යා සහ පතල් කැණීම් කාර්යාංශය සමඟ රැස්වීමක් කැඳවන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.6 කර්මාන්තපුරවල ඉදිරි කටයුතු සහ සංවර්ධනය - ගරු වරුණ ලියනගේ මහතා

බණ්ඩාරගම මිල්ලනිය ප්‍රදේශයේ පිහිටි කර්මාන්තපුරයේ ඉදිරි කටයුතු හා සංවර්ධනය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කර්මාන්තපුරය අදියර 02ක් යටතේ සංවර්ධනය කිරීමට කටයුතු කරන බවත් ඒ සඳහා රු. මිලියන 800කට අධික මුදලක් දැනට වියදම් කර ඇති බවත්

අතිරේක ලේකම් (කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රථම සහ දෙවන අදියර යටතේ සංවර්ධන කටයුතු අරඹා ඇති බවත් මීළඟ වසර තුළ කර්මාන්තපුරය ක්‍රියාත්මක කළ හැකි බවත් අතිරේක ලේකම් (කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අත්පත් කරගැනීමට නියමිත භූමි ප්‍රදේශය ද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ කර්මාන්තකරුවන්ට බදුදෙමින් පවතින බවත් මෙම කර්මාන්තපුරයේ පළමුවැනි පියවර සඳහා කර්මාන්තකරුවන් දැනටමත් තෝරාගෙන අවසන් බවත් අතිරේක ලේකම් (කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කටයුතු විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරියේ දී "වන් ඉන්ඩස්ට්‍රි වන් සෝන්" (One Industry - One Zone) යන සංකල්පය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්තකරුවන් විසින් දැනටමත් අදාළ ගොඩනැගිලි ඉදිකර ඇති බැවින් දැනට ක්‍රියාත්මක වන කර්මාන්තපුරවල එම සංකල්පය ක්‍රියාත්මක කිරීමට අපහසු බවත් එවැනි කර්මාන්ත කලාප 10ක් පමණ දැනට ආරම්භ කිරීමට සාකච්ඡා කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ලබා දී ඇති ඉඩම්වල බදුදීම් සම්බන්ධව ගැටලු පැවතීම පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්තකරුවන්ට කර්මාන්තපුරවල භූමිය ලබාදීමේ දී වෙනත් පහසුකම් ද ලබාදෙන බැවින් ලබාදෙන ඉඩමෙන් සහ පහසුකම්වලින් උපරිම ලාභයක් ලබා ගන්නා ලෙස අදාළ කර්මාන්තකරුවන්ට ප්‍රථමයෙන්ම උපදෙස් ලබාදිය යුතු බවත් දැරිය හැකි වියදම්වලට අනුකූල කර්මාන්ත පමණක් තෝරාගැනීමට ඔවුන් දිරිමත් කළ යුතු බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

කර්මාන්තපුරවල ප්‍රාදේශීය කාර්යාලවල සේවය කිරීමට පත් කරන අධ්‍යක්ෂවරුන් නිරන්තර ස්ථාන මාරු ලැබීම නිසා අදාළ කර්මාන්තපුර නිසි ලෙස නිරීක්ෂණයට ලක් නොවන බැවින් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය මඟින් මේ සඳහා නිශ්චිත නිලධාරීන් පත්කිරීම වැදගත් බව ගරු ඔෂානි උමංගා මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පළමු වැනි සහ දෙවැනි පන්තියේ ප්‍රාදේශීය අධ්‍යක්ෂක තනතුර සඳහා නිලධාරී පුරප්පාඩු 05ක් පමණ පවතින බැවින් එම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන බවත් ප්‍රාදේශීය කර්මාන්ත කමිටු පවත්වා ගැනීමේ දී ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයෙකු එම කමිටුවල නිලධාරීන් ලෙස පත්කිරීමට අපේක්ෂා කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.7 උතුරු ප්‍රදේශයේ සංවර්ධන කටයුතු - ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

උතුරු පළාතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන විශේෂ සංවර්ධන වැඩසටහන් පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථාන මෙම ප්‍රදේශය තුළ පවතින බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කන්කසන්තුරේ සිමෙන්ති කර්මන්ත ශාලාවට අයත් අක්කර 700න් කොටසක් කර්මාන්තපුරයක් ආරම්භ කිරීම සඳහා යොදා ගන්නා බවත් පරන්තන් ප්‍රදේශයේ රසායනික ද්‍රව්‍යත්, ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ සෙරමික් නිෂ්පාදනත්, අලිමංකඩ ප්‍රදේශයේ ලුණු නිෂ්පාදනත් දියුණු කිරීමට හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අවුරුදු 35කට අධික කාලයක් පුරා වසා දමා තිබූ ඔඩ්ඩුසුඩාන් කර්මාන්ත ශාලාව 2025.03.07 වැනි දින විවෘත කරන බවත් වර්තමානයේ දී දංකොටුව ප්‍රදේශයෙන් උතුරු ප්‍රදේශයට සෙරමික් නිෂ්පාදන ගෙන්වන නිසා ප්‍රවාහන ගාස්තු සමඟ ඒවායේ මිල ඉහළ ගොස් ඇති බවත් ලංකා පිඟන් සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලාව ආරම්භ කළහොත් මෙම සෙරමික් නිෂ්පාදන ප්‍රදේශයේ ජනතාවට අඩු මුදලට ලබාදීමට හැකියාවක් ඇති බව ලංකා පිඟන් සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

1970 වර්ෂයේ සිට කර්මාන්තශාලාවේ සවිකර ඇති පැරණි යන්ත්‍ර සූත්‍ර ඉවත්කොට නව යන්ත්‍ර සූත්‍ර සඳහා ආයෝජනය කිරීමට ද බලාපොරොත්තු වන බවත් ලංකා පිඟන් සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පුද්ගලයින් 15ක් පමණ එම ප්‍රදේශයෙන් ද පුද්ගලයන් 50ක් පමණ ප්‍රදේශයෙන් බැහැරව ද මෙම කර්මාන්තශාලාව සඳහා බඳවා ගැනීමට අදහස් කරන බවත් මෙහි දෙවැනි අදියර යටතේ මෙය තවදුරටත් දියුණු කිරීමට බලාපොරොත්තු වන බවත් ලංකා පිඟන් සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම කර්මාන්තශාලාව සඳහා මින් පෙර රු. මිලියන 20ක් වෙන්කරගෙන තිබූ බැවින් යන්ත්‍ර සූත්‍ර සහ කර්මාන්තශාලාවේ පිළිසකර කිරීම් සඳහා එම ප්‍රතිපාදන යොදාගත හැකි බවත් පුහුණු ශ්‍රමිකයින් අම්පාර සහ මුලතිව් දිස්ත්‍රික්කවලින් බඳවාගත හැකි බවත් ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උළු නිෂ්පාදනය අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රචලිත බැවින් ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ උළු ව්‍යාපාරය සාර්ථක ලෙස කරගෙන යා හැකි බවත් පවතින මැටි සංචිත දැනට භාවිත කිරීම සඳහා ප්‍රමාණවත් නමුත් වැව්වල පවතින මැටි ලබාගැනීමට ද කටයුතු කළ යුතු බවත් ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් දැනුම් දෙන ලදී.

කර්මාන්තශාලාව සඳහා දැනට රු. මිලියන 15ක් පමණ ප්‍රතිපාදන වියදම් කොට ඇති බවත් තවත් රු. මිලියන 12.5ක් සියලු කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය බවත් ලංකා පිඟන් සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඊට අමතරව නිෂ්පාදන වියළා ගැනීම සඳහා යොදාගන්නා ප්‍රදේශය සහ නේවාසිකාගාර අලුත්වැඩියා කිරීම අවශ්‍ය බව ද ලංකා පිඟන් සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ජාතික ලුණු සමාගම විසින් මෙස ලුණු සම්බන්ධයෙන් ප්‍රවර්ධන වැඩසටහනක් උතුරු පළාත තුළ ආරම්භ කළ බව ශ්‍රී ලංකා ජාතික ලුණු සමාගමේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අලිමංකඩ ප්‍රදේශයේ පවතින ඉඩම්වල ලුණු ලේවායන් ඇති කිරීම මඟින් වඩා වැඩි ලුණු නිෂ්පාදනයක් ලබාගත හැකි බව ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යාපනය අර්ධද්වීපයේ මේ සඳහා සුදුසු ස්ථාන කීපයක් නිරීක්ෂණය කර ඇති බවත් පැරණි ලුණු ලේවායන් ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වන බවත් ශ්‍රී ලංකා ජාතික ලුණු සමාගමේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් විසින් ද අදහස් පළ කරන ලදී.

**3.8 ව්‍යාපාර සංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගීතාව වර්ධනය කිරීම - ගරු රවී කරුණානායක මහතා**

රට තුළ ව්‍යවසායකයන් ශක්තිමත් කිරීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඔවුන්ගේ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සම්බන්ධතාවය (Public Private Partnership) වැදගත් බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තම අමාත්‍යාංශයේ ඉලක්කය ව්‍යාපාරිකයා ව්‍යවසායකයකු බවට පත්කිරීම බවත් බොහෝ පුද්ගලයින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (National Enterprise Development Authority - NEDA) සහ කුඩා කර්මාන්ත සංවර්ධන අංශය (Small Enterprises Development Division - SED) වැනි ආයතන පිළිබඳව නොදන්නා බැවින් ව්‍යාපාරිකයන්ට ඒ සඳහා දැනුම ලබාදීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් ව්‍යවසායකයන්ගේ ව්‍යාපාරික අරමුණු පෞද්ගලික අංශය සමඟ ඒකරාශී කිරීමට වැඩපිළිවෙළක් සකස්කොට ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඇතැම් ව්‍යවසායකයන් ණය ලබා ගැනීමකින් තොරව ස්වයංපෝෂිතව තමන්ගේ කටයුතු කර ගැනීමට කැමැත්තක් දක්වන බව නිරීක්ෂණය වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එවැනි ව්‍යවසායකයින් ශක්තිමත්ව ගොඩනැගීමට උපකාර කළ යුතු බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධනය අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා පිඟන් සංස්ථාව සහ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (Lanka Phosphate Ltd) ආදී ආයතන සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාවේ මෙහෙයුම් ස්ථාවර මට්ටමකට පත්වූ පසු පෞද්ගලික සහ රාජ්‍ය සහයෝගීතාවය මත කරගෙන යාමට බලාපොරොත්තු වන බවත් සීනි කර්මාන්තශාලාවල නිෂ්පාදනය නිසි

ආකාරයෙන් සිදුවුවත් බෙදාහැරීම් සඳහා වැඩපිළිවෙළක් නොතිබීම හේතුවෙන් පෞද්ගලික අංශ අධික ලාභයක් ලැබූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, වර්තමානයේ දී බෙදාහරින්නන් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බවත් රජයේ ආයතන සඳහා බෙදාහැරීම වැඩි කිරීමට කටයුතු කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ව්‍යවසායකත්ව හැකියාව ඇති නමුත් මූල්‍යමය හැකියාවක් නොමැති පිරිස සඳහා ණය පහසුකම් ලබාදීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ව්‍යවසායකයෙකු මූලික පියවරේ සිට සංවර්ධනය කිරීම සඳහා නිසි වැඩපිළිවෙළක් නොමැති බැවින් ව්‍යාපාරික සංකල්ප ඇති පිරිස වෙළෙඳපොළට යොමු කරවීම සඳහා යාන්ත්‍රණයක් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධනය අමාත්‍යාංශය විසින් හඳුන්වාදෙමින් පවතින බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ව්‍යවසායකයන්ට විශ්වසනීයත්වය පදනම් කරගෙන ණය ලබාදීමක් සිදුකිරීමට අදහස් කරන බැවින් රු. මිලියනයකින් ආරම්භ වන ඇප රහිත ප්‍රාග්ධන ණය මුදලක් ලබාදීමට සාකච්ඡා කර ඇති බවත් අවදානම් වර්ගීකරණ පද්ධතියක් (Risk Rating System) ඔස්සේ ඔවුන්ගේ ව්‍යාපාරය සාර්ථක වන ආකාරය අනුව ලබාදෙන ණය මුදල වැඩි කරගත හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා දුන් රු. බිලියන 15ක ආධාරවලින් කොටසක් යොදාගනිමින් සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට අදාළ ආයතන සම්බන්ධ කරගනිමින් ජාතික මට්ටමේ සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අපේක්ෂා කරන බව ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බොහෝ ව්‍යවසායකයින් ලබාගත් ණය මුදලින් ව්‍යාපාරය සංවර්ධනය කිරීමට පෙර අදාළ ගොඩනැගිල්ල හා යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීමෙන් වස්තු භංගත්වයට පත්වන බැවින් ව්‍යාපාරයේ සාර්ථක මූලික අඩිතාලම දැමීමට යන්ත්‍ර සහ ඉඩ පහසුකම් කුලියට ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී මූලිකම ගැටලුවක් වන්නේ ප්‍රාග්ධනය සහ ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය වන ඉඩ පහසුකම් නොමැතිවීම බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එහිදී ව්‍යාපාර ආරම්භ කර පවත්වා ගැනීම සඳහා උපදේශනය ලබා දෙන මධ්‍යස්ථාන (Incubator Centers) හරහා මෙම ගැටලු නිරාකරණය කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම මධ්‍යස්ථාන මඟින් ව්‍යාපාර සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබාදීම පිළිබඳව මැදිහත්වීම අවම බැවින් අදාළ යන්ත්‍ර සූත්‍ර සහ ඉඩ පහසුකම් කුලී පදනම මත ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු වී ඇති බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

පාසල් සහ විශ්වවිද්‍යාල පදනම් කරගත් ව්‍යවසායකත්වය පිළිබඳ ජාතික සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ව්‍යවසායකත්වය පිළිබඳ මූලික අඩිතාලම ලබා දෙන දින 05ක වැඩමුළුවක් සහ දින 12ක වැඩමුළුවක් හඳුන්වා දී ඇති බවත් ඒ සඳහා ඕනෑම අයෙකුට සහභාගි වීම සඳහා පහසුකම් සලස්වා ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ව්‍යාපාරික සැලැස්ම සකස් කිරීමට රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන ව්‍යවසායකයන්ට උපකාර කිරීම නිසා බැංකුවට ඇති අවදානම ද අඩුවන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා බැංකු කිහිපයක් සමඟ සාකච්ඡා කරමින් පවතින බවත් එමඟින් රු. බිලියන 50ක පමණ අරමුදලක් පිහිටුවා ගත හැකි බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

රට පුරා මෙම සංකල්පය ව්‍යාප්ත කිරීමට පෙර නියමු ව්‍යාපෘතියක් වශයෙන් එක් දිස්ත්‍රික්කයක මෙම කටයුතු ක්‍රියාත්මක කර බැලීම වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.9 බිංගිරිය ප්‍රදේශයේ වසාදමා ඇති සෙරමික් කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම - ගරු විජේසිරි බස්නායක මහතා**

බිංගිරිය ප්‍රදේශයේ වසා දමන ලද සෙරමික් කර්මාන්තශාලාව යළි ආරම්භ කිරීමේ වැදගත්කම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධ ඉදිරි පියවර සහ එම කර්මාන්තශාලාව මඟින් රැකියා උත්පාදනය කිරීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කර්මාන්තශාලා සංවර්ධන වැඩසටහනේ පළමු අදියර සඳහා බිංගිරිය ප්‍රදේශයේ මෙම කර්මාන්තශාලාව ඇතුළත් කර නොමැති බවත් ඵලදායිතාවය අරමුණු කරගත් නියමු ව්‍යාපෘතියක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහිදී තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 100ක් අවුරුදු 03ක් ඇතුළත සමීපව නිරීක්ෂණය කර උපදෙස් ලබාදීම සිදුකරන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ප්‍රධාන කාර්ය සාධන දර්ශක (Key Performance Indicators) මත පදනම්ව ඔවුන්ගේ ව්‍යාපාර සංවර්ධනය කිරීමට කටයුතු කරන බවත් ඉදිරියේ දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම (BCC Lanka Limited) නිපදවන පොල්තෙල් සඳහා මේ වන විට විශාල ඉල්ලුමක් නිර්මාණය වී ඇති බවත් එම ආයතනය මේ වන විට රු. මිලියන 120ක මාසික ආදායමක් ලබන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ශිල්ප සභාව, ලක්සල සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානය වැනි ආයතනවල කාර්යභාරය පිළිබඳව දැනුවත් කර ශිල්පීන් එම ආයතනය වෙත

යොමු කිරීමට කටයුතු කරන ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් පැමිණ සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ අරමුණ විදේශ විනිමය ඉහළ නැංවීම බවත් අපනයනය ඉහළ නැංවීමට අවශ්‍ය තරම් තාක්ෂණික දැනුම රට තුළ පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අයිස් රහිතව මත්ස්‍ය අස්වැන්න ගබඩා කළ හැකි ධීවර බෝට්ටු පවා ශ්‍රී ලංකාව තුළ නිපදවන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නීති රීති සකස් කිරීමට රේඛීය අමාත්‍යාංශයට හැකියාවක් ලැබෙන බැවින් ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් හා යෝජනා ඒ සඳහා ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටින ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන ලදී.

දැනට මෙම කර්මාන්තවල නියැලී සිටින යම් ගැටලුවක් හේතුවෙන් ඉදිරියට යාමට හැකියාවක් ලැබී නොමැති පිරිසට උපකාර කිරීමට මැදිහත් වන ලෙස ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉලෙක්ට්‍රොනික උපාංග ආනයනය කිරීම වළක්වා ඒ වෙනුවට ආදේශක ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කළ හැකි නම් රටින් පිටතට විදේශ විනිමය ගලායාම අඩුකරගත හැකි බවත් මේ පිළිබඳ දත්ත එක් රැස් කරමින් පවතින බවත් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කුඩා කර්මාන්ත දිරිමත් කරමින් විශාල වශයෙන් ලාභ ලැබෙන කර්මාන්තයකට යොමු වීම වැදගත් බවත් එහිදී ජනතාවගේ ක්‍රයශක්තිය වර්ධනය කිරීමට යම් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලිය සඳහා උනන්දුවක් දක්වන ව්‍යාපාරිකයන් සිටී නම් මෙම ආයතනයේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී.

හම්බන්තොට වරායේ බහාලුම් මෙහෙයුම් සිදු නොවීම මත නිෂ්පාදන ප්‍රවාහනය කිරීම ගැටලුවක් වී ඇති බවත් වෙනත් වරායන් වෙත ගෙනයාමේ දී අධික ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවන බවත් ලංකා පිඟන් සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහිදී වරාය කටයුතු සිදුවන ආකාරය පිළිබඳව පසුව සාකච්ඡාවට ලක් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

රේඛීය අමාත්‍යාංශයේ ඉදිරි වැඩපිළිවෙළ සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ලබාදීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කහ සහ කාබනික නිෂ්පාදන අපනයනය කිරීමෙන් අධික ලාභයක් ලැබිය හැකි බවත් එමෙන්ම කාබනික ආහාර සඳහා පුළුල් විදේශීය වෙළෙඳපොළක් පවතින බැවින් ගම්මානවලින් සාම්ප්‍රදායික ගොවි මහතුන් සම්බන්ධ කරගෙන අපනයනය ඉලක්ක කරගත් වගා කටයුතු සඳහා යොමුවීම සුදුසු

බවත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ලංකාවෙන් වසරකට ඇමරිකානු ඩොලර් මිලියන 500කට පමණ වටිනාකමක් ඇති කාබනික ආහාර ද්‍රව්‍ය විදේශීය වෙළෙඳපොළට නිකුත් කරන බවත් අක්කර 70,000ක් පමණ වගා කර ඇති බවත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මෙම වර්ෂයේ දී ආහාර සැකසුම් ගම්මාන (Food Processing Villages) 08ක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බැවින් මේ සම්බන්ධ හැකියාවක් ඇති පිරිස ආයතනය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 1.50 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 මාර්තු මස 12**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු විජිත හේරත් මහතා (සභාපති)
ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
ගරු නන්ද බණ්ඩාර මහතා
ගරු රියාස් ෆාරුක් මහතා
ගරු රුවන් විජේවීර මහතා
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු කෝසල නුවන් ජයවීර මහතා
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු විජේසිරි බස්නායක මහතා
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.2 2022 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.3 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව**
(2025.02.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.4 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව**
(2025.02.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු විජිත හේරත් මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**2. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජනා**

**2.1 2024 වර්ෂයේ රුසියාවේ යුද්ධ හමුදාවේ සේවය කිරීමට විදේශගත වූ ඉහළ කඩිගමුව, කඩිගමුව පදිංචි කේ. එච්. ජී. ඩබ්. කිරින්දහේන මහතා වෙනුවෙන් ලැබිය යුතු වන්දි මුදල් කඩිනමින් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම - ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා (යෝජනා අංක 12)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා**

**3.1.1 නුවරඑළිය ප්‍රදේශයේ සීතාඑළිය හින්දු කෝවිල ආශ්‍රිත සංචාරක කර්මාන්තය දියුණු කිරීම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පීටර්ස් ලේක් ආසන්නයේ ඇති අසෝක වනයේ සීතාඑළිය නමැති ප්‍රදේශයේ සිද්ධස්ථානයක් පවතින බවත් ඒ සඳහා දිනෙන් දින සංචාරක ආකර්ෂණය ඉහළ යන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ප්‍රදේශය අවට රක්ෂිත වනයක් තිබෙන බැවින් රජය මැදිහත්ව ප්‍රමාණවත් ප්‍රදේශයක් අදාළ සිද්ධස්ථානය ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සීතාඑළිය ප්‍රදේශයේ එම කෝවිල ආශ්‍රිතව පහසුකම් ඉහළ නැංවීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් එකඟත්වය පළකර ඇති බවත් රක්ෂිතයට අයත් ඉඩම ලබා ගැනීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ

අනුමතිය ලබාගැනීමට ඉල්ලුම් කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉන්දියාවේ සහාය ඇතිව ආධ්‍යාත්මික නැඹුරුවක් සහිත සංචාරක ක්ෂේත්‍රය (Spiritual Tourism) දියුණු කිරීමේ අරමුණින් භාවනා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමටත් නවාතැන් පහසුකම් සහ වාහන නැවතුම්පළවල් ආදී පහසුකම් දියුණු කිරීමටත් අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

රාමායණ සංචාරය (Ramayana Trail) යටතේ විශේෂ ස්ථාන සඳහා වූ සංචාරක ගමනාන්තයන් ප්‍රචලිත කිරීමේ සැලසුම් දියත් කර ඇති බවත් රාමායණ සංචාරය (Ramayana Trail) සඳහා මෙම ස්ථානය ද එක් කර ගැනීමට අදහස් කරන බවත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බදුල්ල දිස්ත්‍රික්කයේ භාවනා මධ්‍යස්ථානයක් විවෘත කිරීමේ උත්සවය සඳහා ජුනි මස 05 හෝ 06 යන දින අතරින් දිනයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

### 3.1.2 ගුවන් තොටුපළ පරිශ්‍රය තුළ ආබාධ සහිත පුද්ගලයන් සඳහා රෝදපුටු ලබාගැනීම

ගුවන් තොටුපළ පරිශ්‍රය තුළ අවුරුදු 70ට වැඩි පුද්ගලයින්ට පමණක් වෛද්‍ය වාර්තා ඉදිරිපත් නොකර රෝදපුටු ලබා ගැනීමට හැකියාව ඇතත් අවුරුදු 70ට අඩු ආබාධ සහිත පුද්ගලයින්ට රෝදපුටු ලබාදෙන්නේ පෙර දැනුම්දීමක් කර වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ හේතුවෙන් වෛද්‍ය වාර්තා රහිතව හෝ පෙර දැනුම් දීමකින් තොරව පැමිණෙන ආබාධ සහිත සංචාරකයින් අපහසුතාවයට ලක්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ පිළිබඳ සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම (Airport and Aviation Services (Sri Lanka) Ltd.) සමඟ සාකච්ඡා කර සුදුසු විසඳුමක් ලබාදෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පහසුකම යම් මුදලක් යටතේ ඕනෑම අයෙකුට ලබා ගත හැකි අන්දමින් මෙම රෝදපුටු පහසුකම් ලබාදිය යුතු බව ගරු රවී කරුණානායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.2 සංචාරකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම - ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා

සංචාරකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩපිළිවෙළක් අවශ්‍ය බවත් මිරිස්ස, ගාල්ල සහ නුවර ප්‍රදේශවල ගමන් කිරීමේ දී සංචාරකයන්ගේ කැමැත්ත පරිදි කුලී රථ තෝරාගැනීමට හැකියාවක් නොමැති බවට පැමිණිලි වාර්තා වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පික් මී (Pick Me) සහ ඌබර් (Uber) ප්‍රවාහන ජාලවලට අයත් කුලී රථ එම සංචාරක ප්‍රදේශවල ධාවනය කිරීම සම්බන්ධයෙන් එම ප්‍රදේශවල ත්‍රීරෝද රථ රියදුරන් සිය විරෝධය දැක්වීම හේතුවෙන් මෙම ගැටලු පැන නඟින බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගැටලු වැළැක්වීම සඳහා තවත් ස්ථාන කිහිපයක සංචාරක පොලිස් ස්ථාන ආරම්භ කිරීමට සහ නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉහත ගැටලු විසඳීම සඳහා ඒ ඒ පළාත් පාලන බල ප්‍රදේශ තුළ මන්ත්‍රීවරුන්, සංචාරක මඟ පෙන්වන්නන් සහ කුලී රථ රියදුරන් යන සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කර විසඳුමකට එළඹිය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට පවතින නීති රීති සහ 2005 අංක 38 දරන සංචාරක පනතේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ගැටලු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ අපහසුතාවයක් පවතින බවත් ඒ සඳහා දැනටමත් කමිටුවක් පත් කර සාකච්ඡා කරමින් පවතින බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බලපත්‍ර නොමැතිව විදේශිකයින් ශ්‍රී ලංකාව තුළ වෙළෙඳාමේ නියැලීමට සහ බලපත්‍ර නොමැතිව සංචාරක මඟපෙන්වන්නන් ලෙස කටයුතු කිරීම වැළැක්වීමට නිසි ලෙස නීතිමය ප්‍රතිපාදන සකස් වී නොමැති හෙයින් සංචාරක පොලිසියට එම කටයුතු සඳහා පියවර ගැනීමට හැකියාවක් නොමැති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

බලපත්‍ර නොමැතිව විදේශිකයින් ශ්‍රී ලංකාව තුළ වෙළෙඳාමේ නියැලීමට එරෙහිව පියවර ගැනීමට ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවට හැකි බවත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජිතයින්ට ද ඒ සඳහා යම් මැදිහත්වීමක් සිදු කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.3 ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

### 3.3.1 සංචාරක කලාප ආශ්‍රිත රාත්‍රී සාද පැවැත්වීමට අවසර ලබා දීම

මිරිස්ස සහ ඒ අවට ස්ථාන කිහිපයක රාත්‍රී සාද පැවැත්වීම වැළැක්වීමට පොලිසිය මඟින් කටයුතු කර ඇති බැවින් මෙම රාත්‍රී සාද පැවැත්වීමට අවසර දීම සම්බන්ධයෙන් නිශ්චිත පියවරක් ගෙන තිබේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් නඩු තීන්දුවකට අනුව ප. ව. 10.00 න් පසු ශබ්ද විකාශන භාවිතය තහනම් කර ඇති බවත් පොලිසිය මඟින් පරීක්ෂා කිරීමෙන් පසු යම් කාලයක් අවශ්‍ය නම් ලබාදීමට හැකියාව පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශේෂ අවස්ථාවන්වල දී පමණක් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලබා දී ඇතත් අවට පදිංචි ජනතාවට සිදුවන බාධාවන් මත මෙවැනි සාද පැවැත්වීම සඳහා නීතිමය ප්‍රතිපාදන ලබා දී නොමැති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සංචාරක කර්මාන්තය සඳහා මෙම විනෝදාස්වාද කටයුතු අත්‍යවශ්‍ය බැවින් මෙම නීති සංශෝධනයට අවධානය යොමු විය යුතු බව ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.3.2 ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජනා කරන ලද ඡායාරූප තරඟාවලිය සඳහා රාජ්‍ය ආයතනවල සහාය ලබා ගැනීම

ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ එක් පියවරක් ලෙස ලංකාවේ ඡායාරූප ශිල්පීන් ඇතුළු කණ්ඩායමක් විසින් "International Premier League Photography Competition" යනුවෙන් ඡායාරූප තරඟයක් පැවැත්වීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඡායාරූප තරඟය පැවැත්වීම සඳහා අවශ්‍ය වෙබ් අඩවියක් ද ඔවුන් විසින් නිර්මාණය කර ඇති බවත් මෙම අරමුණ ඉටු කරගැනීමට සහාය ලබාගැනීමට සුදුසු ආයතන සම්බන්ධීකරණය කරගැනීම සඳහා ඉල්ලීමක් ද ඉදිරිපත් කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණය සහිත විශේෂ ප්‍රදේශ, තරඟ කළ හැකි කාණ්ඩ සහ ඡායාරූප තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව ද මෙම යෝජනාව තුළ ඇතුළත් වන බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එය ඉතා වැදගත් යෝජනාවක් බැවින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට මේ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිය හැකි බවත් රැස්වීමක් සංවිධානය කර අවශ්‍ය කටයුතු සිදු කළ හැකි බවත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිය හැකි බව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ හා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 3.4 මුතුරාජවෙල ආශ්‍රිත සංචාරක ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීම - ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමත කරන ලද ජා ඇල ප්‍රදේශයේ ආරම්භ කළ සංචාරක ව්‍යාපෘතියක මුතුරාජවෙල ආශ්‍රිත කොටසේ ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමට දිනයක් වෙන්කර ගැනීමට අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීගමුව ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීම සඳහා තෝරගෙන ඇති ව්‍යාපෘති අතරට මුතුරාජවෙල ප්‍රදේශය යෝජනා වී නොමැති බවත් ඒ පිළිබඳ සාකච්ඡා කර අදාළ වපසරිය හඳුනාගෙන ඉදිරි වැඩ ආරම්භ කළ හැකි බවත් සංචාරක අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා සමඟ අදාළ ප්‍රදේශය නිරීක්ෂණය කර ඒ පිළිබඳ යම් අධ්‍යයනයක් සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සංචාරක අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වෙත උපදෙස් ලබාදෙන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට හැකි ප්‍රදේශ සඳහා අමාත්‍යාංශය මඟින් සිදු කිරීමට නියමිත වැඩපිළිවෙළ පිළිබඳව ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා විසින් විමසීමක් කරන ලදී.

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා දිවයින පුරා ප්‍රදේශ 100ක් පමණ හඳුනාගෙන ඇති බවත් ගරු මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරනු ලබන ප්‍රදේශ ද ඇතුළත් කර එම ප්‍රදේශ දියුණු කිරීමට මූල්‍ය දායකත්වය සහ

ඒකාබද්ධ මැදිහත්වීමක් සිදු කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සහ බස්නාහිර පළාත් සභාවෙන් ගම්පහ දිස්ත්‍රික්කයට අදාළ ව්‍යාපෘති සම්බන්ධයෙන් විමසන ලද නමුත් මෙතෙක් එම යෝජනා ඉදිරිපත් කර නොමැති බැවින් එම කාර්යාල සම්බන්ධීකරණයෙන් අදාළ යෝජනා අමාත්‍යාංශයට ලබාදීමට කටයුතු කරන ලෙස සංචාරක අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පළාත් සභා ප්‍රඥප්ති මඟින් පළාත් සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට ඉහළ කාර්යභාරයක් සිදු කළ හැකි බැවින් පළාත් සංවර්ධන අධිකාරිය මඟින් ද මේ සඳහා යම් මැදිහත්වීමක් සිදු කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරනු ලබන ස්ථාන පෞද්ගලිකවම නිරීක්ෂණය කර ඒ පිළිබඳ මූලික තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම් (සංවර්ධන) වෙත උපදෙස් ලබාදෙන ලදී.

**3.5 යාල අභයභූමියට ප්‍රවේශවීමට නව ප්‍රවේශ මාර්ගයක් සකස් කිරීම - ගරු රුවන් විජේවීර මහතා**

යාල අභය භූමියේ ප්‍රවේශ මාර්ගයේ අධික තදබදයක් ඇතිවී තිබීම හේතුවෙන් මොණරාගල ඔක්කම්පිටිය, මාලිගාවිල ප්‍රදේශයෙන් විකල්ප ප්‍රවේශ දොරටුවක් නිර්මාණය කිරීම පිළිබඳ යෝජනා ඉදිරිපත් වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මාලිගාවිල සිද්ධස්ථානය සහ අවට ස්වාභාවික පරිසරය පදනම් කරගෙන සංචාරක කලාපයක් ගොඩනැංවීමේ හැකියාව පවතින නමුත් සංචාරකයන් සඳහා පහසුකම් දිස්ත්‍රික්කය තුළ විසිරී පවතින බැවින් මොණරාගල දිස්ත්‍රික්කය තුළ සංචාරකයින් රැඳී නොසිටින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පැල්වත්ත මූලික කරගෙන සංචාරක කලාපයක් ආරම්භ කිරීමට නිරීක්ෂණ චාරිකාවක් සිදුකළ බවත් මීට පෙර බුත්තල අවට සංචාරක කර්මාන්තය දියුණු කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරිපත් කරන ලද සැලැස්ම පිළිබඳව ද සලකා බලා ඉදිරි පියවර ගැනීමට අදහස් කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මාලිගාවිල, නියදැල්ල ප්‍රදේශයෙන් යාලට ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මඟින් ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

යාල අභය භූමිය සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් කළ බවත් එහිදී ප්‍රවේශපත් කවුළුවල තදබදය ඉහළ යාම හේතුවෙන් තවත් ප්‍රදේශයකින් ප්‍රවේශ දොරටුවක් විවෘත කිරීමට සහ සංචාරක කලාපයක් ආරම්භ කිරීමට සාකච්ඡා කළ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රවේශ දොරටුව විවෘත කිරීමේ අරමුණ වන්නේ ඇල්ල සංචාරක ප්‍රදේශයෙන් පැමිණෙන සංචාරකයන්ට ඒ ප්‍රදේශයට ද ප්‍රවේශ වීමේ පහසුව ඇති කිරීම සඳහා බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

වසර කිහිපයක් පුරා සාකච්ඡාවට ලක් වූ මෙම ව්‍යාපෘතිය මගින් පාලමක් සෑදිය යුතු බවට සාකච්ඡා වී ඇති බැවින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ සඳහා සහයෝගය ලබා ගැනීම වැදගත් බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ අවස්ථා කීපයකදීම මේ පිළිබඳව සාකච්ඡා කර ඇති බවත් නව ප්‍රවේශ මාර්ගයක් ආරම්භ කිරීම සඳහා එකඟත්වය ලබා දී ඇති බවත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

නව ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව එකඟ වූ බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය මගින් පාලම ඉදිකිරීම කාරක සභා යෝජනාවක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට ලිඛිතව ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මාලිගාවිල, බුදුරුවගල, කතරගම යන ප්‍රදේශ එක්කර සංස්කෘතික ත්‍රිකෝණයක් නම් කර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ හැකියාවක් පවතින බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා කන්තලේ සීනි සමාගම අවට ප්‍රදේශය ද ඇතුළත් කර ඒකාබද්ධ සැලැස්මකට අනුව මෙම ව්‍යාපෘතියේ සංවර්ධනය කටයුතු සිදු කළ හැකි බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.6 රුහුණු පුරවරයේ නව සංචාරක කලාපයක් ආරම්භ කිරීම - ගරු මුනීර් මුලාෆර් මහතා

හිරිකැටිය, ගාල්ල යන ප්‍රදේශවල සිට හම්බන්තොට, කතරගම දක්වා අධිවේගී මාර්ගය දිවෙන බැවින් රුහුණු පුරවරයේ සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන එක්කර “රුහුණු රින්ග්” (රුහුණු කවය) ලෙස නව සංචාරක කලාපයක් ආරම්භ කිරීමේ සංකල්පය පිළිබඳව ඉල්ලීම් ඉදිරිපත් වී ඇති බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධ යෝජනා පිළිබඳ ඉදිරියේ දී සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.7 ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දියඇලි වෙත ප්‍රවේශවීම සඳහා පහසුකම් සැපයීම - ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා

ශ්‍රී ලංකාව පුරා විසිරී තිබෙන දියඇලි සහ ආශ්‍රිත පරිසරය නැරඹීම සඳහා නිසි ප්‍රවේශ මාර්ග හා ප්‍රවාහන පහසුකම් නොමැතිවීම හේතුවෙන් එම ප්‍රදේශ සංවර්ධනය කිරීමට සුදුසු වැඩපිළිවෙළක් අවශ්‍ය බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකාවේ සෑම දියඇල්ලකටම ප්‍රවේශවීමේ මාර්ග යහපත් තත්ත්වයක නොමැති බවත් ශ්‍රී ලංකාවේ බඹරකන්ද දියඇල්ලට පවා ගමන් කිරීමට

මාර්ගයක් නොමැතිවීම නිසා ප්‍රවේශයට පහසු දුන්හිඳ හා දියලුම වැනි දියඇලි සංචාරකයින් විසින් තෝරාගනු ලබන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රවේශ මාර්ග සකස් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියට යෝජනාවක් ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.8 ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

### 3.8.1 බේකර්ස් වංගුව අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම

බෙලිහුල්ඔය ප්‍රදේශය තුළ පහන්තුඩ ඇල්ල, සුරතලී ඇල්ල, නැග්රක් බංගලාව (Nagrak Bungalow) සහ බේකර්ස් බෙන්ඩ් (Baker's Bend) යන සංචාරක ආකර්ෂණය ලත් ස්ථාන ගණනාවක් පවතින බැවින් එම ප්‍රදේශයේ සංචාරකයන් සඳහා පහසුකම් වැඩිදියුණු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැග්රක් බංගලාව (Nagrak Bungalow) වෙත ගමන් ගන්නා මාර්ගය සංවර්ධනය කිරීම, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සහ වෙළෙඳසැල් ඉදිකිරීම පිළිබඳ යෝජනාවක් ඉඹුල්පේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර ඇති බැවින් ඒ පිළිබඳ සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.8.2 බේකර්ස් වංගුව වෙත ප්‍රවේශවීම සඳහා ඇති මාර්ගය ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම

බලංගොඩ සිට ලෝකාන්තය (World's End) දක්වා ගැසට් කරන ලද මාර්ගය දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් භාවිතා කිරීමට අවසර නොදෙන බවත් ඒ මාර්ගය විවෘත කළහොත් ඔහිය සහ පට්ටිපොල ප්‍රදේශයෙන් පැමිණෙන විදේශිකයන් බෙලිහුල්ඔය කලාපයට ආකර්ෂණය කරගැනීමට හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉහත කාරණය සම්බන්ධයෙන් නිකුත් කර ඇති අදාළ පළාත් සභා ගැසට් පත්‍රයේ පිටපතක් කාරක සභාවට ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව අදාළ තොරතුරු ලබාදීමට සුදුසු නිලධාරියෙකු පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම තොරතුරු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (මූල්‍ය) වෙත ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම බේකර්ස් බෙන්ඩ් (Baker's Bend) සිට නැග්රක් බංගලාව (Nagrak Bungalow) වෙත ගමන්ගන්නා පෞද්ගලික වතු සමාගමකට (බලංගොඩ ප්ලාන්ටේෂන්ස්) අයත් මාර්ග කොටස දැනට වසා දමා ඇති නමුත් එය ඉදිකර ඇත්තේ ද පළාත් සභාවේ මුදල් යොදාගෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පළාත් සභාව මඟින් වියදම් කර ඉදිකළ මාර්ගයක් බැවින් එය පවරා ගැනීමට ඉඹුල්පේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව විසින් වතු සමාගම වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දීර්ඝ කාලයක් පුරා භාවිතයට ගෙන නොමැති බලංගොඩ සිට ලෝකාන්තය (World's End) දක්වා ගමන් කිරීමට පළාත් සභාවෙන් සාදන ලද ඉහත කී මාර්ගයේ බලංගොඩ වැවිලි සමාගමට අයත් කොටසක් පවතින බවත් එම මාර්ගය ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට ඉඹුල්පේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව සභාවේ දී සාකච්ඡා කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වැවිලි සමාගමට අයත් මාර්ග කොටස එම සමාගම විසින් දැනට වසා දමා ඇති නමුත් පළාත් සභා ප්‍රතිපාදන යොදා අදාළ මාර්ගය සාදා ඇති බැවින් සහ ගැසට් නිවේදනයට අයත් පාරක් බැවින් අවශ්‍ය නීතිමය මැදිහත්වීම සිදු කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීම සඳහා මැදිහත් වන බව සංචාරක අංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.9 සංචාරකයින් විදේශ වෙබ් අඩවි මඟින් පහසුකම් වෙන් කර ගැනීම හේතුවෙන් රටට විදේශ විනිමය නොලැබී යාම - ගරු රවී කරුණානායක මහතා**

සංචාරක හෝටල් සහ තානායම් බහුල වශයෙන් ආරම්භ කිරීමේ ප්‍රවණතාවක් පවතින බැවින් ඒවා ලියාපදිංචි කිරීමේ සහ තරු පන්තිය මත පදනම්ව (Star Grade) ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

www.booking.com වැනි වෙබ් අඩවි මඟින් සහ ව්‍යාපාරික ගනුදෙනු සිදුකිරීම සඳහා වන පද්ධති (Point of Sale Systems - POS) මඟින් විනිමය රටින් පිටතට ගලා යන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සංචාරකයින් පැමිණෙන ප්‍රමාණය සහ ඔවුන් වියදම් කරන ප්‍රමාණය පිළිබඳව ගණනය කිරීම ද සුදුසු ක්‍රමවේදයකට සිදු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, ජාත්‍යන්තර සංචාරක වෙළෙඳපොළ සැලැස්මක් (An International Tourism Marketing Plan) ඇති කිරීම වැදගත් බවත් එවැනි සැලසුම් අනුගමනය නොකිරීම නිසා ශ්‍රී ලංකාව තුළ ඉහළ මිලදී ගැනීම්වලින් ලැබෙන ඉපයීම් (High Spending Revenue) පහත වැටී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

සංචාරකයින් මෙරටට පැමිණීමේ දී ඔවුන්ගේ විනෝදාස්වාදය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමේ දී රාත්‍රී 10.00 න් පසු ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අවසර නොදීම වැනි කරුණු පිළිබඳ නැවත වරක් අවධානය යොමු විය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් ඉහත කරුණුවලට අදාළව ගැසට් කරන ලද රීති සංශෝධනය කිරීම සඳහා වර්ගීකරණය කිරීම පිළිබඳ කමිටුවක් පත්කර තිබෙන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ලියාපදිංචි කර නොමැති හෝටල් ද ඇතුළත් කර දැනට පවතින කාණ්ඩ (Categories) 19ක් සංශෝධනය කිරීමට කමිටුවක් පත් කර ඇති බවත් මේ වන විට ලියාපදිංචි කර නොමැති හෝටල් 50,000ක් පමණ හඳුනාගෙන ඇති

බවත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, රට තුළ යම් රැකියාවක් සිදුකිරීම සඳහා වීසා බලපත්‍ර ලබාගෙන එයින් පරිබාහිර වෙනත් රැකියා කරන පුද්ගලයන්ට එරෙහිව කටයුතු කිරීමට නීතිමය ප්‍රතිපාදන ඇත්තේ සාමාන්‍ය නීතිය යටතේ බැවින් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත සංශෝධනය කිරීමට සුදුසු විශේෂඥයින් පත්කර ඇති බව ද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

www.booking.com, www.Agoda.com, www.airbnb.com යන ආයතන සමඟ සාකච්ඡා කර එම ආයතනවල මාර්ගගත වේදිකා (Online Platforms) ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය සමඟ ලියාපදිංචි කිරීමට කටයුතු සිදුකරන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ලියාපදිංචි නොවූ විදේශිකයන් සඳහා අවශ්‍ය සෘජු නීතිමය පියවර ගැනීමට වන ප්‍රතිපාදන වඩාත් ශක්තිමත් කරගැනීම අවශ්‍ය බවට නීතිපති දෙපාර්තමේන්තුව මඟින් උපදෙස් ලබා දුන් බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම අවිධිමත් සංචාරක කටයුතුවලට එරෙහිව නීතිමය පියවර ගැනීමේ ඒකකය පිහිටුවීමට මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇති නමුත් ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට නම් පනත සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය බවට නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දී ඇති බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, අදාළ භාෂාව දන්නා අයට පමණක් භාවිතා කළ හැකි, විදේශ රටවලට අයත් වෙබ් අඩවිවලින් තමාට අවශ්‍ය නවාතැන් පහසුකම් වෙන් කරගන්නා ඇතැම් සංචාරකයන් හේතුවෙන් විදේශ විනිමය මෙරටට නොලැබී යාම පිළිබඳව ද වැඩි අවධානයක් යොමු කරන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඉහත වෙබ් අඩවිවල සඳහන් හෝටල් හිමිකරුවන් සහ ව්‍යාපාරික ප්‍රජාව ලියාපදිංචි කර ගැනීමේ දී යම් වට්ටමක් ලබාදීම මඟින් ඔවුන් හරහා ශ්‍රී ලංකාවේ පිහිටි හෝටල් ද ප්‍රචාරය කර ගැනීමට උත්සහ කිරීම වැදගත් බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අධික ලාභයක් උපයන බැවින් ඔවුන් ලියාපදිංචි කර ගැනීමට කැමැත්ත ලබා ගැනීම අභියෝගයක් බවත් ඒ සඳහා මූලික පියවරක් ලෙස මෙම සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කරගත යුතු බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ව්‍යාපාරික ගනුදෙනු සිදුකිරීම සඳහා වන පද්ධති (Point of Sale Systems - POS) භාවිතය මඟින් බදු ආදායම් පැහැර හැරීම මඟහරවා ගැනීම පිණිස මුදල් ගෙවීමේ කාඩ්පත් හරහා හෝ යම් ක්‍රමවේදයක් ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳ බැංකු සමඟ සාකච්ඡා කළ හැකි බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.10 මත්පැන් වර්ග අලෙවි කිරීම සඳහා ලබාදුන් බලපත්‍ර අවලංගු වීම නිසා රජයට අහිමිවන අදායම - ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ආපනශාලාවලට මත්පැන් වර්ග අලෙවි කිරීම සඳහා ලබාදුන් බලපත්‍ර විශාල ප්‍රමාණයක් මෙම වර්ෂයේ දී අවලංගු වීමෙන් සහ ඇතැම් ආපනශාලාවල බලපත්‍ර නොමැතිව මත්පැන් අලෙවි කිරීම හේතුවෙන් රජයට ලැබෙන බදු ආදායම් අහිමි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශාල ඉල්ලුම්පත් ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබීම නිසා 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමකින් තොරව මත්පැන් අලෙවි කිරීමේ බලපත්‍ර ලබාදීමට තීරණයක් ගෙන තිබූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

2025 වර්ෂය සඳහා නැවත බලපත්‍ර ලබාදීමේ දී පෙර වර්ෂය සඳහා ලියාපදිංචි නොවූ ආපනශාලා පිළිබඳව ද විමසා බැලීමෙන් පසු ඉල්ලුම්පත් 5,241ක් සඳහා කඩිනම් වැඩපිළිවෙළක් යටතේ බලපත්‍ර ලබා දුන් බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නීතියෙන් නියම කරන ලද නිර්ණායක යටතේ පමණක් අදාළ බලපත්‍ර නිකුත් කළ යුතු බවට සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් නඩු තීන්දුවක් මත මත්පැන් අලෙවියට බලපත්‍ර ලබාදීම සීමා කර ඇති බැවින් ඇතැම් ස්ථානවල බලපත්‍ර ලබාදීමේ ප්‍රමාදයක් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් පවතින ගැටලුකාරී තත්ත්වයන් සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ යුතු බවත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරන ලියාපදිංචි කිරීමේ දී පැන නඟින ගැටලු සඳහා අමාත්‍යාංශය මඟින් පිළියම් යෙදිය හැකි බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගරු රවී කරුණානායක මහතා විසින් ද මේ පිළිබඳව අදහස් පළ කරන ලදී.

## 3.11 ගරු අම්ර්තනාදන් අඩෙක්කලනාදන් මහතා

### 3.11.1 ඉන්දියාවේ කඳවුරුවල සිටින මෙරට නැවත පදිංචි වීමට පැමිණීමට අපේක්ෂා කරන ජනතාවට විදේශ ගමන් බලපත්‍ර නිකුත් නොකිරීම

ඉන්දියාවේ කඳවුරුවල සිටින මෙරටට පැමිණීමට අපේකෂා කරන ශ්‍රී ලාංකික පුරවැසියන් එරට මහකොමසාරිස් කාර්යාලය හරහා ශ්‍රී ලංකාවට පැමිණීමට විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම් කළ ද එම බලපත්‍ර තවමත් ඔවුන් වෙත ලැබී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, යුද සමයේ ඉන්දියාවට සංක්‍රමණය වූ, වර්තමානයේ දී මෙරටට පැමිණීමට බලාපොරොත්තු වන ජනතාවට ඔවුන් උපයාගත් වත්කම් නැවත ලංකාවට ගෙන ඒමට පහසුකම් සැලසීමට නැව් සේවාවක් හෝ ලබාදීම වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගුවන් මඟින් භාණ්ඩ රැගෙන ඒමේ දී කිලෝග්‍රෑම් 35ට අඩුවෙන් රැගෙන යා යුතු බැවින් එම ජනතාවට මෙම නැව් සේවාව ලබාදීම වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඉන්දියාවේ සිට මෙරටට පැමිණෙන ජනතාවට පදිංචි වීම සඳහා ඉඩම් හා අවම මූලික යටිතල පහසුකම් රජය මැදිහත් වී ලබාදෙන ලෙසත් ආහාර ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම සඳහා ආධාර මුදලක් ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉන්දියාවේ පිහිටා ඇති නියෝජ්‍ය තානාපති කාර්යාලය හරහා සරණාගතයින් නැවත ශ්‍රී ලංකාවට ගෙන ඒමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ දී එම සරණාගතයින් බලහත්කාරයෙන් රැගෙන යන බවට චෝදනා එල්ල වූ බැවින් තම කැමැත්තෙන් ස්වාධීනව ලංකාවට පැමිණෙන ඉන්දියානු සරණාගතයන් උදෙසා පමණක් රජය පහසුකම් සලසන බව අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ස්වේච්ඡාවෙන් පැමිණීමට ඉදිරිපත් වන පිරිස සඳහා විදේශ ගමන් බලපත්‍ර ලබාදීමේ ගැටලුවක් නොමැති බවත් ඔවුන් සඳහා හදිසි සහතිකපත් (Emergency Certificates) නිකුත් කරන බවත් අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් දැනුම් දෙන ලදී.

විදේශ ගමන් බලපත්‍රය ලබා ගත්ත ද ඉන්දියානු රජයෙන් ලබාගත යුතු පිටව යාමේ අවසර පත්‍රය (Exit Permit) ලබා ගැනීමේ අපහසුතාව මත පිටව යාමට අවසර නොලැබෙන පිරිසක් ද මේ අතර වන බව අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමට නොහැකි වූ, අදාළ ලිපිලේඛන ඉදිරිපත් කළ හැකි පිරිසට ඉන්දියාවේ පිහිටි මෙරට තානාපති කාර්යාලයෙන් කඩිනමින් එම බලපත්‍ර නිකුත් කිරීමට හැකියාව ඇති බවත් ලේඛන නොමැති පිරිසට පවා විශේෂ වැඩපිළිවෙළක් යටතේ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කළ හැකි බවත් අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් දැනුම් දෙන ලදී.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් එරට ආගමන විගමන දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කළ බවත් පසුගිය වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ගොඩගැසී තිබූ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණය 26,000 සිට 10,000ක් දක්වා අවම මට්ටමට ගෙන ආ බවත් අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.11.2 මන්නාරම ප්‍රදේශයේ පාරු සේවාව දියුණු කිරීම

මන්නාරම ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය දියුණු කිරීමට හැකියාවක් ඇති බැවින් පාරු සේවාව තවදුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.12 මැදපෙරදිග රටවල කොන්ත්‍රාත් පදනම සඳහා රැකියා ලබාදෙන බව පවසා මූල්‍ය වංචා සිදු කිරීම - ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

රියාල් 1500 – 2500ක පමණ වේතනයක් ලබා දෙන බවට පොරොන්දු වී මැදපෙරදිග රටවල්වලට රැකියා සඳහා පිටත් කිරීමේ වංචාසහගත ජාවාරමක් පිළිබඳ වාර්තා වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රු. ලක්ෂ 08ක් පමණ වියදම් කර මැදපෙරදිග රටවලට පිටත් වන නමුත් අවසානයේ අදාළ රැකියා ලබා දෙන ආයතනය හෝ ඔවුන් එරටට පිටත් කළ ඒජන්සිය සම්බන්ධ කරගැනීමට නොහැකි වීමෙන් අසරණ වන පිරිස් නැවත මෙරටට පැමිණෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

රැකියා සඳහා පිටත්ව යන අවස්ථාවේ දී අස්වැසුම ආදී ආධාර නැවැත්වීම හේතුවෙන් නැවත ලංකාවට පැමිණිය ද ඔවුන්ට ජීවත්වීමට ආදායමක් නොමැති බැවින් මෙම වංචාකාරී ඒජන්සිවලට එරෙහිව සුදුසු පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ඇති ආයතන මෙවැනි වංචනික ක්‍රියා සිදු කරන විට ඊට එරෙහිව පියවර ගැනීමට ප්‍රතිපාදන ඇති නමුත්, නීති විරෝධී ක්‍රම ඔස්සේ මැදපෙරදිග රැකියා සඳහා පිටත්ව ගිය පිරිසට සහන සැලසීමට හැකියාවක් නොමැති බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ඇති මෙවැනි වංචනික ක්‍රියා සිදු කරන ඒජන්සිකරුවන්ට එරෙහිව පියවර ගැනීමට හැකි බැවින් ඒ පිළිබඳ තොරතුරු තම කාර්යාලය වෙත ලබා දෙන ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

විදේශ රටවලට තානාපතිවරුන් පත් කිරීමේ දී දැනට ඇති පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් ගරු රවී කරුණානායක මහතා විසින් විමසීමක් කරන ලදී.

තානාපතිවරුන් පත් කිරීමේ දී අදාළ රටවල අනුමතිය ලබා ගැනීමට යම් කාලයක් ගතවන බවත් පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ දී ඒ පිළිබඳ සාකච්ඡාවට ලක් කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.13 ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

### 3.13.1 රුසියානු යුධ හමුදා සේවයට බැඳුණු ශ්‍රී ලාංකිකයන්

රුසියාවේ යුධ හමුදාවේ සේවයට කොන්ත්‍රාත් පදනම මත පිටත්ව ගොස් විවිධ දුෂ්කරතාවන්ට පත්ව ඇති පුරවැසියන් ඉන් මුදා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පිරිස විදේශගත කරන ලද තැරැව්කරුවන් විසින් අදාළ පුද්ගලයාට ලැබෙන මුදලින් කොටසක් අයකර ගැනීම, පොරොන්දු වූ වැටුප් නොලැබීම, තුවාල ලැබූ හා මියගිය පිරිස පිළිබඳ නිවැරදි දත්ත නොලැබීම සහ කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ කළ පිරිස ගිවිසුමෙන් නිදහස් නොකිරීම වැනි ගැටලු රැසක් වාර්තා වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට මියගිය 61 දෙනෙකු පිළිබඳ නිල තොරතුරු තානාපති කාර්යාලය මඟින් වාර්තා කළ බවත් ඊට අමතරව මිය ගිය පිරිසගේ තොරතුරු ඉදිරිපත් කර නොමැති බවත් අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වසරක් සම්පූර්ණ කළ වහාම ගිවිසුම් කාලයෙන් නිදහස් කිරීමට හැකියාව නොමැති බව සහ ඒ සඳහා අදාළ හමුදා රෙජිමේන්තුව විසින් නිර්දේශ කළ යුතු බවට රුසියානු ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලිඛිතව දැනුම් දී ඇති බව අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තවදුරටත් හමුදාවේ සේවය කිරීමට සෞඛ්‍ය තත්ත්වයක් නොමැති බවට දැනුම් දී අදාළ ගිවිසුමෙන් නිදහස් කරන ලෙස ඉල්ලා ඉල්ලීම් ලිපි ඉදිරිපත් කළ ද යුද හමුදාවෙන් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයට අනුව එය තීරණය කරන

බව අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් දැනුම් දෙන ලදී.

තුවාල ලැබූ පිරිසට ප්‍රතිකාර ලබා දෙන රෝහලෙන් අදාළ වන්දි මුදල් ලබාදෙන ක්‍රමවේදයක් පවතින බැවින් එහි ප්‍රමාදයක් නොමැති බවත් සම්පූර්ණයෙන්ම වැටුප් නොගෙවීම් ද වාර්තා වී නොමැති බවත් අතිරේක ලේකම් (කොන්සියුලර් කටයුතු සහ සන්ධාන) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

අදාළ ගිවිසුමෙන් නිදහස් වීමට නම් අදාළ හමුදා රෙජිමේන්තුව භාර නිලධාරියාට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු බවත් තානාපති කාර්යාලයෙන් කරනු ලබන ඉල්ලීම් පිළි නොගන්නා බව රුසියානු විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දැනුම් දුන් බවත් අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මියගිය ශ්‍රී ලාංකිකයින්ට වන්දි ලබාදීම සම්බන්ධයෙන් එරට ආරක්ෂක අමාත්‍යාංශය නියම කරන ලද ක්‍රමවේදයට අනුව 16 දෙනෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට රුසියානු රාජ්‍ය බැංකුවක් වන ස්බර්බෑන්ක් (Sberbank) සමඟ තානාපති කාර්යාලයේ නිලධාරීන් කටයුතු කරමින් පවතින බවත් අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

නමුත්, එම රාජ්‍ය බැංකු සියල්ලටම සම්බාධක පනවා තිබීම මත වන්දි මුදල් ශ්‍රී ලංකාවට එවීම පිළිබඳ ගැටලු මතු වන බව ද අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තුවාල ලැබූ ශ්‍රී ලාංකිකයන් පිළිබඳව එරට විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් වෙන් වෙන්ව තොරතුරු ඉදිරිපත් නොකරන ලද නමුත් යම්කිසි පුද්ගලයෙකු පිළිබඳ තොරතුරු විමසූ විට ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී ඇති බව ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

වැටුප් නොගෙවීම් පිළිබඳව වාර්තා නොවූ බවත් තැරැව්කරුවන් විසින් අදාළ පුද්ගලයාට ලැබෙන මුදලින් කොටසක් අයකර ගැනීමේ ගැටලුව පොලිස් පැමිණිල්ලක් සිදුකිරීම මඟින් විසඳාගත යුතු බවට රුසියානු ආරක්ෂක අමාත්‍යාංශය දැනුම් දුන් බවත් අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව ඉතාමත් සංකීර්ණ බැවින් මේ පිළිබඳ මැදිහත් වී කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.13.2 ඊශ්‍රායලයට පිටත්වීම සඳහා සුදුසුකම් සපුරා ඇති පිරිස නැවත සම්මුඛ පරීක්ෂණයකට ලක්කිරීම

මෙම වර්ෂයේ ඊශ්‍රායලයේ රැකියා සඳහා පිටත්ව යාමට පුද්ගලයන් 109ක් තෝරාගත්ත ද සියලු ලිපිගොනු සකසා අවසන් වූ විට ඔවුන් නැවත පරීක්ෂාවකට ලක් කර ඉන් කිහිප දෙනෙක් පමණක් තෝරා ගෙන ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහිදී සිදුවන්නේ මෙරටින් අදාළ පුද්ගලයන් තෝරා ගැනීමෙන් පසු ඊශ්‍රායලයේ ජනගහන, සංක්‍රමණික හා දේශසීමා අධිකාරිය (Population, Immigration and Border Authority of Israel - PIBA) මඟින් නැවත පරීක්ෂාවකට ලක් කිරීම බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ගිවිසුමට අදාළ ඊශ්‍රායලයේ එක් ආයතනයක් තම බලපත්‍රය ඊශ්‍රායලයේ ජනගහන, සංක්‍රමණික හා දේශසීමා අධිකාරිය (Population, Immigration and Border Authority of Israel – PIBA) තුළ නැවත ලියාපදිංචිය සිදු කර නොතිබීම මත මෙම ගැටලුව පැන නැගුණු බවත් මේ වන විට එම ගැටලුව විසඳී ඇති බවත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකරු විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කෘෂිකර්මාන්තයට අදාළ රැකියා සඳහා ශ්‍රමිකයන් තෝරා ගැනීමේ ක්‍රමවේදයේ දී සුදුසුකම් නොමැති පිරිසක් තෝරාගෙන ඇති බවත් එම පිරිස තෝරාගත් පෙර පැවති ක්‍රමවේදය නුසුදුසු බවත් ඊශ්‍රායලයේ ජනගහන, සංක්‍රමණික හා දේශසීමා අධිකාරිය (Population, Immigration and Border Authority of Israel - PIBA ) විසින් දැනුම් දුන් බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සුදුසුකම් නොමැති පිරිස ප්‍රතික්ෂේප වන බැවින් මෙවන් ගැටලු පැනනැඟී ඇති බවත් ක්‍රමානුකූලව අදාළ ගාස්තු සහ ගුවන් ටිකට් පත් සඳහා වූ මුදල් නැවත ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

#### 3.13.3 පඬුවස්නුවර, දඹදෙණිය හා යාපහුව සංචාරක කලාප ලෙස දියුණු කිරීම

පඬුවස්නුවර ප්‍රදේශය සංචාරක ගමනාන්තයක් වශයෙන් දියුණු කිරීමට ගෙන ඇති පියවර සහ එම ප්‍රදේශයත් සමඟ යාපහුව සහ අනුරාධපුරය එක්කර මාර්ගයක් සෑදීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වයඹ පළාත් සභාව සමඟ පඬුවස්නුවර, දඹදෙණිය සහ යාපහුව යන ප්‍රදේශ සංචාරක ගමනාන්තයක් ලෙස දියුණු කිරීම පිළිබඳව වාර්තාවක් සකස් කර ඇති බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වාර්තාව පිළිබඳ ගරු මන්ත්‍රීතුමාට ලියාපදිංචි තැපෑලෙන් පිටපතක් යැවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබාදෙන ලදි.

සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනාගෙන මුදල් වෙන් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ දායකත්වය ලබා දී ඇති බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.14 ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

#### 3.14.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාලවල මාරුවීම් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාලවල සේවාවන් පුළුල් කර ඇති නමුත් 2012 වර්ෂයෙන් පසු කාර්යමණ්ඩල සංඛ්‍යාව පිළිබඳ සමාලෝචනයක් සිදුකර නොමැති බැවින් සේවක සංඛ්‍යාව අවම මට්ටමක පවතින බවත් ස්ථාන මාරු ලැබූ ඇතැම් නිලධාරීන් විසින් යොමුකරන ලද

අභියාචනා සඳහා සැලකිල්ලක් දක්වා නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ස්ථාන මාරු ලබාදීමේ දී ප්‍රාදේශීය කාර්යාලවල සේවා කාලය වැඩිම නිලධාරියා කොළඹ හෝ කටුනායක කාර්යාලවලට මාරු කර කොළඹ හෝ කටුනායක කාර්යාලවල වැඩිකලක් සේවය කළ නිලධාරියා සඳහා එම ප්‍රාදේශීය කාර්යාලවලට ස්ථාන මාරුවක් ලබාදීම, පවතින ක්‍රමවේදය බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකරු විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම පිණිස ස්ථාන මාරු ලබාදීම් සිදු කරන බවත් සාධාරණ ඉල්ලීම් සඳහා අභියාචනා සලකා බැලීමට හැකි බවත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

සේවා ස්ථානවල කාර්යක්ෂමතාවය ඇති කිරීමට නිලධාරීන් ස්ථාන මාරු කිරීම අත්‍යාවශ්‍ය බවත් මේ පිළිබඳව කරුණු ඉතා විමසිල්ලෙන් සලකා බලන ලෙසත් ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ට දැනුම් දෙන ලදී.

### 3.14.2 ජාත්‍යන්තර රියදුරු බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය සඳහා නිසි නියාමනයක් සිදු කිරීම

ජාත්‍යන්තර රියදුරු බලපත්‍රය ලබා ගැනීම සඳහා ලංකා ඔටෝමොබයිල් සංගමය (Automobile Association of Ceylon) හරහා හෝ ගරු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන අලියොන්ස් ඉන්ටර්නැෂනල් ඩී ටුවරිසම් ඉන් ජිනීවා යන ආයතනයට අනුබද්ධ යම් සංගමයක් (any other Association which is affiliated to the Alliance International de Tourism in Geneva, Switzerland) හරහා හෝ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලුම් පත්‍රයක් හා අදාළ ගාස්තු ඉදිරිපත් කළ යුතු බවට 2009 අංක 08 දරන මෝටර් වාහන (සංශෝධිත) පනතේ දක්වා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලිය සඳහා රු. 7,000/= පමණ මුදලක් අය කරන බවත් ජාත්‍යන්තර රියදුරු බලපත්‍රය සහිත විදේශිකයකු මෙරටට පැමිණියහොත් ඔහුට පවා මෙම සංගමය හරහා වෙනත් රියදුරු බලපත්‍රයක් නිකුත් කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා යම් නියාමනයක් අවශ්‍ය බැවින් ජාත්‍යන්තර රියදුරු බලපත්‍රය ලබාදීමේ සමස්ත ක්‍රියාවලියම රජය මැදිහත්ව සිදු කිරීම වැදගත් බව විදේශ රැකියා අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හා ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනයට (පුද්ගලික සමාගම) අදාළ පනත් සංශෝධනය කර ඒ සඳහා සුදුසු ආයතන ඇතුළත් කිරීම සඳහා කටයුතු කරන බව විදේශ රැකියා අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා පවතින ක්‍රමවේදයේ වෙනස්කම් සිදු කිරීමට ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා

අමාත්‍යාංශයෙන් ලිඛිතව විමසීමක් සිදුකර අදාළ තොරතුරු ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.15 ශ්‍රී ලාංකිකයයන් විදේශගත වීමේ දී මූල්‍ය වංචාවන්ට හසුවීම වළක්වා ගැනීම - ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

දැනුවත්භාවය අවම වීම නිසා සාමාන්‍ය ජනතාව විදේශගත වීමේදී විවිධ නියෝජිතායතනවල (Agencies) මූල්‍ය වංචාවන්ට හසුවන බැවින් ඒවා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර සහ ඒ සම්බන්ධ වර්තමාන තත්ත්වය පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අදාළ ලියාපදිංචි නියෝජිතායතන (Agencies), විදේශගත කිරීමට අපේක්ෂා කරන රැකියා සහ පුරප්පාඩු ප්‍රමාණය සහ අයකළ හැකි මුදල පිළිබඳව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය මඟින් තොරතුරු ලබාගත හැකි බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකරු විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, 1989 යන කෙටි දුරකථන අංකය ඔස්සේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇමතීමෙන් ද මෙම තොරතුරු ලබාගත හැකි බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකරු විසින් දැනුම් දෙන ලදී.

විවිධ අක්‍රමිකතා සහිත නියෝජිතායතන (Agencies) පිළිබඳව තොරතුරු ඇත්නම් ප්‍රධාන කාර්යාලය ඇතුළු ශාඛා කාර්යාල 05 වෙත හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරනු ලැබූ සංවර්ධන නිලධාරීන් වෙත අදාළ පැමිණිලි ඉදිරිපත් කළ හැකි බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකරු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ශිෂ්‍ය වීසා බලපත් (Student Visa) ලබාගෙන රැකියා සඳහා විදේශ ගතවන පිරිස ඒ සඳහා පිටත් කරන උපදේශන සමාගම් (Consultancy Institutes) නියාමනය කිරීමට නිසි ක්‍රමවේදයක් නොතිබීම නිසා මෙවැනි ගැටලු පැන නැඟෙන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අයත් ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය (පුද්ගලික) සමාගම මඟින් ඊශ්‍රායලය, ජපානය, දකුණු කොරියාව යන රටවල් සඳහා විදේශ රැකියාවන්ට යොමු කළ ද බොහෝ යුරෝපීය රටවලට විදේශගත වීමේ දී පෞද්ගලික නියෝජිතායතන (Agencies) මඟින් මෙම කටයුතු සිදු කරන බැවින් මෙවැනි ගැටලු ඇතිව තිබෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

E 8 වීසා කාණ්ඩයේ රැකියා (E 8 Visa) හෙවත් සෘතුමය රැකියාවන් සඳහා දකුණු කොරියාවට විදේශ රැකියා සඳහා පිටත් කිරීමට අමාත්‍ය මණ්ඩල යෝජනාවක් අනුමත කර ඇති බවත් දකුණු කොරියාවේ ඇති රැකියා ආයතන සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු මෙම කටයුතු ආරම්භ කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 12.45 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

-----------------------------------------------------------------------------------------

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2025 අප්‍රේල් මස 07**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (සභාපති)
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
ගරු නීතිඥ සරත් කුමාර මහතා
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා

**1. නියමය සලකා බැලීම**

**1.1 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 08 දිනැති අංක 2418/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය**
(2025.03.20 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

2013 අංක 02 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය විශේෂ විධිවිධාන පනතේ 7 (2) වගන්තිය යටතේ මෙම නියෝගය වසර දෙකකට වරක් දීර්ඝ කිරීමට සිදුවන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ලඝු නොවන පරීක්ෂණයක් නොමැතිව නීතිපතිවරයාට සෘජුවම අධි චෝදනා ඉදිරිපත් කිරීමට හැකිවන ලෙස කටඋත්තර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ ක්‍රමයක් බවත් සාමාන්‍ය පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන පැය 24ක් පමණක් රඳවා තබා ගැනීමට හැකි වුවත් මෙම පනත විසින් ඉදිරිපත් කරනු ලබන සීමිත අවස්ථාවල දී පැය 48ක් දක්වා රඳවා තබා ගැනීමට අවස්ථාව ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා අදාළ වන විධිවිධාන වලංගුවන කාලය ඉක්මවා ගොස් තිබීම හේතුවෙන් නැවතත් එම කාලය වසර 02ක් දක්වා දීර්ඝ කළ යුතු බැවින් මෙම නියෝගය ඉදිරිපත් කරනු ලබන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ වාසි සහ අවාසි සහගත තත්ත්වයන් පවතින අතර නිදසුන් වශයෙන් ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම කඩිනම් වීම, ලඝු නොවන පරීක්ෂණයකින් නඩුවක් ඉවත් කිරීමට මහේස්ත්‍රාත්වරයා සතු බලතල මෙම පනත මගින් බැහැර කර ඇති අවස්ථා පවතින බවත් මෙම විධිවිධානවල වලංගු කාලයේ විටින් විට දීර්ඝ කිරීම වෙනුවට මෙම පනත සංශෝධනය කිරීම සම්බන්ධව කටයුතු සිදු විය යුතු බවත් ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම පනත මගින් කිසිඳු ආකාරයකින් මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදු නොවන බවත් මෙම පනතේ දක්වා ඇති උපලේඛනගත වැරදිවලට අදාළව

පමණක්ම මෙම කාලය දීර්ඝ කිරීම අදාළ වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම විධිවිධානවල වලංගු කාලය විටින් විට දීර්ඝ කිරීම වෙනුවට මෙම පනත සංශෝධනය කිරීම සම්බන්ධව ගරු නීතිපතිතුමා විසින් අදහස් දක්වා ඇති බවත් මෙම නියෝගය අනුමත කිරීමෙන් අනතුරුව පනත සංශෝධනය කිරීම සම්බන්ධව අවධානය යොමු කළ යුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම පනත 2005 වර්ෂයේ සිටම මෙම තත්ත්වයේ පවතින බවත් වසර දෙකින් දෙක මෙම කාලය දීර්ඝ කිරීම යම් කාලයක දී සිදු කිරීමට නොහැකිවීම හේතුවෙන් 2013 වර්ෂයේ දී නව පනතක් ගෙන ඒමට සිදු වූ බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම විධිවිධානවල වලංගු කාලය නිශ්චිතවම වසර දෙකින් දෙක පමණක් දීර්ඝ කිරීමට විශේෂ හේතුවක් තිබේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල්ගෙන් විමසීමක් කරන ලදී.

2015 වර්ෂයේ සිට මෙම පනත සම්මත කිරීමෙන් අනතුරුව පැවැති ක්‍රියාවලියම මේ වනතෙක් පවත්වා ගෙන පැමිණ ඇති බවත් මේ සම්බන්ධව නීතිපතිතුමාගේ මතය ලිඛිතව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ හරස් ප්‍රශ්න ඇසීම සිදු නොකරන බැවින් මේ පනත යටතේ දෙනු ලබන සාක්ෂිය සාක්ෂි ආඥාපනතේ 33 වගන්ති යටතේ අනුකූල කරගත නොහැකි බවට නඩු තීන්දු කිහිපයක් ලබා දී ඇති බවත් ගරු නීතිපතිතුමා වෙත සෘජුවම අධි චෝදනා ගොනු කිරීමේ හැකියාව සහ පොලිසියට රඳවා ගැනීමේ හැකියාව පැවතීම යන කාරණා 02 පැවතීම හේතුවෙන් බරපතල අපරාධ සම්බන්ධයෙන් මෙම නීතිය තවදුරටත් පවත්වාගෙන යා යුතු බව ගරු නීතිපතිතුමාගේ සහ පොලිසියේ මතය වන බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙම අනුනීති ප්‍රධාන පනතට ගැනීමට හෝ ස්ථිර සංශෝධනයක් සිදුකිරීමට මෙය කිසිසේත්ම බලනොපාන බවත් ලඝු නොවන පටිපාටිය ඉවත් කිරීමට ද හැකි බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව නීතිඥ සංගම්වලින් අදහස් ද ලබා ගෙන කමිටුවක් පත්කර මෙම කටයුතු සිදුකළ හැකි බව ද නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල් විසින් දැනුම් දෙන ලදී.

තව ද, ලඝු නොවන කාර්ය පටිපාටිය වසර 10කට වඩා ගත වූ නඩු සම්බන්ධ දත්ත රැස් කරන ලෙස ද නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසටර් ජෙනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සියලු කරුණු සම්බන්ධව සලකා බලා ඉදිරි කටයුතු සිදු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් නියමයට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 2. වෙනත් කරුණු

### 2.1 ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා

#### 2.1.1 පූගොඩ අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු

පූගොඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු සිදුකරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අධිකරණ සංකීර්ණය ඉදිකරනු ලබන කොන්ත්‍රාත්කරු සමඟ නිරන්තර අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පූගොඩ අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා තමන් පැමිණෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට නඩු කටයුතු පවත්වාගෙන යන ගොඩනැගිල්ල භාවිත කිරීමේ කුලී ගිවිසුම තවත් වසරකින් හෝ නව අධිකරණ සංකීර්ණය ඉදිකර අවසන් කරන තෙක් දීර්ඝ කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

#### 2.1.2 නඩු භාණ්ඩ ගබඩාකර තැබීමේ අපහසුව

ඇතැම් අධිකරණවල නඩු භාණ්ඩ ගොඩ ගසා තිබීම හේතුවෙන් ඒවායේ කටයුතු පවත්වාගෙන යාමට අපහසු තත්ත්වයක් මතුව ඇති බැවින් එම නඩු භාණ්ඩ මුදා හැරීම සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අධිකරණ සංකීර්ණ කෙතරම් ඉදිකළ ද නඩු භාණ්ඩ බැහැර කිරීමේ නිසි ක්‍රමවේදයක් නොමැති වුවහොත් මෙම ගැටලුව මතුවන බවත් මේ සම්බන්ධව කමිටුවක් පත් කර ඇති අතර එහි කටයුතු සිදුවෙමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දන ලදී.

Disposal of Court Productions යන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූලික සැලසුම් සිදුකරන අතර එය ඉදිරියේ දී ඉදිරිපත් කරන බවත් එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන තෙක් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය මෙම කටයුතුවල නීති රාමුව සම්බන්ධව සාකච්ඡා කිරීම උපදෙස් ලබා දීම ආදිය සිදුකරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

2025 අංක 05 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත තුළ මෙම නඩු භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධ විධිවිධාන පවතින බැවින් ඉදිරියේ දී එම කටයුතු වෙනස් විය හැකි බව නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

විවිධ පනත් ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින ගැටලු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා එම පනත කෙටුම්පත් කරන ලද කණ්ඩායම ගෙන්වා මහේස්ත්‍රාත්වරුන් සහ විනිසුරුවරුන් දැනුවත් කළ හැකි බවත් පුහුණු වැඩසටහන් හා සංවේදී කරන වැඩසටහන් පැවැත්වීම මගින් පනත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.1.3 අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සැලසීම

ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමය සහ එක් එක් අධිකරණවල පවතින ප්‍රාදේශීය නීතිඥ සංගම් සමඟ සාකච්ඡා කර එම අධිකරණවල කඩිනමින් සිදු කළ හැකි යටිතල පහසුකම් සංවර්ධනය සහ විවිධ වෙනත් කටයුතු සිදු කිරීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

නීතිඥ සංගම් කිහිපයක් තමා සමඟ සාකච්ඡා කර අදාළ අධිකරණවල පවතින යටිතල පහසුකම් සම්බන්ධව දැන්වූ බවත් මෙවැනි කටයුතු සම්බන්ධව සලකා බලා ඉදිරි කටයුතු සිදුකරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, නීතිඥ සංගම්වලට තවත් මෙවැනි ගැටලු පවතී නම් වේලාවක් වෙන් කරවාගෙන තමන් හමුවීමට පැමිණ මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර එම කමිටුවට ලබා දෙන යෝජනා වර්ගීකරණය කර ඒ සම්බන්ධව සලකා බැලීමට හැකි බවත් එවැනි ක්‍රියාවලියක් පැවතීමෙන් කටයුතු පහසු වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම යෝජනාව පිළිබඳව සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.2 බිබිල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය ඒකාබද්ධ උසාවියක් කිරීම - ගරු නීතිඥ සරත් කුමාර මහතා

බිබිල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය ඒකාබද්ධ උසාවියක් (Combined Court) කරන ලෙස බිබිල නීතිඥවරුන්ගේ සංගමය විසින් ඉල්ලීමක් කර ඇති බැවින් එහි ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඒකාබද්ධ උසාවියක් (Combined Court) ස්ථාපිත කිරීම සඳහා අගවිනිසුරුතුමාගේ සහ අභියාචනාධිකරණ විනිසුරුවරයාගේ එකඟතාවය ලැබී ඇති බවත් ඒ අනුව නීති කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර එය ලැබුණු පසු ගැසට් පත්‍රය නිකුත් කිරීමට හැකි බවත් අතිරේක ලේකම් (නීති) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.3 මාන්කුලම් උසාවි සංකීර්ණය - ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා

මාන්කුලමහි ඉදිකර ඇති නව අධිකරණය සංචාරක උසාවියක් ලෙස ක්‍රියාත්මක වන බැවින් මෙය පූර්ණ උසාවියක් බවට පත්කරන ලෙසට යෝජනාවක් ඉදිරිපත් වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒකාබද්ධ උසාවි (Combined Court) ස්ථාපිත කිරීම, උසාවිවල පවතින නඩු සංඛ්‍යාව ආදිය සැලකිල්ලට ගෙන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඊට අදාළ තීරණ ගනු ලබන බවත් රේඛීය අමාත්‍යාංශය ලෙස මේ සඳහා සෘජුව මැදිහත්වීම් සිදුකළ නොහැකි බැවින් මීට අදාළව යෝජනාවක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය හරහා එය අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 මාරවිල අධිකරණය සඳහා විනිසුරුවරයකු පත් කිරීම - ගරු නීතිඥ හිරුණි විජේසිංහ මහත්මිය**

මාරවිල අධිකරණයේ විනිසුරුවරයාගේ වැඩ තහනමට ලක්වීමෙන් පුරප්පාඩු වූ එම තනතුරට කඩිනමින් විනිසුරුවරයකු පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් වීම නිසා රේඛීය අමාත්‍යාංශය හරහා එයට බලපෑම් සිදුකළ නොහැකි බවත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කඩිනමින් විනිසුරුවරයකු පත් කරනු ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.5 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම - ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා**

මේ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන ඇති අතර එම කමිටුව සඳහා සාමාජිකයින් පත්කර ගැනීමට නාමයෝජනා විමසා ඇති බවත් හැකි ඉක්මනින් මෙම කමිටුවේ සාමාජිකයින්ගේ අවසන් නම් ලැයිස්තුව සකස් කරගෙන මූලික රැස්වීමක් පැවැත්වීමට හැකි වුවහොත් කටයුතු සාර්ථක වනු ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම් (නීති) වෙත උපදෙස් ලබාදෙන ලදී.

මෙම කමිටුවේ සභාපති සමඟ තමන් සාකච්ඡා කර අදාළ පාර්ශ්ව සමඟ මූලික සාකච්ඡා සිදු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව දැනුම් දෙන බවත් මේ සම්බන්ධ කටයුතු වේගවත් කිරීම සම්බන්ධව ගරු ජනාධිපතිතුමන් ද අවධානය යොමු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නව පනත් ගෙන එන තෙක් මෙය ක්‍රියාත්මක බවත් මීට අදාළ මූලික කෙටුම්පත් සකස් කිරීමට මාස හතරක් පමණ ගතවන අතර ජනතාවගේ අදහස් ලබා ගැනීම සඳහා තවත් මාස 2 - 3ක් වැනි සීමිත කාලසීමාවක් ලබා දී අවසන් වාර්තාව සකස්කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව ප. ව. 03.10 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---------------------------------------------------------------------------------------

**කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2025 අප්‍රේල් මස 08**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (සභාපති)
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍ය)
ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය
ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු චානක මාදුගොඩ මහතා
ගරු රුවන් මාපලගම මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

## 1. 2025.02.21 දින පැවති රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු

### 1.1 කාන්තා හා ළමා කටයුතු විෂය සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක පදනම් කර ගනිමින් අධීක්ෂණයක් සිදු කිරීම - ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය (2025.02.21 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.5.4)

**ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සංවර්ධන යෝජනා පිළිබඳව සාකච්ඡා කළ ද කාන්තාවන් හා ළමයින් පිළිබඳව සාකච්ඡා කිරීම න්‍යාය පත්‍රයෙන් ඉවත්වන බැවින් ඒ පිළිබඳව ලිඛිතව දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කිරීම පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගෙන් ප්‍රගතිය විමසීම**

මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් ලිඛිතව දැනුවත් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කළ බවත් ඒ අනුව, බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක කිහිපයකට ම දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටුවල දිස්ත්‍රික්කය තුළ පවතින කාන්තාවන් හා ළමයින් පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීම න්‍යාය පත්‍රයට යොදා ගෙන ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සෑම දිස්ත්‍රික්කයකම කාර්තුවක් පාසා මෙම කමිටු රැස් වන බවත් එම කමිටුවට අදාළ වාර්තා අමාත්‍යාංශයට ද යොමු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම සම්බන්ධීකරණයෙන් පවතින ළමා හිමිකම් ප්‍රවර්ධන කමිටුවල දී පාසල්වල අර්බුද, දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම මෙන්ම එම ප්‍රදේශවලට ආවේණික දරුවන් සම්බන්ධ ගැටලු සාකච්ඡා කරන බවත් අවසන් කමිටුවේ දී දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අමාත්‍යාංශය විසින් යොමු කරන ලද දැනුවත් කිරීම්වලට අවධානය යොමු කරමින් කාන්තා හා ළමා කටයුතු විෂය පිළිබඳ සාකච්ඡා කළ බවත් ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම පවතින ගැටලුවලට ප්‍රධානම හේතුව වන බවත් කාන්තා හා ළමා කටයුතු ඉලක්කගතව විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බවත් ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම කාන්තා සහ ළමා සංවර්ධන කමිටුව විධිමත්ව ක්‍රියාත්මක නොවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එම කමිටු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලිඛිතව දැනුවත් කළ යුතු බවත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභික ගරු මන්ත්‍රීවරයෙක් ද එම කමිටුවට සම්බන්ධ කර ගන්නා ලෙස ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට සම්බන්ධව නිලධාරීන් 06 දෙනෙකු සේවය කරන බවත් එම නිලධාරීන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා ගැටලු ඉදිරිපත් කර සාකච්ඡා කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එක් දිස්ත්‍රික්කයකට අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සියල්ල පැවැත්වීමෙන් පසු එම යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ක්‍රියාත්මක කළ යුතු බව ද ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

**2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

**2.1 2025.02.21 දින පැවති රැස්වීමේ දී පැන නැඟුණු කරුණුවලට අදාළව පහත ආයතනවල නිලධාරීන් සම්බන්ධ කරගනිමින් ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳව සාකච්ඡා කිරීම**

බාල වයස්කාර දරුවන් මෙහෙකාර සේවයේ යෙදවීම, ලිංගික හිංසනයට ලක්වන දරුවන් සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධ කරගැනීම, පොදු ප්‍රවාහන සේවයේදී දරුවන් හා කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම, අධ්‍යාපනයෙන් මඟහැරෙන දරුවන් සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග, ඔටිසම් තත්ත්වයන් ඇති දරුවන් සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග මෙන්ම දරුවන් සම්බන්ධව තොරතුරු මාධ්‍යට වාර්තාකරණය ක්‍රමවත් කිරීම පිළිබඳව ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළැඹීමට අමාත්‍යාංශ

05ක නිලධාරීන් සම්බන්ධ කරගෙන ඇති බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ පළමු රැස්වීමේ දී සාකච්ඡා කළ පරිදි 1939 අංක 48 දරන ළමා හා යෞවන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා සකස් කරන ලද අවසන් පනත් කෙටුම්පතට අදාළව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා පත්කර ඇති කමිටුවේ සාමාජිකයෙක් ලෙස තමා කටයුතු කරන බවත් එම වාර්තාව අවසන් අදියරේ පවතින බැවින් ඉදිරි සතියක කාලයක දී එම වාර්තාව ලබාදිය හැකි බවත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශාරීරික දණ්ඩනය වරදක් ලෙස දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීමට අදාළව සංශෝධන සකස් කර ඇති බවත් අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමට නිර්දේශ ඉදිරිපත් කර ඇති බවත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සම්බන්ධව විශේෂඥ කමිටුවක් පත් කර ඇති බවත් සම්පූර්ණයෙන්ම ළමා හිංසනය ශාරීරික හිංසනය වැළැක්වීමට හැකි පරිදි සංශෝධන ඇතුළත් කර ඇති බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබීමෙන් අනතුරුව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට එය යොමු කළත් පසුගිය රජය විසින් අවසන් වශයෙන් ලබාගත් අමාත්‍ය මණ්ඩල තීරණය පිළිබඳව නැවත සොයා බැලිය යුතු බවට පවතින රජය ගත් තීරණය හේතුවෙන් මේ වනතෙක් නීතියක් ලෙස ක්‍රියාත්මක නොවී ඇති බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දී ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2025 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ලබාගත හැකි ද යන්න සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

වරදක් කිරීම හා එම වරදට දෙන දඬුවම ද සංශෝධනය විය යුතු බැවින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ සංශෝධන ද අවසන් වූ පසු සංශෝධන සියල්ල එකවර ඉදිරිපත් කරන බව නීති නිලධාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.2 දරුවෙක් ජීව විද්‍යාත්මක පවුලෙන් වෙන් කිරීම (2025.02.21 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.1.3)

මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

2019 වසරේ දී විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දීමේ දී ළමයෙකුට ජීවත්වීමට සුදුසුම පරිසරය " පවුල" වන බැවින් ළමා නිවාසවල දරුවන් අඩු කිරීමටත් ළමා හිමිකම් නිලධාරීන් හරහා අවදානම් සහගත සිසුන් සහ ආර්ථික අපහසුතා ඇති සිසුන් හඳුනාගත් විට එම දරුවන්ට රැකවරණ සැලසුම් සකස් කිරීමට කටයුතු කරන බවත් පරිවාස කොමසාරිස් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එලෙස අධ්‍යාපන ආධාර, දෙමාපියන්ට ස්වයං රැකියා සඳහා අවශ්‍ය ආධාර හා නිවසේ ජීවත්වීමට අවශ්‍ය යටිතල පහසුකම් සලසා දීමට කටයුතු කරන බව පරිවාස කොමසාරිස් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඇතැම් අවස්ථාවල අධිකරණ කටයුතුවල දී ඉතා කුඩා දරුවන් පවා පවුලෙන් වෙන්කර ආයතනගත කිරීම ප්‍රායෝගිකව සිදු වන බව ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, යුනිසෙෆ් ආයතනය හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යන ආයතන ත්‍රිත්වය ඒකාබද්ධව දකුණු, මධ්‍යම, උතුරු, බස්නාහිර වැනි පළාත් ඇතුළුව පළාත් මට්ටමෙන් මහේස්ත්‍රාත්වරුන්, දිස්ත්‍රික් විනිසුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද බවත් ඉදිරි වැඩසටහන්වල දී විනිසුරුවන් සඳහා ළමා නිවාස ක්ෂේත්‍ර චාරිකාවක නියැළීමට අවස්ථාව සලසා ඇති බවත් පරිවාස කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

දරුවන් පරිවාසගත කිරීමේ දී දරුවා පවුලෙන් ගිලිහුණත් සහෝදරත්වය රැකෙන පරිදි එක්ව වාසය කිරීමට ප්‍රතිපාදන සැලසිය හැකි ද යන්න සම්බන්ධයෙන් ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය විසින් විමසීමක් කරන ලදී.

පවතින සම්පත් සීමාසහිත වීම, ලිංග භේදය හා වයස අනුව දරුවන් කාණ්ඩ, පරිවාසගත කිරීම හේතුවෙන් ඒ පිළිබඳව ගැටලු පවතින බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනතේ අධිකරණයට ඉදිරිපත් කරන සියලුම ළමයින් සම්බන්ධයෙන් නීති ප්‍රතිපාදන පවතින බවත් වර්තමානයේ වින්දිත දරුවන්, සැකකාර දරුවන් එක්ව රඳවා තබන අතර මෙම දරුවන් වර්ගීකරණයෙන් අනතුරුව ආයතනගත කිරීම සිදුකළ යුතු බවට නව සංශෝධනයක් ඉදිරිපත් කර ඇති බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් පත්කළ කමිටුව විසින් බන්ධනාගාර නිලධාරීන් සමඟ කළ සාකච්ඡාවකින් අනතුරුව බරපතල ගණයේ අපරාධ සිදු කරන ලද අවුරුදු 18ට අඩු දරුවන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට ඇතුළත් නොකර වෙනම ස්ථානයක රඳවා තැබීමට තීරණය කළ බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම දරුවන් රඳවා තැබීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදුවන බවත් පුනරුත්ථාපන ක්‍රියාවලිය හා උපදේශන ක්‍රියාවලිය ද එලෙස කාර්යක්ෂම කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නව රජය යටතේ පරිවාස දරුවන්ට ප්‍රතිපාදන සලසා ඇති බවත් පරිවාසගත ගැහැණු දරුවන් විවාහ වීමේදී නිවාසක් සඳහා ණය ලබාදීමේ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා නිලධාරින් පුහුණු කිරීමේ කටයුතුවල වර්ධනයක් පෙන්නුම් නොකරන බව ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනවල සේවක පුරප්පාඩු පවතින බවත් නීතිය හදාරන උපදේශනය ලබාදිය හැකි පුද්ගලයන් බඳවා ගැනීම සඳහා, බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය වෙනස් කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.3 යාපනය දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථානවලට දෙමළ භාෂාව කතා කළ හැකි කාන්තා නිලධාරිනියක් පත් කිරීම (2025.02.21 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.2.1)

පොලිස් ස්ථානවලට මෙන්ම පොලිස් ස්ථානවල ස්ථාපිත කර ඇති ගෘහස්ථ හිංසන කවුළුවලට (domestic violence desk) දෙමළ භාෂාව කතා කළ හැකි කාන්තා නිලධාරිනියක් පත් කිරීම පිළිබඳව ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

යාපනය දිස්ත්‍රික්කයේ සේවය කරන කාන්තා නිලධාරීන් 56න් 21ක් ළමා හා කාන්තා කාර්යාංශවල සේවය කරන බවත් දෙමළ භාෂාව හැසිරවිය හැකි නිලධාරීන් 08 දෙනෙකු සිටින බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කයිට්ස් පොලිස් ස්ථානයේ පමණක් දෙමළ භාෂාව හැසිරවිය හැකි නිලධාරිනියක් නොමැති බැවින් ඒ සඳහා ඉල්ලීම් සිදුකර ඇති බවත් මෙහිදී පොලිස් කාන්තාවන් සඳහා මූලික පහසුකම් සැලසීමේ දී ගැටලු පවතින බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා පොලිසියට ලැබෙන සෑම පැමිණිල්ලක්ම සටහන් කර විභාග කර ගත යුතු බවට චක්‍රලේඛයක් ද නිකුත් කර ඇති බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

සීමිත පොලිස් නිලධාරීන් ප්‍රමාණයක් සේවයේ නියුතු වීම හේතුවෙන් එම අදාළ නිලධාරිනිය නිවාඩු ලබා ඇත්නම් පැමිණිල්ල නියමාකාරයෙන් සටහන් නොවීම අධිකරණයේ දී ගැටලුවක් විය හැකි බැවින් එක් අධිකරණ බල ප්‍රදේශයකට ආසන්නතම පහසුකම් සහිත එක් ස්ථානයක් තෝරා එම ස්ථානයට නිලධාරින් යෙදවීමට කටයුතු කරන ලෙස ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය විසින් යෝජනා කරන ලදී.

වර්තමානයේදීත් මෙලෙස කොට්ඨාස කාර්යාංශයක් ක්‍රියාත්මක බව ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විවිධ ප්‍රදේශවලට අදාළව දෙමළ මාධ්‍යයෙන් බඳවා ගත යුතු නිලධාරීන් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් සකස් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

කයිට්ස් හැරුණු කොට යාපනය කොට්ඨාසය තුළත් ජේදුරුතුඩුව හැරුණුකොට කන්කසන්තුරේ කොට්ඨාසය තුළත් සෑම පොලිස් ස්ථානයකම දෙමළ භාෂාව හැසිරවිය හැකි අවම වශයෙන් එක් නිලධාරිනියක් සේවය කරන බව නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දෙමළ භාෂාව හැසිරවිය හැකි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ හිඟතාවය හේතුවෙන් ගැටලු පැන නැඟී ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 සෑම ප්‍රදේශයකම මානසික උපදේශන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම (2025.02.21 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.2.2)**

පරිවාසගත දරුවන් සහ ගෘහස්ථ හිංසනයට ලක්වන කාන්තාවන් සඳහා මානසික උපදේශන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු විවිධ අමාත්‍යාංශවල මැදිහත් වීමෙන් ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආර්ථික සවිබල ගැන්වීම පමණක්ම නොව මානුෂීයව සමාජ සවිබල ගැන්වීම සඳහා අවධානය යොමු කළ යුතු බව ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් දැනුම් දෙන ලදී.

මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා සායන 458ක නිලධාරීන් 249ක් මූලික රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල්වල සතිඅන්ත දිනවලදී ද ක්‍රියාත්මක වන බවත් වෙනම මධ්‍යස්ථානයක් පිහිටුවීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා ද නිලධාරීන් යොමු කළ හැකි බවත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ද අදහස් පළ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල උපදේශන නිලධාරී තනතුරෙහි සේවය කරන නිලධාරීන් උපදේශනය සඳහා යොමුවන පුද්ගලයාව නිසි පරීක්ෂණයකින් හඳුනාගැනීම සිදු කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම, ආර්ථික උපදේශන ක්‍රියාවලිය සඳහා පත් කරන සිටින නිලධාරීන් පිරිස, මෙම ක්‍රියාවලියට සම්බන්ධ කරගත නොහැකි බව ගරු සභාපතිතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**2.5 පෙර පාසල් පද්ධතිය නියාමනය කිරීම (2025.02.21 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.3.4)**

පළාත් 09 යටතේ පෙර පාසල් ක්‍රියාත්මක වන බවත් රජයෙන් පවත්වාගෙන යන පෙර පාසල් සංඛ්‍යාව සීමිත වන අතර රජයෙන් පෙර පාසල් ගුරුවරුන් බඳවා නොගන්නා බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලිය උපස්ථම්භනය සඳහා ලබාදෙන රු. 5,000ක රජයේ දීමනාව රු. 6000 දක්වා ඉහළ දමා ඇති බවත් පළාත් 09ටම පෙර පාසල් සඳහා පොදු විෂය නිර්දේශයක් ක්‍රියාත්මක විය යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

හසුරු කුසලතා වර්ධනය කර ගනිමින් බුද්ධි වර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය යුතු බව ද ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

එක් එක් පළාත් සභාවේ පළාත් ප්‍රඥාප්තියට අනුකූලව පෙර පාසල් ක්‍රියාත්මක වන බවත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයත් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයත් ඒකාබද්ධව දිවයිනටම පොදු විෂය නිර්දේශයක් හඳුන්වාදීමට වැඩකටයුතු සිදුකරමින් පවතින බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

අවුරුදු 05ට අඩු දරුවන් යටතට ගැනෙන උපතේ සිට අවුරුදු 3 හා අවුරුදු 3-5 වයස් කාණ්ඩවල දරුවන්ගේ පෝෂණය, මනෝ සමාජයේ වර්ධනය හා මොළයේ ධාරිතාවේ ඉහළ නැංවීම මෙම වැඩපිළිවෙළෙහි අපේක්ෂාව බව ද ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඔටිසම් දරුවන් හා අධික්‍රියාකාරි දරුවන් මුල් අවදියේම හඳුනාගැනීම මුල් ළමාවිය කළමනාකරණයේ වැදගත්ම කාර්යභාරය බවත් මුල් ළමාවියේදී පවතින සංකූලතා හඳුනා ගැනීමෙන් අනතුරුව ප්‍රතිකාර කිරීමෙන් දරුවන් යථා තත්ත්වයට පත් කර ගැනීම පහසු බැවින් මෙම ක්‍රියාවලිය සක්‍රීය කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පාසල් අධ්‍යාපනයට පූර්ව ළමාවිය සංවර්ධනය ඇතුළත් කිරීමේ දී මනෝචාලක අවධියේ සිටින අවුරුදු 3 - 5 අතර විවිධ සංකූලතා පවතින දරුවන් හඳුනා ගැනීම හා ප්‍රතිකාර සඳහා යොමු කිරීම මූලිකව මෙම පෙර පාසල් නියාමනය තුළ සිදුවිය යුතු බවත් පාසල් අධ්‍යාපනය තුළ විශේෂ අධ්‍යාපනය ක්‍රියාත්මක වන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවර අයවැයෙන් ඔටිසම් දරුවන්, ස්නායු ආබාධ සහිත දරුවන් හා ඒඩ්ස් රෝගී තත්ත්වයේ දරුවන් සඳහා ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍යවරයෙකුගේ සම්බන්ධීකරණයෙන් මූලික සාකච්ඡා පවත්වා ඇති බවත් වෙන්කරන ලද රු. මිලියන 250න් ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථාන 03ක් හඳුනාගත් ප්‍රදේශවල ආරම්භ කිරීමට සාකච්ඡා කළ බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධයෙන් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට දීප ව්‍යාප්තව මෙම හඳුනාගත් දරුවන් යොමු කිරීමෙන් දරුවන් නිසි සංවර්ධන අවධිවලට අවතීර්ණ වීමට පූර්ණ පසුබිමක් සකස් කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා

දෙපාර්තමේන්තුව හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා ඒකාබද්ධව කමිටුවක් පත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

විශේෂඥ වෛද්‍යවරුන්, පවුල් සෞඛ්‍ය කාර්යාංශය, ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය, සමාජ සේවා දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය යන ආයතනවල නියෝජිතයින් හා ඒකාබද්ධව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ආබාධ සහිත දරුවන් සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවේ දී කමිටුවක් පත් කිරීමේ එකඟතාවයකට පැමිණි බවත් මෙම ආබාධ සහිත දරුවන් වැඩි ප්‍රදේශ තෝරාගෙන මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට යෝජනා වූ බවත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එහිදී මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට සාමාන්‍ය දරුවන් ද ඇතුළත් කිරීමට සාකච්ඡා වූ බව ද මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම කමිටුවට නොවිධිමත් අධ්‍යාපන ඒකකය ද සම්බන්ධ කරගත යුතු බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2025 ජනවාරි මස වන විට බස්නාහිර පළාතේ පමණක් විශේෂ අවශ්‍යතා සහිත ඒකකවල දරුවන් 1,070ක් අතරින් ඔටිසම් දරුවන් 261ක් හා විශේෂ අධ්‍යාපනය සඳහා පවතින පාසල් 27හි දරුවන් 2,000කට ආසන්න ප්‍රමාණයක් සිටින බවත් විශේෂ අවශ්‍යතා සහිත ඒකකවල දරුවන් 6,813ක් පමණ ද මුළු දිවයිනම සැලකූ විට දරුවන් 9,000ක් පමණ සිටින බවත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් අවුරුදු 03දී මෙම විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගැනීමෙන් අනතුරුව කොට්ඨාස හා කලාපවලට අදාළව දරුවන්ගේ අධ්‍යාපන තක්සේරුවක් සිදුකිරීමට පිහිටුවා ඇති මධ්‍යස්ථාන 100ක් සඳහා දරුවන් යොමු කරන බව ද සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහිදී දරුවන් ප්‍රාථමික හා විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ගුරුවරුන් හා උපදේශකවරුන්ගෙන් සමන්විත කමිටුවකින් අධීක්ෂණය කිරීමෙන් අනතුරුව පවතින ආබාධ තත්ත්වයේ ස්වභාවය අනුව විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කරන බවත් අවුරුදු 04දී ඇතුළත් වූ දරුවෙක් අවුරුදු 05 වන විට සාමාන්‍ය දරුවෙක් ලෙස පළමු වසරට ඇතුළත් කරන අවස්ථා ද තිබෙන බවත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

සෑම පාසලකටම අන්තර්කරණ අධ්‍යාපනය (Inclusive Education) සම්බන්ධ ගුරුවරයෙක් පත්කර ඇති බවත් විද්‍යාපීඨ ගුරුවරුන්ට ආබාධ සහිත දරුවන් හසුරුවීම සම්බන්ධව මාස 06ක පුහුණුවක් ලබාදෙන ලෙසට ඉල්ලීම් සිදු කර ඇති බවත් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් දැනුම් දෙන ලදී.

නිවසේ දී දරුවන් රැකබලා ගත යුතු ආකාරය පිළිබඳව දැනුවත් වීමට මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට දෙමාපියන්ට ද සහභාගී වීමට අවස්ථාවක් ලබා දෙන ලෙසත් සාමාන්‍ය දරුවන් සමඟ අධ්‍යාපනය ලබන විට සීඝ්‍ර දියුණුවක් දැකිය හැකිවීම ගෝලීය වෛද්‍ය මතය බවත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් දැනුම් දෙන ලදී.

මෙම දරුවන් දෙපාර්ශ්වය සමඟ එකවර පන්ති කාමර හැසිරවීමට ගුරුවරුන්ගේ ආකල්ප තවදුරටත් සංවර්ධනය කළ යුතු බව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

අන්තර්කරණ අධ්‍යාපනය (Inclusive Education) සංකල්පය ද ඇතුළත් කර මුල් ළමාවිය අධ්‍යාපනය සම්බන්ධයෙන් Preprimary Education Policy නමින් ප්‍රතිපත්තියක් මේ වන විට කෙටුම්පත් කරමින් පවතින බවත් පසුගිය වසරේ දී සිදු කරන ලද පෙර පාසල් විෂය මාලා රාමුව සම්බන්ධ කෙටුම්පතට ජාතික අධ්‍යාපන ආයතනය මඟින් අනුමතිය මේ වන විටත් හිමි වී නොමැති බවත් මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පෙර පාසල් ගුරුවරුන්ට විශේෂිත අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම හා උපදේශනය සම්බන්ධ පුහුණුවක් ලබා දිය යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

NVQ Level 4 හි විෂය මාලාවේ පසු විපරමක් ද මෙම ප්‍රතිපත්තිය සඳහා අන්තර්ගත කර ඇති බව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව සාදන ලද ප්‍රතිපත්තිය පිළිබඳව පළාත් මට්ටමින් පසුගිය සතියේ දී සාකච්ඡාවක් පැවැති බව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3. වෙනත් කරුණු

### 3.1 කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වය ලබා ගැනීම - ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද කැඳවන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.2 අවුරුදු 05ට අඩු දරුවන් සිටින කාන්තාවන්ට විදෙස්ගත වීමට අවසර ලබාදීම - ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

අවුරුදු 05ට අඩු දරුවන් සිටින කාන්තාවන්ට විදෙස්ගත වීමට අවසර ලබාදීම හේතුවෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතුකරයේ පවුල් ආශ්‍රිතව ගැටලු පැන නැඟී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමට මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් කැඳවීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ දී මේ පිළිබඳව සාකච්ඡාවෙන් අනතුරුව රේඛීය අමාත්‍යාංශයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත් විදෙස්ගත වීමට අපේක්ෂිත මෙම කාන්තාවන් සඳහා මෙරට සුදුසු ස්වයං රැකියා ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම සුදුසු බව එම කමිටුවේ දී තීරණය කළ බවත් පරිවාස කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

සුළු වැරදිවලින් සිරගතවන දරුවන් වටරැක සුණීත පාසල සඳහා යොමු කරන බවත් එහි 200කට ආසන්නව සිටි දරුවන් 20 දක්වා අඩුවී ඇති බවත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන) විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා දරුවන් යොමු කිරීමේ ගැටලුවක් පවතින බව ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන) විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා පොලීසිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ හා ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන් 600ක් සම්බන්ධීකරණයෙන් මෙම සුළු වැරදි කරන ලද දරුවන් සමථ මණ්ඩලයට යොමු කිරීමෙන් අනතුරුව වර්තමානයේ ප්‍රජාපාදක පුනරුත්ථාපනයට ඉඩ හරින අතර ආයතනගත කිරීම අවම බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වර්තමානයේ අවුරුදු 18ට අඩු ළමයින් 32ක් බන්ධනාගාරගතව සිටින අතර ආයතනගතව සිටින අපරාධවලට ලක් වූ දරුවන් පුනරුත්ථාපනයට ජාතික ප්‍රතිපත්තියක් සකස් කර නොමැති වීම හේතුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ සම්බන්ධීකරණයෙන් එවැනි ප්‍රතිපත්තියක් සකස් කිරීමට මෙම කමිටුව මඟින් අදාළ පාර්ශ්ව රැස් කිරීමට යෝජනා කරන බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3.3 යාපනය දිස්ත්‍රික්කයේ ගෘහස්ථ හිංසනයට ලක් වූ වින්දිතයින්ට රැකවරණ මධ්‍යස්ථානයක් ඇති කිරීම - ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**

ගෘහස්ථ හිංසනයට ලක් වූ වින්දිතයින්ට රැකවරණ මධ්‍යස්ථානයක් යාපනය දිස්ත්‍රික්කයේ ඇති කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට කිලිනොච්චිය හා අච්චුවේලි රැකවරණ මධ්‍යස්ථාන තිබෙන බවත් නුවරඑළිය නව රැකවරණ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දරුවන් සඳහා රැකවරණ මධ්‍යස්ථාන තිබෙන නමුත් කාන්තා රැකවරණ මධ්‍යස්ථානය සඳහා ලබා දුන් ගොඩනැඟිල්ල උතුරු පළාතේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදවා ඇති බව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

## 3.4 මනෝ සමාජීය එකමුතුව වැඩසටහන ක්‍රියාත්මක කිරීම - ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා

මනෝ සමාජීය එකමුතුව සඳහා ත්‍රෛමාසිකව දිස්ත්‍රික් මට්ටමින් සියලු නිලධාරීන් කැඳවා පවතින ගැටලු සාකච්ඡා කළ බැවින් නැවත එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළයුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

දිස්ත්‍රික් මට්ටමින් ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථාන (Child Guidence Centre) ඇති කළ යුතු බවත් වීඩියෝ පටිගත කිරීම් මඟින් සාක්ෂි ලබා ගැනීමෙන් අදාළ තොරතුරු අධිකරණයට යොමු කළ හැකිවීම තුළින් දරුවා නැවත ප්‍රශ්න කිරීම්වලට යොමු නොවන බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ හේතුවෙන් පොලිස් ස්ථානවලට ළමයින් හා කාන්තාවන් සම්බන්ධයෙන් පැමිණිලි වාර්තා කිරීම සීමා වන බව නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 341ක් සඳහා උපදේශන නිලධාරීන් 309ක් සේවයේ යෙදෙන බවත් ගැටලු පැන නගින අවස්ථාවල දී ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය ඇතිව මෙම නිලධාරීන් කණ්ඩායම් වශයෙන් පවතින ගැටලු නිරාකරණය කරන බවත් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රේඛීය අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල උපදේශන ඒකක ස්ථාපිත කර තිබුණ ද එම ඒකකවල වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක වන බැවින් ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර එම ස්ථානවල නැවත උපදේශන ඒකක පවත්වාගෙන යාමට දැනුම් දී ඇති බවත් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් වර්තමානයේදීත් වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් සිදු කරන බවත් ඇමරිකාව වැනි රටවල ළමා මනෝ විශේෂඥයින් විසින් දරුවාගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීමක් සිදු කර එම වීඩියෝ පොලිසිය, අධිකරණ වෛද්‍යවරයා ඇතුළු සියලු පාර්ශ්ව වෙත යොමු කරන බැවින් දරුවා අපහසුතාවයට පත්වන පරිදි නැවත සාක්ෂි නොවිමසන බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා එම රටවල ළමා උපදේශන මධ්‍යස්ථාන (Child Advocacy Centres) පවත්වාගෙන යන බව ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එම ක්‍රමවේදවල අවශ්‍ය කොටස් අවශෝෂණය කර ගනිමින් අප රටට ආවේණික ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විවිධ රටවල ක්‍රියාත්මක පද්ධති 03ක් පිළිබඳව අත්දැකීම් ලද බවත් මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය වෙනුවෙන් සේවාව සපයන නිලධාරීන් ද මේ සඳහා

සම්බන්ධ කරගත යුතු බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් දැනුම් දෙන ලදී.

ජපානයේ එක් මධ්‍යස්ථානයකට ළමයින් 35,000ක් පමණ අයත් වන බවත් එම මධ්‍යස්ථානවලට බහුලව අධ්‍යාපනික ගැටලු වාර්තා වන බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

ළමා මනෝ උපදේශන ඒකකය, සයිබර් අපරාධ ඒකකය, ශ්‍රී ලංකා පොලීසිය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එකම වහලක් යට ක්‍රියාත්මක වන බවත් වර්තමානයේ නිලධාරීන් 38 දෙනෙක්ගෙන් යුත් කණ්ඩායමකින් අධීක්ෂණය කරන බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් දැනුම් දෙන ලදී.

ළමා නිවාසවල ළමයින්ගේ මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් ගැටලු පවතින බැවින් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් සෞඛ්‍ය නිලධාරින් විසින් ළමා නිවාස නිරන්තරයෙන් නිරීක්ෂණය කළ යුතු බවත් මනෝ උපදේශනය ලබා දිය යුතු බවත් පරිවාස කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධව එක් මනෝ වෛද්‍යවරයෙක් දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රාදේශීය සේවා කාර්යාලයේ සේවය කරන බවත් මාසිකව හෝ ත්‍රෛමාසිකව ළමා නිවාස හා පරිවාස නිවාස නිරීක්ෂණය කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීට පෙර මනෝ සමාජයීය සේවක ලෙස තනතුරක් පැවති බවත් ලිංගික හිංසනයට පත් වූ දරුවන් හෝ කාන්තාවන් සම්බන්ධව එක් වරක් පමණක් ප්‍රශ්න කිරීම් හා අදාළ වෛද්‍ය පරීක්ෂණ සිදු කරන බවත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා රෝහල්වල වෙනම ස්ථානයක් සකස් කර ඇති බව ද සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් දැනුම් දෙන ලදී.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය හරහා ක්ෂණික ඇමතුම් ලබා දීම සඳහා 1926 දුරකථන අංකය විවෘතව ඇති බව නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මහජනතාව අතර සියදිවි හානි කර ගැනීම ඇතුළු විවිධ ගැටලු පවතින බැවින් දිස්ත්‍රික්ක පදනම්ව ළමා උපදේශන මධ්‍යස්ථාන නියමු වැඩසටහනක් (Child Advocacy Centres Pilot Programme) ක්‍රියාත්මක කළ යුතු බවත් රේඛීය අමාත්‍යාංශයට වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් පවතින යාන්ත්‍රණයේ අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමිය විසින් නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

මනෝවිද්‍යා උපදේශනය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දුන් ගොඩනැගිලි වෙනත් අවශ්‍යතා සඳහා යොදා ගෙන ඇත්නම් එම ගොඩනැගිලි නැවත භාරදීමට දිනයක් නියම කර ලිඛිතව අදාළ අංශ දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

එක් එක් දිස්ත්‍රික්කවල මානසික උපදේශනය සඳහා යොමු වී ඇති දරුවන් ප්‍රමාණය, අවුරුදු 05ට අඩු දරුවන් සිටිය දී විදෙස්ගත වී සිටින කාන්තාවන් ප්‍රමාණය, පාසල් යන වයසේ පරිවාසගත දරුවන් ප්‍රමාණය, පාසල් නොයන දරුවන් ප්‍රමාණය හා ආබාධ සහිත දරුවන් ප්‍රමාණය පිළිබඳ වාර්තා ජුනි මස අවසන් වන විට ලබා ගෙන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට යොමු කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

දැනට පවතින යාන්ත්‍රණයට හසු නොවූ දරුවන්ගෙන් උපදේශනයට යොමු නොවූ දරුවන් ප්‍රමාණය, පරිවාසගත දරුවන්ට පවතින ගැටලු හා අධ්‍යාපනය නොලබන දරුවන් ප්‍රමාණයෙහි සංඛ්‍යාලේඛන ලබාගෙන සමාජ සුභසාධන කටයුතු ක්‍රියාත්මක කළ යුතු බවට ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

**3.5 මනෝවිද්‍යා උපදේශන නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් මාර්ගෝපදේශයක් සැකසීම - ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**

දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් මනෝවිද්‍යා උපදේශන නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් වැඩපිළිවෙළක් සැකසීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

**3.6 ප්‍රසිද්ධ ස්ථානවල දරුවන් යොදා ගනිමින් සිඟමන් යැදීම - ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

බැංකු, සුපිරි වෙළෙඳසැල්, ආලෝක සංඥා පුවරු අසල කුඩා දරුවන් හා පාසල් යන වයසේ දරුවන් යොදා ගනිමින් සිඟමන් යැදීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා පළමු රැස්වීමේ දී ස්වභාවික දෙමාපියන් විසින් දරුවන් සිඟමනේ යෙදවීම පිළිබඳව පැමිණිලි ඵලදායි ලෙස විමර්ශනය කර පියවර ගන්නා ලෙස පළාත් නියෝජ්‍ය පොලිස්පතිවරුන් ලිඛිතව දැනුවත් කිරීමට උපදෙස් ලබා දුන් බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තාවන සෑම පැමිණිල්ලකම පැමිණිලි අංකය ද සමඟ එම ස්ථානවල එවැනි සිඟමනේ යෙදෙන පුද්ගලයින් නොසිටි බවට ලද පිළිතුර පිළිගත නොහැකි බැවින් ඵලදායි ලෙස මෙම පැමිණිලි විමර්ශනය කර ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති දැනුවත් කරන ලෙසට පොලිස්පති හා නියෝජ්‍ය පොලිස්පතිවරුන් දැනුවත් කළ බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් දැනුම් දෙන ලදී.

2023 හා 2024 වර්ෂවල පිළිවෙළින් දරුවන් 101ක් හා 66ක් පොලිස් භාරයට ගෙන පවුල්වල ගැටලු හේතුවෙන් ළමා නිවාස ගතකළ බවත් වර්තමානයේ මෙලෙස වාර්තා වූ සිද්ධීන් පිළිබඳ වාර්තාවක් ලබා දිය හැකි බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් දැනුම් දෙන ලදී.

මත්ද්‍රව්‍යවලට දිනකට වැය වන රු. 7,000ක පමණ පිරිවැය ක්ෂණිකව සොයාගැනීම සඳහා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දෙමාපියන් දරුවන් ද රැගෙන

සිහමනේ යෙදෙන බව නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.7 ආබාධ සහිත දරුවන්, ඔටිසම් දරුවන් හා සාමාන්‍ය දරුවන්ට එකම පන්ති කාමරයේ අධ්‍යාපනය ලබා දීම - ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**

ආබාධ සහිත දරුවන් හා ඔටිසම් දරුවන් සාමාන්‍ය දරුවන් සමඟම එකම පන්ති කාමරයේ තබාගෙන අධ්‍යාපනය ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බව මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී යෝජනා වූ බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.8 ඩිජිටල් අවකාශයේ කාන්තාවන් හා ළමයින් හිංසනයට ලක්වීම වැළැක්වීමට කමිටුවක් පත් කිරීම - ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (ගරු සභාපතිතුමිය)**

අන්තර්ජාලය හරහා ඩිජිටල් අවකාශයේ කාන්තාවන් හා ළමයින් හිංසනයට ලක්වීම, මාධ්‍ය වාර්තාකරණය, ප්‍රචණ්ඩත්වය මුදා හැරීම සම්බන්ධයෙන් විශේෂඥ දැනුමැති කමිටුවක් පත් කිරීමට ගරු සභාපතිතුමිය විසින් යෝජනා කරන ලදී.

මේ සම්බන්ධයෙන් නව නීති සම්පාදනයට ශ්‍රී ලංකා පොලීසිය, අමාත්‍යාංශ නිලධාරීන් අවධානය යොමු කළ යුතු බව ද ගරු සභාපතිතුමිය විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අපරාධයක් නොවන වරදක් සැලකූ විට අපරාධයක් තරමටම වින්දිතයින් මානසික හිංසනයට ලක් විය හැකි බවත් දේශීය ක්‍රියාදාමය සැලකූ විට 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතට (Online Safety Act) අදාළව කොමිෂන් සභා පිහිටුවා නොමැති වීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇති බවත් නියෝජ්‍ය පොලිස්පතිනි (ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන දිශාව) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පනත සංශෝධනය කිරීම සඳහා අදහස් හා යෝජනා ලබා දීමට කමිටුවක් පත් කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විද්වත් කමිටුවක් මගින් මේ සම්බන්ධයෙන් ආචාර ධර්ම පද්ධතියක් සකස් කර අවසන් කර ඇති බවත් යම් ආචාර ධර්මයක් කඩ කළ විට ගත යුතු නීතිමය ක්‍රියාමාර්ග පමණක් ඇතුළත් කළ යුතුව ඇති අතර මසක් ඇතුළත අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට නියමිත බවත් ජාතික ළමාරක්ෂක අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ළමා ආරක්ෂණ සම්මුතියට (Convention of Child Protection) අනුකූලව කම්කරු අමාත්‍යාංශය ක්‍රියාත්මක වන බවත් දරුවෙක් සේවයේ යෙදිය යුතු අවම වයස අවුරුදු 16 බවත් කම්කරු කොමසාරිස් (කාන්තා හා ළමා කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

අවුරුදු 16-18 වයස්වල පුද්ගලයින් අනතුරුදායක රැකියාවලට යෙදවිය නොහැකි බවට නීතිමය රැකවරණයක් පවතින බැවින් මෙම කරුණු ද එම සංශෝධනවලට ඇතුළත් කරන ලෙසට කම්කරු කොමසාරිස් (කාන්තා හා ළමා කටයුතු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ළමා සංවර්ධන කමිටුවල සිදු කරන දැනුවත් කිරීම්වලට ද කම්කරු අමාත්‍යාංශයෙන් නිලධාරීන් යොමු කිරීමට චක්‍රලේඛ නිකුත් කර ඇති බවත් ළමා ශ්‍රමය සම්බන්ධ නඩු පැවරීම්වලට දීර්ඝ කාලයක් ගතවීම ගැටලුවක් බවත් කම්කරු කොමසාරිස් (කාන්තා හා ළමා කටයුතු) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.8.2 සෑම ක්ෂේත්‍රයකම රැකියාවල නියුතු කාන්තාවන්ට ප්‍රසූත නිවාඩු නොලැබීම

වතු නිවාස ආශ්‍රිතව පළමු දරුවාට ලැබෙන ප්‍රසූත නිවාඩු, තෙවන දරුවාට නොලැබීම ගැටලුවක් බවත් විවාහය සඳහා වන නීත්‍යානුකූල වයස නිශ්චය කර ගැනීම අවශ්‍ය බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය මට්ටමින් සියලු කාන්තාවන්ට ප්‍රසූත නිවාඩු ලබා දීම සඳහා සාකච්ඡා කළ යුතු බව කම්කරු අමාත්‍යාංශයේ කම්කරු කොමසාරිස් (කාන්තා හා ළමා කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

පළමු වැනි දරුවාට ලැබෙන ප්‍රසූත නිවාඩු, දෙවැනි හා තෙවැනි සජීවී දරු උපත් සඳහා ද ලබාදීමට අදාළ නීති සංශෝධනය වී ඇති බවත් මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව දැනුවත් වී නොමැති බවත් කම්කරු කොමසාරිස් (කාන්තා හා ළමා කටයුතු) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.9 වතු ආශ්‍රිතව නීති විරෝධී මත්පැන් අලෙවිය හා භාවිතය ඉහළ යාම - ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

නීති විරෝධී මත්පැන් අලෙවිය හා භාවිතය ඉහළ ගොස් ඇති බවත් පොලිස් වැටලීම්වල දී අදාළ ස්ථානවල නීති විරෝධී මත්පැන් අලෙවියක් සිදුවී ඇති බවට සාක්ෂි සොයාගැනීම අපහසු වන බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නීති විරෝධී මත්පැන් භාවිතය ඉහළ යාම තුළින් ගෘහස්ථ හිංසනය සම්බන්ධ ගැටලු ද ඉහළ ගොස් ඇති බව ද ගරු මන්ත්‍රීතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවට ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

ප්‍රදේශය හා ස්ථානය නාමිකව සඳහන් කර ඉල්ලීමක් සිදුකරන ලෙසත් ඒ ඇසුරින් පසු විපරමක් සිදුකළ හැකි බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

පාසල් දරුවන් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ද විශාල පැමිණිලි ප්‍රමාණයක් ලැබෙන බව ජාතික ළමාරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ද නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සාකච්ඡා කළ බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

වතු ආශ්‍රිතව මෙන්ම නගරබද ප්‍රදේශවල ද පාසල් ආශ්‍රිතව විවිධ නීති විරෝධී මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වීම හේතුවෙන් වැටලීම් හා විමර්ශන ක්‍රියාත්මක කිරීම ඉහළ

දැමිය යුතු බව ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මත්ද්‍රව්‍ය, මත්පෙති, මත්කුඩුවලට ඇබ්බැහි වීම විශාල වශයෙන් දැකිය හැකි බවත් වැටලීම් නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මත්ද්‍රව්‍ය ලෙස ශිෂ්‍යයන් භාවිත කරන ඇතැම් ද්‍රව්‍ය පාරිභෝගික සේවා අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කර නොමැති බව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් දැනුම් දෙන ලදී.

මෙම ද්‍රව්‍ය තහනම් කරන ලෙස දන්වමින් ඉල්ලීමක් අදාළ ආයතනවලට යොමු කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් සියලුම ක්ෂේත්‍රවල දැනුවත් කිරීම් සිදු කරන බවත් එම මණ්ඩලයට අදාළ පනත මේ වන විට සංශෝධන වෙමින් පවතින බැවින් ඉහත කරුණු ද ඇතුළත් කිරීමට අදාළ ආයතනය දැනුවත් කරන බවත් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කෘත්‍රිම රා වැනි ද්‍රව්‍ය ද සමාජගත කර ඇති බව ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් දැනුම් දෙන ලදී.

පස්සර නගරයේ ඇති පාසල් සංඛ්‍යාව 05ක් පමණක් වුව ද මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව 12ක් වන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

වතු ආශ්‍රිත ප්‍රදේශවල මත්පැන් භාවිතය පමණක් ම නොව දුම්වැටි භාවිතය ද ජාතික මට්ටමට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බැවින් එය අධීක්ෂණය කිරීම සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෙනම වතු හා නාගරික ලෙස අධ්‍යක්ෂ ධූරයක්ද ස්ථාපිත කර ඇති බවත් "සතුටු වතුකරය" ලෙස විශේෂ වැඩසටහනක් ද ක්‍රියාත්මක වන බවත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 01.55 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---------------------------------------------------------------------------------

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2025 ජුනි මස 03**

**පැමිණි ගරු සාමාජික මන්ත්‍රීවරුන්**

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (සභාපති)
ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය)
ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය)
ගරු අනුර කරුණාතිලක මහතා
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු චන්දන තෙන්නකෝන් මහතා
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
ගරු නිමල් පලිහේන මහතා
ගරු රුවන් මාපලගම මහතා
ගරු සංජීව රණසිංහ මහතා
ගරු මංජුල සුගත් රත්නායක මහතා
ගරු සුනිල් රාජපක්ෂ මහතා
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු ආර්. එම්. සමන්ත රණසිංහ මහතා

**පැමිණි ගරු සාමාජික නොවන මන්ත්‍රීවරුන්**

ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා
ගරු වසන්ත සමරසිංහ මහතා
ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා
ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු අශෝක ගුණසේන මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
ගරු නන්දන පත්මකුමාර මහතා
ගරු සුදත් බලගල්ල මහතා
ගරු ඊ.එම්. බස්නායක මහතා
ගරු විජේසිරි බස්නායක මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු දීප්ති වාසලගේ මහත්මිය
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා
ගරු මුහම්මද් ෆයිසාල් මහතා

## 1. 2025.03.07 දින පැවති රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු

### 1.1 අනු කාරක සභා පත්කර ගැනීම
### (2025.03.07 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 5.2)

ගරු සභාපතිතුමිය විසින් අදාළ අනු කාරක සභා සාමාජිකයින්ගේ නම් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

උසස් අධ්‍යාපන අංශය පිළිබඳ අනු කාරක සභාව සඳහා ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා පත් කළ යුතු බව ගරු වසන්ත සමරසිංහ මහතා විසින් යෝජනා කරන ලදී.

තව ද, පාසල්වල පවතින මානව සහ භෞතික සම්පත් ඌනතාවය පිළිබඳ අනු කාරක සභාව සඳහා ගරු චන්දන තෙන්නකෝන් මහතා ද උසස් අධ්‍යාපන අංශය පිළිබඳ අනු කාරක සභාව සඳහා ගරු නිමල් පලිහේන මහතා ද නම් කරන ලදී.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් මෙම අනු කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරුන් වීමට කැමැත්ත පළ කරන්නේ නම් ඒ බව දැනුම් දෙන ලෙසත් මෙම සෑම අනු කාරක සභාවක් සඳහාම අමාත්‍යාංශ නිලධාරියෙකු ද පත් කරන බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2 විශේෂ අධ්‍යාපන උපදේශක සභාව පත් කිරීමේ ප්‍රමාදය - ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
### (2025.03.07 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 6.2)

විශේෂ අධ්‍යාපන උපදේශක සභාව පත්කර පත්වීම් ලිපි ලබා දී ගරු අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් පළමු රැස්වීම ද පැවැත්වූ බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3 මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලය සඳහා ස්ථිර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු පත් කිරීම - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා (2025.03.07 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 6.5.2)**

2025.06.09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම පත්වීම ලබා දී ඇති බව නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4 නැගෙනහිර විශ්වවිද්‍යාලය සඳහා උපකුලපතිවරයකු පත් කිරීම - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා (2025.03.07 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 6.5.3)**

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත්කිරීමට අදාළ නිර්දේශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත යොමු කර ඇති අතර ලබා දී ඇති නිර්දේශ අනුව ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරි කටයුතු සිදු කරනු ඇති බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ සහ ත්‍රිකුණාමල මණ්ඩපයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරුන් පත් කර නොමැති බැවින් උපකුලපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්දයට එය බාධාවක් වන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විට පත් කරගෙන සිටින නිලධාරීන්ගෙන් ඡන්දය පැවැත්විය හැකි බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

**2. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජනා**

**2.1 තම දරුවාගේ විශ්වවිද්‍යාල වරම් ප්‍රමාද වී තිබෙන තත්ත්වය මත එම විශ්වවිද්‍යාල ප්‍රවේශය සලසා දෙන ලෙස ගෝනාපීනුවල, කුරුසගොඩ, අංක. 133/12/3 ඒ ලිපිනයේ පදිංචි එච්. එම්. උපුල් කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම - ගරු ටී. කේ. ජයසුන්දර මහතා (යෝජනා අංක 31)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.2 ව/ ම/ බලල්ල යූ. බී. වන්නිනායක මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවන්ට දැනට පවත්නා ගොඩනැගිලි ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් එයට විසඳුමක් සලසා ගැනීම සඳහා පාසල ඉදිරිපිට ඉඩම මෙම පාසලේ ඉඩකඩ පුළුල් කර ගැනීමට රජයේ ප්‍රතිපාදන මඟින් ලබා ගැනීමට කටයුතු සලසා දෙන ලෙස එම පාසලේ ආදී ශිෂ්‍ය සංගමයේ ලේකම්, කේ. එම්. ඒ. නායක බණ්ඩාර මහතා විසින් කරන ලද ඉල්ලීම - ගරු නාමල් කරුණාරත්න මහතා (යෝජනා අංක 32)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත යොමු කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ව/ ම/ බලල්ල යූ. බී. වන්නිනායක මහා විද්‍යාලය යනු ළමුන් 1,652 පමණ ඉගෙනුම ලබන 1AB පාසලක් වන අතර මෙම පාසල සඳහා වර්ගඅඩි 20*120 ප්‍රමාණයේ ගොඩනැගිල්ලක අවශ්‍යතාවය පවතින බවත් මෙම ගොඩනැගිල්ල

ඉදිකිරීම සඳහා වන පර්චස් 72ක යෝජිත ඉඩම පාසල ඉදිරිපිට පවතින බවත් වයඹ පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙම ඉඩම සින්නක්කර ඔප්පුවක් සහිත ඉඩමක් වන අතර 2018 වර්ෂයේ දී රු. ලක්ෂ 72ක් වටිනා විකුණුම්කරයක් ලියා ඇති බවත් වර්තමානයේ දී මෙම ඉඩම අත්පත් කරගනු ලබන්නේ නම් රු. කෝටියක් පමණ වටිනාකමක් ගෙවීමට වනු ඇති බවත් වයඹ පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙම ඉඩම ලබා ගැනීම සඳහා වන ලිඛිත ඉල්ලීම මේ වනතෙක් ඉදිරිපත් කර නොමැති අතර එම ලිඛිත ඉල්ලීම ලබාගත් පසු ප්‍රතිපාදනය සම්බන්ධව ගැටලුවක් නොවේ නම් ඉදිරි කටයුතු සිදු කළ හැකි බවත් වයඹ පළාත් අධ්‍යාපන ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙහි ප්‍රගතිය සම්බන්ධව මීළඟ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් වයඹ පළාත් අධ්‍යාපන ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

**2.3 කාර්යය මණ්ඩල දරුවන් ඇතුළත් කර ගැනීමේ දෙවෙනි අදියර යටතේ සිය දරුවාට පාසැල අහිමිවීම සම්බන්ධව කේ. ඩබ් කේ. ඩී. මංජු ශ්‍රී මහතා විසින් කරන ලද ඉල්ලීම - ගරු ටී. කේ. ජයසුන්දර මහතා (යෝජනා අංක 33)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ පැමිණිලිකරු විසින් මෙම පිළිතුරු වාර්තාව පිළිනොගන්නා බැවින් මේ සම්බන්ධව මහජන පෙත්සම් කාරක සභාව වෙත පෙත්සමක් ඉදිරිපත් කළ බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙය පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධ ගැටලුවක් වීම සහ අදාළ නිලධාරීන් විසින් මෙය සාවද්‍ය බව දැනුම් දී තිබෙන බැවින් මේ සම්බන්ධව ඉදිරි කටයුතු කිසිවක් සිදු කිරීමට නොහැකි බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**2.4 පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛය සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම - ගරු ලසිත් භාෂණ ගමගේ මහතා (යෝජනා අංක 51)**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමාට යොමු කර ඇති බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**3.1.1 නැගෙනහිර විශ්වවිද්‍යාලය සඳහා නැගෙනහිර පළාතෙන් නිලධාරීන් පත් කිරීම**

නැගෙනහිර විශ්වවිද්‍යාල කවුන්සිලයේ සාමාජිකයින් නැගෙනහිර පළාතෙන්ම පත් කර ගැනීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

නැගෙනහිර විශ්වවිද්‍යාලය යනු රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන බැවින් කිසියම් නිශ්චිත ප්‍රදේශයකින් පමණක්ම නිලධාරීන් තෝරාගැනීමට නොහැකි බවත් ප්‍රායෝගික හේතූන් මත විශ්වවිද්‍යාලවලට ආසන්න ප්‍රදේශවලින් නිලධාරීන් පත් කරගන්නා බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යම් විශ්වවිද්‍යාලයක් පවතින ප්‍රදේශයෙන්ම නිලධාරීන් පත්කර ගතහොත් අභ්‍යන්තර ගැටලු නිර්මාණය වීමේ හැකියාව ඉහළ බවත් විවිධ විෂයන්හි විශේෂඥතාව ඇති අත්දැකීම් සහිත නිලධාරීන් පත් කරගන්නා බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 3.1.2 විශ්වවිද්‍යාල කවුන්සිලය සඳහා සාමාජිකයින් පත් කර ගැනීම

සෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයකම කවුන්සිලය පත්කර ගැනීමේ ක්‍රමවේදය සමාන ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මීට අදාළ ක්‍රියා පටිපාටිය සම්බන්ධව ගරු සභාපතිතුමිය විසින් දීර්ඝ පැහැදිලි කිරීමක් කරන ලදී.

## 3.2 රජය විසින් පාසල් සිසුන් සඳහා ලබාදෙන පොත් සහ පාවහන් වවුචර්පත් නොලැබීම - ගරු ටී. කේ. ජයසුන්දර මහතා

රජය විසින් පාසල් සිසුන් සඳහා ලබාදෙන පොත් සහ පාවහන් වවුචර්පත් ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම අධ්‍යාපන කලාපයේ පාසල්වල ඇතැම් සිසුන් සඳහා ලැබී නොමැති බව දැනුම් දී ඇති බැවින් ඔවුන්ට එම වවුචර්පත් නොලැබීමට හේතුව කුමක් ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ලබා දුන් ලේඛනය පරීක්ෂා කර බලන බවත් මෙතරම් සිසුන් සංඛ්‍යාවකට එම වවුචර්පත් නොලැබීමට හේතුවක් නොමැති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් අතිරේක ලේකම්ගෙන් (ප්‍රසම්පාදන) විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධව විශේෂ පැමිණිලි කිසිවක් ලැබී නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් ලබා දුන් ලේඛනය පරීක්ෂා කර වාර්තා කරන බවත් අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.3 කළුතර, බණ්ඩාරගම රමුක්කන විද්‍යාලෝක විද්‍යාලයේ ඉදිකරනු ලබන ගොඩනැගිල්ල - ගරු අජිත් පී. පෙරේරා මහතා

"ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ අඩක් නිමකළ ව්‍යාපෘතිවල ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ලබාදුන් උපදෙස් සහ නිර්දේශවලට අනුව කළුතර බණ්ඩාරගම රමුක්කන විද්‍යාලෝක විද්‍යාලයේ කටයුතු සිදුකරගෙන යන බවත් කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන පැවතියදීත් පාසලේ මේ වන විට පවතින ගොඩනැගිලි ප්‍රමාණවත් බව අදාළ ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, තමා සහ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරින් අතර සාකච්ඡාවක් කැඳවා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී මෙම ගැටලුව මතුවූ අවස්ථාවේ දී මෙම පාසලේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව දෙමහල් ගොඩනැගිල්ලක් ප්‍රමාණවත් වන බැවින් අදාළ තට්ටු දෙකක් පමණක් ඉදිකර තාවකාලිකව නවත්වා ඉතිරි පන්ති කාමර සැලසුම් සහගතව පවත්වාගෙන යා යුතු බව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අදහස වන බවත් ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.4 පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල නිලධාරීන් කැඳවීම - ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල නිලධාරීන් කැඳවන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් සෑම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක් සඳහාම සහභාගි වන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.5 ආබාධ සහිත සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වීම - ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා**

රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා අයදුම් කිරීමේ දී අනෙකුත් විෂය ධාරාවන් හා සැලකීමේ දී තාක්ෂණික විෂයයන් සඳහා ආබාධ සහිත සිසුන් ඇතුළත් කරගැනීමේ කෝටාවක් නොතිබීම හේතුවෙන් එම සිසුන් මුහුණ දී ඇති ගැටලුව සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදුකරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී අංශ 04ක් සඳහා පමණක් ආබාධ සහිත දරුවන් ඇතුළත් කරගන්නා බවත් විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි ඇතුළත් සියලු අංශ සඳහා ආබාධ සහිත දරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධව සාකච්ඡා කර මාර්ගෝපදේශ සකස් කර ඒ සඳහා අනුමතිය ලබාගෙන ඇති බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වර්ෂයේ විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් වන ආබාධ සහිත සිසුන්ට ද මෙය බල පැවැත්වෙන පරිදි පුවත්පත් දැන්වීම් පළ කර මහජනතාව දැනුවත් කර මෙම කටයුතු කඩිනමින් සිදු කිරීමට අපේක්ෂා කරන බවත් මෙම ගැටලුවට සම්බන්ධ සිසුවා මීට පෙර වර්ෂයක විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබා ඇති බැවින් මෙහිදී ප්‍රායෝගික ගැටලුවක් මතුවන බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

වර්තමානයේ දී මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් මෙම වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මෙම සිසුන් ඇතුළත් කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

මෙම ගැටලුවට මුහුණ දුන් දරුවාහට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා දෙන්නේ නම් ඔහු අයත් වන අ.පො.ස. උසස් පෙළ විභාග කණ්ඩායමේ සියලුම ආබාධ සහිත දරුවන්ට මෙම අවස්ථාව ලබාදීමට කටයුතු කළ යුතු බව ගරු අනුර කරුණාතිලක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී සාමාන්‍ය ප්‍රවේශය (Normal Intake) සහ විශේෂ ප්‍රවේශය (Special Intake) යන දෙයාකාරයක් පවතින අතර විශේෂ ප්‍රවේශය යටතේ ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කරගන්නා බවත් විශේෂ ප්‍රවේශය යටතේ ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ගය අනුව විශ්වවිද්‍යාලවල අදාළ අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා විසින් කරනු ලබන ඉල්ලීමකට අනුව ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගන්නා බවත් ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම අවස්ථාවේ දී ඇතැම් අධ්‍යයන පීඨ සඳහා ආබාධ සහිත සිසුන් ඇතුළත් කරගැනීම සහ ඇතැම් අධ්‍යයන පීඨ සඳහා ආබාධ සහිත සිසුන් ඇතුළත් කර නොගැනීම යන වෙනස මතුවන අතර එකම විෂය ධාරාව යටතේ වුව ද ඇතැම් විශ්වවිද්‍යාලවලට ආබාධ සහිත සිසුන් ඇතුළත් කරගන්නා අතර ඇතැම් විශ්වවිද්‍යාලවලින් ආබාධ සහිත සිසුන් ඇතුළත් කර නොගන්නා බවත් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කළ යුතු බවත් ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

මීට වසර 02කට පමණ පෙර සකස් කළ අන්තර්කරණ අධ්‍යාපනය (Inclusive Education) ප්‍රතිපත්තිය නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ද ඉදිරිපත් කළ බැවින් මේ වනවිට ඒ සම්බන්ධ ප්‍රගතිය පිළිබඳව ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගෙන් විමසීමක් කරන ලදී.

කෙටුම්පතක් ලෙස ඉදිරිපත් කළ අන්තර්කරණ අධ්‍යාපනය (Inclusive Education) ප්‍රතිපත්තිය සම්පූර්ණ කර ක්‍රියාවට නැංවීමට කටයුතු කිරීම මගින් ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුලත් කර ගැනීම සඳහා එය ප්‍රයෝජනවත් වනු ඇති බව ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද පැරණි වාර්තාව සහ වත්මන් තත්ත්වය සංසන්දනය කර නව වාර්තාවක් සකස් කර ඇති බවත් ඒ සඳහා අනුමතිය ලබාගෙන 2024 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගැනීමට කටයුතු කළ හැකි නමුත් ඊට පෙර වර්ෂවලදී අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගන්නේ නම් ඔවුන් ද 2024 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් සමඟම ඇතුළත් කර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා කරන බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආබාධ සහිත දරුවන් සඳහා විශ්වවිද්‍යාල තුළ පවතින පහසුකම් ද වැඩිදියුණු කළ යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ආබාධ සහිත දරුවන් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගැනීම සම්බන්ධව ප්‍රතිපත්තියක් සකස් කරන්නේ නම් එම දරුවන්ට විශ්වවිද්‍යාල තුළ පහසුකම් සැපයීම සම්බන්ධව ද කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් ද අදහස් පළ කරන ලදී.

මේ වන විට විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ආරම්භ වී ඇති බැවින් මෙම දරුවන් කඩිනමින් විශ්වවිද්‍යාල වෙත ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත උපදෙස් ලබාදෙන ලදී.

## 3.6 ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

### 3.6.1 රජයේ පාසල් විභාග සඳහා පෙනී සිටින දෘෂ්‍යාබාධ සහිත දරුවන් මුහුණ දෙන ගැටලු

ඉකුත් වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගයේ පොදු පරීක්ෂණය ප්‍රශ්න පත්‍රයේ ඇතුළත් ප්‍රශ්න 50න් දෘශ්‍යාබාධ සහිත විභාග අපේක්ෂකයකුට මුහුණ දිය හැකිවන්නේ ප්‍රශ්න 12ක් පමණක් බවත් ඉතිරි ප්‍රශ්න 38 රූපසටහන් හා සංකේත ඇතුළත් වන ප්‍රශ්න බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවැනි ආබාධිත තත්ත්වයන් සහිත විභාග අපේක්ෂකයින් පිළිබඳව සලකා බැලීමකින් තොරව ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අ.පො.ස. උසස් පෙළ විභාගයේ පොදු පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා නොගැනීම හේතුවෙන් සරසවි වරම් අහිමිවන බව ගරු නිමල් පලිහේන මහතා විසින් ද දැනුම් දෙන ලදී.

මෙවැනි පොදු විභාග පැවැත්වීමේ දී ආබාධ තත්ත්වයන් සහිත දරුවන් පිළිබඳව සලකා බලා විභාග ප්‍රශ්න පත්‍ර සකස් කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

දෘශ්‍යාබාධ සහිත විභාග අපේක්ෂකයින් සඳහා බ්‍රේල් ක්‍රමයට ප්‍රශ්න පත්‍ර සකස් කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව විභාග කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විභාග ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ මණ්ඩලවල ආබාධ සහිත පුද්ගලයින් නියෝජනය කරමින් එක් නිලධාරියෙකු හෝ සිටිය යුතු බවත් මෙවැනි කටයුතු සඳහා ආබාධ සහිත ප්‍රජාවගේ ද අදහස් ලබාගත යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙම ගැටලුවට මුහුණ දුන් මෙම වසරේ විභාග අපේක්ෂකයින් සම්බන්ධව ගනු ලබන පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් සහ උපදේශක මණ්ඩලය සමඟ සාකච්ඡා කර කඩිනම් පියවරක් ගන්නා බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.6.2 නොවිධිමත් ව්‍යාපෘති නිලධාරීන්ට පත්වීම් ලබා දීම

නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන කටයුතු සඳහා දිවයින පුරා නොවිධිමත් ව්‍යාපෘති නිලධාරීන් කණ්ඩායමක් විසින් කටයුතු කරනු ලබන බවත් ඔවුන්ට පත්වීම් ලබා දීම සම්බන්ධව 2005 වර්ෂයේ සිට ගැටලුවක් පවතින බැවින් මේ සම්බන්ධව එම නිලධාරීන් විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමිය වෙත ඉදිරිපත් කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.7 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

### 3.7.1 රට පුරා පවතින ගුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම

දිවයින පුරා ගුරු පුරප්පාඩු 40,000ක් පමණ පවතින අතර ඒ අතුරින් පළාත් මට්ටමින් ගුරු පුරප්පාඩු පිරවීම සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මගින් අයදුම්පත් කැඳවා විභාග සහ සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රේඛීය අමාත්‍යාංශය මගින් අනුමත ගුරු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා දිය යුතු බවත් ඒ සඳහා රජය මඟින් අනුමතිය ලබාදීමෙන් පසු මෙම ගුරු පුරප්පාඩු පිරවීම පිළිබඳ ගැටලුව විසඳිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගුරු බඳවා ගැනීම් සම්බන්ධ ගැටලුවේ වත්මන් තත්ත්වය සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් සාකච්ඡා කරනු ඇති බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

අධිකරණ නියෝගයක් හේතුවෙන් ජාතික මට්ටමෙන් පාසල්වල ගුරු සේවයට නවක ගුරුවරුන් බඳවා ගැනීමට නොහැකි බවත් 2023 වර්ෂයේ ජනවාරි මාසයේ නිශ්චිත දිනයක් දක්වා පවතින පුරප්පාඩු සඳහා පළාත් සභා පාසල් වෙත ගුරුවරුන් බඳවා ගැනීම සිදුකළ හැකි අතර එම පුරප්පාඩු සංඛ්‍යාව අනුමත කර ගැනීමට නම් අදාළ පළාත් සභා විසින් අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කමිටුව වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කළ යුතු බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කමිටුව මගින් ඒ සඳහා අනුමතිය ලබා දුන් පසුව බඳවාගැනීම් ආරම්භ කළ හැකි බවත් මේ සම්බන්ධව සාමාන්‍ය අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් (ගුරු ආයතන) විසින් පැහැදිලි කරනු ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

2023.01.27 වැනි දින ගැසට් පත්‍රය මගින් උපාධිධාරි ගුරුවරුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවූ අතර එය තහනම් කරමින් අධිකරණ නියෝගයක් ලබාගෙන ඇති බවත් ඒ අනුව 2023.01.27 වැනි දිනෙන් පසු ඇති වූ ගුරු පුරප්පාඩු සඳහා අදාළ පළාත් සභා විසින් අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කමිටුව වෙත කරුණු ඉදිරිපත් කර අනුමතිය ලබාගෙන බඳවා ගැනීම් සිදුකළ හැකි බවත් සාමාන්‍ය අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් (ගුරු ආයතන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බඳවා ගැනීම් අත්හිටුවා ඇත්තේ 2023.01.27 දින දක්වා ඇති පුරප්පාඩු සඳහා පමණක් බවත් පවතින තත්ත්වය මත ඒ සම්බන්ධව කටයුතු කළ නොහැකි බවත් සාමාන්‍ය අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් (ගුරු ආයතන) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු නීතිපතිවරයා සමඟ සාකච්ඡා කළ අතර මෝසමක් ඉදිරිපත් කර මෙහි කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දුන් බවත් නුදුරේදීම මේ පිළිබඳව අවසන් තීන්දුවක් ලබාදෙනු ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.7.2 විකිරණ ශිල්පී උපාධි පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීමේ දී මතුවී ඇති ගැටලුව

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් පිරිනමන විකිරණ ශිල්පී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා අ. පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනට සාමාන්‍ය සාමාර්ථ (S passes) ලබා තිබීම ප්‍රමාණවත් බව විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ සඳහන් කර තිබුණ ද ඔවුන් උපාධි පාඨමාලාව අවසන් කර පත්වීම් ලබාගැනීමේ දී අ. පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව විෂය සඳහා සම්මාන සාමාර්ථ (C passes) ලබා තිබිය යුතු බව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් එම සිසුන්ට දැනුම් දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විකිරණ ශිල්පී උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ උපාධිධාරීන්ට 2025.06.01 දින පත්වීම් ලබාදීමේ දී මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උපාධිධාරීන් දෙදෙනෙකුට අ. පො.ස. (උසස් පෙළ) විභාගයේ දී රසායන විද්‍යාව විෂය සඳහා සම්මාන සාමාර්ථ (C passes) ලබා නොතිබීම හේතුවෙන් පත්වීම් ලබා දී නොමැති බවත් මීට අමතරව කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවලින් විකිරණ ශිල්පී උපාධි පාඨමාලාව සඳහා තේරී පත්වී උපාධිය සම්පූර්ණ කළ තවත් උපාධිධාරීන් කිහිපදෙනෙකුට ද අ. පො.ස. (උසස් පෙළ) විභාගයේ දී රසායන විද්‍යාව විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ද (S passes) අනෙකුත් විෂයයන් සඳහා අධිසම්මාන සාමාර්ථ (B passes) සහ සම්මාන සාමාර්ථ (C passes) ලබාගෙන ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට අදාළ උපාධිය සම්පූර්ණ කර ඇති නමුත් අ. පො.ස. (උසස් පෙළ) විභාගයේ දී රසායන විද්‍යාව විෂය සඳහා සම්මාන සාමාර්ථ (C passes) ලබා නොගත් උපාධිධාරීන් හට රාජ්‍ය සේවයේ පත්වීම් ලබා නොදෙන්නේ නම් විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි මීට අදාළ නිවැරදි බඳවා ගැනීම් සුදුසුකම් ඇතුළත් කරන ලෙසත් මේ පිළිබඳව කඩිනම් පියවර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව පරීක්ෂා කර බලන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.7.3 පාසල්වල විදුහල්පති පුරප්පාඩුවල වැඩ බලන විදුහල්පතිවරුන් සේවය කිරීම

බොහෝ පාසල්වල විදුහල්පති තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට නොහැකිවීමෙන් එම තනතුරේ වැඩ බැලීම සඳහා ගුරුවරුන් පත් කර ඇති බැවින් විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.7.4 කිලිනොච්චියේ පිහිටි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ විදුහල්පති තනතුර සඳහා බඳවා ගැනීම

කොළඹ පිහිටි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පරිපාලනය සහ කිලිනොච්චියේ පිහිටි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පරිපාලනය අතර ඇතිවී තිබෙන බොහෝ පරස්පරතා හේතුවෙන් කිලිනොච්චියේ පිහිටි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ විදුහල්පති තනතුර සඳහා බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් මගින් හෝ වෙනත් ක්‍රමවේදයක් ඔස්සේ අයදුම්පත් කැඳවීම සිදුකර සාධාරණ ක්‍රමවේදයක් ඔස්සේ තෝරාගැනීම් සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය සම්බන්ධ ගැටලුවේ දී අමාත්‍යාංශය මගින් මේ සම්බන්ධව කටයුතු කරමින් පවතින බවත් එහි ප්‍රගතිය සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් සාකච්ඡා කරනු ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.8 ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

#### 3.8.1 අ. පො.ස. (උසස් පෙළ) විභාගයේ ජීව විද්‍යාව දෙමළ මාධ්‍ය ප්‍රශ්න පත්‍රයේ පැවති පරිවර්තන දෝෂ

අ. පො.ස. (උසස් පෙළ) විභාගයේ ජීව විද්‍යාව දෙමළ මාධ්‍ය ප්‍රශ්න පත්‍රයේ අක්ෂර වින්‍යාස දෝෂ සහ ව්‍යාකරණ දෝෂ විශාල ප්‍රමාණයක් පැවැති බවත් පසුගිය වසරේ විභාග ප්‍රශ්න පත්‍රය සහ මෙම වසරේ විභාග ප්‍රශ්න පත්‍රය සංසන්දනය කළ විට මෙය දිගින් දිගටම ඇති වූ ගැටලුවක් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව හේතුවෙන් සිසුන් දැඩි අපහසුතාවයට පත්වන අතරම විභාග ප්‍රශ්න පත්‍රයට මුහුණ දීමේදී සිසුන් දැඩි මානසික පීඩනයට පත්වන බවත් ප්‍රශ්න පත්‍ර ලකුණු කිරීමේ දී ලකුණු ලබාදීම සම්බන්ධ ගැටලුවක් ද ඇතිවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මේ සම්බන්ධව නිසි විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමිය විසින් විභාග කොමසාරිස් ජනරාල්ගෙන් විමසීමක් කරන ලදී.

ජීව විද්‍යාව දෙමළ මාධ්‍ය ප්‍රශ්න පත්‍රයේ පරිවර්තන දෝෂ පැවැති බවට ලද පැමිණිලිවලට අනුව ප්‍රධාන පාලන පරීක්ෂක ඇතුළු පරීක්ෂක මණ්ඩලයෙන් පැහැදිලි කිරීමක් ලබාගෙන මාර්තු මාසයේ දී පිළිතුරක් ලබා දුන් බවත් සිදුවී ඇති දෝෂ සම්බන්ධව ප්‍රධාන පාලන පරීක්ෂක සමඟ සිදුකළ සාකච්ඡාවේදී මෙම ප්‍රශ්න පත්‍රයට මුහුණ දුන් සිසුන්ට අසාධාරණයක් නොවන පරිදි ඇගයීම් කටයුතු සිදුකළ බවත් විභාග කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව නැවත නැවතත් ඇතිවන බැවින් මේ සඳහා නිසි විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

අ. පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යාව ප්‍රශ්න පත්‍රයේ පමණක් නොව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය ප්‍රශ්න පත්‍රවල ද ගැටලුවක්

පවතින බව ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රශ්න පත්‍ර ඇගයීම් කටයුතු සිදු කිරීමේ දී මෙම ගැටලුව සහිත ප්‍රශ්න සඳහා ලකුණු ලබා දුන්න ද එය ස්ථිර විසඳුමක් නොවන බවත් සිසුන් විභාග ප්‍රශ්න පත්‍රයට මුහුණ දීමේදී මෙම ප්‍රශ්න සඳහා උත්තර සැපයීමට ද සැලකිය යුතු කාලයක් වැය කරන බවත් ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා විසින් විමසීමක් කරන ලදී.

විභාග දෙපාර්තමේන්තුව තුළ දෙමළ මාධ්‍ය භාෂා පරිවර්තක පුරප්පාඩු පවතින බව විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දුන් බවත් මෙම පුරප්පාඩු පුරවන ලෙස ද දැනුම් දී ඇති අතර මෙම පරිවර්තක නිලධාරීන්ගේ ගැටලුව සැම ආයතනයකම පවතින බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

භාෂා පරිවර්තක පුරප්පාඩු පැවතිය ද මේ සඳහා අයදුම් කිරීමට අයදුම්කරුවන් නොමැති අතර මේ වන විට සේවයේ නිරතවන නිලධාරීන් ද සේවය තුළ රඳවා ගැනීමේ ගැටලු පවතින බවත් භාෂා පරිවර්තකයින් බඳවා ගන්නා තුරු මෙම ගැටලුව නොවිසෙදෙන බැවින් මේ සඳහා තාක්ෂණය භාවිත කිරීමට සිදු වන බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

දැනට මෙම අංශයේ සේවය කරනු ලබන නිලධාරීන් දෙදෙනා ද ඉදිරියේ දී උසස් පෙළ විභාග ප්‍රශ්න පත්‍ර පරිවර්තනය කිරීමට නොහැකි බව දැනුම් දී ඇති බවත් මෙම කටයුතු සඳහා සිසුන්ගේ පරිහරණය සඳහා ලබා දී ඇති මූලාශ්‍ර ග්‍රන්ථ (Resource Book), ඔක්ස්ෆර්ඩ් දෙමළ ශබ්දකෝෂය ද ප්‍රශ්න පත්‍ර පරිවර්තනය කිරීමට භාවිත කරන බවත් විභාග කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ග්‍රන්ථවල ද ඇතැම් වැරදි වචන පවතින බැවින් ඒවා භාවිත නොකර නිවැරදි වචන භාවිත කරන නමුත් සිසුන් සඳහා ලබා දී ඇති මූලාශ්‍ර ග්‍රන්ථවල (Resource Book) පවතින වචනය භාවිත නොකිරීම පිළිබඳ ගැටලු උද්ගත වී ඇති බවත් විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ඉන්දියානු වචන සහ ශ්‍රී ලංකාවේ විෂය මාලාව තුළ භාවිත කරන වචන අතර වෙනසක් පවතින බවත් ඇතැම් භාෂා පරිවර්තකයින් විසින් ඉන්දියානු පාරිභාෂික වචන භාවිත කරන අතර ශ්‍රී ලංකාව තුළ එම වචන භාවිත නොකරන බවත් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු අබූබකර් අතම්බාවා මහතා ද අදහස් පළ කරන ලදී.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු කටයුතු භාෂා ත්‍රිත්වයෙන්ම සිදු කරන බැවින් අමාත්‍යාංශයට ද දෙමළ භාෂා පරිවර්තකයින් නොමැති වීම ද විශාල ගැටලුවක් බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 3.8.2 උතුරු පළාතේ ගුරු හිඟය

උපාධිධාරින් සඳහා ගුරු පත්වීම් ලබා දුන්න ද උතුරු පළාතේ මුලතිව්, වවුනියාව සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල ගුරු හිඟය තවමත් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සාමාන්‍යයෙන්, විවෘත තරඟ විභාගයකින් සේවාවකට බඳවා ගන්නා විට අදාළ නිලධාරියා විභාගයට මුහුණ දෙන දිස්ත්‍රික්කය තුළ ආයතනයකට නොව වෙනත් දිස්ත්‍රික්කයක් තුළ ඇති ආයතනයක් වෙත අනුයුක්ත කළ ද එම සේවා ස්ථානයේ වසර කිහිපයක් සේවය කිරීමෙන් අනතුරුව අදාළ නිලධාරියා පදිංචි ප්‍රදේශය වෙත ස්ථාන මාරුවීම් ලබාදෙන බවත් මේ හේතුවෙන් දුෂ්කර සහ ග්‍රාමීය පළාත්වල දිගින් දිගටම ගුරු හිඟයක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විවෘත තරඟ විභාග සඳහා කඩඉම් ලකුණු ලබා දී අදාළ දිස්ත්‍රික්කයෙන්ම එම දිස්ත්‍රික්කය තුළ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමෙන් ස්ථාන මාරු ගැටලු සහ ගුරු හිඟයට විසඳුම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා ද අදහස් පළ කරන ලදී.

දිස්ත්‍රික් පදනමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා බඳවා ගැනීමේ දී ඉසෙඩ් අගය (Z-Score) මත අදාළ පළාතෙන් හෝ දිස්ත්‍රික්කයෙන් පිට විද්‍යාපීඨ ශික්ෂණලාභීන්හට ද අයදුම් කළ හැකි බැවින් නිශ්චිත දිස්ත්‍රික්කයකින් පමණක් එම දිස්ත්‍රිකයේ පිහිටා ඇති ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා සිසුන් බඳවා ගන්නේ නම් ඒ සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගැටලු පැන නැගී ඇති බැවින් මෙම ක්‍රමවේදය සමාලෝචනය කළ යුතු අතර සමාලෝචනය කිරීමකින් පසු ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවත් දැනට පවතින ප්‍රතිපත්තිමය තීරණය අනුව වර්තමානයේ කටයුතු කිරීමට සිදුවන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.9 ගරු ජගත් මනුවර්ණ මහතා

#### 3.9.1 මධ්‍යම පළාත් ගුරු පුරප්පාඩු පිරවීම

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හරහා ඒ ඒ පළාත්වල පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව පුරවා ගැනීමට අවශ්‍ය අනුමතිය ලබාගැනීමට රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම සමාලෝචනය කිරීමේ අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කමිටුව වෙත අදාළ ලේඛන එවා ඇති බවත් එම අනුමතිය ලබා ගැනීමේ ප්‍රමාදයක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මධ්‍යම පළාතේ ගුරු පුරප්පාඩු 4,534ක් පිරවීම සඳහා අනුමතිය ලබා ගැනීමට අවශ්‍ය බැවින් මෙම අනුමතිය ප්‍රමාද වීමට බලපා ඇති හේතු සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

විවිධ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලෙස අමාත්‍යාංශ 21කින් ඉල්ලීම් ලැබී ඇති අතර මේ වන විට බඳවා ගැනීම් 30,000ක් සිදුකිරීම සඳහා අනුමතිය ලබා දී ඇති බවත් වර්ෂ 05කින් පමණ බඳවා ගැනීම් සිදුකර

නොමැතිවීම හේතුවෙන් යම් ප්‍රමාදයක් ඇති විය හැකි බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.9.2 පාසල්වල සේවය කරන සංවර්ධන නිලධාරීන්

මධ්‍යම පළාතේ සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධ නඩු තීන්දුව මෙම බඳවා ගැනීම් සඳහා බලනොපාන බව අදාළ නිලධාරීන් විසින් දැනුම් දුන් බවත් මධ්‍යම පළාතේ පවතින දුෂ්කර පාසල් බොහෝමයක සිටිය යුතු අනුමත ගුරු සංඛ්‍යාව 25ක් වුව ද සේවය කරනු ලබන්නේ ගුරුවරුන් 10 දෙනෙකු පමණ වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පාසල් වෙත අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් විසින් මෙම පාසල්වල විද්‍යාව, ගණිතය වැනි ප්‍රධාන විෂයයන් ආවරණය කර ඇති අතර පවතින චක්‍රලේඛයට අනුව එම නිලධාරීන් ස්ථිර පත්වීම් ලද පසු වෙනත් සේවා ස්ථානයකට ගිය පසු ඔවුන් විසින් ඉගැන්වූ විෂයන් තවදුරටත් ඉගැන්වීම සඳහා කිසිවෙකුත් නොමැති බවත් ඒ සඳහා වෙනත් ගුරුවරයකු අනුයුක්ත කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පවතින 43,000ක් පමණ වන ගුරු පුරප්පාඩු සියල්ලම මෙම වර්ෂය තුළදී පිරවීමට නොහැකි වන අතර එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට තරම් ප්‍රමාණවත් ගුරුවරුන් නොමැති බවත් පසුගිය වසර 05 තුළ රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සිදු නොකළ බැවින් මෙවැනි ගැටලුවකට මුහුණ දීමට සිදුව ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය සේවය තුළ ගුරු පුරප්පාඩු පමණක් පිරවිය නොහැකි බවත් ගුරු පුරප්පාඩු පවතින පාසල් සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිත කරමින් දරුවන්ට අඛණ්ඩ අධ්‍යාපනයක් ලබාදීමේ වැඩසටහන් සිදු කිරීමට සැලසුම් සකස් කරමින් පවතින බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පළාත් සභාව විසින් ඉල්ලුම් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අනුමතිය ලැබුණහොත් පළාත් සභා මට්ටමින් බඳවා ගැනීම සිදුකළ හැකි බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මධ්‍යම පළාතේ උපාධිධාරීන් 532 දෙනෙකු සඳහා 2025.06.16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබාදුන් අතර එම උපාධිධාරින් අතර නව සංවර්ධන නිලධාරීන් ද බඳවාගත් බවත් ඔවුන් දුෂ්කර සහ අති දුෂ්කර ප්‍රදේශවල පවතින පාසල් සඳහා අනුයුක්ත කළ බවත් මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙතෙක් එම පාසල්වල සේවය කළ සංවර්ධන නිලධාරීන් ස්ථාන මාරුවීම් ලැබ වෙනත් සේවා ස්ථාන වෙත ගිය ද ස්ථාන මාරුවීම් මගින් සහ පත්වීම් ලබාදීම මගින් ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළ දුෂ්කර සහ අති දුෂ්කර ප්‍රදේශවල පාසල්වල සේවය කිරීමට විද්‍යා පීඨ ගුරුවරුන් ඇතුළුව 23 දෙනෙකු අනුයුක්ත කළ බවත් මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ගුරු තුලනයක් මගින් මෙම පාසල් වෙත විසඳුමක් ලබාදීම සඳහා මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් 2025.06.04 දින සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව අවධානය යොමු කරමින් මෙම නිලධාරින් කටයුතු කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දුන් අතර මේ සම්බන්ධව තොරතුරු සොයා බැලීමක් සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහි ප්‍රගතිය පිළිබඳව මීළඟ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.10 ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා

### 3.10.1 උහන සහ පොතුවිල් අධ්‍යාපන කලාප ස්ථාපිත කිරීම

අම්පාර දිස්ත්‍රික්කයේ උහන සහ පොතුවිල් අධ්‍යාපන කලාප ස්ථාපිත කිරීම සඳහා කඩිනමින් අනුමතිය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සඳහා නැගෙනහිර පළාතේ ව්‍යුහ කමිටුවේ නිර්දේශය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අමාත්‍යාංශය වෙත ලබාදිය යුතු බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙය වසර 5කට පමණ පෙර සිදුකළ කටයුත්තක් බවත් උහන උප කලාපය සහ පොතුවිල් උප කලාපය කලාප අධ්‍යාපන කාර්යාල 02ක් ලෙස සංවර්ධනය කරන ලෙසට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කළ බවත් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඒ වන විට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කර තිබූ බැවින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඇතුළත් පරිපාලනමය ප්‍රතිසංස්කරණ හරහා ශ්‍රී ලංකාවේ කලාප කාර්යාල වැඩි කිරීම යටතට මෙම උප කලාප දෙක ද ඇතුළත් කරන බැවින් ඒ දක්වා මෙම කටයුතු ප්‍රමාද කරන බව ඒ අවස්ථාවේ දී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් දැනුම් දුන් බවත් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

නැගෙනහිර පළාතේ ව්‍යුහ කමිටුවෙන් මෙය නිර්දේශ කර තිබේ ද යන්න පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විසින් විමසීමක් කරන ලදී.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ මෙය සලකා බලන බවට එවක පටන් ලිපි ලැබුණු බව නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපන කලාප 22ක් අලුතින් ඉදිකිරීමට යෝජනා වී තිබුණ ද මෙම වසරේ වැඩි අවධානය යොමු කරනු ලැබුවේ පාසල් විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීමට වන බැවින් අධ්‍යාපන කලාප 22 සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක නොවන බව අධ්‍යක්ෂ (සැලසුම්) විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව පරීක්ෂා කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 3.10.2 ජාතික පාසල්වල සේවය කරනු ලබන අනධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරීන්

ජාතික පාසල්වල අනධ්‍යන කාර්යමණ්ඩල නිලධාරී සංඛ්‍යාව අතිරික්තයක් වුව ද ඇතැම් පළාත් සභා පාසල්වල අනධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරියකුදු නොමැති බැවින් මේ පිළිබඳව පරීක්ෂා කර බලා වැඩි සේවක සංඛ්‍යාවක් සිටින ස්ථානවලින් නිලධාරීන් නොමැති ස්ථානවලට නිලධාරීන් අනුයුක්ත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් පත්වීම් බලධරයා වන්නේ ජාතික පාසල්, ගුරු මධ්‍යස්ථාන සහ ගුරු විද්‍යාලවල අනධ්‍යයන කාර්යමණ්ඩල පත්කිරීම් සම්බන්ධයෙන් පමණක් වන බවත් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලින් පත් කරනු ලබන කාර්යමණ්ඩල තනතුරු සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම්වලට අදාළ බලධරයා වන්නේ පළාත් අධ්‍යාපන බලධාරීන් වන අතර අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්හට ඒ සම්බන්ධව නීතිමය බලධාරීත්වයක් නොමැති බවත් අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික පාසල්වල පවතින පුරප්පාඩු පිරවීම සඳහා අනුමතිය ලබා ගැනීමට අවශ්‍ය ලේඛන මීට මසකට පමණ පෙර අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවට යොමු කළ බවත් අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) විසින් දැනුම් දෙන ලදී.

## 3.11 පාසල්වල අතරමග නවතා දමා ඇති ඉදිකිරීම් ව්‍යාපෘති - ගරු කේ. කාදර් මස්තාන් මහතා

උතුරු පළාතේ වන්නි දිස්ත්‍රික්කයේ බොහෝ පාසල්වල 2019 වර්ෂයෙන් පසු ගොඩනැගිලි ඉදිකර නොමැති බවත් ඇතැම් ව්‍යාපෘති යටතේ විවිධ පාසල්වල 30% - 50% දක්වා ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පැවති ආර්ථික අර්බුදය හමුවේ වුව ද මෙම කටයුතු සඳහා වැයවන මුළු මුදලම නොව වැය වන මුළු මුදලින් අඩක් පමණ ලබා දීමට පසුගිය වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් නියමිත කාලය වන විට ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර අවසන් කිරීමට නොහැකි වී ඇති බැවින් ඡන්දයෙන් පසු මේ සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන නැවත ලබාගෙන ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ අයුරින් අතරමග වැඩකටයුතු නවතා දැමූ පාසල් 36ක් පමණ පැවතිය ද මෙම ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භ කළ වවුනියාව, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල පවතින පාසල් 11ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර නොමැති බව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් දැනුම් දුන් බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

"ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පළාත් සභා මගින් සිදුකළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා පසුගිය වසරේ අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කළ බවත් හිටපු අමාත්‍ය රිසාඩ් බදියුදීන් මහතා විසින් ඒ ඒ අමාත්‍යාංශය යටතේ ආරම්භ කළ ව්‍යාපෘති කිහිපයක් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපාදන ලබා නොදීම මත අවසන් නොකළ ව්‍යාපෘති කිහිපයක් සඳහා මුදල් කොමිෂන් සභාව හරහා පළාත් සභාව විසින් මුදල් ලබාගෙන එම

ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කළ යුතු බවත් අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම පාසල් මේ වන විට හඳුනාගෙන ඇති බවත් මුදල් කොමිෂන් සභාව හරහා මුදල් ලබාගෙන පළාත් සභා සඳහා ලබා දී මෙම කටයුතු අවසන් කිරීමට සිදු වන බවත් අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

ජාතික තිරසාර සංවර්ධන උපායමාර්ග (NSDS) හරහා සහ අනෙකුත් ඉතිරි වැඩකටයුතු සඳහා අදාළ අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත් බවත් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මෙය ක්‍රියාත්මක නොවූ අතර පසුගිය වසරේ මේ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සෘජුවම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලැබුණු බැවින් උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මේ සඳහා සම්බන්ධ නොමැති බවත් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඇතැම් කටයුතු සම්බන්ධව තාවකාලික තීරණ ලබා දී ඇති බැවින් මේ සම්බන්ධව කඩිනමින් පරීක්ෂා කළ යුතු බවත් "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ ආරම්භ කර අතරමඟ නවතා දමා ඇති ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට මේ අවස්ථාවේදී ප්‍රමුඛතාව ලබා දිය යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දුන් ගැටලුව රේඛීය අමාත්‍යාංශයේ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව වෙනත් අමාත්‍යාංශයක් හරහා සිදුවී ඇති කටයුත්තක් වන බැවින් මේ සම්බන්ධව පරීක්ෂා කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

පාසල් 11ක ඉදිකිරීම් කටයුතු 30% - 40%ක ප්‍රමාණයක් පමණක් අවසන් කළ ව්‍යාපෘති සහ අතරමග නවතා දැමූ ව්‍යාපෘති පවතින බවත් ඉදිකිරීම් කටයුතු අවසන් නොකළ මෙම ව්‍යාපෘති හේතුවෙන් පාසල් ළමුන්ට අවධානමක් පවතින බවත් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

අවසන් නොකළ ව්‍යාපෘති සහ අතරමඟ නවතා දැමූ ව්‍යාපෘති සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හරහා ප්‍රතිපාදන ලබා දෙන ආකාරයටම මෙම පාසල් 11 පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

මේ සම්බන්ධව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එවන ලද ලිපියකට පිළිතුරු වශයෙන් පළාත් සභාව හරහා මෙම කටයුතුවලට ප්‍රතිපාදන වෙන් කළ නොහැකි බව දැනුම් දුන් බව උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීළඟ වසරේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කළ හැකි ද යන්න සම්බන්ධව ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

මීළඟ වසරේ මෙම කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකි නමුත් මීට අදාළ ලිපිගොනු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සතු නොවන බව උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එසේ නම් මෙම පාසල් 11හි වර්තමාන තත්ත්වය සම්බන්ධව තක්සේරු කර ඉතිරි ඉදිකිරීම් කටයුතු පිළිබඳව වාර්තාවක් සකස් කර අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස ගරු

සභාපතිතුමිය විසින් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී.

ඉන්පසුව මෙය 2026 වසරේ අයවැය සඳහා ඇතුළත් කළ හැකි බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දුන් අතර ඉදිරියේ දී මෙවැනි තාවකාලික තීරණ ගෙන කටයුතු කිරීමට ඉඩ නොදෙන ලෙස ද ගරු සභාපතිතුමිය විසින් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

**3.12 උතුරු පළාතේ ප්‍රාථමික අංශ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු - ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**

උතුරු පළාතේ ප්‍රාථමික අංශ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු 550ක් පමණ පවතින අතර උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English) හැදෑරූ ඩිප්ලෝමාධාරීන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින් ඔවුන් හට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හරහා පුහුණුවක් ලබා දී මෙම පුරප්පාඩු පුරවන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English) හැදෑරූ ඩිප්ලෝමාධාරීන් 500 ක් සේවයට බඳවා ගැනීම සඳහා අනුමතිය ලද නමුත් 2024 වසරේ දී බඳවා ගැනීමට හැකි වූයේ 390ක් පමණක් බවත් ඉතිරි 110 දෙනෙකු බඳවා ගැනීම සඳහා අවස්ථාව පැවතිය ද උතුරු පළාතේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු නොමැති බවට ලද තොරතුරු මත උතුරු පළාතට වෙන් කර තිබූ පත්වීම් සංඛ්‍යාව නැවත ජාතික පාසල් වෙත වෙන් කළ බවත් අතිරේක ලේකම් (ආයතන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උතුරු පළාතට ප්‍රාථමික ගුරුවරු සහ ප්‍රාථමික ඉංග්‍රීසි ගුරුවරු 599ක් බඳවා ගැනීම සඳහා විශේෂ ඉල්ලීමක් ඉදිරිපත් කළ බවත් ද්විතීයික අංශ ඉංග්‍රීසි ගුරුවරු අතිරික්තයක් පවතින බැවින් ඒ සම්බන්ධව ඉල්ලීම් ඉදිරිපත් නොකළ බවත් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ප්‍රාථමික ඉංග්‍රීසි ගුරු යනුවෙන් විශේෂ අනුමත ගුරු සංඛ්‍යාවක් නොමැති අතර විද්‍යාපීඨ ගුරුවරුන් විසින් ප්‍රාථමික පන්ති සඳහා ඉංග්‍රීසි විෂය උගන්වන බවත් මේ සම්බන්ධව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු ආයතන සමඟ සාකච්ඡා කරන බවත් අතිරේක ලේකම් (විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English) හැදෑරූ ඩිප්ලෝමාධාරීන් පළාත් සභා පාසල් සඳහා බඳවාගත නොහැකි ද යන්න සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් විමසීමක් කරන ලදී.

එම අවස්ථාවේ දී පළාත් සභා පාසල්වල පුරප්පාඩු නොතිබූ බවත් උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English) හැදෑරූ ඩිප්ලෝමාධාරීන් බඳවා ගනු ලබන්නේ 6 - 11 ශ්‍රේණි සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා බවත් අතිරේක ලේකම් (ආයතන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English) හැදෑරූ ඩිප්ලෝමාධාරීන් ප්‍රාථමික පන්තිවල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා යොදාගත නොහැකි ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

ප්‍රාථමික ඉංග්‍රීසි ගුරුවරු යනුවෙන් කණ්ඩායමක් නොමැති බවත් ප්‍රාථමික සහ ද්විතීයික යන අංශ 02 සඳහාම ඉංග්‍රීසි ගුරුවරුන් යොදවන බවත් ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික් පදනම මත ගුරුවරුන් බඳවා ගන්නා බවත් උතුරු පළාතට නිශ්චිත ගුරු සංඛ්‍යාවක් වෙන් කර තිබූ අතර උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ පිළිබඳව විමසීම් කළ විට ඒ සඳහා ගුරු පුරප්පාඩු නොමැති බව දැන්වූ බැවින් උතුරු පළාත සඳහා වෙන් කළ ගුරු සංඛ්‍යාව ජාතික පාසල් වෙත ලබා දුන් බවත් අතිරේක ලේකම් (ආයතන) විසින් දැනුම් දෙන ලදී.

6 - 11 ශ්‍රේණිවලට ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු නොමැති බව සහ ප්‍රාථමික අංශවලට ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු පවතින බව පැහැදිලිව ලිඛිතව දැනුම් දුන් බවත් ඊට අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය අනුමතිය ලිඛිතව ඉල්ලා සිටි බවත් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English) හැදෑරූ ඩිප්ලෝමාධාරීන් 500 ක් සේවයට බඳවා ගැනීම සඳහා අනුමතිය ලද නමුත් 2024 වසරේ දී බඳවා ගැනීමට හැකි වූයේ ඩිප්ලෝමාධාරීන් 390ක් පමණක් බවත් ඉතිරි 110 දෙනා අදාළ විභාගය සමත් වී නොමැති බැවින් බඳවා ගත නොහැකි බව අතිරේක ලේකම් (ආයතන) විසින් දැනුම් දෙන ලදී.

උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා පමණක් පළාත් සභාවට බලය ඇති බවත් රේඛීය අමාත්‍යාංශයේ විශේෂ අවසරය සහිතව පමණක් ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමට හැකි බවත් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඩිප්ලෝමාධාරී ගුරුවරුන්හට ප්‍රාථමික අංශ සිසුන්ට ඉගැන්වීම සම්බන්ධව පුහුණුවක් නොමැති බැවින් ඔවුන් ප්‍රාථමික අංශ අධ්‍යාපනය සඳහා බඳවා නොගන්නා බව ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ගුරු හිඟයක් පවතී නම් සහ එම පුරප්පාඩු පිරවීම සඳහා අනුයුක්ත කළ හැකි ඩිප්ලෝමාධාරී ගුරුවරුන් ද සිටී නම් ඔවුන්ට අදාළ පත්වීම ලබා දී ඉන්පසු ගුරු පුහුණුවක් ලබා දීමට හැකි බවත් නව විසඳුම් සොයාගැනීමෙන් මෙම ගැටලු සඳහා විසඳුම් ලබා දිය හැකි අතර මෙය ජාතික අධ්‍යාපන ආයතනයට සිදු කළ හැකි බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික අධ්‍යාපන ආයතනයේ අනෙකුත් මධ්‍යස්ථාන සතුව ප්‍රාථමික අංශය සඳහා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට අදාළ මොඩියුල 12කින් සමන්විත පාඨමාලාවක් පවතින බවත් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මගින් මෙය ඉල්ලුම් කරන්නේ නම් ඩිප්ලෝමාධාරීන්ට ද මෙම පුහුණුව ලබා දිය හැකි බව ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සිසුන් රජයේ රැකියා සඳහා බඳවා ගැනීමේ දී ඔවුන් NVQ 6 මට්ටම ළඟා කරගෙන නොතිබීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගැටලුවක් මතු කිරීම සම්බන්ධව ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

ලංකාව තුළ ඉංග්‍රීසි භාෂාව සඳහා NVQ 5 මට්ටම පමණක් පවතින අතර ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව ඩිප්ලෝමාධාරියෙක් බඳවා ගන්නේ නම් NVQ 6 තිබිය යුතු බවත් 2019 වර්ෂයේ දී පැවැත්වූ තරඟ විභාගයෙන් සමත් අයවලුන් බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළ බවත් අතිරේක ලේකම් (ආයතන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම අවස්ථාව සඳහා පමණක් NVQ 6 මට්ටම නොමැති වුවත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (Sri Lanka Institute of Advanced Technological Education - SLIATE) ජාතික උසස් අධ්‍යාපන ඩිප්ලෝමාව හදාරා ඇති අයවලුන් පමණක් බඳවා ගැනීමට අවසර දෙන බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනුම් දුන් බැවින් එම නිශ්චිත අවස්ථාවේ පමණක් එම බඳවා ගැනීම් සිදු කළ බව අතිරේක ලේකම් (ආයතන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර මේ සම්බන්ධව විසඳුමක් ලබා ගත යුතු බවත් NVQ 5 මට්ටම සපුරා ගෙන තිබෙන පුද්ගලයින් NVQ 6 මට්ටමට උසස් කිරීමට යම් ක්‍රමවේදයක් සකස් කරගෙන හෝ මෙම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

NVQ 5 මට්ටම සපුරා ගෙන තිබෙන ඩිප්ලෝමාධාරීන්ව NVQ 6 මට්ටමට උසස් කිරීමට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) එකඟ වූ බව ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් පිරිනමන උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English - HNDE) අවසන් කර මේ වන විට අධ්‍යයන කණ්ඩායම් 03ක සිසුන් 300ක් පමණ ඩිප්ලෝමාධාරීන් ලෙස සමත් වී ඇති බවත් ඔවුන් රාජ්‍ය සේවයට බඳවා ගෙන පුහුණුවක් ලබා දීමට කටයුතු කරන්නේ නම් ඔවුන් NVQ 6 මට්ටමට උසස් කිරීමට හැකි බවත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (Higher National Diploma in English - HNDE) අවසන් කරන සිසුන්ට NVQ 5 මට්ටම ලබා දෙන බවත් ඔවුන්ව NVQ 6 මට්ටමට උසස් කිරීම සඳහා මේ වන විට අදාළ විෂය සමාලෝචන සිදු කරමින් පවතින බවත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**3.13 අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතන (Anuradhapura University College) පරිශ්‍රයේ ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොමැති වීම - ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**

අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය (Anuradhapura University College) පරිශ්‍රයේ ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොමැති වීමෙන් සිසුන් අපහසුතාවයට පත්ව සිටින බවත් අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය ඉදිකර ඇත්තේ අනුරාධපුර කාර්මික විද්‍යාලයට අයත් ඉඩම් කොටසක බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහි ඉඩකඩ පහසුකම් වැඩිකර දෙන එහි සිසුන් ඉල්ලීම් කරන බැවින් මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ශිෂ්‍ය සංගමය අමාත්‍යාංශයට පැමිණ මේ පිළිබඳව සාකච්ඡා කළ බවත් අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ඉඩම සහ උග්‍ර පානීය ජල ගැටලුව ආදී ගැටලු කිහිපයක් පවතින බව ගරු වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයට අයත් ඉඩම සම්බන්ධ ගැටලුව කඩිනමින් නිරාකරණය කරන බව ද ගරු වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.14 අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම - ගරු සුදත් බලගල්ල මහතා

කොළඹ විශ්වවිද්‍යාලයෙන් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ගත් අධ්‍යාපනවේදී උපාධිධාරීන් 232ක් පමණ මේ වන විට සිටින බැවින් ඔවුන් ගුරු සේවයට බඳවා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නඩු කටයුත්තක් පවතින බැවින් ජාතික මට්ටමින් බඳවා ගත නොහැකි නමුත් පළාත් සභා මට්ටමින් බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ 2025.06.04 දින සාකච්ඡා කරන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.15 ගරු සුනිල් රාජපක්ෂ මහතා

#### 3.15.1 06 ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම

ඇතැම් ජාතික පාසල් සහ පළාත් සභා පාසල්වල 06 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ දී අවට ඇති පෝෂිත පාසල් සහ 05 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සමත් වීම වැනි පදනම් මත සිසුන් අධික ප්‍රමාණයක් බඳවා ගන්නා බවත් දුර බැහැර සිටින 05 ශ්‍රේණිය ශිෂ්‍යත්වයේ කඩඉම් ලකුණට ආසන්න ලකුණක් තිබියදීත් බඳවා නොගන්නා බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

06 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ දී පදිංචියේ ආසන්නතාව පිළිබඳ චක්‍රලේඛ මගින් හෝ අර්ථකථනයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

06 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමට අදාළ චක්‍රලේඛයේ පදිංචිය සම්බන්ධව සලකා බලන්නේ ද යන්න පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විසින් විමසීමක් කරන ලදී.

06 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ දී පාසලට ආසන්නතාව යනුවෙන් පදනමක් නොමැති අතර නම් කරන ලද පෝෂිත පාසල්වලින් සිසුන් බඳවා ගැනීමේ දී මෙම ගැටලුව ඇති වන බව අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා දැනුම් දෙන ආකාරයට පෝෂිත පාසල්වල විදුහල්පතිවරුන් විසින් ඉතා දුර බැහැර ප්‍රදේශවල දරුවන් එම පාසල්වලට ඇතුළත් කරගෙන ඉන්පසුව 06 ශ්‍රේණිය සඳහා ජනප්‍රිය යැයි හඳුන්වන පාසල්වලට ඇතුළත් කරන බවත් ඉදිරි වර්ෂවල 06 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ දී මේ සම්බන්ධව අවධානය යොමු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.15.2 රත්නපුර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය පාසල්

රත්නපුර දිස්ත්‍රික්කයේ 1 - 5 ශ්‍රේණි දක්වා පන්ති පවතින බොහෝ පාසල් සංඛ්‍යාවක් ඇති නමුත් 6 - 13 ශ්‍රේණිය දක්වා පන්ති පවතින දෙමළ මාධ්‍ය පාසලක් ආරම්භ කිරීමට තරම් ප්‍රමාණවත් සිසුන් පිරිසක් නොමැති බැවින් 6 - 13 ශ්‍රේණිය දක්වා පන්ති පවතින සිංහල මාධ්‍ය පාසල්වල දෙමළ මාධ්‍ය පන්ති කිහිපයක් ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ව්‍යුහ කමිටු වෙත මේ පිළිබඳව ඉල්ලීම් කරන්නේ නම් මේ සම්බන්ධව සලකා බැලිය හැකි බව අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්ය සාධන සමාලෝචන) විසින් වෘත්තීය අධ්‍යාපන දැනුම් දෙන ලදී.

## 3.16 රුහුණු ජාතික අධ්‍යාපන පීඨයේ ඇතැම් පාඨමාලා සඳහා බඳවා ගැනීම් නැවැත්වීම - ගරු මුනීර් මුලාෆර් මහතා

2000 වර්ෂයේ දී රුහුණු ජාතික අධ්‍යාපන පීඨය ආරම්භ කරන අවස්ථාවේ සිංහල මාධ්‍ය ප්‍රාථමික අංශය, ශාරීරික අධ්‍යාපනය, ගෘහ ආර්ථික විද්‍යාව සහ ප්‍රාථමික අධ්‍යාපනය (දෙමළ මාධ්‍ය) සඳහා බඳවා ගැනීම් සිදුකරන ලද බවත් 2010 වර්ෂයෙන් පසු අදාළ බඳවාගැනීම් සිදු කිරීම නවතා ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එලෙස අදාළ බඳවා ගැනීම් නතර කිරීමට හේතුව සහ නැවත එම බඳවාගැනීම ආරම්භ කරන්නේ ද යන්න සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා සිදුකරන ඉදිරි බඳවා ගැනීම්වල දී පවතින පුරප්පාඩු හඳුනා ගනිමින් එම පාඨමාලා සඳහා ශික්ෂණලාභීන් වැඩි වශයෙන් බඳවා ගැනීමට කටයුතු කරන බවත් නව පාඨමාලා හඳුන්වාදීමට කටයුතු කරන බවත් ප්‍රධාන කොමසාරිස් (ගුරු ආයතන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.17 මධ්‍යම පළාතේ උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ සිසුන්හට රැකියා නොලැබීම - ගරු ඊ. එම්. බස්නායක මහතා

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව මඟින් ඩිප්ලෝමා ලබාගත් මධ්‍යම පළාතේ ඩිප්ලෝමාධාරීන් 66 දෙනෙකු මෙතෙක් රැකියා විරහිතව සිටින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ විභාගය ජාතික මට්ටමින් පවත්වා ඉන් සමත් වූ 500 දෙනෙකු සඳහා පළාත් අනුව පත්වීම් ලබාදීම සඳහා අනුමතිය ලැබී ඇති අතර ඉන් 390ක් පත්වීම් භාර ගෙන ඇති බවත් සෙසු 110 දෙනා සඳහා ඉදිරියේ දී පළාත් මට්ටමින් පත්වීම් ලබාදීමට කටයුතු කරන බවත් අතිරේක ලේකම් (ආයතන) විසින් දැනුම් දෙන ලදී.

තව ද, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් විභාගය පවත්වන අවස්ථාව වන විට මෙම 66 දෙනා විසින් අදාළ ඩිප්ලෝමාව සම්පූර්ණ කර නොතිබීමේ හේතුව මත එම පිරිසට පත්වීම් ලැබීමේ අවස්ථාව අහිමි වී පැවතිය හැකි බැවින් අදාළ ඩිප්ලෝමාධාරීන් සම්බන්ධව තොරතුරු අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසට අමාත්‍යාංශ ලේකම් විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

**3.18 අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට රැකියා ලබා දීම - ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා සම්පූර්ණ කොට ඒ සම්බන්ධ ඩිප්ලෝමා ද ලබාගත් බොහෝ උපාධිධාරීන් රැකියා විරහිතව සිටින බැවින් සහ නැගෙනහිර පළාත තුළ ඉහළ පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බැවින් එම අධ්‍යාපනවේදී උපාධිධාරීන් සඳහා ගුරු පත්වීම් ලබාදීම සම්බන්ධයෙන් සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන් සමඟ සාකච්ඡා පවත්වන ලද බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ ද ඉදිරි දිනක සාකච්ඡා පවත්වා අදාළ බඳවාගැනීම් සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.19 ගරු මංජුල සුගත් රත්නායක මහතා**

**3.19.1 අම්පාර උහන ජාතික පාසලට විදුහල්පතිවරයෙකු පත් කිරීම**

අම්පාර උහන ජාතික පාසලේ පුරප්පාඩු වී පවතින විදුහල්පති තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බැවින් එම විදුහල්පති තනතුර සඳහා පත්වීම් ලබාදීමේ කටයුතුවල වත්මන් ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම සතිය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අදාළ පත්වීම් ලේඛනය ලැබීමට නියමිත බවත් ඒ අනුව කඩිනමින් එම පත්වීම ලබාදීමට හැකියාව ලැබෙනු ඇති බවත් අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.19.2 නැගෙනහිර පළාතේ ගුරු පුරප්පාඩු පිරවීම**

නැගෙනහිර පළාත තුළ පවතින ගුරු හිඟය සම්බන්ධව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බැවින් එම ගුරු හිඟය පිරවීම සඳහා ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

5000කට අධික ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් පවතින බවත් ගුරුවරුන් 3,000කට පත්වීම් ලබාදීම සඳහා ඉල්ලීම් කර ඇති බවත් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.20 ගරු රිසාඩ් බදියුදීන් මහතා**

**3.20.1 ඉදිකිරීම් අවසන් කර නොමැති පාසල් ගොඩනැගිලි**

මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්ක තුළ ඇති ඉදිකිරීම් අවසන් කර නොමැති පාසල් 06 සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම පාසල්වල ඉදිකිරීම් කටයුතු රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව සිදු වී ඇති බවත් එම ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා 2025 වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර නොමැති බැවින් 2026 වර්ෂයේ දී ප්‍රතිපාදන වෙන් කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තව ද, අදාළ පාසල් 06 සම්බන්ධ තොරතුරු රේඛීය අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමිය විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

### 3.20.2 ඉංග්‍රීසි ගුරුවරුන් බඳවා ගැනීම

ගුරුවරුන් බඳවාගෙන ඔවුන් දුෂ්කර පළාත්වල සේවය සඳහා යෙදවීමේ දී එමඟින් එම ගුරුවරුන්ට සහ එම ප්‍රදේශයේ පාසල්වල සිසුන්ට අපහසුතාවයක් ඇති නොවන පරිදි අදාළ ගුරුවරුන්ගේ පදිංචිය අනුව අධ්‍යාපන කලාප වශයෙන් හෝ පාසල් සඳහා අනුයුක්ත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එවිට ස්ථාන මාරුවීම් සම්බන්ධ ගැටලුව ද විසඳා ගැනීමට හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නව බඳවාගැනීම් සිදුකිරීමේ දී මේ වන විට පවතින ක්‍රමවේදය පිළිබඳව නැවත සලකා බැලිය යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 3.21 භාෂා පරිවර්තක ගැටලුවට විසඳුම් යෝජනා - ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න

යාපනය සහ නැගෙනහිර විශ්වවිද්‍යාලවලට භාෂා 03ම පරිවර්තන කටයුතු සම්බන්ධ උපාධි පාඨමාලා සඳහා එක් අධ්‍යයන වර්ෂයකට 100 දෙනෙකු බඳවා ගෙන ඔවුන්ට ක්ෂේත්‍රයේ රැකියා ලබා දීම මගින් භාෂා පරිවර්තක ගැටලුව විසඳාගැනීමට හැකි වනු ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට පමණක් නොව වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට ද මේ සම්බන්ධව මැදිහත් විය හැකි බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 3.22 ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

### 3.22.1 ත්‍රෛභාෂා පාසල්

මාධ්‍ය අනුව පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමෙන් තොරව ඕනෑම මාධ්‍යයක් භාවිත කරන දරුවන් සෑම පාසලකටම ඇතුළත් කර ගැනීම සම්බන්ධව නව රජයේ ප්‍රතිපත්තිය යටතේ කටයුතු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එස්. ද එස්. ජයසිංහ විද්‍යාලයේ දෙමළ මාධ්‍යයෙන් උගන්වන ගුරුවරුන් නොමැති වීම හේතුවෙන් දරුවන් අපහසුතාවට පත්වී සිටින බැවින් භාෂා මාධ්‍ය දෙකකින් ඉගැන්වීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

එම විද්‍යාලයේ දෙමළ මාධ්‍ය පන්ති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගෙන ඇති බවත් 2026 වර්ෂයේ සිට ළමුන් ඇතුළත් කරගැනීමට හා ගුරුවරුන් බඳවා ගැනීමට අවශ්‍ය අනුමතිය ලැබී ඇති බවත් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.22.2 පාසල්වල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම

පාසල්වල පවතින ඉඩ පහසුකම් පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව සිසුන් ඇතුළත් කර ගැනීම හේතුවෙන් දෙහිවල මිලාද් මුස්ලිම් විදුහලේ ගැටලුවක් ඇති වී ඇති බවත් මෙම පාසල අයත්වන අධ්‍යාපන කලාපයේ

නිලධාරීන් විසින් මේ පිළිබඳව කිසිඳු තැකීමක් නොකරන බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එබැවින්, මේ සම්බන්ධව පරීක්ෂා කර අවශ්‍ය පහසුකම් සපයා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය වසර 10 - 15 කාලයක් තුළ දෙහිවල මිලාද් මුස්ලිම් විදුහලේ අධ්‍යාපනය ලැබීමට පවතින ඉඩකඩ ඉක්මවා යමින් සිසුන් ඇතුළත් කරගෙන ඇති බවත් ව්‍යුහ කමිටුව කැඳවා මේ සම්බන්ධව කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.23 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග සමත් වූ සිසුන් ජනප්‍රිය පාසල්වලට තෝරා නොගැනීම - ගරු සංජීව රණසිංහ මහතා**

ශිෂ්‍යත්ව විභාගයෙන් කඩඉම් ලකුණට ආසන්නව හා කඩඉම් ලකුණට වඩා වැඩියෙන් ලකුණු ලබාගත් ඇතැම් ශිෂයන්ට ජනප්‍රිය පාසලක් ඉල්ලුම් කළත් එම පාසල ලැබී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පළමුවැනි අදියරේ දී ඉල්ලුම් කරන ලද පාසල් ප්‍රමාණය හා එම පාසල්වල පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව කඩඉම් ලකුණ නිර්ණය කරන බවත් ඒ සම්බන්ධව කිසිඳු අවබෝධයකින් තොරව කඩඉම් ලකුණු ප්‍රසිද්ධ කර නොමැති අවස්ථාවේ දී අයදුම්පත් ඉදිරිපත් කර තිබීමට හැකි බවත් අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යම් පාසලක කඩඉම් ලකුණට වඩා වැඩි ලකුණු ලබාගත් ශිෂ්‍යයින් බොහොමයක් අභියාචනා ඉදිරිපත් කර තිබෙන බවත් අභියාචනා අවස්ථාවේ දී අදාළ පාසලේ ඒ වන විට පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව මෙම අභියාචනා සලකා බැලිය හැකි බවත් අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලබාගත් ලකුණු අනුපිළිවෙළ අනුව පාසල්වලට ළමුන් ඇතුළත් කරගන්නා අතර ඒ අවස්ථාවේ දී පාසල්වල පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව සලකා බැලීමට සිදුවන බවත් එම පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිසුන් ඇතුළත් කර ගතහොත් ඉඩකඩ සහ අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් නොවීමෙන් දරුවන් දැඩි අපහසුතාවයට පත් වන බවත් අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එවැනි ගැටලුවලට මුහුණ දීමට සිදුවන බැවින් අභියාචනා අවස්ථාවේ දී අදාළ පාසල්වල විදුහල්පතිවරුන් සමඟ සාකච්ඡා කර දරුවන් ඇතුළත් කළ බව ද අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙලෙස 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධව අභියාචනා කරන අවස්ථාවේ දෙවන අදියර ක්‍රියාත්මක වෙමින් පවතින බවට දෙමාපියන් දැනුවත් කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ජනමාධ්‍ය හරහා නිවේදනයන් නිකුත් කළ බවත් මෙම තොරතුරු අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇති බවත් අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ග්‍රාමීය ප්‍රදේශවල දෙමාපියන් විධිමත්ව දැනුවත් කිරීම රේඛීය අමාත්‍යාංශයේ පවතින මාධ්‍ය ඒකකයේ කාර්යභාරය බව ගරු ජගත් මනුවර්ණ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.24 පාසල්වල ළමාරක්ෂක කමිටු සක්‍රීය කිරීම - ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය**

පාසල් ළමුන් අතර සිය දිවි හානි කර ගැනීමේ ප්‍රවණතාවය ඉහළ ගොස් ඇති බැවින් අවදානමකට ලක්විය හැකි සිසුන් හඳුනා ගත යුතු අතර පාසල්වල ළමාරක්ෂක කමිටු සක්‍රීය කළ යුතු බවට ගරු අමාත්‍යතුමිය විසින් යෝජනා කරන ලදි.

විධිමත් ලිංගික අධ්‍යාපනය සම්බන්ධයෙන් පාසල් දරුවන් දැනුවත් කළ යුතු බවට ද ගරු අමාත්‍යතුමිය විසින් යෝජනා කරන ලදි.

ළමාරක්ෂක කමිටු සක්‍රිය කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීමට කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළ බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පාසල්වල සේවය කරන ළමා මනෝ උපදේශකවරුන් බොහොමයක් පාසල් දරුවන් සමඟ මිත්‍රශීලීව ගණුදෙනු නොකරන බැවින් මේ සම්බන්ධව අදාළ මනෝ උපදේශකවරුන් දැනුවත් කළ යුතු බව ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ළමාරක්ෂක අධිකාරිය, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය හා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සම්බන්ධ කර ගනිමින් පාසල්වල මනෝ උපදේශන ගුරුවරුන් පුහුණු කිරීමට මොඩියුල සකස් කර ඇති බවත් අතිරේක ලේකම් (විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

මනෝ උපදේශනය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී දරුවන්ගේ විශ්වාසනීයත්වය හා රහස්‍යභාවය සුරැකීම අනිවාර්ය බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මනෝ උපදේශනය විෂයක් ලෙස හදාරන ලද ගුරුවරුන් පාසල්වල පවතින මනෝ උපදේශන ඒකක සඳහා බඳවාගත යුතු බව ගරු සුනිල් රාජපක්ෂ මහතා විසින් දැනුම් දෙන ලදී.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා විසින් ද මේ සම්බන්ධයෙන් අදහස් පළ කරන ලදී.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මනෝවෛද්‍යවරුන්ගේ විද්‍යාලය (Sri Lanka College of Psychiatrists) සමඟ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී හෙට දිනයේ දී සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බව ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශ්වාසනීයත්වය දිනාගත් මිත්‍රශීලී ගුරුවරුන්හට ශිෂ්‍යයින් තමා සතු ගැටලු ඉදිරිපත් කරන බවත් පාසල්වල එම ගුරුවරුන් තෝරා මනෝ උපදේශනය සම්බන්ධ පුහුණුවක් ලබා දිය යුතු බවත් ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් යෝජනා කරන ලදී.

**3.25 වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය, ගරු නලින් හේවගේ මහතා**

වර්ෂයක දී පාසල්වලට දරුවන් ලක්ෂ 03ක් පමණ ඇතුළත් වුවත් විශ්වවිද්‍යාලවලට සිසුන් 42,000ක් හා වෘත්තීය අධ්‍යාපන අංශයට 125,000ක් පමණ ඇතුළත් වන බවත් පෞද්ගලික අංශයේ රැකියා සඳහා සිසුන් 75,000ක් පමණ යොමුවන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විධිමත් ආකර්ෂණීය රාජ්‍ය ආයතන පද්ධතියක් ගොඩනැගීමේ ශ්‍රම මෙහෙයුම මෙම මස 27 වැනි දින ආරම්භ කරන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

එම වැඩසටහන සම්බන්ධයෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

**3.26 විධිමත් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම - ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**

වෘත්තීය අධ්‍යාපන ආයතනවල පවතින පාඨමාලා රැකියා වෙළෙඳපොළ සමඟ සම්බන්ධ කර ගනිමින් පාසල හැර යන දරුවන් සඳහා පාසල සමග සම්බන්ධීකරණයෙන් විධිමත් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

පාසල තුළදීම මෙම වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සාකච්ඡා කරමින් පවතින බව ගරු වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.27 ගරු සභාපතිතුමිය විසින් සිදුකරන ලද දැනුම්දීම්**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්බන්ධව මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව දැනුවත් කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව යටතේ පවතින අනු කාරක සභා සම්බන්ධව ගරු සභාපතිතුමිය විසින් පැහැදිලි කිරීමක් කරන ලදී.

මෙම අනු කාරක සභා රැස්වීමෙන් අනතුරුව එම අනු කාරක සභාවල නිර්දේශ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන බව ද ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව 04.20 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.